
Uploaded By Sanda
Publications
SL UNLIMITED
ඉසිවර දැක්
දිල්හානි වික්‍රමරත්න
Dilhani Wickramarathna

# ඉසිවර දෑත්

## දිල්හානි වික්‍රමරත්න

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

Uploaded By Sanda

# 01

ඒළුවඒ කොරටුවෙන් ඇළ නියරට ගොඩ වී, ඇළ නියර දිගේ තමා නැවතී හිඳින ඉසව්වට සෙමින් ඇවිද එන මහලු මිනිසා දෙස මානවී බලා සිටියේ මුව මදහාස ඇතිව ය. අවිහිංසකත්වය සියලඟ ම තවරා ගත් මහලු ගැමියා, තම ග්‍රාමයේ තරුණ ග්‍රාම නිලධාරිනිය වෙත දුබල ගමනින් ඇවිද ආවේ යටහත් පහත් ලෙසිනි.

"සුගතදාස මාමා.."

"අනේ ආරච්චි නෝනා මහත්තයෝ..!"

ස්කූටරය මත හිඳ උන් මානවී, පැළඳ උන් හෙල්මටය ගලවා අතට ගත්තේ යතුරු පැදිය මත හිඳගෙන ම ය.

"මම මේ මාමා දැකලා නැවැත්තුවේ.. මොකද මේ ගෝවා ලියදි තුන හතරෙම කොළ කොඩ වෙලා..?"

මානවී විමසුවේ පැහැදිලි, ශෝකී ස්වරයකිනි. මහල්ලා, තරුණ ග්‍රාම නිලධාරිනිය දෙස බැලුවේ අසරණ දෑසිනි.

"මං දන්නෑ ආරච්චි නෝනා මහත්තයෝ.. මේ මුලු යායටම ඕං ඔය හෙණ ගෙඩිය වැදිල.. ගොයියො හිටු කියලා තෙල් බෙත් ගහනවා ඉවරයක් නෑ.. ඒත් ඵලක් නැති පාටයි.."



Uploaded By Sanda

මානවී, යටි තොල සපාගෙන මදක් කල්පනාවේ නිමග්නව හිඳ යලිත් මහල්ලා දෙස බැලුවා ය.

"ඇයි මධුරංග මහත්තයා ආවෙ නැද්ද මාමා..?"

"ඔහෙ නෑ අපේ ආරච්චි නෝනා මහත්තයෝ.. කුසිකරුම මහත්තයා ටික දොහකින් මේ පැත්තටවත් ආවෙ නෑ.."

මානවී, යලිත් මහල්ලා දෙස බැලුවේ කුහුලින් පිරි දෑසිනි.

"එතකොට අසේල මහත්තයා..?"

"සමුර්ද්ධි මහත්තයාවත් ආවෙ නෑ ආරච්චි නෝනා මහත්තයෝ.."

මානවී යලිත් කල්පනාවට වැටුණා ය. අව්හිංසක ගැමි ගොවියන් කෙරෙහි උපන් සංවේගයත්, තම සගයන් කෙරෙහි උපන් කිසියම් කලකිරීමක් ද එකට කැලතී ඇගේ ළයෙහි අමුතු ම රිදුමක් ඇති කළේ ය.

"මුළු යායෙම ගෝවා කොටු මෙහෙමද මාමා?"

"නෑ නෝනා මහත්තයෝ.. මේ යායෙ කොටු හත අට තමයි මෙහෙම විනාස වෙලා ම ගොහින් තියෙන්නෙ.. අනිත් යායවල් නං තවම බේරිල තියෙනවා.. මොකක් නමුත් කොරන්ට බැලුවොත් ඉතුරු ගොයියො ටිකවත් බේරගන්ට බැරිවෙන එකක් නෑ ආරච්චි නෝනා මහත්තයෝ.."

මානවීගේ මුවින් ගිලිහුණු දිගු සුසුම උඩකැන්දවල ගම්මානයේ වා තලයට මුසු විය.

"මේ ප්‍රශ්නෙට අපි මොකද කරන්නෙ..? ම්.. ම්..???"

මානවී, මද වේලාවක් දෙතොල් එකිනෙක මත තදින් තෙරපවාගෙන කල්පනා කරන්නට වූවා ය. අහිංසක ගැමියා, ළෙන්ගතු බැල්මෙන් යුතුව තම ගම්මානයට පැමිණි හෘදයාංගම ගැලවුම්කාරිය දෙස යටහත් නෙතින් බලා සිටියේ ය.





"මට මෙහෙ වැඩ බැලීම විතරයිනෙ තියෙන්නෙ මාමා.. ඊනවට වැඩිය කෘෂිකර්ම මහත්තුරුන්ගෙ වැඩවලට මැදිහත් වෙන්නත් මට බෑ.. මේක මගේ වසමවත් උනා නම් මොනවා හරි කරන්න තිබුණා.. කමක් නෑ.. මම කෝකටත් යන ගමන් ජී. අයි. මහත්තයව හම්බවෙලා යන්නම්.. හෙට මම කොට්ඨාශ රැස්වීමට යනවා.. එතකොට මධුරංගයි, අසේලයි හම්බවෙලා මේ ගැන කතා කරන්නම්.."

"හොඳමයි ආරච්චි නෝනා මහත්තයෝ.."

ගැමියාගේ ආමන්ත්‍රණය මානවීගේ මුව කොනට ඉබේ ම හසරැල්ලක් ඇන්දුවේ ය. උපන් දා පටන් ගැමි සුවඳ ඇසුරේ දිවි ගෙවූ මානවී කවදත් ප්‍රිය කළේ ගැමියන් අතරේ ම ජීවත් වන්නට ය. ජීවිතය පිළිබඳ මහා පරිමාණයෙන් සිහින නොදුටු ඇය, මීට වසර තුනකට පෙරාතුව රජයේ ග්‍රාම නිලධාරී විභාගය ඉහළින් ම සමත් වී, රාජ්‍ය සේවයට එක් වූවා ය. ගෙවී ගිය වසර තුන මුළුල්ලේ ම ඈ හදවත තුළ කිසිදු හිස් තැනකට ඉඩක් නොතබා අවංකව තම සේවය උදෙසා කැප වූවා ය. ඒ අවංක වූත්, අමිල වූත් සේවය උදෙසා ඈ පසුගිය වසරේ කොට්ඨාශය තුළ හොඳම ග්‍රාම නිලධාරිනිය වශයෙන් ගෞරව බහුමානයට පාත්‍ර වූවා ය.

"මම එහෙනම් යන්නම් මාමා.. අද මගේ කාර්යාල දවස.. අනිද්දා මම වැඩ බැලීමට එනවා.. ඒ ආවා ම කුඹුරු ටිකේ ඇවිදලා බලමු.. පුළුවන් නම් රණවීර මහත්තයට කියන්න අනිද්දා හවසට ගොවි කමිටු රැස්වීම ලෑස්ති කරන්න කියලා.. මාමා අමුතුවෙන් අර කන්ද නැගගෙන රණවීර මහත්තයා හොයාගෙන යන්න එපා.. මගදි හම්බ උනොත් හරි අමතක නොකර කියන විශ්වාසවන්ත කෙනෙක් අතේ හරි පණිවිඩේ යවන්න.. මට කෝල් කරලා නම් කියන්න පුළුවන්.. ඒත් සමහර වෙලාවල්වලට සිග්නල් නැතුව රණවීර මහත්තයාගේ ෆෝන් එක වැඩ නෑ මාමා.."

"නෑ.. නෑ.. නෑ.. අපේ ආරච්චි නෝනා මහත්තයා මහන්සි වෙන්ට එපා.. මං ඉස්කෝලෙ මහත්තයට පණිඉඩේ යවන්නං.."



Uploaded By Sanda

මානවී, අත බැඳි රන් පැහැති ඔරලෝසුව දෙස බැලුවා ය. අතරමග නැවතීම ඇගේ කාර්යාල වේලාව අරඹන වේලාවෙන් විනාඩි පහක පමණ කාලයක් සොරාගෙන තිබිණි.

"කට්ටිය ඇවිල්ලා බලාගෙන ඇති මාමා.. මම එහෙනම් යන්නම්.."

"හොඳයි අපේ ආරච්චි නෝනා මහත්තයා.."

මානවී, ස්කූටරයේ හැඬලය මත රඳවා තිබූ ඇගේ හිස ආවරණය දෑතට ගත්තා ය. ඈ ස්කූටරය නවතා ගෙන උන් මහ ඇළ බෝක්කුව යටින්, ඇළ පහර නිල් දියවරක් ව ගලා යමින් තිබිණි. කැඩපතක් සේ පැහැදිලි දිය දහරේ තිත්ත පැටවුන් රිසි සේ දඟපාමින් උන්නෝ ය. තැනින් තැන සුදු වලා පෙළ ඉහිරී තිබුණු නීල වර්ණ ආකාශයේ උදා හිරු බබලමින් තිබිණි. මහ ඇළට පහළින් පිහිටි මඩ කුඹුරු යායත්, ඉහළින් පිහිටි එළවළු කොරටු සහිත ගොඩ කුඹුරු යායේ මායිම් සනිටුහන් කරමින් නැගී උන් උණ පඳුරු සමූහයා, ඒ මඳ නලෙහි නැලවෙමින්, නටමින් උන්හ.

මානවීගේ ළය පුරා ඉහිරී තිබුණේ නොතේරුණු සැහැල්ලුවකි.

හෙල්මටය යළි හිස පළඳා ගත් මානවී, ස්කූටරය පණ ගන්වා ගත්තා ය. මහල්ලා යළි ඇළ නියරට බැස ගත්තේ තරුණිය මාවතේ නොපෙනී යන තෙක් ම බලා හිඳීමෙන් අනතුරුව ය.

මානවී, යළිත් තමාගේ ස්කූටරය මාර්ගයෙන් ඉවතට කොට නවතා ගත්තේ, ඉදිරියෙන් ඇදී එන සුඛෝපභෝගී මෝටර් රථයකට මාර්ගයේ ඉඩ සලසා දෙනු සඳහා ය. සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදී ආ මොන්ටෙරෝ රිය ඈ අසල දී තවත් ගමන් වේගය බාල කර ගත්තේ ය.

සුඛෝපභෝගී රියෙහි අඳුරු කළ ඉදිරි වම්පස කවුළුව ඇරී, මැදිවිය ඉක්මවා ගොස් මහලු වියට සමීපව හිඳින මුහුණක් එබී





බැලුවේ ය. ආගන්තුක මුහුණේ වූ ප්‍රසන්න සිනාව මානවීගේ මුහුණට ද ආයාසයකින් තොරව ම සිනා රැගෙන ආවේ ය.

"මිස්.. මේ.. ගඟුලැලිතැන්නට ගොඩක් දුර ද තව..?"

සැණෙන් මානවීගේ හදවතට පුදුමයක් පිවිසියේ ය. ආගන්තුකයින් විමසුවේ ඇගේ ග්‍රාමයේ නාමයයි. එහෙත්, ඈ ඒ පුදුමයෙන් බිඳක් හෝ අමුත්තන් ඉදිරියේ පතළ නොකොට, ඇසූ පැනයට පමණක් පිළිතුරු සපයන්නට වග බලා ගත්තා ය.

"මේ යන පාරෙ ම කෙළින්ම ඉස්සරහට යන්න සර්.. හරියට ම කිලෝ මීටර් හතරයි.. ලොකු බෝ ගහක් එක්ක බුදු පිළිමයක් තියෙනවා.. ඒ කඩමණ්ඩිය තමයි ගඟුලැලිතැන්නෙ කඩමණ්ඩිය.."

"බොහොම ස්තුතියි මිස්.. අපි යන්නම්.."

මානවී යන්තමින් සිනාසී, යන්තමින් හිස සැලුවාය. සුඛෝපභෝගී රියෙහි අඳුරු කළ වීදුරුව යළි ඉහළට එසවිණි. සමරසිංහ මහතාට පිටුපස අසුන දෙසට හැරෙන්නට සිදුවූයේ තම පුතුගේ සිනා හඬක් රිය තුළ පැතිරී ගිය බැවිනි.

"මොකද පුතා හිනාවෙන්නෙ..? ඒ ළමයා අපිට යන පාර පැහැදිලිව කිව්වා මිසක් වෙන විහිළුවක් කළේ නෑනේ.."

ගඟුල්ගේ සිනාව එතෙකින් නොවියැකිණි. ඔහු බොහෝ කලකට පසුව සැහැල්ලුවේ හිනැහෙමින් සිටියේ ය.

"අනේ නෑ තාත්තේ.. මම ඒ ළමයට හිනා උනා නෙමෙයි.. වංකගිරියට යනවා වගේ එනවා එනවා ඉවරයක් නැතුව කිලෝ මීටර් ගාණක් ආවා ආවා.. ඒත් එක මිනිස් පුළුටක් දැක්කද අපි..? එළවළු දාගෙන යන ලොරියකුයි, ත්‍රීවීල් එකකුයි ඉස්සරහට හම්බ උනා විතරයි.. ඒත්.. මෙන්න එකපාරට ම ස්කූටර් එකක නැගලා ඉගිළෙන කෙල්ලෙක් මූණට හම්බ වෙනවා..!"

සමරසිංහ මහතා සැහැල්ලුවේ හිනැහෙන තම පුතු දෙස



Uploaded By Sanda

බැලුවේ විමතියෙනි. රියදුරු රත්නජීව පවා ගඟුල් දෙස නෙත් කොනින් බැලුවේ විමතියෙනි.

"ඉතින් පුතා මොකටද ඒකට හිනාවෙන්නෙ..?"

"ඇයි තාත්තෙ.. අපේ උන් ටිකක් නොදියුණු වැඩක් කළාම අපිට ඉබේ ම කියවෙනවනෙ උන් වැද්දො වගේ කියලා.. ඒ උනාට තාත්තේ මෙක වැද්දො සයිබර් ස්පේස් යන ස්මාර්ට් ෆෝන් පාවිච්චි කරන කාලෙ.. මේ ගමට එනකොට අපි හිතාගෙන ආවට මහ වනාන්තරයක් ඇතුළට යනවා කියලා.. සමහර විට ඊට වඩා මෙහෙ ගොඩක් දියුණු ඇති තාත්තේ.."

සමරසිංහ මහතා තම පුතු හා තර්ක කරන්නට ගියේ නැත. එහෙත්, තම පුතුගේ සිනා හඬ එයිනිදු නොනැවතුණු බැවින්, සමරසිංහ මහතා යළිත් තම විමසිලිමත් දෑස පුතු වෙත යොමු කළේ ය.

"ඒ පාර මොකද පුතා.. අවුරුදු ගාණකට පස්සෙ මං මේ පුතා මේ විදියට හිනාවෙනවා දැක්කමයි.."

"තාත්තා අහලා තියෙනවද කතාවක්..???"

ගඟුල්, තම සිනාබර දෑස පියා වෙත පා සැහැල්ලුවෙන් විමසුවේ ය. ඕනෑම මොහොතක මහ මෙර හිස තබාගෙන හිඳින තම පුතුට මේ හදිසියේ බෝ වූ කෙළිලොල් බව කුමක්දැයි සමරසිංහ මහතාට පවා දැනුණේ අද්භූත ලෙස ය.

"සමහර මිනිස්සු සිරිපාදෙ යනකොට.. පාර හොයාගන්න බැරුව අතරමං වෙනවලු.. එතකොට ම හදිසියේ කවුරු හරි පෙනිලා පාර කියලා යනවලු.. ටිකකින් බලනකොට ඒ පාර පෙන්නපු මනුස්සයා අතුරුදහන්ලු.. මේ කෙල්ලත් එහෙම අද්භූතයෙක් ද දන්නෑ.. එයාව පාස් වෙනකොට ම මම ආපහු හැරිලා බැලුවා.. බයික් එකක් පේන පළාතක නෑ.. කොහෙට අන්තරස්දාන උනාද මන්දා.."





රියදුරු රත්නජීව පවා නැගෙන්නට ආ ලොකු සිනාව දෙතොල් අතරේ සිර කර ගත්තේ වෑයමිනි. සමරසිංහ මහතා අඳුරු රිය කවුළුව විනිවිද බලමින් ඉවතට හැරී හිනැහුණේ ය.

දුක් ම විඳි පුතු, දෛවෝපගත එක ම ගමනකින් සිනාසෙන්නට පුරුදු වී තිබිණි.

"නිකම් විහිළු නොකර ඉන්න පුතා.. ඒ දරුවා ඔය ළඟම තිබුණ අතුරු පාරකින් හැරිලා යන්න ඇති.."

"තාත්තට ෂුවර් ද ඒ හොල්මනක් නෙමේ කියලා..?"

ගඟුල් ඇසූ තාලයට උස් හඬින් සිනා නැගෙනු වළක්වා ගන්නට සමරසිංහ මහතා එවර නම් නොසමත් වූයේ ය.

"මොන හොල්මනක්ද ළමයො.. ඒ ළමයා මට හරි අහිංසක විදියට හිනා වෙලානෙ යන්න ගියේ.."

"ඇත්තට ම තාත්තා හොල්මන් හිනාවෙන්නෙ නැද්ද?"

"හොල්මන්වලට පුළුවන් හිනාවෙන්න නෙමෙයි.. උන්ට පුළුවන් විරිත්තන්න.."

සමරසිංහ මහතා බොහෝ දුර නොසිතා කියූවත්, ගඟුල්ට දැනුණේ එහි බොහෝ යට සැඟවී ගත් අරුතක් ඇති වග ය.

"තාත්තා කිව්වෙ ඇත්ත.. අද නෙමෙයි මෙච්චර කල් අපිට හම්බ උනේ හොල්මන් තමයි.. අපි හොඳින් ඉන්නකොට.. අපිට උදව් එපා වෙලාවෙ ළඟ ඉඳලා අපි අසරණ උනාම.. අපිට ඕන ම වෙලාවෙ.. විරිත්තලා යන්න ගියේ හොල්මන් තමයි.. සමහර වෙලාවට, අපි නොහිතන තරම් හොඳ මිනිස්සු.. මේ වංකගිරි ඇතුළෙ ජීවත්වෙන්න පුළුවන්.."

ගඟුල්ගේ හඬ නොමනා තරම් හැඟුම්බර වනු දැනී සමරසිංහ මහතා මදක් කලබල විය. සද්ධන්ත කුලයේ මහා හස්ති රාජයෙකු සේ විරාජමානව උන් තම පුතුගේ දෛවය, ඔහු මේ ජීවිත ගමන

Uploaded By Sanda

තුළ මුව පොව්වකුටත් වඩා අසරණ කර දැමුවේය. ජීවිත ගමනේ ගිරි හිස තරණය කළ තම වැඩිමහල් පුතු එකවිට ම ඇද වැටුණේ ලෝකාන්තය මෙන් ඉමක් කොනක් නොදන්නා ප්‍රපාතයකට ය. ඒ දළ බෑවුම තුළින් යළි තම පුතු මෙගොඩට ගත හැකි මගක් සමරසිංහ මහතාගේ දුබල දෑසට හසුවූයේ ම නැත.

සමරසිංහ මහතාට උවමනා වූයේ තම පුතුගේ ඉරිතලා ගිය ගත සේ ම ආත්ම ය ද සුවපත් කරන්නට ය. මේ වංකගිරි තරණය ඒ අපේක්ෂාව උදෙසා ම ය.

යුවතිය කියූ මං සලකුණු ඔස්සේ රොහාන් සමරසිංහ මහතා, ගඟුල් සමරසිංහ හා රියදුරු රත්නජීව ඇතුළු පිරිස රැගත් රිය, යුවතිය කියූ මං සලකුණු ඔස්සේ ගඟුලැලිතැන්න වෙත සේන්දු විය. රත්නජීව, කඩමණ්ඩිය අද්දර, කිසිවකුටත් අවහිරයක් නොවන ලෙස රිය නවතා, සමරසිංහ මහතා දෙස බැලුවේ ය.

"සර්.. මෙතන තමයි අර නෝනා කිව්ව කඩමණ්ඩිය.. අර තියෙන්නෙ බුදු පිළිමෙයි, බෝ ගහයි.."

තම වෙළඳසැල ඉදිරියේ නැවතුණු සුඛෝපභෝගී රිය දෙස කඩයේ දැළ තුළින් දෑසක් එබී බැලුවේ ය. සමරසිංහ මහතා රියෙන් බැස වෙළෙන්දා වෙත සමීප වූයේ සිනාමුසු දෑසිනි. වෙළෙන්දා, අඩියට දෙක වෙළෙඳ සැල තුළින් පිටතට පැමිණියේ, මෙ ාගාකය අමුත්තා වෙත රඳවාගත් ගෞරවණීය බැල්මක් සමගිනි.

"මුදලාලි මහත්තයෝ.. මෙ අර.. වනිගසේකර මහත්තයාගේ ගේ කොයි හරියෙද..?"

සමරසිංහ මහතා, ගැමියා දෙස බලා සිටියේ වඩාත් සුහදශීලී ලෙසිනි.

"වනිගසේකර මහත්තයා කිව්වෙ සර්..???"

"අර.. සෙකියුරිටි ෆර්ම් එකක වැඩ කළේ..? අන්තිමට වැඩ කළේ.. මහරගම බැංකුවක.. දැන් අවුරුදු තුනකට විතර කලින්





නෝනා නැති උනා.. ඊට පස්සෙ තමයි රස්සාවෙන් අස්වෙලා ගමට ආවෙ.."

වෙළෙන්දාගේ මුහුණ සැහැල්ලු සිනාවකින් විකසිත විය. ඒ සිනාවත් සමඟ ම සමරසිංහ මහතාගේ බලාපොරොත්තු ද දැල්විණි.

"ආ.. මෙ මහත්තයා කියන්නෙ.. අපේ පොඩි මහත්තයා අයියා ගැන.. මේ අපේ අයියා දන්න අඳුනන මහත්තයෙක් වෙන්ට ඇති.."

"ඔව්.. මට මිස්ට වනිගසේකරව හොඳට ම අඳුනනවා.. මිස්ට වනිගසේකර වැඩ කළේ මං වැඩ කරපු බැංකුවේ.. මම තමයි මිස්ට වනිගසේකර අයින් වෙනකොට බැන්ක් එකේ හිටපු මැනේජර්.."

ගැමියා, ආගන්තුකයා දෙස බැලුවේ වඩාත් ගෞරව සම්ප්‍රයුක්ත හැඟීමෙනි.

"මහත්තයෝ.. ඔය පාර දිගේ කෙළින්ම ඉස්සරහට යන්ට.. මීටර් සීයක් විතර යනකොට තරමක දොළක් හම්බවෙයි.. ඒ දොළ ගාවින් දකුණට තියෙන පාරට හැරිලා ඉස්සරහට යනකොට හම්බවෙන වමට තියෙන දෙවෙනි ගේ තමයි පොඩි මහත්තයා අයියලාගේ ගේ.."

"බොහොම ස්තුතියි මුදලාලි මහත්තයෝ.. අපි එහෙනම් ගිහිල්ලා එන්නම්.."

"හොඳමයි මහත්තයෝ.."

ඉනික්බිති, ඔවුන් පිවිසියේ වඩාත් රමණීය භූමි භාගයකට ය. අඳුරු කළ විදුරු සහිත රියෙහි පිටුපස අසුනේ උන් ගඟුල්ට පරිසරය පිළිබඳ දැඩි හැඟීමක් නොවුණේ, ඔහුගේ පාදයේ වේදනාව දරුණු ලෙස ඔහු පෙළමින් තිබූ බැවිනි. එහෙත්, පරිසරය වෙත ම දෑස් තබාගෙන පැමිණි සමරසිංහ මහතා නම් සොබා සෞන්දර්යයෙන් කුල්මත් වී සිටියේ ය.



Uploaded By Sanda

"ඊළඟ වතාවෙ එනකොට.. නිකම් කාර් එකක එන්න ඕන පුතා.."

"ඇයි තාත්තෙ..?"

"මේ පහුවෙලා යන ගහ කොළ ඇළ දොළ වෙල් ඉපනැලි දකිනකොට.. මට.. ජීවිතේ ගැන අපූරු හැඟීම් පහළ වෙනවා පුතා.."

පියාගේ එවදන්, ගඟුල්ට දැනුණේ සුවදායී නැවුම් සුසුමක් සේ ය. එහෙත්, හැඟීම්බර වන්නට ඔහු බිය ගත්තේ ය. ඔහුට ජීවිතය ගැන දැනුණේ එතරම් ම බියකි. දුකකි. කලකිරීමකි. අවිනිශ්චිතභාවයකි.

"අපිට ආයෙත් එන්න පුළුවන් වෙයිද තාත්තේ..?"

සමරසිංහ මහතා මදක් හැරී තම පුතුගේ මුහුණ බැලුවේ ය.

"ඇයි පුතේ අපි ආයෙ එන්නෙ නැත්තෙ..? අපි ආපහු එනවා.."

"අවුරුදු පහළොවක් තිස්සෙ මම මොන විඳවිල්ලක් විඳෙව්වද තාත්තෙ.. තවත් නම් විඳවන්න දෙයක් මට ඉතුරු වෙලා නෑ.."

ගඟුල්ගේ සුසුමින් ඔහුගේ පියා වූ සමරසිංහ මහතාගේ සිත පමණක් නොව රියදුරු රත්නජීවගේ සිත පවා වේදනාවෙන් හැකිලිණි.

"මේ ඇළ ළඟින් වමට තියෙන අර පාර නේද සර්.."

රත්නජීව අවස්ථාවේ බැරෑරුම් බව සැහැල්ලු කළේ ය. ඉදිරි මග පැහැදිලි විය. සුන්දර දොළ ඉහත්තාවේ පිහිටි මදක් ඔබ්බෙන් දිස්වන නිවෙසක් ඉදිරියේ මෝටර් රථය නැවතිණි. ඔවුන්.. සියල්ලන්ගේ ම ජීවිත තවත් වැදගත් සැතපුම් කණුවක් ඉදිරියේ එලෙස නවාතැන් ගත්තේ ය.

❊ ❊ ❊ ❊ ❊ ❊





වැඩි ආටෝප සාටෝපයෙන් යුතුව නොවුණත්, පළු දෙකේ ගේට්ටුවක් නිවසේ ඉදිරිපස සීමාවේ ඉදිවී තිබිණි. ග්‍රාමීය තාලයට පෙර ඉදිව තිබූ නිවසක් නවීකරණයට ලක් කළ බවට සාධක, නිවස දෙස බලන විට ඕනෑ තරම් සොයා ගත හැකි විය. රියෙන් බැස ගත් සමරසිංහ මහතා, අර්ධයක් විවෘතව තිබූ ගේට්ටු පළුවට අත තබා මෝටර් රථයේ හිඳ උන් තම පුතු දෙස බැලුවේ ය.

"මම ඇතුළට ගිහිල්ලා බලලා එන්නම්.. පුතා ඔහොම ඉන්න.."

සමරසිංහ මහතා, පළමු පා පියවර තැබුවේ ම බලාපොරොත්තු සහසක් දල්වා ගෙන ය.

ගඟුල්, එතෙක් වේලා වසාගෙන උන් රිය කවුළු හැර දැමුවේ ය. සොබා දහමේ මන බඳන දසුන් එකිනෙක තරගයට මෙන් ඇදී විත් ගඟුල්ගේ දෑසේ පමණක් නොව හදවතේද ඇළෙන්නට විය.

පවු ගුරු පාරට පහළින් ගලා යන සිහින් දොළ පහරේ සිලි සිලිය ගඟුල්ට දැනුණේ මියුරු ගීතයක් ලෙසිනි. ඈතින් ඈතට දිව යන නිල්ල නෙලූ වෙල් යාය මතින් ඇදී ආ මඳ නල ගඟුල්ගේ ගත වෙළාගන්නට වූයේ ගත හිරි ගඩු නංවමිනි. ගඟුල් තම දෑත් ළය මතින් පොරවා ගනු දුටු රත්නජීවගේ මුවගට මඳ සිනා නැගිණි.

"ඇයි සර්.. සීතලද..?"

"හ්ම.. සීතලයි.. සනීපයි.."

"අපි කොළඹ ඉඳන් ඒසී දාගෙන කිලෝ මීටර් කීයක් නම් ආවද සර්.. ඒත්.. මෙහෙම සනීපයක් දැනුණද..?"

"ඒක නම් ඇත්ත.. මට බිමට බහින්න හිතෙනවා.."

"එපා සර්.. කකුල පැරෙයි.. ඊටත් මෙහෙ පොළොව කොහොමද කියලා අපි දන්නෙ නෑනෙ සර්.. හදිසියෙ කුඩැල්ලොවත් හිටියොත්.."

ගඟුල්ගේ දෙතොලතර ඇඳුණේ හැඬුමකට ආසන්න සිනාවකි.



Uploaded By Sanda

"මට මෙහෙම දෙයක් සිද්ධ උනේ.. මොන විදියෙ පවකටද දන්නෙ නෑ අන්කල්.. දැන් නම් මට ඇත්තට ම හිතෙනවා මොකටද මේ ජීවිතේ කියලා..?"

රත්නජීව, තරුණියා දෙස බැලුවේ විසල් අනුකම්පාවකිනි. සියල්ල දෛවයේ තීන්දු ය. ඒවාට එරෙහිව කළ හැකි දෑ ඇත්දැයි සැක සහිත ය.

සමරසිංහ මහතා, වනිගසේකර නිවස ඉදිරිපිට සිටගෙන මොහොතකට වටපිට බැලුවේ ය. නිවසේ ඉදිරි දොර වසා තිබූ අතර, හාත්පස වූයේ දැඩි නිස්කලංක බවකි. නිවස ආශ්‍රිතව ගත නිහැඬියාවක් පැවතියත්, නිවසේ කවුළු පියන්පත් හැර දමා තිබීම, නිවැසියන් හිඳින බවට සලකුණක් විය.

සමරසිංහ මහතා, විදුලි සීනුවට සුරත තැබුවේ ය. කුරුලු කූජනයක හඬින් නැගුණු විදුලි සීනු නාදයෙන් මතු ගෙවී ගිය විනාඩි දෙක තුනක කාලයකට පසුව වනිගසේකර නිවසේ ඉදිරි දොරටුව සෙමින් විවෘත විය. දරු ගැබක් දරා උන් කාන්තා රුවක් දොර තීරයෙන් මෑත් වූවා ය. සමරසිංහ මහතා සිනාසෙන්නට ඉක්මන් වූයේ ය.

"පුතා.. මේ.. වනිගසේකර මහත්තයාගෙ ගෙදර නේද..?"

නිවසේ දොරටුව මුළුමනින් ම විවර විය. චේතනාගේ කුහුලින් පිරි දෑස් අමුත්තා දෙසට පමණක් නොව නිවස අද්දර නවතා තිබූ සුඛෝපභෝගී රිය දක්වා ම ඇදී ගියේ ය.

"ඔව්.. ඒ අපේ තාත්තා.. අන්කල්.. කවුද..?"

චේතනා, සාමාන්‍ය ළෙන්ගතුකමකින් විමසුවා ය.

"මගේ නම සමරසිංහ.. අපි හෝමාගම ඉඳලා ආවෙ.. පුතා.. වනිගසේකර මහත්තයා අන්තිමට වැඩ කළේ මං වැඩ කරපු බැන්ක් එකේ.. මේ වනිගසේකර මහත්තයාගේ දුව වෙන්න ඕන.. කෝ පුතා තාත්තා ගෙදර නැද්ද..?"





සමරසිංහ මහතාගේ වදනක් ගානේ ම වූයේ දැඩි මිත්‍රශීලීභාවයකි. අමුත්තා කෙරෙහි චේතනාගේ සිත පැහැදී තිබිණි.

"මම.. ලොකු දුව අන්කල්.. තාත්තා කුඹුර පැත්තට ගියා. ඉන්නකො අන්කල්.. මම කවුරු හරි අතේ පණිවිඩයක් යවලා තාත්තට එන්න කියන්නම්.. ඇවිල්ලා වාඩිවෙන්න අන්කල්.."

සමරසිංහ මහතා තරුණිය දෙස බැලුවේ සමාව අයදින දෑසිනි.

"මේ දරුවට අපි ඇවිල්ලා කරදරයක් උනාද මන්දා.. ඒකට නම් සමාවෙන්න ඕන පුතා.."

"අනේ නෑ අන්කල්.. මට කරදරයක් නෑ.. තාත්තා කුඹුරට වතුර බැඳලා එන්නයි ගියේ.. සමහර විට දැන් එනවත් ඇති.. කෝකටත් මම පණිවිඩයක් යවන්නම්කො.. ඇතුළට ඇවිල්ලා වාඩිවෙන්න අන්කල්.."

සමරසිංහ මහතා තරුණියගේ ආයාචනය කාරුණිව ප්‍රතික්ෂේප කළේය.

"නෑ පුතා.. මම ජීප් එක ළඟ ඉන්නම්.. මගේ පුතයි, මගේ ඩ්‍රයිවයි වාහනේ ඉන්නවා.."

ගෙවත්ත ආවරණය කළ ක්‍රෝටන්, කෝපි, වද ආදී ශාක සමූහයාගෙන් ගැවසීගත් මායිම් වැට හේතුවෙන්, චේතනාට රියෙහි උන් කිසිවකු හෝ පැහැදිලිව දිස්වූයේ නැත. චේතනා, ඉදිරි දොරින් මිදුලට බැස, ගෙවත්තේ වම් පස ඉසව්වට සෙමින් අඩි තබා ඇවිද ගියා ය.

"ටිකිරි නැන්දා.. ටිකිරි නැන්දා..."

යාබද නිවසේ ගෙහිමි කාන්තාව පිටතට පැමිණියා ය. ඇගේ දෑස චේතනාගෙන් මිදී අමුත්තන් වෙත දිව ගියේ ය.

"නැන්දා.. චමීර මල්ලි ඉන්නවද..? මේ අපේ තාත්තා අඳුරන



Uploaded By Sanda

මහත්තයෙක් කොළඹ ඉඳන් ඇවිත්.. තාත්තා ගල උඩ කුඹුරට ගියේ නැන්දා.. මල්ලි අතේ පණිවිඩයක් යවනවද නැන්දා තාත්තට ගෙදර එන්ට කියලා..???"

ලිඳිද ආරංචියෙන් වනිගසේකර මහතා පළමුව විමතියටත්, දෙවනුව අතිශය උද්දාමයටත් පත් වූයේ ය.

"මොනවා පුතේ.. සමරසිංහ මහත්තයා ඇවිත්..???"

"ඔව් මාමා.. මං වාහනේ පනු කරගෙන ආවේ.. මොන්ටෙරෝ එකක් ඇවිත් තියෙන්නෙ.. වාහනේ එලවගෙන ආව ටිකක් වයසක මනුස්සයෙකුයි, තව අයියා කෙනෙකුයි වාහනේ ඇතුළෙ හිටියා.."

වෙල් නියරක් දිගේ විත්, ඇළ නියරට ගොඩ වූ වනිගසේකර මහතා, යළි ඇළට බැස හොඳින් අත පය සෝදා ගත්තේ ය. වනිගසේකර මහතාගේ ජීවයෙන් පිරුණු මුහුණ දෙස චමීර බලා සිටියේ පුදුමයෙන් විකසිත වූ දෑසිනි.

"කවුද මාමා ඒ ඇවිත් ඉන්නෙ..?"

"මං අන්තිමට වැඩ කරපු බැංකුවෙ හිටපු මැනේජර් මහත්තයා පුතා.. නැන්දා ලෙඩ වෙලා හිටිය කාලෙනෙ පුතා.. ඔය මහත්තයා ඒ දවස්වල මට පිහිට උනේ දෙවි කෙනෙක් වගේ.."

වනිගසේකර මහතාගේ එම වචන කිහිපය ම, අමුත්තන් කවුදැයි හඳුනා ගැනීමට චමීරට ප්‍රමාණවත් විය. මහ ඇළ නියරට ගොඩ වූ වනිගසේකර මහතා චමීරට ද ඉස්සර වී, පය ඉක්මන් කළේ ය.





"මානවී අක්කා වැඩට ගියා ද මාමා..?"

"අද බ්‍රහස්පතින්දානෙ පුතේ.. වරුවක් වැඩ.."

"ඒත් මේ ටිකේ ම අක්කා වැඩට ගියානෙ මාමා.."

"වැඩ බැලීම් දෙකක් ම දීලා පුතා.. කොට්ඨාශෙ ආරච්චි මහත්තුරු තුන් දෙනෙක් ම පෙන්ෂන් ගිහින්ලු.."

"ඒක තමයි.. මම දැක්කා අක්කා ගෙදර හිටියෙ ඉරිදා විතරයි.."

"ඒ දරුවටත් නිදහසක් නෑ පුතේ.. රාජකාරී වැඩක් ඉහටත් උඩින්.. ගෙදර ආවත් වැඩ වැඩ.. ලොකු ළමයා ගෙදර හිටියා කියලා අතක් පයක් හොලවලා වැඩක් කරන්නෙ නෑනෙ පුතේ.."

චේතනාගේ හැසිරීම් රටාවන් සිහිවීමෙන් චමීරගේ මුව කොන සිනාවක් ඇතිරිණි.

"ලොකු අක්කගෙ වැඩේ ම දවල් තිස්සෙ ම නිදියන එකමනෙ මාමා.. අපෙ අම්මා හැම වෙලාවෙ ම ලොකු අක්කට කියනවා ඔහොම නිදියන්ට එපා බබාට හොඳ නෑ කියලා.. කොහෙද.. අම්මා බලන්ට යන යන වෙලාවට ලොකු අක්කා නිදි.."

චමීර හිනැහෙමින් කියුවත්, වනිගසේකර මහතාගේ සිත පෑරී තිබිණි.

"ඒ ළමයා ජීවිතේ ම කළේ හිතුවක්කාරකම් පුතේ.. තවත් ඉවරයක් නෑ.. හිතුවක්කාරකම් සේරම කරලත් ඒගොල්ලො අදටත් බොහොම සුවෙන් පහසුවෙන් ජීවත්වෙනවා.. අර පොඩි කෙල්ලට තමයි සේරම බර කර තියාගන්න උනේ.."

චමීර, වනිගසේකර මහතාගේ වේදනාව කොනිති ගසන්නට ගියේ නැත. දෙදෙනා ම පය ඉක්මන් කොට නිවස දෙසට ඇවිද යන්නට වූහ.



Uploaded By Sanda

නිවසට ආසන්න වෙත් ම වනිගසේකර මහතා පළමුව දුටුවේ ගෙයි ඉදිරිපිට ගුරු පාරේ නවතා ඇති සුඛෝපභෝගී රථයයි. තම හිතවතාගේ රුව එකවර දක්නට නොලැබුණ ද, වනිගසේකර මහතාගේ සිත තුළ උපන්නේ කවරාකාරදැයි හඳුනාගත නොහැකි වූ සුවිශේෂී සතුටකි.

"මාමා.. මං ගෙදර යන්වද..?"

චමීර විමසුවේ ඔහුගේ නිවසේ ඉදිකඩ හමුවේ නවතිමිනි. වනිගසේකර මහතා යළි තරුණයා වෙත හැරී බැලුවේ වැදගත් යමක් සිහිවීමෙනි.

"පුතේ.. පුතාට පුළුවන්ද ඔහොමම ගිහින් සිරිසේන මාමාගෙ කඩෙන් මොනවා හරි අරන් එන්න.. තියෙන සුදුසු දෙයක් ඉල්ලගෙන එන්න පුතේ.. මම පස්සෙ සල්ලි ගිහින් දෙන්නම්.."

"හා මාමා.. මං ගිහින් ගෙනත් දෙන්නම්.."

වනිගසේකර මහතා පැළ දිග වැඩ කඩුල්ල පැන ගෙවත්තට ඇතුළු වී, වට මිදුල දිගේ හනික නිවසේ ඉදිරිපසට ඇවිද ආවේ, අත තිබූ උදැල්ල, වප්පිහිය හා දෑකැත්ත ආදී වූ කෘෂි ආම්පන්න කට්ටලය නිවසේ පසෙකින් පිහිටා තිබුණු ගෙඩි පිරුණු ජම්බෝල ගසට හේත්තු කරමිනි. පෝච්චි විසි පහක තිහක පමණ සරුවට වැඩුණු ඔහුගේ බාල දියණියගේ ඇන්තූරියම් වගාව එක ම මල් ගොමුවක් බවට පත්වී තිබිණි. වනිගසේකර මහතා අමුත්තන් ඉදිරියට ඇවිද ගියේ අදහාගත නොහැකි ප්‍රීතියකිනි.

"සර්..!!!"

වනිගසේකර මහතාට සිතට දැනුණු සොම්නස වැඩිකමට තවත් වචන ගොනු වූයේ නැත. සමරසිංහ මහතාට ද දැනුණේ පුදුමාකාර සොම්නසකි.

"පියල්..!!!"





"අවුරුදු තියකට පස්සෙද.. සර්ව මෙහෙම මුණ ගැහෙයි කියලා නම් මං හීනෙකින්වත් හිතුවෙ නෑ.."

"මමත් එහෙම තමයි පියල්.. මටත් හිතාගන්න බෑ මෙහෙම අවස්ථාවක් කොහොම ආවද කියලා.."

"විස්තර කතා කරගන්න බැරියැ.. යමුකො යමුකො සර් ගෙට.."

වනිගසේකර මහතාගේ හඬෙහි වූයේ දිදුලන සොම්නසකි. ඉදිරි දොර උළුවස්සට හේත්තු වී චේතනා හිනැහෙමින් බලා සිටියා ය.

"මම අන්කල්ලට ගෙට ඇවිත් වාඩිවෙන්න කිව්වා තාත්තෙ.. අන්කල් එළියෙම හිටියා.."

චේතනා, නිදහසට කරුණු කීවා ය. සමරසිංහ මහතා කාරුණිකව හසරැල්ලක් පෑවේ ය.

"පුතා ඉන්නවා පියල් වාහනේ.. අපේ ඩ්‍රයිවර් රත්නජීවත් ඉන්නවා.."

"හැබැට ම.. මට සර්ව දැක්කම ඒ ඩිංගට ඒකත් අමතක උනා.. රියදුරු මහත්තයාගෙ නම නම් මට මතකයි යාන්තමට වගේ.. ඒත් සර්ගෙ පුතාව නම් මම කවදාවත් දැකලා නැනෙ සර්.."

හිනැහෙමින් කී වනිගසේකර මහතා ඉක්මන් පය සුපිරි රිය දෙසට එසෙව්වේ ය. සමරසිංහ මහතා ද ඒ පිටුපසින් ම පියවර තැබුවේ ය.

"පුතාට සනීප නෑ පියල්.. කකුලෙ තුවාලක්.. පේරාදෙණිය කැම්පස් එකේ ඉන්නවා මහානාම කියලා මගෙ යාළුවෙක්, ප්‍රොෆෙසර් කෙනෙක්.. මහානාම තමයි මට මෙහෙ ඉන්න සරණංකර හාමුදුරුවො ගැන පණිවිඩේ කිව්වෙ.. සනීප කරන්න බැරි ඕන තුවාලයක් සනීප කරන්න හාමුදුරුවන්ට පුළුවන් කියලා..



Uploaded By Sanda

මට එක පාරට ම පියල්ව මතක් උනා.. සෙකියුරිටි ෆර්ම් එකට ගිහින් හරි අමාරුවෙන් තමයි මම පියල්ගෙ එඩ්‍රස් එකත් හොයා ගත්තෙ.."

ඉදිරිපස ඉදි කඩුල්ල දෙසට ඇවිද යන වනිගසේකර මහතාගේ දෙපා ඉබේ ම නතර විය. සරණංකර හාමුදුරුවන් සොයා දුරු කතර ගෙවාගෙන පැමිණියේ නම්, එය එසේ මෙසේ තුවාලයක් විය නොහැකි බව ඔහුගේ හිත කීවේ ය.

"පුතාගෙ කකුලෙ තුවාලයක්..???"

"ඔව් පියල්.. අවුරුදු පහළොවක් තිස්සෙ සැරින් සැරේ මතුවෙන හොඳ නොවෙන තුවාලයක්.. දැන් අවුරුදු එක හමාරක් තිස්සෙ පොඩ්ඩක්වත් සනීපයක් නැතුව සැරව ගලන තුවාලයක්.. අන්තිමට ඩොක්ටර්ස්ලා කිව්වා කකුල කපන්න වෙයි කියලා.."

වනිගසේකර මහතා ප්‍රකම්පනය වූයේ නොසිතූ අන්දමිනි. රෝගියාගේ තත්වය අවබෝධ කර ගැනීමට ඔහුට එම විස්තරය හොඳට ම ප්‍රමාණවත් වූයේ ය.

"ඒකත් එහෙමද..???"

තමාට ම මුමුණා ගත් වනිගසේකර මහතා රිය වෙත ඇවිද ගියේ සසල හදිනි.

රියදුරු රත්නජීව, වනිගසේකර මහතාගේ පෙරමගට ඇවිද ආවේ හිතෛෂීවන්ත සිනාවක් පාමිනි. ඔහුට හිස සලා, අසිරු සිනාවක් තිළිණ කළ වනිගසේකර මහතා රිය අසලට සමීප වූයේ පෙර වූ සසල බවින්ම ය.

රිය තුළට ම වී අසුන් ගෙන සිටියත්, වනිගසේකර මහතා සමීපයට පැමිණෙත් ම, ගඟුල් ඔහු වෙත ළෙන්ගතු හසරැල්ලක් පෑවේ ය.

"අන්කල්.."





"පුතා.."

ඒ.. සසරේ හමු වී හුරු පුරුදු මිනිසුන්.. යළි හමු වූ එක්තරා නිමේෂයකි.

"පුතාට බිමට බහින්න අමාරුද..? කකුල බිමට තියාගන්න පුළුවන්ද..?"

රියෙහි පිටුපස දොරෙහි කවුළුවෙන් රිය තුළට එබී බලා, ගඟුල් දෙස බලන වනිගසේකර මහතාග් හදවත යළි දෙදරා ගියේ, තරුණයාගේ අසුන පසෙකින් තබා තිබූ කිහිලිකරු යුගලය දැකීමෙනි.

තරුණයාගේ දෑසේ ඇඳි තිබුණු අසරණභාවය විසින් වනිගසේකර මහතාගේ ළය රිදුම් දෙමින් තිබිණි.

"තුවාල කකුල බිමට තියන්න බෑ අන්කල්.. මේ කිහිලිකරු දෙකෙන් තමයි ඇවිදගන්නෙ.."

දෑසින් නොහඬා හඬන තරුණයා දෙස වනිගසේකර මහතා බැලුවේ කඳුළු රැඳි දෑසිනි. එවන් සුර දූතයෙකුගෙන් ඔහු මෙබඳු බේදවාචකයක් අසන්නට, දකින්නට ප්‍රාර්ථනා කළේ නැත.

"හෙමිහිට බැහැගන්න පුළුවන්ද පුතේ.. නැත්නම් මම කවුරු හරි දෙන්නෙකුට කතා කරන්නද පුතාව ගෙට ගෙනියන්න.."

වනිගසේකර මහතාගේ කරුණාව ළඟ නොසිතූ විරූ වේගයකින් ගඟුල්ගේ දෑසට කඳුළු පිරිණි.

"එපා අන්කල්.. මට පුළුවන්.. අවුරුදු දෙකක් තිස්සෙ මම ඇවිද්දෙ කිහිලිකරුවලින් ම තමයි.."

අසිරුවෙන් රියෙන් බැස ගත් ගඟුල්, රත්නජීවගේත්, සමරසිංහ මහතාගේත් ආධාරයෙන් අසිරුවෙන් සිරුර සමබර කරගෙන නැගී සිටියේ ය. ආගන්තුක තරුණයාගේ රුවෙහි වූ අපූර්වත්වයත්,



Uploaded By Sanda

කඩවසම් බවත් වනිගසේකර මහතාගේ නෙතට නිශ්චිතව ම හසුවූයේ ඒ මොහොතේ ය.

"පුතාට ගොඩක් අමාරුද පුතේ..?"

තමා මේ දුරු කතර ගෙවාගෙන පැමිණියේ පිළිසරණ පතාගෙන ය. පිහිට පතා ඔවුන් හමුවට පැමිණියේ නම්, තමා තවත් මොනවා නම් ඔවුන්ගෙන් සඟවා ගන්නේදැයි ගඟුල් මොහොතකට සිතුවේ ය.

"කකුල හින්දා.. මගෙ මුළු ජීවිතේම කළුවර උනා අන්කල්.. ඇත්තම කිව්වොත්.. දැන් මට ජීවිතේකුත් නෑ.."

"එහෙම කියන්නෙපා පුතා.. ලෙඩට දුකට පත්වෙන්න සිද්ධ වෙන එක අපි කාටත් පොදු ඛේදවාචකයක් පුතේ.. අපේ දරුවන්ගෙ අම්මා අසනීප වෙලා අවුරුදු තුනක් තිස්සෙ අපි විඳපු දුක් කන්දරාවක්..??? ලෙඩ දුක් උනාම අපි කවුරුත් අසරණයි පුතේ.."

වනිගසේකර මහතා ගේට්ටු පියන්පත් දෙක මුළුමනින් ම හැර දැමුවේ ය.

"පරිස්සමට පුතේ.. බලාගෙන.. පරිස්සමට හිමින් අඩිය තියන්න.."

වනිගසේකර මහතාගේ අප්‍රමාණ වූ ළෙන්ගතුකම හමුවේ, එතෙක් වේලා රිදෙමින් පැවති ගඟුල්ගේ හදවත මඳින් මඳ සුවපත් වෙමින් තිබිණි.

නිවස දෙසට ඇවිද යන අතරවාරයේ, ගඟුල් හිස හරවා මිත්‍රශීලී ආගන්තුක වැඩිහිටියා වෙත පෑවේ අපේක්ෂා පිරුණු බැල්මකි.

"හාමුදුරුවන්ට මේ තුවාලෙට.. මොනවා ම හරි කරන්න පුළුවන් වෙයිද අන්කල්.."

ගඟුල්ගේ දෑස් ඒ වන විටත් රැඳී තිබුණු කඳුළු බිඳු කිහිපය,





වනිගසේකර මහතාගේ පියවත් ළයට යළි එක්කාසු කළේ විසල් බරකි.

"බලමුකො පුතේ.. අපි බලාපොරොත්තු තියාගමු.. හවසට අපි පන්සලට යමුකො.. මම තව ටිකකින් ගිහිල්ලා ලොකු හාමුදුරුවො මුණ ගැහිලා එන්නම්කො.."

අමුත්තන් ඉස්තෝප්පු කොටසේ අසුන් ගැනීමට සැරසෙනු දුටු වනිගසේකර මහතා යළිත් හඬ අවදි කළේ ය.

"ගෙට ම යමු සර්.. ඇතුළෙන් වාඩිවෙමු.."

"නෑ පියල්.. මෙහෙ ම හොඳයි.. මේ හුළං පොදක් ඇඟේ වදින එක ම මොන තරම් සුවයක්ද..?"

රත්නජීව, කිහිලිකරු යුගළය පසෙකට ගෙන, ගඟුල්ට අසුන් ගන්නට ආධාර කළේ ය. අසුන් ගන්නට යාමේදී හැඳ උන් සරම පාදයෙන් මදක් ඉහළට එසවී ගියෙන්, ගෝස් තොගයකින් වෙළා තිබුණු ගඟුල්ගේ වම් පිටිපතුල හොඳින් ම දැක ගන්නට වනිගසේකර මහතාට අවස්ථාව සැලසිණ. ගන ගෝස් ආවරණය ද පසාරු කරගෙන ඉහළට නැග තිබුණු සැරව පැල්ලම් දුටු වනිගසේකර මහතාගේ හද සසල වූවා පමණක් නොව නළල පවා රැළි නැගිණි.

වනිගසේකර මහතා තුළ වූ කැළඹීම, ගඟුල් හොඳින් දුටුවේ ය.

"පේනවා නේද අන්කල්.. මොකටද මේ ජීවිතේ..? කකුල කපලා දාන්න කලින් එක ම එක පාරකට උත්සාහ කරලා බලන්නයි මේ ගමන ආවෙ අන්කල්.."

"ජීවිතේ මොකටද කියලා අපි කාටත් හිතෙන අවස්ථා මොන තරම් නම් තියෙනවද පුතේ.. ඒත් අපිට ඕන හැටියට ජීවිතේ අතෑරලා අපිට ඕන වෙලාවට යන්න බෑ.. හැමදේම කොහොම හරි දරාගෙන අපි ජීවත් වෙන්න ඕන.. ලොකු හාමුදුරුවො මොකක් හරි පැහැදිලි උත්තරයක් දෙයි පුතේ.. මේ



Uploaded By Sanda

පැය දෙක තුනත් ඉවසමුකො අපි.. පුතා නරක දරුවෙක් කියලා මම මොහොතකටවත් හිතන්නෙ නෑ.. පුතාට හොඳක් ම වෙයි පුතේ.."

වනිගසේකර මහතා බණක් දෙසුවාක් වැනි සුවදායී හැඟීමක් ගගුල්ගේ හදවතට දැනිණි. වනිගසේකර මහතා වෙත හෙලූ කෘතවේදී දෑසින් ම ගගුල් තම පියා දෙස බැලුවේ ය.

වනිගසේකර මහතා අවස්ථාවේ බර මනාව වටහා ගෙන සිටියේ ය. ඔහුට උවමනා වූයේ සියල්ලෝ ම පෙළන දෝමනස්ස සහගත සිතිවිලි සමුදායෙන් මුදවා ගැනීමට ය.

"හරි.. හරි.. උදේ ඉඳන් ඇවිත් ගමන් මහන්සියත් උතුරලා යනවා නැතැයි.. අපි තේ ටිකක් බීලා ඉමු සර්.. රත්නජීව මහත්තයෝ.. මහත්තයත් මෙහෙන් ඇවිත් ඉඳගන්නකෝ.."

පිරිසට ආරාධනා කළ වනිගසේකර මහතා, කලබලයෙන් නිවස තුළට ඇවිද ගියේ එතෙක් නිහඬව ම දොර උළුවස්සට වාරු වී උන් චේතනාට ද අමතමිනි.

"ලොකු පුතේ එන්නකො.. අපි ඉක්මනට තේ ටිකක් ලෑස්ති කරමු.."

චේතනා, පියා පසුපස ඇදී ගියේ යන්ත්‍රානුසාරයෙනි. විදුලි කේතලය ක්‍රියාත්මක කළ වනිගසේකර මහතා තේ පිළියෙල කරන්නට වුවමනා කරන සෙසු කළමනා සූදානම් කරන්ට වූයේ කලබලයෙනි.

"ඔන්න ඔය කෝප්ප ටිකක් ගෙනල්ලා සෝදලා ගන්නකො ළමයො.."

ඔහේ අලසව එහෙට මෙහෙට වන තම වැඩිමහල් දියණිය සමග වනිගසේකර මහතාට ඒ මොහොතේ දැනුණේ නොරිස්සුමකි.

"හැමදේම මතක් කර කර කියන්න බෑ දරුවො.. පොඩ්ඩක්



Uploaded By Sanda



අතක් පයක් හොල්ලලා දෙයක් කරන්න පුරුදු වෙන්න.. දරුවො ලැබෙන්න ඉන්න හැම ගෑනිම ඔය වගේ අත පය අකුගෙන හිටියා නම් මේ ලෝකෙ ම ගමන එතනින් ඉවරයි.. මොකක්ද දරුවෝ ඔයාගෙ ඔය ඔතෑනිකම...???"

චේතනාට තම පියා ඉදිරියේ ගොනු කර ගන්නට පිළිතුරක් නොවුණත්, මුනිවතින් පසුවීම නොමනා යැයි හැඟුණු බැවින්, සුදුසු යැයි හැඟෙන පිළිතුරක් ගොනු කර ගත්තා ය.

"අනේ මන්දා තාත්තා.. මගෙ ඇඟට මහ පුදුමාකාර අපහසුතා ගොඩක් දැනෙනවා.. මට මේ ලෝකෙ දෙයක් කරන්න හිතෙන්නෙ නෑ.. කොයි වෙලාවෙත් නිදාගන්නමයි හිතෙන්නෙ.."

අමුත්තන්ට සංග්‍රහ කිරීමෙ දැඩි කලබලය මධ්‍යයේ වුවත්, වනිගසේකර මහතාගේ අවධානය තම වැඩිමහල් දියණිය වෙත යොමු වූයේ ය.

"දැන් ඔය ළමයා ඔය විටමින් ජාති ටික එහෙම හරියට බොනවද..?"

තමාගේ පවුලට, තමාට, කිසිසේත් ම නොගැළපෙන තරුණයකු හා හාද වී, හොර රහසේ ම ඔහු සමග පලා ගොස්, වැඩිමහල් දියණිය වනිගසේකර මහතාගේ හදවතට කළ තුවාලවල වේදනාව ඒ මොහොතේත්, නොඅඩුව ම ඔහුගේ ළයට දැනෙමින් තිබිණි. එහෙත්, කිසිසේත් ම නොපැතූ මොහොතක පැමිණි සම්භාවනීය ආගන්තුකයන්ට ගරු සත්කාර කළ යුතුව තිබියදී, දියණිය ගැන හෝ ඇ විසින් නිර්මාණය කළ වේදනාවේ පරිමාණය පිළිබඳව වද වෙමින් හිඳින්නට කාලයක් වනිගසේකර මහතාට ඉතිරිව නොතිබිණි.

"ඒවා නම් බොනවා තාත්තා.. ඒත්.. මට දැන් දැනෙනවා.. මගෙ හිතට දැනෙන වේදනාව හින්දයි මේ සේරම කියලත්.. වෙච්ච හැමදේම ගැන දැන් මගෙ හිත පසුතැවෙනවා තාත්තා.."

චේතනාගේ දෑසේ කඳුළක් ද මෝදු වී තිබිණි. වනිගසේකර මහතාගේ හදවත යළිත් දැවෙන්නට ගත්තේ ය.

"ඕවා ඉතින් අපි කට කැඩෙනකල් කියපුවා නාහපු එකේ ඵල විපාකනෙ.. දැන් දුක් උනා කියලා ඇති එලේ මොකක්ද ළමයො.. කරගත්ත මෝඩකම් ගැන හිත හිතා ඔය බඩේ ඉන්න දරුවව තලන්නෙ පෙළන්නෙ නැතුව දැන් ඉතින් සිහි බුද්ධියෙන් වැඩ කරන එකයි ඇත්තෙ.. අපිට නම් නෑ ඉතුරුවෙලා තවත් දෙන්න උපදෙස්.."

වනිගසේකර මහතා තම දියණියට පැවසුවේ දැඩි අවවාදයක ස්වරූපයෙනි. වත් කළ තේ කෝප්ප දෙක තුන බන්දේසියක් මත තබා ගත් වනිගසේකර මහතා ඉස්සර වූයේ ය.

"කෝ අර දරුවා ගෙනත් තියලා ගිය කෑම ටික මේ ලොකු පිඟානට තියලා ගන්න.."

ග්‍රාමීය තේ කඩයක, අවේලාවක ඉතිරිව පවතින කෑම බීම මොනවාදැයි අමුතුවෙන් පහදා දිය යුතු නොවිණි. ආප්ප, බනිස්, වඩේ ආදී සුලභ කෑම වර්ගයක් විනා වෙන විශේෂ යමක් චමීර ගෙනැවිත් දුන් පාර්සලයේ තිබුණේ නැත.

"මම මේ තේ ටික අරගෙන එනකල් ඔය කෑම පිඟාන අරගෙන ගිහිල්ලා ස්ටූල් එක උඩින් තියන්න ලොකු පුතේ.."

වනිගසේකර මහතා තම දියණියට විධානය කළා සේ ය.

"දවල්ට තියෙන විදියට ඔය මොනවා හරි උයලා කෑම ටිකක් හදාගන්නත් එපායැ.. රෑට නම් උයාගන්න බයක් නෑ නංගි එන හින්දා.."

අමුත්තන්ට සැලකීමේදී කිසියම් හෝ අඩුපාඩුවක් සිදුවේ යැයි වනිගසේකර මහතාගේ සිත තුළ වූයේ විසල් කලබලයකි. චේතනා, නිහඬව ම කෑම දැමූ පිඟාන රැගෙන පියා පසුපස ඇදුණා ය.





අමුත්තන් ඉදිරියට ගිය වනිගසේකර මහතා, සියල්ලෝම එක ම බැල්මෙන් අල්ලා ගත්තේ, සමාව යදින දෑසිනි.

"තේ ටිකක් බීලා ඉමු සර්.. තියෙන හැටියකට තියන දෙයක් තමයි කන්න නම් වෙන්නෙ. මේ ගම්වල කඩවල තියෙන්නෙ ඉතින් මෙහෙම කෑම තමයි පුතේ.. පුතාට නම්, මේ කෑම කොහොමවත් කන්න පහසු වෙන එකක් නෑ.."

සමරසිංහ මහතාට සේ ම ගගුල්ට ද දිය හැකි පිළිතුරු බොහෝමයක් සිත තුළ ගොනුවී තිබිණි.

"කෑම බීම නම් මොනවද පියල්..? මේ දරුවා මේ විඳින දුකේ තරමට පහුගිය කාලෙ කෑම බීම තියා දවස් ගෙවුණෙ කොහොමද කියලවත් මතක නෑ.."

සමරසිංහ මහතාගේ හඬ අත්‍යයන්තයට ම බිඳී ගොස් තිබිණි.

"අනේ ඔව් අන්කල්.. පහුගිය අවුරුදු ටිකේ කෑවා නෙමෙයි අහුවෙන වෙලාවට අහුවෙන දෙයක් බඩට දාගත්තා.. දැනුණෙ තුවාලෙ වේදනාව විතරක්.. කෑමක රසක් ගුණක් නෙමෙයි.."

වනිගසේකර මහතාගේ මුවින් සැනසුම් සුසුමක් ගිලිහුණේ ඉබේට ම ය.

"දවල්ටත් ඉතින් එහෙනම් අපි තියෙන දෙයක් රත් කරගෙන කමු සර්.. රෑට නම් මගෙ ඔළුවට බරක් නෑ.. පොඩි දූව වැඩට ගිහින් තුන විතර වෙනකොට ගෙදර එනවනෙ.."

පිය පුතු දෙදෙනා ම උනුන් මුහුණු බලා ගත්හ.

"පොඩි දූව..??? පියල්ගෙ පොඩි දූව කොහෙද වැඩ කරන්නෙ..?"

"පොඩි දූව ග්‍රාමසේවක නෝනා කෙනෙක් සර්.. වැඩ කරන්නෙ මේ ගම් හතර පහකට උඩහා.."



Uploaded By Sanda

"හාමෙන්.. ඇත්තද පියල්..? ඉතින් දුව එනකොට ගොඩක් රෑ වෙන්නෙ නැත්ද..?"

"නෑ සර්.. කාර්යාල දවස් තියෙන්නෙ තුනයි.. ඒ දවස් තුනට දවල් දෙක වෙනකල් කාර්යාලවල රැඳිලා ඉන්න ඕනෑ.. දවසෙ පැය විසි හතරෙ ඕනෑම මොහොතක රාජකාරී කරන්න ඒ රස්සාව කරන අය බැඳිලා ඉන්නවා.. වෙන උදවියට නම් කාර්යාල දවස් ඇරුණාම ඉතිරි දවස් හතර විවේකයක් ගන්න ඉඩ තියෙනවා.. ඒත් අපේ දුවට එහෙම නිදහසක් නෑ සර්.. ආරච්චි මහත්තුරු නැති වසම් දෙකකම දුවට වැඩ බැලීම් දෙකක් දාලා තියෙනවනේ.."

වනිගසේකර මහතා කියූ දෑ සමරසිංහ මහතාට යම් තරමකින් අවබෝධ වුවත්, ගඟුල්ට නම් ඒ කිසිවක් සැබැවින් ම වැටහුණේ නැත. ගඟුල්ගේ ඉරියව් දුටු වනිගසේකර මහතාගේ මුවග සිනාවක් ඇඳුණේ නිරායාසයෙනි.

"පුතාට නම් මං කියපු දේවල් තේරුණේ නෑ නේද..? නගරවල ජීවත්වෙන දරුවන්ට මේ ගම්වල තියෙන දේවල් තේරුම් ගන්න ටිකක් අපහසුයි තමයි.. සුමානයක් හමාරක් ගමේ ජීවත් වෙනකොට ඔය කොයි දේත් පුතාට හෙමින් හෙමින් වැටහෙයි.."

ගඟුල් සිනාමුසු මුහුණින් හිස සැලුවේ වනිගසේකර මහතාගේ අදහස සනාථ කරන අන්දමිනි. සමරසිංහ මහතා ඇතුළු දොර උළුවස්සට හේත්තු වී හිඳින චේතනා දෙස බැලුවේ කාරුණික දෑසිනි.

"දුව ඇයි ඔතන අපහසුවෙන් හිටගෙන ඉන්නෙ.. මෙහෙන් ඇවිල්ලා වාඩිවෙන්න.."

"ඕන නෑ අන්කල්.. මෙහෙම හොඳයි.."

"අන්න මං ඔයාට තේ ටිකක් තියලා ආවා පුතේ.. මොනවා හරි කාලා තේ එක බොන්න.. මොනවද ඔයා කන්නෙ..?"

වනිගසේකර මහතා ඒ මොහොතේ නම් තම වැඩිමහල්





දියණිය දෙස බැලුවේ අනුකම්පාවෙනි. චේතනා කෝළ සිනාවක් පෑවා ය.

"පුතා කැමති දෙයක් කන්න.. මේ කෑම ජාති මහ ගොඩක් අපි කොහෙට කන්නද..?"

සමරසිංහ මහතා කෑම පිඟාන ඔසවා චේතනා වෙත දිගු කළේය. මුළුමනින්ම ආගන්තුක වුවත්, ඒ පීතෘ දෑසේ ද වූයේ මහා දයාබර බවකි.

"හකුරුත් එක්ක මම ආප්ප කන්නම් තාත්තා.. තැන්ක් යූ අන්කල්.."

ආප්ප දෙකක් අතට ගත් චේතනා, යළි හැරී නිවස තුළට වැදී නොපෙනී ගියා ය.

වනිගසේකර මහතා අමුත්තන් ඉදිරියේ වූ අසුනකට බර වූයේ, සාකච්ඡාවේ වැදගත් ම අර්ධයට ප්‍රවිශ්ට වීමට ය. වනිගසේකර මහතාගේ දෑස යොමුවී තිබුණේ වෙළුම් පටිවලින් ඔතා ඇති ගඟුල්ගේ වම් පාදය වෙතට ය. වෙළුම් පටි පසාරු කරගෙන ඉවතට විහිදී ඇති සැරව පැල්ලම් දකින වනිගසේකර මහතාගේ ළය නොදන්නා වේදනාවකින් ඇදුම් කන්නට විය. ගඟුල්ගේ හදවත ද තමා ගැන ම උපන් දරා ගත නොහැකි වේදනාවකින් දූවෙමින් තිබිණි.

"කකුල දිහා බලන්නෙපා අන්කල්.. මේ ජරාව දැක්කම අන්කල්ට අප්පිරියා හිතෙයි.."

"මේ මොනවා කියනවද පුතේ.. රෝගාතුර උනාම එහෙමත් කෙනෙක්ව පිළිකුල් කරන සිරිතක් කොහෙ තියෙනවද පුතේ..???"

වනිගසේකර මහතාගේ වදන් දිව්‍යමය වදන් සේ දෙසවන් සිප ගනිද්දී, පිය පුතු දෙදෙනා ම උනුන් දෙස බැලුවේ අදහාගත නොහැකි දෑසිනි. එක ම සිදුවීම ලොවේ දෙතැනකදී දෙස්වරූපයක් ගැනීම පුදුමයට හේතු කාරණාවක් නොවන්නේ ද?



Uploaded By Sanda

"සර්.. ඇයි.. මගෙන් මොකුත් වැරදි දෙයක්වත් කියවුණාද..?"

වනිගසේකර මහතා පිය පුතු දෙදෙනා ම දෙස බැලුවේ කිසිවක් වටහා ගත නොහැකි දැසිනි. ගගුල් පිළිතුරක් දීමට ඉස්සර වූයේ ය.

"රෝගියෙක් පිළිකුල් කරන සිරිතක් නෑ කියලා අන්කල් කිව්වට.. ගොඩක් තැන්වලදී.. ගොඩක් අය අතින් මාව නම් පිළිකුලට ලක් උනා අන්කල්.. මේ කියන දේටත් වඩා පිළිකුලට ලක්වෙන්න දෙයක් නෑ අන්කල්.. තුවාලෙ හින්දා මාව අප්පිරියයි කියලා මගේ වයිෆුත් මාව දාලා ගියා.."

ගගුල්ගේ මුවින් ගිලිහුණේ වනිගසේකර මහතා ඒ මොහොතේ අසන්නට තබා සිතන්නටවත් සූදානමින් නොඋන් කටුකතම සත්‍යයකි. පානය කළ හිස් තේ කෝප්පය බන්දේසිය මතින් තැබූ රියදුරු රත්නජීව හිඳ උන් අසුනින් නැගිට සෙමින් ඉස්තෝප්පුවෙන් බැස යන්නට ගියේ, ස්වාමි පුතුන්ගේ සංවාදය තීරණාත්මක සංධිස්ථානයකට පැමිණෙමින් තිබූ බව හොඳින් ම වටහා ගත් බැවිනි. ගගුල්ගේ වචන හමුවේ වනිගසේකර මහතාගේ මුව ගොළු වී තිබිණි.

"ජේනවට වඩා.. මගේ ජීවිතේ ඛේදවාචකයක් අන්කල්.. මම දන්නෙ නෑ මේ දුකෙන් මට ගැලවීමක් තියෙනවද කියලා.."

වනිගසේකර මහතා දකුණතේ ඇඟිල්ලෙන් නළලත පොඩි කර ගත්තේ ය.

"ජීවිතේ හැටි ඔහොම තමයි පුතේ.. මේ ලෝකෙ කොයි තරම් මිනිස්සු ජීවත් උනත්.. කවදාවත් දෙන්නෙක්ගෙ දෛවය එක වගේ වෙන්නෙ නෑ.. හොඳට.. නරකට.. මේ දෙපැත්තෙන් එක පැත්තකට බෙදිලා හැමෝගෙම ඉරණම ලියවෙනවා පුතේ.. ගොඩක් මිනිස්සු ජීවත්වෙනවා කියලා කරන්නෙ.. නරකට ලියවිලා තියෙන තමන්ගෙ ඉරණම වෙනස් කරන්න සටන් කරන එක... අපිටත් ඒ සටන කරන්නම සිද්ධ වෙනවාමයි පුතේ.."





තේ පානය අවසන් වූ විට හිස් තේ කෝප්ප කිහිපය එකතු කරගත් වනිගසේකර මහතා නිවස තුළට වැදී නොපෙනී ගියේ ය.

නිවස තුළට ගියා හා සමාන වූ වේගයකින් වනිගසේකර මහතා යළි පිය පුතු දෙදෙනා වෙත පැමිණියේ ය.

"පුතාට කකුල එහෙම තියාගෙන ඉන්න අමරුයි නේද පුතේ..? හාන්සි වෙලා ඉන්න ඇඳක් ලෑස්ති කරලා දෙන්නම්.."

මානවීගේ අල්මාරියෙන් ගත් අලුත් ඇඳ ඇතිරිල්ලක් හා කොට්ට උරයක් රැගෙන ආ චේතනා, නිවසේ ඉදිරිපස පිහිටි අමුත්තන්ගේ කාමරයේ කුඩා යහන ගගුල් වෙනුවෙන් සූදානම් කළා ය.

"පුතා අර කාමරෙන් හාන්සි වෙන්න.. පොඩි දුව ආවට පස්සෙ අපි පිළිවෙළක් කරගමු. සර්ට කම්මැලි ඇති නේද..? මම එහා ගෙදර පුතාව කඩේට යවලා පත්තර ටික ගෙන්නලා දෙන්නම් සර්ටයි, රත්නජීව මහත්තයටයි බල බල ඉන්න. ඒ අතරෙ මම යන්තමට මොනවා හරි රත් කරන්නම් දවල්ට කන්න.."

සමරසිංහ මහතාගේ දෑසේ වූයේ පැහැදිලිව ම සමාව අයදින බැල්මකි.

"කිසිම දැනුම්දීමක් නොකර අපි මෙහෙම ආව එක පියල්ට විතරක් නෙමෙයි මේ  දරුවන්ටත් හරි හිරිහැරයක් උනා නේද..?"

"මේ මොනවා කියනවද සර්.. මටවත් දුවලා දෙන්නටවත් සර් ආපු එක කිසිසේත් ම කරදරයක් නෙමෙයි.. අපි බොහෝ ම ආගන්තුක සත්කාරවලට ලැදි උදවිය.. තව කෙනෙකුට කෑම වේලක් හරි හදලා දෙන්න අපිට ඉඩක් ලැබෙන්නෙ කවුරු හරි අපි ළඟට ආවොත්නෙ සර්.. හැමදාම එක ම විදියට ගෙවිලා යන ජීවිතේට ඒ වෙනස ම මොන සතුටක්ද..?"

වනිගසේකර මහතා කියාගෙන යද්දී, සමරසිංහ මහතාටත් වඩා ගගුල්ගේ හදවතට දැනුණේ අපූර්ව සුවදායක බවකි. ගගුල්..



Uploaded By Sanda

මොහොතකට මුළු ලෝකය ම අමතක කර දමා, වනිගසේකර මහතා විසින් ඇතිරිලි එළා සකසා දුන් කුඩා යහනෙහි වැතිර ගත්තේ ය.

"පුතා එහෙනම් ටිකක් හාන්සි වෙලා ඉන්න.. අපි පොඩ්ඩක් වටපිට ඇවිදලා බලලා එන්නම්.."

සමරසිංහ මහතා කීවේ ගඟුලැලිතැන්නට පැමිණියාට වඩා බොහෝ නිදහස් හා සැහැල්ලු හැඟීමකිනි.

"රත්නෙ අන්කල්.. මගෙ අර කකුල තියෙන කොට්ටෙ ගෙනල්ලා දීල ම යන්න.."

සමරසිංහ මහතාත්, රත්නජීවත් පිටත්ව ගිය පසු, ගඟුල් දෑස පියා ගත්තේ ය. පාන්දර යාමයේ පටන් ගමනේ යෙදීම නිසාදෝ, ඔහුගේ දෑස නිදිබර වන්නට වැඩි වේලාවක් ගතවී ගියේ නැත.

සමරසිංහ මහතාත්, රත්නජීවත්, වනිගසේකර නිවස ඉදිරිපසින් ගුරු පාරට පිවිස, සෙමින් සෙමින් ඉදිරියට පිය මනින්නට වූහ. ගුරු පාරට පහළ නිම්නයේ ගලා යන දොළ ඉවුර පුරවක්, ගොරක, ඇටඹ, කුඹුක් ආදී අම්ල තුරු ලතාවන්ගෙන් ගැවසී ගෙන සිටියේ ය. දොළ පහරේ සිලි සිලියට විටින් විට මුසුවන රෑහැයියන්ගේ නාදය ඉමිහිරි සංගීත නාදයක් ලෙස විනා වෙහෙසක් ලෙස සවනට වැටුණේ නැත. හාත්පස පැතිර තිබූ නිල්ල තෙළන වෙල් යාය මැවූ මන මෝහනීය දසුන් භාවනාවක් ම වූයේ ය.

උදැල්ලක් කර තබා ගත් මිනිසකු, එළවළු මල්ලක් ඉන තබා ගත් මිනිසකු, දර මිටියක් හිස තබා ගත් ගැහැනියක.. ඉඳ හිට ඔවුන් පසු කර ගියේ.. විමතිය තවරාගත් දෑස යොමු කොට අමුත්තන් වෙත ලෙන්ගතු හසරැල්ලක් හිළිණ කරමිනි.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

"මොනවද තාත්තා දැන් උයන්නෙ..?"





"පරිප්පු ටිකක් උයලා, බෝංචි ටිකක් හින්දලා, අර මුකුණුවැන්න ටික මලවලා, හාල්මැස්සන් ටිකක් තෙල් දාලා ගමු පුතේ.."

වනිගසේකර මහතා අවශ්‍ය කළමනා සූදානම් කරන්නට වූයේ ය.

"අපි ටිකිරි නංගිටවත් කතා කරමුද පුතේ.. පැයක්වත් යයි මේ ටික හදාගන්න.."

"අනේ තාත්තා.. ටිකිරි නැන්දගෙ අනිත් වැඩ නම් සේරම හොඳයි.. කෑම නම් රහට උයන්න ටිකිරි නැන්දට බෑ.. තාත්තා උයන ඒවා ඊට සිය ගුණයකට වඩා රහයි.."

වනිගසේකර මහතාගේ මුව කොන අමුතු ම අන්දමේ හිනාවක් විසිරෙනු දුටු චේතනා විමසිලිමත් දෑසින් තම පියා දෙස බැලුවා ය.

"ඇයි තාත්තා..?"

"කවද හරි දවසක තවත් අය ඔයාටත් ඔය විදියට ම කියයි ලොකු දුව.. ඔයාටත් ව්‍යංජනයකට හරියට ලුණු ඇඹුල් ටික දාගන්න බැනෙ.."

චේතනා නිහඬ වූවාය. ඇයට තම පියා ඉදිරියේ බඳින්නට ප්‍රති උත්තර තිබුණේ නැත. වනිගසේකර මහතා බොහෝ දවසක පටන් තම දියණියට දෙන්නට බලා උන් අවවාදයක් දෙන්නට ඒ මොහොත අවස්ථාවක් කර ගත්තේ ය.

"පුතේ.. මොකක්ද ඔයා ඔය ගෙවන ජීවිතේ කියලා නිකමට කල්පනා කරලා තියෙනවද..? මම මේවා කියන්නෙ මට ඔයාව බරක් එහෙම හින්දා නෙමෙයි.. ඒත්.. ඔයා දැන් කසාද බැඳපු.. දරුවෙකුත් ලැබෙන්න ඉන්න අම්මා කෙනෙක්.. ජීවිතේ ගැන කිසි ම වගකීමක් නැතුව ඔහොම හැසිරෙන එක අනිත් කාට කෙසේ වෙතත් ඔය ඉපදෙන්න ඉන්න දරුවට කරන ලොකු අසාධාරණයක්.."



Uploaded By Sanda

වනිගසේකර මහතාගේ මුවින් ගිලිහුණේ දිගු සුසුමකි.

"මට තේරෙන්නෙ නෑ තාත්තා.."

"තේරෙන්නෙ නෑ.. තේරෙන්නෙ නැත්තං ඒවා තේරුම් ගන්න උත්සාහ ගන්න.. නොතේරෙන්න ඔයා දැන් අත දරුවෙක් නෙමෙයිනෙ.."

"මං දන්නවා තාත්තා.."

"දන්නවා නම් ඇයි නොදන්නවා වගේ හැසිරෙන්නෙ.. කසාදයක් බැන්දා නම් ගෑනියෙක් ඉන්න ඕන ස්වාමියාගේ ගෙදර.. දෙන්නා එක තැනක.. රට වටේ යන ඒ මනුස්සයා සුමානෙකට සැරයක් ඒ ගෙදර යනවා.. නැත්තං කට ගොන්නක් බීගෙන මෙතන ඇවිත් වැටෙනවා.. දෙන්නා දෙමහල්ලො අහසින් කඩන් වැටුණා වගේ ඔහොම ජීවත් වෙනකොට ඔය දරුවට යන කල මොකක්ද ලොකු දූව..?"

බෝංචි කරල් කිහිපය කඩන අතරවාරයේ වනිගසේකර මහතා තම වැඩිමහල් දියණියගෙන් විමසන්නට වූයේ, බොහෝ දිනක් තිස්සේ විමසන්නට බලා උන් ප්‍රශ්න මාලාවකි.

"මම සජිත් එක්ක කතා කරන්නම් තාත්තා.."

"ඔව්.. කතා බහ කරලා ගෙදර යන්න පිළිවෙළක් යොදාගන්න.. අම්මා අසනීප වෙච්ච වෙලාවෙ සමරසිංහ මහත්තයා මට කළේ සුළු පටු උදව් උපකාර නෙමෙයි.. ඒ හින්දා මේ වෙලාවෙ මට ඒ මනුස්සයින්ට පිටුපාන්න බෑ.. ගගුල් පුතා තුවාලකාරයෙක්.. තුවාලයක් කියන්නෙ විෂබීජ නවාතැක්.. අලුත උපදින දරුවෙකුට ඒ වගේ විෂබීජ ගොඩක ජීවත්වෙන්න බෑ.. අනික.. සජිත් පුතාගෙ අම්මා මොන තරම් අහිංසක මනුස්සයෙක්ද.? ඔයාට ඒගොල්ලො මොන තරම් හොඳින් සලකද්දිද ඔයා ගෙදර ඇවිල්ලා ඉන්නෙ පුතේ..?".





චේතනාට තම පියා හමුවේ ගොනු කරන්නට පිළිතුරු තිබුණේ නැත. පියාගේ මුවින් පිටවූ වදනක් ගානේම සත්‍ය බව ඇ දැන සිටියා ය.

"මම මේ ඔයා ගැන අහිතකින් කතා කරනවා නෙමෙයි පුතේ.. මට ඔයාව මෙහෙන් යවාගන්න උවමනාවකුත් නෑ.. මම ඔයාගෙ තාත්තනේ.. ඒ හින්දා මට ඔයාව බරක් නෙමෙයි.. ඒත්.. ඔයාලට ජීවිතයක් තියෙන්න ඕන පුතේ.."

වනිගසේකර මහතාගේ හඬෙහි වූයේ වේදනාබර නිහැඬියාවකි.

"මං මේ කරන්නෙ වැරැද්දක් කියලා.. මට තේරෙනවා තාත්තා.. ඒ අම්මලා හොඳයි තමයි.. ඒත් මට.. එයාලත් එක්ක එකට ඉන්න හිතෙන්නෙ නෑ.. ගෙදර වගේ නිදහසක් නැතෙ.."

"කවුරු මොනවා කිව්වත්.. කාට උනත්.. තමන්ගෙ ගෙදර වගේ නිදහස් තැනක් ලෝකෙ නෑ තමයි.. ඒත්.. එහෙම කියලා.. කසාද බැඳපු ගෑනියෙකුට මහ ගෙදරට වෙලා ඉන්න බෑ.. නංගිගෙ අනාගතේ ගැනත් හිතන්න දැන් කාලෙ හරි.. ඒ හින්දා.. අක්කා හැටියට ඔයා මීට වඩා වගකීමෙන් හිතන්න පුරුදු වෙන්න පුතේ.."

තෙම්පරාදුවෙන් පසු සුවඳ හමන පරිප්පු ඇතිලිය බිම තබා, බෝංචි ඇතිලිය ලිප මත තබන තම පියාගේ යුහුසුලු දෑත දෙස චේතනා බලා සිටියේ හැඟීම් පැටලුණු හිස් දෑසිනි.

මෙදිනික රාජකාරී නිම කොට මානවී යළි නිවසට පැමිණෙන විට පස්වරු තුන පමණ වී තිබිණි. නිවස ආසන්නයට පැමිණෙත් ම ඇගේ දෑස් දුටු දසුනින්, හදවත විමතියට පත් වූයෙන් දෑස කුහුලින් සිහින් වී ගියේ ය. තම නිවසේ කුඩා ගේට්ටුව



Uploaded By Sanda

ඉදිරිපිට ම නවතා තිබූ සුඛෝපභෝගී රිය දුටු මතින් ඇගේ සිතට හුරුපුරුදු බවක් දැනී, ඇගේ මතකය අවදි විය. එතරම් වාහන ප්‍රමාණයක් දිනකට ගමන් නොගන්නා, තමාට හුරුපුරුදු තම ග්‍රාමීය මාර්ගයේදී උදෑසන හමුවූ විශේෂ සුපිරි රිය ඇයට මතකයට නගා ගැනීම අසීරු වූයේ නැත.

'මේ අද උදේ මගෙන් පාර අහපු වාහනේ නේද..? එතකොට.. පාර අහගෙන.. හොයන් ඇවිත් තියෙන්නෙ අපේ ගෙදරම ද..?'

මානවීගේ සිත තුළ වූයේ නොසන්සිඳෙන කුතුහලයකි.

'උදේ ආපු වාහනේ.. මෙච්චර වෙලා..??? ඒ වාහනේ හිටපු අය මම අඳුරන්නෙත් නෑ.. තාත්තා දන්න කවුරුහරි වෙන්න ඇති..'

මානවී, සුඛෝපභෝගී රියට පිටුපසින්, තමාගේ ස්කූටරය නැවැත්වූයේ පැහැදිලි නොවූ සිතිවිලි පිරුණු සිතිනි.

ස්කූටරයෙන් බිමට බට ඇ, හිස් ආවරණය ගලවා වමතට ගෙන, අත් බෑගයත්, රැගෙන ආ එළවළු මල්ලත් සුරතට ගත්තා ය. නවතා තිබුණු රියත්, ගේට්ටුවත් අතර වූ තීරුවක් බඳු සිහින් ඉඩකඩින් ඈ ඇතුළු වූයේ රිංගාගෙන මෙනි. මේ සියල්ල දෙස ඉදිරිපස ආලින්දයේ කොනක හිඳ, දෑසක් තමා වෙත ම යොමුවී තිබුණු වග, ඉස්තෝප්පුවට ගොඩ වන තෙක් ම ඈ නුදුටුවා ය.

'ඕ... ගෝඩ්.. මේ අර උදේ අපි පාර අහගත්ත ගර්ල් නේද..? වට් අ සප්‍රයිස්..???'

ගඟුල්ගේ දෑස විස්මයෙන් විසල් වන්නට ඇසිල්ලකට වැඩි කාලයක් ගත වූයේ නැත. පුදුමයෙන් පුදුමයට පත් සිවු දෑසක් එකට හමුවූයේ එවන් අහඹු මොහොතක ය.

අමුත්තා දුටු මතින් මානවීගේ දෑස නොසමාන තරමින් තිගැස්සිණි.





'මේ කවුද මේ.? මෙයත් එහෙනම් මේ වාහනේ ඇතුළෙ ඉන්න ඇති..'

මානවී, සිනාවක් නගා ගන්නට අසීරු උත්සාහයක නිරත වූවා ය.

'එතකොට.. පියල් අන්කල්ගෙ පොඩි දුව ද මේ..?'

ගඟුල්ගේ හදවත මත්තේ ඒ මොහොතේ පිපෙන්නට වූයේ සොම්නසේ මල් පොකුරකි. ඔහු, සැණෙකින් පියවි ලොවට පිවිස ඈ හා මුව පුරා හිනැහුණේ ය. අමුත්තා ඉදිරියේ අපහසුතාවයක් නොපෙන්වා හිඳීමට වෙර දැරූ මානවීගේ දෙතොලතර ඇඳුණේ ළා පැහැති හසරැල්ලකි. දේදුනු වර්ණ ඔසරියකින් සැරසී උන් මානවීගේ චාම් සොඳුරු රුව, ගඟුල්ගේ හදවත තුළ සිතුවමක් වී ඇඳුණේ ඔහුටත් හොර රහසේ ම ය. ගඟුල් වෙත මදහස තිළිණ කළ මානවී, ඉක්මන් ගමනින් නිවස තුළට වැදුණා ය.

'හරියට නිකම් භාවනාවක් වගේ හිනාවක්...!!!'

වසර ගණනාවක් මුළුල්ලේ.. ගිනිගෙන දැවෙමින් තිබුණු ගඟුල්ගේ හදවත, සැබැවින් ම යුවතියගේ එක ම හසරැල්ල ඇසුරේ 'නිවීම' හඳුනාගෙන තිබිණි.

"තාත්තා..???"

ගඟුල්ගේ සිතිවිලි ලෝකය කඩා බිඳ දමමින්, මානවීගේ ලයාන්විත හඬ නිවස සිසාරා ඇදී ගියේ ය.

"ආ.. පොඩි දුව.. ආවද පුතේ..? අපි මේ එනකල් මග බලාගෙන හිටියෙ..?"

පියාගේ ආමන්ත්‍රණය තුළ ඇයට වූයේ වෙනදා නොවන නුහුරකි.

"අපි..???"



Uploaded By Sanda

ඒ, එකම ම වචනය තුළ ජීවිතයේ එතෙක් අත් නොවිඳි කුමක්දෝ අපූර්වත්වයක් ගැබ්ව ඇතැයි ඇයට හැඟිණි.

"කවුද තාත්තා ඇවිත් ඉන්නෙ..???"

මානවී, මුළුතැන්ගෙයි දොර තීරයෙන් ඇතුළු වූයේ එසේ අසාගෙන ය.

"බයික් එකේ සද්දෙ අද ඇහුණෙවත් නෑ නංගි.. අපි හිතුවෙ ඔයා අද පක්කුයි කියලා.."

"බයික් එක පාරෙනෙ නැවැත්තුවෙ අක්කි.. කවුද ඇත්තට ම මේ ඇවිල්ලා ඉන්නෙ තාත්තා..?"

"ඒ ඇවිත් ඉන්නෙ මං අන්තිමට වැඩ කරපු බැංකුවෙ හිටපු මැනේජර් මහත්තයා, සමරසිංහ මහත්තයාලා පොඩි පුතේ.."

වනිගසේකර මහතා කෙටියෙන් ම දියණියට පැහැදිලි කළේ ය. මානවී, පුදුමයෙන් නළල රැළි කළා ය.

"එතකොට අර ඉස්සරහා වාඩිවෙලා ඉන්නෙ..?"

"ඒ සර්ගෙ ලොකු පුතා පුතේ.. ගඟුල් පුතාගෙ කකුලෙ ලොකු තුවාලයක්.. අවුරුදු පහළොවක් විතරලු.. රට හිටන් ගිහින් බෙහෙත් කරලා කරලා අන්තිමේදි දොස්තර මහත්තුරු මේ ගමන කිව්වලු වළලුකර ළඟින් කකුල කපන්න වෙනවා කියලා.. ඔය අතරෙ විශ්ව විද්‍යාලෙ වැඩ කරන මහත්තයෙක් තමයි අපේ මේ ලොකු හාමුදුරුවො ගැන ආරංචිය කියලා තියෙන්නෙ.. සර්ට එක පාරට ම මාව මතක් වෙලා.. බැංකුවට ගිහින්.. එතනින් අපේ ඔෆිස් එකට ගිහින් තමයි විස්තර හොයාගෙන මේ ඇවිදින් තියෙන්නෙ.."

බාල දියණියට තවත් එකදු පැනයකට හෝ ඉඩ නොතබා, වනිගසේකර මහතා පූර්ණ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කළේ ය. පියාගේ වචනයක් වචනයක් ගානේම මානවීගේ දෑස ශෝකයෙන් ද වේදනාවෙන් ද හැකිළී ගියේ ය.





"අවුරුදු පහළොවක විතර.. හොඳ කරන්න බැරි තුවාලයක්..??? කකුල කපන්න කියලා..??"

වනිගසේකර මහතා කිසිවක් ම නොකියා හිස සැලුවේ ය. මානවී, හිඳ ගත් අසුනින් යළි නැගී සිටියේ වේදනාබර හදවතිනි. ඇගේ සුරත අත්බෑගය තුළට ගියේ අවිඥානිකව ම ය. පියාත්, සොයුරියත් වෙනුවෙන් හැමදාමත් ගෙන එන රටකජු පැකට්ටු දෙක ඈ තම සොයුරිය වෙත දිගු කළා ය. චේතනාගේ මුව සිහින් හසරැල්ලක් ඇඳී ගියේ ය.

"නංගි.. තාත්තටයි මටයි එකක් ඇති.. මෙක අර මල්ලිට ගිහින් දෙන්න.. අන්කලුයි, ඩ්‍රයිව අන්කලුයි වටපිටාවෙ ලස්සන බලන්න ඇවිදින්න යන්න ඇති.. උදේ එක වටයක් ඇවිදින්න ගියා.. කෑම කාලා දැන් රිදී ඇල්ල පැත්තට යනවා කියලා ගියා.."

ඇළ දොළ පිරුණු, කෙත් වතුවලින් සරුසාර වූ, ගම්මානයේ වන සොබා සෞන්දර්යයෙන් අමුත්තන් වශීකෘත වීම අරුමයක් නොවන බැවින්, මානවී, සිහිවිල්ලෙන් ම ආලින්දය දෙසට යන්නට පා එසෙව්වා ය. ඈ, යළිත් හැරී චේතනා දිගු කළ රටකජු පැකට්ටුව අතට ගත්තා ය.

"කට්ටිය කෑවද තාත්තා..?"

"අනේ ඔව් පුතේ.. මට සන්තෝසෙ බෑ.. පුළුවන් හැටියට උයලා දුන්නා.. කොළඹ උදවියට අපේ කෑම කොහොම කන්න පුළුවන් වෙයිද කියලා හිත හිතයි බෙදලා දුන්නෙ.. අපරාධෙ කියන්න බෑ.. රහයි රහයි කියලා කෑවා.."

මානවීගේ දෙතොලර මඳ සිනාවක් සිත්තම් විය. ඈ, චේතනා දුන් රටකජු පැකට්ටුව ද අතට ගෙන ආලින්දයෙන් බැස විවෘත ආලින්දය දෙසට පිය මැන්නාය.

ටික් ටික් හෝ ටක් ටක් නොවන අතරමැදි හඬකින් ඈ පැළඳගෙන උන් පාවහන් යුවළින් නැගෙන හඬ, මානවී තමා



Uploaded By Sanda

දෙසට ඇවිද එන බව ගගුල්ට ඇඟවූවේ ය. ඔහු, අත වූ පුවත්පතින් හිස ඔසවා ඈ එන දෙසට දෑස් හැරෙව්වේ ය. මානවී, දෑස් දල්වා හිනැහුණා ය. හදවතට නිවීම ම දනවන ඇගේ සිනාව ඔහු දෑසින් අල්ලා ගත්තේ පැහැබර හසරැල්ලකිනි.

"අයියෙ.. සනීප නැතිලු නේද..?"

"ඔව් නංගි.. තාත්තා කියන්න ඇති නේද..? කකුලෙ හොද කරන්න බැරි තුවාලයක් තියෙනවා.. පොඩි තුවාලක් නෙමෙයි අවුරුදු පහළවක තුවාලයක්.."

"බයවෙන්නෙපා අයියෙ.. ලොකු හාමුදුරුවෝ අයියගෙ කකුල සනීප කරයි.."

මානවීගේ ස්ථිරසාර වදන් හමුවේ ගගුල්ගේ දෑස් තිගැස්සිණි.

"එච්චර විශ්වාසෙන්.. කොහොමද නංගි ඒක එච්චර විශ්වාසෙන් කියන්නෙ..?"

"මේ තරම් කාලයක් ලොකු හාමුදුරුවෝ හොයාගෙන ආව කිසිම කෙනෙක් සුවපත් නොවී ආපහු යනවා අපි දැකලා නෑ අයියෙ.. හැබැයි එකක්.. ලොකු හාමුදුරුවෝ කියන විදියට ම ඒ පිළිවෙත් ටික ඉෂ්ට කරන්න ඕන.. එහෙම කළොත් තමයි සනීප වෙන්නෙ.."

"මෙහෙම මේ දුක විඳිනවට වඩා.. කියන විදියකට ඉඳලා.. සනීප වෙන්න කවුද අකමැති නංගි..?"

මානවී, දයාබර ව හිනැහුණා ය. සිව් නෙතු එක ම රේඛාවක හමු විය. ඈ, අත වූ රටකජු පැකට්ටුව ගගුල් වෙත දිගු කළා ය.

"මොනවද නංගි..?"

"රටකජු.. මේ වගේ දේවල් අයියා ඉතින් කනවද නම් දන්නෙ නෑ.."





පැහැදිලිව ම ඔහුගේ දෑසේ ඇඳුණේ තරවටුව මුසු වූ සිනාවකි. කිසිවක් නොකී ගගුල්, මානවී දෙසට සුරත දිගු කළේ ය.

"මගේ ඔෆිස් එක ළඟ පුංචි පෙට්ටි කඩයක් තියෙනවා.. සීයා කෙනෙක් ඒක කරන්නෙ.. පව්නෙ ඒ සීයා.. මං ඒ හින්දා හැමදාම.. තාත්තටයි, අක්කටයි රටකජු පැකට් දෙකක් ගේනවා.."

මානවී අත වූ රටකජු පැකට්ටුව සුරතට ගන්නා ගගුල්ගේ දෑසේ වූයේ වෙනස් ම ආකාරයක සොඳුරු හසරැල්ලකි.

"මම ටික දවසක් මෙහෙ හිටියොත්.. එහෙනම් හෙට ඉඳන්.. රටකජු පැකට් තුනක් ගේන්න වෙයි නංගිට.."

මානවී ද ගගුල්ගේ සැහැල්ලු සිනාවට එක් වූවා ය.

"ඉතින් ගේන්නම.. අපිට කවුරු හරි අමුත්තො වෙන්නෙ මේ ගෙදරට එනකල් විතරයි.. ඊට පස්සෙ හැමෝම ගෙදර අය වගේ තමයි.."

ගගුල්, මානවී දෙස බැලුවේ සැහැල්ලුව අමතක කොට, කෘතවේදී දෑසිනි. එහෙත්, මානවීගේ හදවත තුළ කිසිදු ආගන්තුක බවක් නොවූ අපූර්වතම සැහැල්ලුවක් ඉහිරී තිබිණි.

"මම.. අයියෙ කියලා කතා කළාට.. මල්ලි ද දන්නෙත් නෑ.."

ගගුල්ට, මානවී හමුවේ දැනුණේ කාලාන්තරයක් ඇසුරු කළාක් බඳු සමීපස්ථ බැඳීමකි. ඔහුට තමාගේ රෝගී තත්වය පමණක් නොව පරිසරයේ ආගන්තුක බව පවා ඒ මොහොතේ අමතක වී ගොස් තිබිණි. මානවී කෙරෙන් දිස් වූයේ එතරම්ම සැහැල්ලු, අව්‍යාජ, විවෘත භාවයකි.

"ඔයාගෙ අක්කා අසූ හතරෙ.. මම අසූ හයේ.. ඔයා අසූ අටේ.."

මානවීගේ දෑස විමතියෙන් කුඩා වූයේ ඇයටත් නොදැනීම ය.



Uploaded By Sanda

"ආ.. එහෙනම් ඉතින් අයිය ම තමයි.. මගෙ අම්මේ.. මේ ටික වෙලාවට අයියා දැනගෙන තියෙන දේවල්..???"

ගඟුල්ගේ මුහුණේ ඇඳී තිබුණේ තාරුණ්‍යයේ උවනක ඇඳෙන අන්දමේ සොඳුරු ම හසරැල්ලකි. මානවී හමුවී කියා ගන්නට කොතෙකුත් දෑ ඔහුගේ හදවතේ අතොරක් නොමැතිව ගොඩ ගැසෙන්නට වූයේ ය.

"මොන ටික වෙලාවක්ද නංගි.. අපි මෙහෙට එනකොට උදේ නවය හමාරයි.. දැන් වෙලාව තුන හමාරයි.. පැය හයක්.. පොඩි වෙලාවක්ද..? අනික... මම ඇවිල්ලා ඔයාගෙ අක්කට, නංගි නංගි කියනකොට අක්කා තමයි වයස කිව්වෙ.."

මානවීගේ දෑස අත බැඳි ඔරලෝසුව වෙත යොමු වූයේත්, වනිගසේකර මහතා ඉදිරි ආලින්දයට පැමිණියේත් එක ම මොහොතක ය.

"පොඩි පුතේ.. මම පන්සලට ගිහින් එන්නම් ලොකු හාමුදුරුවො හම්බ වෙලා.. මං පොඩ්ඩක් බලන්නම් ලොකු සර් කොහෙද කියලා.."

ගඟුල්ගේ හදවත යළිත් සොම්නසින් පිරිතිරී ගියේ ය.

"අන්කල් යන්නෙපා.. ඉන්න.. මං තාත්තට කෝල් එකක් අරගන්නම්.. අපේ තාත්තාට චූටි කාලෙ තාත්තගෙ ගමේ ගෙවුව ජීවිතේ මතක් වෙලා වෙන්න ඇති.. සොබාව සෞන්දර්යයෙන් වශී වෙලා.."

එසේ කියූ ගඟුල්.. මානවී දෙස බැලුවේ ආයාචනාත්මක දෑසිනි.

"නංගි.. ප්ලීස්.. මට පොඩි උදව්වක් කරන්න.. අර ඇඳ උඩ තියෙන මගෙ ෆෝන් එක ගෙනල්ලා දෙනවද මට..?"

ගඟුල්ගේ අපහසුතාවය වටහා ගත් මානවීගේ හදවත වෙනස්





ම අන්දමේ අනුකම්පාවකින් හිරි වැටී ගියේ ය. හිස සැලූ ඇ, සෙමින් අඩි තබා ඉදිරිපස කාමරය දෙසට ඇවිද ගියා ය.

"තාත්තා.. බුලත් අතක් කඩාගන්න වෙයි නේද..? ගන්සූරියා ගහේ තියෙන වැලට නගින්නෙපා මේ වෙලාවෙ.. ළිඳ ළඟ මැස්සෙන් කඩා ගන්න තාත්තා.."

මානවී, නිවසේ අමුත්තන්ගේ කාමරයට පිවිසියේ දහසක් සිතිවිලි දරාගත් හදවතිනි. කොතෙකුත් රෝගී අමුත්තන් විටින් විට නිවසට පැමිණ ප්‍රතිකාර ලබාගෙන ගොස් තිබුණ ද, ඒ මොහොතේ දැනුණු අන්දමේ සමීප හැඟීමක් ඇයට ඒ කිසිදු අවස්ථාවක දැනී තිබුණේ නැත. ඇ, කුඩා යහන වෙතට පහත් වී ගඟුල්ගේ ජංගම දුරකතනය සුරතට ගත්තා ය. ජංගම දුරකථනයේ ස්වරූපය දුටු ඇ එය අතට ගත්තේ වඩාත් ප්‍රවේසමෙනි.

'බුදු අම්මේ.. මේ ෆෝන් එක නම් ලක්ෂයක්වත් වටිනවා ඇති.. ලේසි පාසු සල්ලිකාරයො නෙමෙයි වගේ..'

මානවීගේ සිත තුළ ඒ මොහොතේ රජැයූයේ බාල බොළඳ ළදැරියකගේ සිතිවිලි ය. ඇ ගඟුල් වෙත දුරකථනය දිගු කළේ වඩාත් ප්‍රවේසමෙනි. ඒ, පරිස්සමේදී ඇගේ දිගු මෘදු අතැඟිලි ඔහුගේ සුරතේ ස්පර්ෂ විය. යුවතියට කිසිදු සුවිශේෂීභාවයක් නොදැනුණත්, තුරුණුවාගේ හදවත නම් කුමක්දෝ මිහිරියාවකින් පිරී ඉතිරී ගියේ ය.

තම නැගණියගේ ප්‍රමාදය නොඉවසූ චේතනා ද පැමිණ ආලින්දයට කර පොවා බැලුවා ය. පියා ද නැගණිය සමීපයේ හිඳිනු දුටු ඇගේ සිතට යම් අස්වැසිල්ලක් දැනිණි. ගඟුල්ගේ ඇමතුම, සමරසිංහ මතාගේ ඇමතුම හා සම්බන්ධ වූයේ ඒ මොහොතේ ය.

"තාත්තෙ.. තාත්තලා කොහෙද ඉන්නෙ..? අන්කල් පන්සලට යන්නයි ලෑස්ති වෙන්නෙ.."



Uploaded By Sanda

"අපි පුතේ රිදී ඇල්ල බලලා.. රිදී ඔය ඉවුර දිගේ පහළට ආවා.. හරි පුතේ.. අපි ඉක්මනට එනවා කියලා අන්කල්ට කියන්න.."

විනාඩි දහයක පමණ කාලයක් ගත වන විට සමරසිංහ මහතා හා රත්නජීව යළි වනිගසේකර නිවස වෙත පැමිණියේ සොම්නස පුරවා ගත් සිනා මුසු මුහුණුවලිනි. බුලත් අතක් සූදානම් කර ගත් වනිගසේකර මහතා ඒ වන විට ගමනට සූදානම්ව සිටියේ ය.

තවමත් ඔසරියකින් සැරසී, පෙරමග බලා හිඳිනා යුවතිය දුටු මතින් විමතියෙන් බර වූ සමරසිංහ මහතාගේ දෑස් ක්‍ෂණිකව යොමු වූයේ රියදුරු රත්නජීව වෙත ය. රත්නජීවගේ දෑසේ වූයේ ද සමරසිංහ මහතාගේ දෑසේ වූ පුදුමයට නොදෙවෙනි පුදුමයකි.

"සර්.. මේ අපි උදේ පාර අහපු නෝනා නේද..? දෙයියනේ.. එතකොට මේ අපේ වනිගසේකර මහත්තයාගේ පොඩි දුවද..?"

"ඒකනෙ රත්නෙ මමත් මේ ගැස්සුණේ.. අර තියෙන්නෙ ඒ ස්කූටර් පොඩ්ඩත්.. මේක නම් මහ පුදුමයක් තමයි.."

ගේට්ටුවත්, නිවසේ හිරු ආවරණයත් අතර වූ පරතරය ගෙවා දමා දෙදෙනා නිවසට ළං වන විටත්, මානවී, ඔවුනතර වෙන්නට ඇති කතාව අනුමාන කර ගත්තා ය. සිනාමුසුව මදක් පෙර මගට පැමිණි මානවී, සමරසිංහ මහතාට දණ නමා ආචාර කළා ය.

"තෙරුවන් සරණයි දුව.. නැගිටින්න.. මේක නම් හරි ම පුදුමයක් පියල්.. දුව තාම කියන්න නැතුව ඇති.. උදේ අපි මෙහාට එන පාර අතරමගදි අහගත්තෙ දුවගෙන් තමයි.."

"ඒකත් එහෙමද සර්.. ඒක එහෙම නම්.. මේ ගමනත් සුබයි ඔන්න..!"

වනිගසේකර මහතා කීවේ අසමාන වූ සැහැල්ලුවකිනි. වනිගසේකර මහතාගේ කතාවෙන් සියල්ලන්ට ම වඩා පුදුමයට පත් වූයේ එතෙක් නිහඬව පසෙකට වී අසුන් ගෙන උන් ගගුල් ය.





"නංගි ඉස්සරහට හම්බ උන එක.. ඒ කියන්නෙ මගුල් ලකුණක්ද අන්කල්..?"

ගගුල් විමසුවේ සියල්ලෝ ම සැහැල්ලු සිනා සයුරක ගිල්වමිනි.

"මම නම් දන්නෙ නෑ පුතා.. කොහොම හරි.. අපේ ලොකු හාමුදුරුවො නම් එහෙම කියනවා.. බෙහෙත් අහගෙන එන කාට හරි අපේ පොඩි දුව ඉස්සරහට හම්බ උනොත්.. ඒ ලෙඩ, සුවපත් වෙනව ම තමයි කියලා උන්නාන්සෙ කියනවා.. ඇත්ත නැත්ත නං තේරුම් බේරුම් කරන්න මං දන්නෙ නෑ පුතේ.."

සියල්ලෝ ම සාවධානව අසා උන්නේ සිහිනයෙන් මෙනි. එය.. එසේ නම්..??? ගගුල්ගේ හදවතේ ලේ නහර සිසාරා ඇදී ගියේ ජීවිත් වීමේ නව අපේක්‍ෂාවන් අනන්තයකි.

"ඇත්ත නැත්ත මොකක් උනත්.. ඒ ඇහිච්ච වචන ටික කණට මී පැණි වැක්කෙරුවා වගේ පියල්.. පිච්චි පිච්චි ඉන්න වෙලාවක.. වැහි පොදක් වැටුණත්.. ඒක පිච්චෙන මිනිහට ලොකු සිසිලසක්.. ලොකු හාමුදුරුවන් වහන්සේ පන්සලේ මේ වෙලාවට වැඩ ඉන්නවද දන්නෙ නෑ පියල්..?"

සමරසිංහ මහතාගේ හඬෙහි වූ සුසංවේදී බව සියල්ලන්ගේ ම ඇස කඳුළු නංවාලී ය. ගගුල්, කාටත් හොර රහසේ දෑසට ඉනූ කඳුළු පිසදා ගන්නට ගිය ද, හදිසියේ හැරී බැලූ මානවීගේ දෑසට එය හසු විය. ඇගේ ළතෙත් හදවත ඉන් සසැලිණි. අසීරුවෙන් දරාගෙන හිඳන්නට වෙර දරන වේදනාව පමණටත් වඩා ඔහුගේ මුහුණේ ලියැවී තිබිණි.

වනිගසේකර මහතා කුමක්දෝ යමක් කල්පනා කළේ ය.

"එහෙනම්.. සර්රුත් මාත් එක්ක පන්සලට ගිහිල්ලා එමුද..? රත්නජීව මහත්තයා ගෙදර නතර වෙන්න.. පුතාට හදිසියේ වැසිකිළියටවත් යන්න උවමනා උනොත් උදව්වට කවුරු හරි ඉන්න එපායැ.."



Uploaded By Sanda

"අන්න හොඳයි.. එහෙම හොඳයි.. අපි දෙන්නා ගිහින් එමු පියල්.. හාමුදුරුවො වැඩ හිටියොත් මට පුතාගෙ ලෙඩේ ගැන පැහැදිලිව කියන්නත් පුළුවන් මාත් ගියාම.."

සමරසිංහ මහතාත්, වනිගසේකර මහතාත් පිටව් ගිය පසු මානවී ද ගඟුල් වෙත හැරුණා ය.

"දිග ගමනක් ඇවිල්ලා මහන්සිත් ඇති නේද අයියෙ.. කොහොමද වොෂ් එකක් දාගන්නෙ..? බාත්රූම් එකක් තියෙනවා.. කකුල ඉටි මල්ලකින් ගැට ගහලා තෙමෙන්නෙ නැතිවෙන්න ඇඟ සෝදා ගන්නවද තාත්තලා එනකල්.. තාත්තලා ආවම සමහර විට පන්සලට යන්න වෙයිනෙ අදම.. අන්කල් උදව් කරයිනෙ අයියට.. මම පුටුවක් දාලා දෙන්නද බාත්රූම් එකට..?"

ගඟුල්, මානවී දෙස බැලුවේ අප්‍රමාණ වූ කෘතවේදී බැල්මක් ද රැඳි දෑසිනි.

"මට පස්සෙ පුළුවන් නංගි.. දැන් ගිහිල්ලා නංගි චේන්ජ් එකක් දාගෙන කෑම කාලා ඉන්නකො.."

මානවීගේ දෙතොලතර ඇඳුණේ අපූරු හසරැල්ලකි.

"ඇත්ත තමයි.. මම තාම කාලත් නෑ නේන්නම්.. අයියා මතක් කළා විතරයි.. බඩගිනිත් දැනුණා.. එහෙනම් ටිකක් ඔහොම ඉන්න.. මම කාලා, නාගෙන එන්නම්.."

යුවතියගේ නිර්ව්‍යාජ, සැහැල්ලු හැසිරීම සැබැවින් ම ගඟුල්ගේ රිදෙන, දැවෙන හදවතට ඒ වන විටත් දිව ඔසුවක් වී තිබිණි.

මානවී, නිවස තුළට වැදී, තම සොයුරියට ඇමතුවා ය.

"අක්කි.. පොඩ්ඩක් අර දෙන්නා එක්ක කතා කර කර ඉන්න.. මම නාගෙන එන්නම්.. අද පරක්කු හින්දද මන්දා ඉවසන්න බැරි බඩගින්නකුත් ආවා.."





"දැන් ඔය වත්ත පහළ ළිඳට යන්නද ලෑස්තිය..? බඩගිනි නම් ඔය බාත්රූම් එකෙන් නාගන්නකො ටක් ගාලා.."

"අයියෝ බෑ.. ඔයා දන්නවනෙ අක්කි.. බාත්රූම් මට ඇලජික් කියලා.."

"ඉතින් එහෙනම් ඔය ටැංකිය පිරිලා තියෙන්නෙ.. ඒකෙන් නාගන්නකො.. මෙච්චර මේ වැඩ කරන්න තියෙන අස්සෙ ළිඳට දුවන්නෙ නැතුව.."

මානවී, හිස දෙපසට සලා, සොයුරිය දෙස බැලුවා ය.

"අර අයියට හදිස්සියේ බාත්රූම් එහෙම යන්න ඕන වෙලා ආවොත්.. මං මෙතන නනා ඉන්න එක හරි නෑනෙ අක්කි.. ඒගොල්ලො අපේ අමුත්තො.."

චේතනාගේ මුව බොහෝ වේලාවකට පසුව, සොඳුරු හසරැල්ලකින් හැඩ වී තිබිණි

"ඇයි..? ඒ ළමයට ඔයාගෙ ලස්සන පෙනෙයි කියලද මෙතන නාන්න බෑ කියන්නෙ..?"

මානවී, සොයුරිය දෙස බැලුවේ නොමනාපයෙනි.

"ඔයාට පිස්සුද..? ඔය ටවුන්වල සල්ලිකාර කොල්ලන්ට මේ කැලෑ මල්වල ලස්සන බලන්න ඕනකමක් නෑ.. ලස්සන බලන්න එහෙ ඕන තරම් උඩවැඩියා තියෙනවා හලෝ.."

මානවී, ඇඳුම් කිහිපය ද, බාල්දිය ද අතට ගත්තේ ඇගේ ආවේණික සැහැල්ලුවෙනි.

"නංගි.. ඒ මල්ලි මැරි කරපු කෙනෙක්.."

චේතනාගේ වදන්වලින් මානවී පුදුමයට පත් වූයේ නැත. ඒ මොහොතේත් ඇගේ දෙතොලතර වූයේ හුරුපුරුදු සැහැල්ලුව ම ය.



Uploaded By Sanda

"මට හිතුණා.."

"ඒක කොහොමද ඔයාට හිතුණෙ..?"

"ඇයි හලෝ අර දකුණු අතේ වෙඩින් රිංග් එකක් දිලිසි දිලිසි තිබුණෙ.."

මානවීගේ සැහැල්ලුව, චේතනාගේ හදවතට එක් කළේ බරකි. බියකි.

"ඒ උනාට නංගි.. ඔයා දන්නෑනෙ.."

චේතනාගේ වදන්, තුළ වූයේ දැඩි අවිනිශ්චිතාර්ථයකි.

"මොනවද අක්කි..???"

"කකුලෙ තුවාලෙ හින්දා.. එයාව අප්පිරියයි කියලා.. එයාගෙ වයිෆ්.. එයාව දාලා ගිහිල්ලලු නංගි.."

මානවී, යන්නට ගිය ගමන නවතා, සසල දෑසින්, සොයුරිය දෙස බැලුවා ය.

"මොකක්ද අක්කි කිව්වෙ..? තුවාලෙ හින්දා.. වයිෆ් එයාව අතෑරලා ගිහින්..???"

චේතනා හිස සැලුවා ය. මානවීගේ හදවතට එකවිට ම පිවිසියේ උග්‍ර කලකිරීමකි.

"මේ මොන වගේ කතාවක්ද? අයියෝ.. එහෙම කරන මිනිස්සුත් ඉන්නවද..? අනේ මං දන්නෑ අක්කි.. මට නම් හිතා ගන්නවත් බෑ.."

මානවී, බාල්දියත්, රෙදි පොදියත් රැගෙන පැළ දොරින් පිටවී වත්ත පහළට ඇවිද ගියේ පෙර කිසිදා නොවූ විරූ තරමේ බරකිනි.

'කකුල විතරක් නෙමෙයි ලොකු හාමුදුරුවන්ට එයාගෙ හිතත් සුවපත් කරන්න වෙයි එහෙනම්..!'





වෙනදා මෙන් පමා නොවී, අත ඉක්මන් කොට, ඈ වතුර බාල්දි කිහිපයක් සිරුරට හලා ගත්තා ය. විගසින් දිය නා ගත් ඈ කිලිටි ඇඳුම් කිහිපය පවා සේදීමට පමා නොවී යළි නිවස වෙත ගියා ය.

"ඔච්චර ඉක්මනට ඔයා නාලත් ආවද නංගි..?"

"රෑට උයන්නත් එපායැ අක්කි.. රෙදි ටික හෝදන්නෙ නැතුව අරන් ආවා.. අර අයියා මොකද කරන්නෙ කියලා බැලුවද අක්කි..?"

"පත්තර බලනවා නංගි.. අනේ පව්.. පීනන්න සල්ලි තිබුණත් මොකද ඔහොම අසනීපයක් හැදිලා තියෙද්දි.. ආව වෙලාවෙ ඉඳන් හතර පස් වතාවක් මං දැක්කා තුවාලෙ වහල තියෙන ගෝස් මාරු කරනවා.. කකුල වහගෙන වගේ.. මං හිතන්නෙ දරුණු විදියට සැරව ගලන තුවාලයක් වගේ තියෙන්නෙ.."

මානවී, බැරෑරුම් ලෙස දෙඋර හැකිළුවා ය. අනේක විධ හැඟීම් සිත තුළ පහළ වුවද, ඒ කිසිවක් ප්‍රකාශ කිරීමට එය අවස්ථාව නොවිණි. කිළිටි ඇඳුම් කිහිපය නිවසේ පිටුපස පිහිටි බරාඳය කොනක වූ බේසමකට දැමූ මානවී හිස පිස දමමින් ම පැළ දොරින් නිවස තුළට ඇතුළු වූවා ය.

ඈ, අවස්ථානුකූලව ක්‍රියා කළා විනා, හැඟීම් දැනීම් සමග ගණුදෙනු කරන්නට උත්සාහ නොකළා ය. ඈ, අත වූ තුවාය තමාගේ කාමරයේ දොර පියන මතින් වනා, මුදා හළ වරලසින් යුතු ව ම ඉදිරි ආලින්දය දෙසට ඇවිද ගියා ය.

ගඟුල්ගේ දෑස පුවත්පත් පිටු අතරේ රැඳී තිබුණද, ඔහුගේ සිත ඒ අකුරු අතරේ නොවූ බව මානවී පැහැදිලිව ම හඳුනා ගත්තා ය. රත්නජීව මිදුලේ වූ මල් ගොමුවේ සක්මන් කරමින් සිටියේ ය. මානවී, දෙදෙනා වෙත ම මෘදු සිනාවක් පෑවා ය.

"අන්කලුත් නාගන්න අන්කල්.. බාත්රූම් එකකුත් තියෙනවා..



Uploaded By Sanda

පිටිපස්සෙ ටැංකියකුත් තියෙනවා.. නැත්තං වත්ත පහළ ළිඳකුත් තියෙනවා.."

රත්නජීව, බයාදු සිනාවක් පෑවේ ය.

"මට තව ඊ වෙලා නාගත්නහැකි පුංචි නෝනා.."

"පුංචි නෝනා..??? මොන පුංචි නෝනෙක්ද..? මේ ගම්වල නෝනලා නෑ අන්කල්.. ගමේ හැමෝ ම මට කතා කරන්නෙ පොඩි දූව කියලා.."

රත්නජීවට සිනාමුසු හඬින් සෘජුව ම පැවසූ මානවී, ගගුල් දෙස බලා යළිත් මෘදු සිනාවක් පෑවා ය.

"ලොකු හාමුදුරුවෝ පන්සලේ වැඩ හිටියොත් සමහර විට තව ටිකකින් පන්සලට යන්න වෙයි අයියව එක්කරගෙන.. ඒ හින්දා අන්කල් නාගෙන එන්න.. ඒ ආවට පස්සෙ අයියට ඇඟ හෝදගන්න පුළුවන්නෙ.."

ඇගේ සොඳුරු අණසක පිරිමින් දෙදෙනාගේ ම හදවතට ගෙන ආවේ සැනසීමකි. ප්‍රතිකාර සඳහා නන්නාඳුනන ගම්මානය තුළ කාලාන්තරයක් නවතින්නට සිදු වුවහොත්, මේ කරුණාවන්ත මිනිසුන් අතරේ සුවසේ ජීවත් වීමට ඉඩකඩ නියත වශයෙන් ම හිමිවන බව ගගුල් විශ්වාස කළේ ය. ආගන්තුකයන් ලෙස තමන් නිවසට පැමිණි මොහොතේ ලද උණුසුම් පිළිගැනීමෙන්, සිත තුළ ලියැලූ විශ්වාසය, ඒ මොහොත් නිවසේ නොළත් නිවසේ අනෙක් සාමාජිකාව වූ මානවී නිවසට පැමිණි මොහොතේ, වඩාත් ස්ථිරසාර වූයේය.

මානවීගේ අනුමානය සත්‍යයක් බවට පත් කරමින්, හෝරා කාලක් පමණ ගත වන විට ගගුල්ගේ පියාගෙන් ගගුල්ගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලැබිණි.

"පුතා.. ඔයා මොකද කරන්නෙ..?"





"මම මේ වොෂ් එකක් දාගන්න ලෑස්ති වෙන්නෙ තාත්තෙ..?"

"පුතේ.. ලොකු හාමුදුරුවෝ වැඩ ඉන්නවා.. උන් වහන්සේ හවස හය හමාරට අල්ලපු ගමක බණකට වඩිනවලු.. ඒ හින්දා පුළුවන් ඉක්මනට ලෑස්තිවෙලා රත්නෙ අන්කල් එක්ක පන්සලට එන්න පුළුවන්ද පුතේ..?"

"එන්නම් තාත්තේ.. පන්සලට එන පාර දන්නෙ නෑනෙ අපි.."

"අපි උදේ ගමේ ඇවිද්දනෙ පුතේ.. රත්නෙ අන්කල් පාර දන්නවා.. පුතා එහෙනම් පරිස්සමට ලෑස්තිවෙලා එන්නකො.. වාහනේ පන්සල කිට්ටුවට ම ආවහැකි.."

"මම එන්නම් තාත්තෙ.."

ගගුල්ගේ මුවින් පිටවූයේ දිගු සුසුමකි. ඔහු, රත්නජීවත්, මානවීත් දෙස බැලුවේ අසරණ දෑසිනි.

"ඇයි අයියෙ..?"

මානවීගේ දෑසේ වූයේ ප්‍රශ්නාර්ථයකි. ගගුල්, පියා ලබා දුන් පණිවුඩය ඈ හමුවේ තැබුවේ ය.

"ඉතින්.. ඇයි අයියා දුකින් ඉන්නෙ.. අපේ ලොකු හාමුදුරුවෝ.. ඔය කකුල සනීප කරයි.."

ගගුල්ගේ දෑසේ වූයේ අවිනිශ්චිතභාවය බිඳක් හෝ බොඳ වූයේ නැත.

"නංගිටත් විශ්වාසද ලොකු හාමුදුරුවෝ මාව සනීප කරයි කියලා..?"

"නංගිටත් කිව්වෙ අයියෙ..? තව කවුද එහෙම කිව්වෙ..?"

"නංගිගෙ තාත්තත් ඔය විදියට ම කිව්වා.."

මානවී මද සිනාවක් පෑවා ය.



Uploaded By Sanda

"ලොකු හාමුදුරුවො වෙදකම් කරනවා මට මතක තියෙන්නෙ අවුරුදු තුනේ හතරෙ ඉඳන් අයියෙ.. අපි දැකලා නෑ කවදාවත්ම ලෙඩෙක් විදියට ආව කෙනෙක් සනීප නොවී ලෙඩෙක් විදියට ම ආපහු යනවා.. ඒකයි ඒ තරම් විශ්වාසයෙන් කියන්නෙ.."

චේතනා ද පැමිණ ආලින්දයට කර පොවා බැලුවා ය.

"අක්කි.. මම ලොකු ඉටි බෑග් එකක් හොයාගෙන එනකල් ඔයා අයියට ටවල් එකකුයි, සරමකුයි, සබන් කෑල්ලකුයි දාන්නකො බාත්රූම් එකට.. මගෙ අල්මාරියෙ වම් පැත්තෙ උඩ ම තට්ටුවෙ ඇති ටවල්ස්.. යට ම තට්ටුවෙ ඇති සරම.."

ගඟුල් යළිත් වතාවක් දෙසොහොයුරියන් දෙස බැලුවේ අසරණ දෑසිනි.

"මගේ ට්‍රැවලින් බෑග් එකේ ඇඳුම් තියෙනවා නංගි.."

ගඟුල්ට දරාගත නොහැකි ම වූයේ මානවීගේ ඒ මෘදු ළබැඳි හසරැල්ල ම ය.

"බෙහෙත් ගන්න කී දවසක් ඉන්න වෙනවද දන්නෙ නෑනෙ අයියෙ.. ඔය සේරම ඇඳුම් ඕන වෙයි.. අක්කි ඇඳුම් දානකල් අපි බාත්රූම් යමුකො.. මම අයියට වාඩිවෙන්න පුටුවකුත් දාලයි ආවෙ.."

ගඟුල්, මානවී වෙත හෙලුවේ අපූර්වතම කෘතවේදී බැල්මකි.

"ගොඩක් අය මෙහෙම ඇවිල්ලා.. බෙහෙත් අරගෙන යනවද නංගි..?"

"ඇයි අයියෙ එහෙම අහන්නෙ..?"

"ලෙඩ්ඩුන්ට සලකලා හොඳ පුරුද්දක් තියෙනවා වගේ.. හැම දේම පිළිවෙළට.. එකක්වත් අමතක නොවී කරන්න බෑ එහෙම පළපුරුද්දක් නැත්නම්.."

"ඕන තරම් අය එනවා අයියෙ.. අපි මෙ ඉස්සරහා කාමරේ



Uploaded By Sanda



හැදුවෙ.. බාත්රූම් හැදුවෙ.. බෙහෙත් ගන්න එන අයට පහසු වෙන්නමයි.. ගොඩක් වෙලාවට අපේ ගෙදර බෙහෙත් ගන්න එන කවුරු හරි නැති දවසක් නැති තරම්.. මේ සතියෙ තමයි කවුරුත් ම නොහිටියෙ.. හරියට ම අයියට ඉඩ වෙන් කරලා තිබ්බා වගේ.."

රත්නජීව මේ සියල්ල අසමින්, නිහඬව ම පසු වූයේ දහසක් දෑ සිත තුළ ම ගොනු කරගනිමිනි. තම හාම්පුතුගේ ලෝකය ම උඩු යටිකුරු කරන දෛවයක් හමුවී ඇතැයි ඔහු තනිව කල්පනා කළේ ය.

කිහිලිකරු යුගළයේ ආධාරයෙන් ගමන් ගන්නා ගඟුල් දෙස මානවී බලා හිටියේ වේදනාවෙන් කකියන දෑසිනි. ඉපදෙන සියලු සත්වයෝ ජරාවට, ව්‍යාධියට පත්වෙති. එය සනාතනික ලෝක ධර්මතාවයකි. එයට පිටුපෑමට උපදිනා සත්වයෝ නොසමත් වෙති. තමාගේ උපකාරය, පිහිට පතා පැමිණි ඔහුට, තම ශක්ති ප්‍රමාණයෙන් උපකාර කරනු, පිළිසරණ වනු විනා ඉන් එහා ගිය යමක් තමාට කළ නොහැකි බව ඈ දැන උන්නා ය. හදිසියේ ම යමක් සිහිවූ ගඟුල්, මානවී දෙස බැලුවේ ය.

"නංගි.. හෙට වැඩට යනවද..?"

මානවී, ගඟුල් දෙස බැලුවේ විස්මයෙන් සිහින් කර ගත් දෑසිනි.

"ඇයි අයියෙ..?"

"න්.. නෑ.. නිකම්.."

මානවී, ගඟුල්ගේ වදන් පිළිගන්නට මැලි වූවා ය.

"නෑ.. නෑ.. නිකම් වෙන්න බෑ.. මොකක් හරි හේතුවක් තියෙන බව තේරෙනවා අයියා ඒක අහපු විදියෙන් ම.."

ගඟුල්, සිනාමුසුව වුවත්, මානවී දෙස බැලුවේ අසරණ දෑසිනි.

"නෑ නංගි.. මට එක පාරට ම හිතුණා නංගි ගෙදර හිටියා නම්.. කොච්චර හොඳද කියලා..?"

මානවී, මොහොතකට තිගැස්සුණා ය. එහෙත්, ඈ ඒ කිසිවක් නොදැනෙන සේ හුරුපුරුදු සැහැල්ලුව මවා ගත්තා ය.

"අපි දුප්පත් මිනිස්සුනෙ අයියෙ.. රස්සාව හරියට නොකළොත් අපිට ජීවත්වෙන්න සල්ලි නෑ.. ඒ හින්දා ඉතින් මම වැඩ කරන්නෙපායැ... හැබැයි හෙට මට වැඩ බැලීමක් තියෙන්නෙ.. මම හෙට දොළහා වෙනකොට ගෙදර එනවා අයියෙ.."

ගඟුල්, රත්නජීව සමඟ නාන කාමරය අසල නතර කළ මානවී, එතැනින් මඳක් ඉවත් වූවා ය. වැට අද්දරට ගිය මානවී, තමාට සොයුරකු බඳු තරුණයාට ඇමතුවා ය.

"චමිර මල්ලී.."

මානවීගේ හඬ ඇසුණු සැණින් ම චමිර නිවසින් පිටතට පැමිණියේ ඇයට ආමන්ත්‍රණය කරගෙන ම ය.

"ඇයි පොඩි අක්කා..?"

"මල්ලි මේ වෙලාවෙ වැඩක්ද..? වැඩක් නැත්නම් මට උදව්වක් කරනවද මල්ලි..?"

"කියන්ට පොඩි අක්කා.. මම නිකම් හිටියෙ.. කම්මැලිකමට ටීවී එක දාගෙන.."

"එහෙනම් අම්මට කියලා.. ඇඳුමක් දාගෙන එන්න මල්ලි අර අයියත් එක්ක පන්සලට ගිහින් එන්න.. එනකොට අපේ ළිඳ ළඟ වැලෙන් බුලත් අතකුත් කඩාගෙන ම එන්න හොඳ ද..?"

"හරි.. මම ටක් ගාලා එන්නම් පොඩි අක්කා.."

පසු කලෙක ගඟුල්ගේ ද ජීවිතයට, තමාගේ ම සොයුරකු මෙන් බද්ධ වූ චමිර, ඔවුන්ගේ කතාවේ නායකයකු බවට පත් වූයේ එයාකාරයෙනි.





චමිර, ගමනට සූදානම්ව පැමිණ මිනිත්තු පහකට පමණ පසු, ගඟුල් ද ගමනට සූදානම් ව ඉදිරි ආලින්දයට පැමිණියේ ය.

"එහෙනම් පරිස්සමට ගිහින් එන්න අයියෙ.. හිතේ විශ්වාසෙ පුරවගෙන ලොකු හාමුදුරුවෝ ඉස්සරහට යන්න.. පොඩ්ඩක්වත් බය වෙන්න එපා.. ලොකු හාමුදුරුවෝ අයියව සනීප කරයි.."

ගඟුල්, මානවී දෙස බැලුවේ ආත්මගත කෘතවේදීත්වයක් දෑස් පුරා ඇඳගෙන ය. රත්නජීවත්, චමිරත් දෙපසින් ගමන් සගයන් බවට පත් වෙද්දී, කිහිලිකරුවල ආධාරයෙන් ප්‍රවේසමට අඩි තබා යන ගඟුල්ගේ පිටුපසින් අඩි තබා, මානවී ද රිය අසල ට ම ඇවිද ගියා ය.

බොහෝ අසීරුවෙන් රියට නැග ගත් ගඟුල්, අසුනේ පසුපසට ඇදී හිඳ ගත්තේ ය. දකින සෑම දසුනකින් ම මානවී හිත පාරවා ගනිමින් සිටියා ය.

"මල්ලී.. ඉස්සරහා සීට් එකට නගින්න.."

එවන් සුව පහසු වාහනයක ජීවිතයට ගමන් කරන නොතිබූ චමිරට, ගඟුල්ගේ ඉල්ලීම පුදුමාකාර ආශ්වාදයක් ගෙන දුන්නේ ය.

"ගිහින් එන්නම් නංගි."

"පරිස්සමට අයියෙ.. පරිස්සමට අන්කල්.."

සෙමින් සෙමින් පසුපසට ඇදී යන රිය දෙස මානවී නිනව්වක් නොමැතිව බලා සිටියා ය.



Uploaded By Sanda

සරණංකර හිමියන්ගේ ගැඹුරු ගම්භීර හඬ පරදවන උන් වහන්සේගේ මහා කාරුණික දෙනෙත යට, ගඟුල්ගේ ආත්මයම ඒකාත්මික වී තිබිණි. එතෙක් කල් අතහැර දමා උන් ජීවන අපේක්ෂාවන් එකින් එක යළි ඔහුගේ හදවතට කාන්දු වෙමින් තිබුණේ අරුමැසි ලෙස ය. හෝමාගම හිඳ ගඟුලැලිතැන්නට පැමිණීමට ගෙවා ආ මග කිලෝ මීටර් දෙසිය ගණනට වඩා ආත්මගත ගමනක්, සංසාරයේ හුරු පුරුදු ගමනක්, තමා පැමිණ ඇතැයි ගඟුල්ට දැනෙමින් තිබිණි.

ආවාස ගෙට යාබද ව පිහිටි වැලි මළුවේ කොනකට වී, ගඟුල් නෙත් නොසලා බලා සිටියේ, තමාගේ විසකුරු ඉරණම පහන් කරන්නට සැරසෙන ජීවකයාණන් දෙස ය. ඒ ඉසිවර දෑත් තමා සුවපත් කරන අන්දම ගඟුල්ගේ දෑස් අද්දර මැවී මැවී පෙනෙන්නට වූයේ ය. සිහිලැති නා සෙවණේ ගෙලමය ආසනයක් මත වැඩ උන් සරණංකර හිමියෝ.. තමා ඉදිරියේ අසුන්ගෙන උන් තම ඥාති සොයුරාත්, වැඩිහිටි අමුත්තෝ දෙසත් බැලුවේ මදක් බැරෑරුම් නෙතිනි. එසේ ම, උන් වහන්සේගේ කාරුණික දෑස, රෝගී තරුණයා වෙත ද ඒ සැණින් ම යොමු විය.

"අපේ හාමුදුරුවනේ.."

සමරසිංහ මහතාගේ බැගෑබර හඬ, සරණංකර හිමියන්ගේ විමසුම් සහගත දෙනෙතු වෙත යොමු විය. ගඟුල්ගේ උපන් වේලාව අනුව කිසියම් ගණනය කිරීමක නිතර වූ උන් වහන්සේ, යළිත් වතාවක් පිය-පුතු දෙදෙනා දෙස පමණක් නොව, වනිගසේකර මහතා දෙස ද බැලුවේ තීරණාත්මක දෑසිනි.

"මට.. මේ දරුවව සුවපත් කරන්න පුළුවන්..!!!"





උන් වන්සේ කිසිදු දෙගිඩියාවකින් තොරව දෙසුවෝ ය. සියුම් ඉදිකටු තුඩු ගොඩක් ඇනුණු කලෙක මෙන් සොම්නස පැමිණ ගඟුල්ගේ හදවතේ ඇනිණි. ඔහුගේ දෑසින් කඳුළු කඩා හැලිණි. සමරසිංහ මහතාගේ ද දෑසේ වූයේ උණු කඳුළු ගංගාවකි. පසෙකට වී උන් රත්නජීවගේ දෑස පවා කඳුළින් තෙමී යමින් තිබිණි. සරණංකර හිමියන්ගේ ඉසිවර දෑත ගැන අතැඹුලක් සේ දැන උන් වනිගසේකර මහතා, මේ සියල්ල දෙස උපේක්ෂා සහගත දෑසින් බලා හිඳියේ ය.

"නමුත්.. මට ඒකට කාලාන්තරයක් උවමනා වෙනවා.."

නාහිමියෝ යළිත් හඬ අවදි කළහ.

"එහෙමයි අපෙ හාමුදුරුවනේ.."

උන් වහන්සේ හොඳින් දෑස හරවා බැලුවේ ගඟුල් දෙස ය.

"අවුරුද්දක් හමාරක්.. ඔය දරුවට මම කියන විදියට පිළිවෙත් පුරන්ට පුළුවන් නම්.. ඔය දරුවට සුවපත් වීමේ භාග්‍යය තියෙනවා.. නගරයේ ජීවත් වෙච්ච.. සැප සම්පත් මැද්දෙ.. සුකුමාර මහේශාක්‍ය ජීවිතයක් ගත කරපු ඔය දරුවට මේ දුෂ්කර ක්‍රියාව කරන්ට පුළුවන් වෙයිද..?"

ගඟුල්, දොහොත් මුදුනේ තබා සරණංකර හිමියන්ට නමස්කාර කළේ ය.

"ඔබ වහන්සේ කියන.. ඕනම දෙයක්.. මම කරන්නම් අපේ හාමුදුරුවනේ.."

සරණංකර හිමියෝ යළිත් මෘදු සිනාවක් පහළ කළෝ ය.

"ජීවිතහරණයට වඩා මේ දුෂ්කර ක්‍රියාව පහසුවක් තමයි දරුවො.."

උන් වහන්සේගේ හදවත තුළ කිසිදු බරක් තිබුණේ නැත. සංසාර ගමන තුළ ඔසවාගෙන යන්නට සුවිශේෂී මලගුවක් නොවූ



Uploaded By Sanda

උන් වහන්සේට සියලු කාරණා අල්ප මාත්‍ර වූ සැහැල්ලු කාරණා ම වූයේ ය.

"අනික ඉතින්.. මේ අපේ මල්ලිගෙ ගෙදර ගත කරන ජීවිතෙත්.. ඔය දරුවට තවත් සැහැල්ලුවක් වෙයි.. කොයි වෙලාවෙත් හිනාවෙවී.. සිංදුවක් කාරිය මුමුණ මුමුණා.. කිරිල්ලියක් වගේ සැහැල්ලුවෙන් ඉන්න ගෑනු දරුවෙකුත් ගෙදර සැරිසරණකොට.. ඔය දරුවට පාළුවක් දැනෙන එකක් නෑ.."

නොසිතූ මොහොතක සරණංකර හිමියන්ගේ මුවින් ගිලිහුණු විවරණය අදහාගත නොහැකිව, පිය - පුතු දෙදෙනාම උණුන් මුහුණ බලා ගත්හ. කිසිදු වගක් නොවූ ලෙස සරණංකර හිමියෝ ගඟුල්ගේ උපන් වෙලාව ලියා ගත් පත් ඉරුවෙහි මදහස ඇඳි මුහුණ රඳවාගෙන උන්හ.

නොබෝ වේලාවකින් උන් වහන්සේ යළිත් හඬ අවදි කළෝ ය.

"පොඩි මල්ලියේ.."

"අපේ හාමුදුරුවනේ.."

වනිගසේකර මහතා වඩාත් බැගෑබරව උන් වහන්සේට සමීප වූයේ ය.

"පොඩි දූවට හෙට නිවාඩුවක් දාගන්ට පුළුවන්ද කියලා අහලා බලමු.."

සරණංකර හිමියන්ගේ කතිකාවත පමණට වඩා දිගු නොවිණි. උන් වහන්සේගේ සාරාංශගත කතිකාවතෙහි නොකියන දීර්ඝ අරුත උන් වහන්සේට සම්මුඛව හිඳින්නන් විසින් වටහා ගත යුතුව තිබිණි.

"හොඳමයි අපෙ හාමුදුරුවනේ.."

වනිගසේකර මහතා නාහිමියන්ගෙන් හරස් පැන විමසන්නට



Uploaded By Sanda



ගියේ නැත. වලංගු හේතු කාරණාවන් නොමැතිව උන් වහන්සේගේ මුවින් කිසිදා හිස් වචන ගිලිහෙන්නේ නැත.

"අද හොඳ දවසක්.. ප්‍රතිකාර පටන් ගන්ට සුබ මුහුර්තයක් තියෙනවා.. මේ බෙහෙත ගැල්ලුවට පස්සෙ හෝරාවකින් හමාරකින් සැරව පිට ගලන්ට පටන් ගනියි.. තුවාලෙ හෝරා කීපයක් එක දිගට සුද්ධ පවිත්‍ර කරන්ට සිද්ධ වෙනවා.. පොඩි දූවට ඇරෙන්ට වෙන කෙනෙකුට ඒ ව්‍යායාමෙ කරන්ට අමාරුයි මහත්තයෝ.."

සරණංකර හිමියෝ සියල්ලන්ගේ ම හදවත් තුළ නළියූ කුකුස් එක ම පිළිතුරකින් පහදා ලූහ. වනිගසේකර මහතාට නම් උන්වහන්සේගේ තෙපුල් හි කිසිදු අරුමයක් දැනුණේ නැත. එහෙත්, පිය-පුතු දෙදෙනා ම පසු වූයේ ඇසෙන, දකින කිසිවක් ම අදහාගත නොහැකි විසල් පුදුමයකිනි.

"පුතේ.. එහෙනම්.. පොඩි දූවට කෝල් එකක් ගන්නකො.."

ගඟුල්.. පියවී ලොවට පැමිණියේ වනිගසේකර මහතාගේ හඬිනි.

"අන්කල්.. මානවීගේ නම්බර් එක කියන්නකො එහෙනම්.."

සන්ධ්‍යාව ප්‍රභාමත් විය. බෝ මළුව දෙසින් නැගෙන සිලි සිලිය මනෝරම්‍ය වූයේ ය. ජීවිතය පෙරළන පිටු සියල්ල අති රමණීය වී ඇතැයි ගඟුල්ගේ තුරුණු හදවතට දැනෙමින් තිබිණි.

"ෆෝන් එක රිං වෙනවා අන්කල්.. අන්කල් කතා කරන්න.."

ගඟුල්, දුරකථනය වනිගසේකර මහතා වෙත දිගු කළේ ය. ඒ වන විටත් තරුණයා කෙරෙහි වනිගසේකර මහතාගේ හදවත තුළ ඉපදී තිබුණේ අපූර්වතම සෙනෙහසකි.

"පුතා කතා කරලා.. අපේ හාමුදුරුවන්ට දෙන්න.. උන් වහන්සේ අවශ්‍ය දේ පොඩි දූවට කියයි.."

පියෙකුට මෙතරම් සැහැල්ලුවේ හැසිරිය හැකි දැයි ඒ මොහොතේ පවා ගගුල් කල්පනා කළේ විමතියෙනි. ගගුල් දුරකතනය කන තබාගෙන උන්නේ චමත්කාරජනක හැඟීම් ගොන්නක් හදවත වසා ඉතිරී පැතිරී යමින් තිබියදී ය.

'මගේ රටට දළදා හිමි සරණයි
මගේ දැයට දළදා හිමි සෙවණයි
සැපතින් සපිරුණු නිවහල් දෙරණයි
උපතින් මා හට මේ හැම උරුමයි

මානවීගේ දුරකථනය නාද වන ගීතයේ පවා තිබුණේ සුබ ප්‍රාර්ථනා අනන්තයකි. ඉසිඹුවෙන් ඉසිඹුවට ගගුල්ගේ හදවත ආනන්දනීය ලොවක අභිෂේක ලබමින් හිඳියේ ය.

නුහුරු නුපුරුදු අංකයක් තිරයේ දක්වමින් තමාගේ දුරකථනය නාද වන මොහොතේ, මානවීගේ දෑස කුහුලින් පිරී ගියත්, මොහොතින් ඈ අනුමානයකට එළඹුණා ය. ඈ, සෙමින් කටහඬ අවදි කළා ය.

"හෙලෝ.."

"නංගි.. මම ගගුල්.."

"මට හිතුණා අයියෙ.."

මානවී, කිසිදු පැකිළීමකින් තොරව ගගුල් ඉදිරියේ විවෘත වූවා ය. කෙතරම් මිහිරි හඬවල් ප්‍රමාණයක් ඊට පෙර දුරකථනය ඔස්සේ සවනට වැටී තිබුණත්, යුවතියකගේ එතරම් පවිත්‍ර, නිර්මල, නිර්ව්‍යාජ හඬක් ඔහු කිසිදා අත් විඳ තිබුණේ නැත. දහසක් පහන් හැඟුම් විත් හදවතට ගොඩ වැදුණද, ඒ, හැඟීම්වලට ඉඩ දිය හැකි මොහොතක් නොවූයෙන් ඔහු ආයාස දරා වචන ගළපා ගත්තේ ය.

"නංගි.. ලොකු හාමුදුරුවන්ට නංගිත් එක්ක කතා කරන්න ඕනලු.."





කිසිවක් අරබයා අනන්තයට කල්පනා කරමින් හිඳිමින් කාලය මරා දැමීම මානවීගේ සිරිත නොවිණි. ඈ හැම මොහොතක ම අවශ්‍ය දෑ වෙනුවෙන් ක්‍රියාත්මක වූ යුවතියකි.

"ඇයි දන්නෙ නෑ අයියෙ.. එහෙනම් ෆෝන් එක ලොකු හාමුදුරුවන්ට දෙන්නකො අයියෙ.."

වනිගසේකර මහතා, ගගුල් අත වූ දුරකථනය රැගෙන සරණංකර හිමියන් වෙත දෝතින් ම පෑවේ ය.

"පොඩි දුව.."

"අපේ හාමුදුරුවනේ.."

"මම නිරන්තරේ කියලා ඇත්තෙ ඔය දරුවට.. ඔය අත් දෙක ගිලානෝපස්ථානයට කැපවෙච්ච දෑතක් කියලයි.."

"එහෙමයි අපේ හාමුදුරුවනේ.."

"හැබැයි දරුවො.. මේ වතාවෙ පැවරෙන්න ටිකක් බාරදූර වගකීමක්.."

"ගිලානෝපස්ථානය කියන්නෙ.. සංසාර ගමන පුරා ම මට සොබා දහමින් පැවරුණු වගකීමක් කියලා ඔබ වහන්සේ මට පහදලා කියලා තියෙනවනේ.. ඕනෑම මොහොතක ඔබ වහන්සේ පවරන වගකීමක් ඉෂ්ට කරන්න මම බැඳිලා ඉන්නවා අපේ හාමුදුරුවනේ.."

සරණංකර හිමියෝ යුවතියට සිදුවිය යුත්ත පිළිබඳව පහදාලූහ.

"අපේ හාමුදුරුවනේ.. එහෙම නම් මම නිවාඩු ඉල්ලුම් පත්‍රයක් උදේම බස් එකේ යන කෙනෙක් අතේ දිසාපතිතුමාට යවන්නම්.. මගේ නිවාඩුව නම් එහෙම දාගන්නහැකි.. ඒත්.. අපේ හාමුදුරුවන්ට රත්මල්දූවෙ බණකට වඩින්න තියෙනවා කිව්වා නේද අද..?"



Uploaded By Sanda

"මේ දරුවගෙ වෙලාවෙ යහපත් පිහිටීම කියන්නෙ.. දැන් බස් එකේ සුමේධ වැඩියා දරුවො.."

"ඇත්තද අපේ හාමුදුරුවනේ.. එහෙනම් ඒක ගඟුල් අයියගෙ හොඳ වෙලාව ම තමයි.. නැත්නම් අද පොඩි හාමුදුරුවො වඩින දවසක් නෙමෙයිනෙ.. අපේ හාමුදුරුවනේ.. මම දැන් මොකක්ද කරන්න ඕන ඊළඟට..?"

"තියෙන වැඩක් පොලක් අහවර කරලා.. පොඩි දුව තව ටිකකින් පන්සලට එන්ටකෝ.."

"හොඳමයි අපේ හාමුදුරුවනේ.. මම එන්නම් තව ටිකකින්.."

සරණංකර හිමියන්ගෙන් සමුගැනීමට අවසර පැතූ මානවී, ගෙම්දුලෙන් නිවසට වැදී සොයුරියගේ කාමරයට කර පොවා බැලුවා ය.

"මොකක්ද අක්කි වෙලා තියෙන්නෙ.. කොච්චර කිව්වත් අවේලාවෙ නිදියන්න එපා කියලා.. ඔයාට අහන්න ම බෑ නේද..?"

"අනේ කම්මැලියි නංගි.."

චේතනා පුරුදු ලෙස ම මැසිවිලි නැගුවා ය. මානවී, සොයුරිය දෙස බැලුවේ තියුණු නෙතිනි.

"මෙච්චර මේ ගෙදර වැඩ ගොඩක් තියෙන වෙලාවෙත් ඔයාට කම්මැලියි..??? මේ.. මේ... ඔය බඩේ ඉන්න දරුවත් අලි ශරීර හොරෙක් නොකර නැගිටින්න.. ගිහින් අන්න අර වතුසුද්ද ගහෙන් මල් ටිකක් කඩන්න පන්සලට ගිහිල්ලා එන්න.."

"පන්සලට.. දැන්..???"

චේතනා, යහන මත හිඳ ගත්තේ අලස ලෙසිනි. එහෙත්, ඇයට නැගණියගේ අණට කීකරු වීමට සිදුවී තිබිණි. නැගණියගේ සෙනේවන්ත අණකිරීම්වලට පිටුපෑමට ඇයට කිසිදු ශක්තියක් තිබුණේ නැත.





"ඔව්.. දැන් තමයි.. යන්න ඉතින්.. ගිහිල්ලා මල් ටිකක් කඩාගෙන ඇවිත් ඇඟ හෝදගෙන ඇඳුමක් දාගන්න.. මම මේ ගේ පොඩ්ඩක් අතු ගාලා දානකල්.."

මානවී, නිතඹ දක්වා දිගු, කැරලි ගැසුණු කේශ කලාපය එක් කොට, ලොකු කටුවක් ගසාගත්තා ය. පිට පුරා විසිරී යන ස්වභාවිකව කැරලි ගැසුණු කාල වර්ණ කේශ කලාපයේ වන සොඳුරු බව, කිසිදා නගරයේ රූපලාවණ්‍යාගාරයකදී රැළි ගසන කේශ කලාපයකට කාන්දු කළ නොහැකි වග ඇ දැන සිටියා ය. කැඩපත ඉදිරියේ හිඳ තමාගේ ම පිළිබිඹුව නරඹන මානවීගේ හදවතෙහි ජනිත වී තිබුණේ පෙර කිසිදා නොදැනුණු අන්දමේ, පහදා ගත නොහැකි සියුම් සතුටකි. ඇ තමාගේ කේශ කලාපය, දෙබැම, දෙතොල, ජවි වර්ණය ආදිය ජීවිතයේ පළමු වතාවට පරීක්ෂාකාරීව නිරීක්ෂණය කළා ය.

"බලන් ගියාම.. මාත් ටිකක් ලස්සන ගෑනු ළමයෙක් තමයි.."

හදවතින් තමාට ම මුමුණා ගත් මොහොතේ, ඇගේ ඇතුළු හදවත නුහුරු කිතියකින් හිරි වැටී ගියේ ය. වෙනදා නොවන නැගණියගේ ප්‍රමාදය චේතනාගේ කුහුලට හේතු විය. චේතනා, නැගණියගේ කාමරයේ දොර තිරයෙන් එබී බැලුවා ය. සොයුරියගේ අහඹු ළදරු හැසිරීම ළඟ චේතනාගේ මුවට සිනාවක් නැගුණේ ඉබේට ම ය.

"වෙනදට විනාඩියට ලෑස්ති වෙන ළමයා.. අද මොකෝ මේ කිරිල්ලි වගේ හැඩවෙන්නෙ.. අර කොල්ලට පේන්න වෙන්නැති.."

මානවී, සොයුරිය දෙසට හැරී, එතෙක් උන් සැහැල්ලුවෙන් ම දෙතොල නොපිට පෙරළුවා ය. ඇගේ දෑසේ ලියැවී තිබුණේ පුදුමාකාර චණ්ඩිකමකි.

"පිස්සුද හලෝ.. මට ඔය කසාද බැඳපු මිනිස්සු ඕන නෑ.. මං වෙනුවෙන් ඉපදිච්ච කොල්ලෙක් මේ ලෝකෙ නෑ කියලද ඔයා කියන්නෙ..?"



Uploaded By Sanda

මානවීගේ පිළිතුර එකවිට ම චේතනාගේ මුව ගොළු කොට දැමුව ද, ගගුල් සිහිවන විට ඇගේ ළය තුළ ඉපදුණේ අපූර්වතම සෝයුරු බැඳීමකි. ඒ ලබැඳි හැඟීමට චේතනා දිග දුර නොසිතා ලෝබ වූවා ය.

"බලමුකො.. බලමුකො.. කසාද බැඳපු බවක්වත් ඒ කොල්ලගෙ පේන්න නෑ.. ඒ විතරක් නෙමෙයි.. ඔයා ඒ බව කාටවත් කියන්න යන්නත් එපා.. කවුද දන්නෙ.. අනාගතේ මොනවා වෙන්න තියෙනවද කියලා.."

මානවී, දෑස් විදා සොයුරිය දෙස බැලුවා ය. ඒ මොහොතේ නම් මානවීගේ දෑසේ වූයේ පැහැදිලි ම දෙගිඩියාව මුසු වූ ප්‍රශ්නාර්ථයකි.

"ඔයාට ඇත්තට ම පිස්සුද අක්කි.. මේ ඒ මිනිස්සු ගෙට ගොඩ උනා විතරයි හීනෙන් කතන්දර ගොතන්නෙ.. අහිංසකයි වගේ හිටියට මොන ලෝකෝත්තරයෙක් ද කවුද දන්නෙ..? එයාගෙ චරිත ලක්ෂණ කොහොම උනත්.. කසාද බැඳපු මිනිහෙක් නම්.. මට ඕනම නෑ අක්කි.."

මානවී, කැඩපත ඉදිරියෙන් මෑත් වී, සොයුරිය ඉදිරියට ආවා ය.

"අපි කොච්චර පුරාජේරු කියෙව්වත්.. මේ ලෝකෙ හැම මනුස්සයෙකුට ම දෛවයක් කියලා එකක් තියෙනවා නංගි.. ඒ දෛවයට පිටුපාන්න අපි කාටවත් බෑ.."

සන්තානගත කුමක්දෝ මුරණ්ඩුකමක් අවදි වී මානවීගේ හදවත ගලක් කොට තිබිණි.

"අනේ පිස්සු නොකියවා මෙන්න මෙහෙ එන්න අක්කි.. ලොකු හාමුදුරුවො බලාගෙන ඇති.. යමු.. පරක්කු වෙනවා.."

මානවී, නිවසේ ආලින්දයේ විවෘතව තිබුණු ඉතිරි කවුළු පියන්පත් දෙක ද වසා දැමුවා ය.



Uploaded By Sanda



"මතක තියාගන්න අක්කි.. මල් උයනක් මැද්දෙ ජීවත් වෙන මට.. අනුන්ගෙ වතුවල පිපිච්ච මල්වලින් ඇති වැඩක් නෑ.. අනික.. මේ පුංචි සුදු මලක් මිසක්.. උඩවැඩියා, කානේෂන් වගේ මල් අපේ ලෝකෙට වැඩකුත් නෑ.."

මොහොතක් සොයුරිය දෙස බිරාන්තව මෙන් බලා උන් චේතනාගේ මුවගින් ඊළඟ මොහොතකදී පිට පැන්නේ උස් සිනාවකි.

"ඔන්න ඔය බක පණ්ඩිතකම හින්දා තමයි අද තව වෙනකල් මෙයාට කොල්ලෙක්වත් නැත්තෙ.. ඕනවට වඩා සීරියස් වෙන්නෙ නැතුව ඉන්නවා නංගි.. වෙන දෙයක් වෙන හැටියකට වෙයි.."

නිවසේ ඉදිරිපස දොරගුළු ලෑ මානවී, සොයුරිය වෙත හැරී බැලුවේ තියුණු නෙතිනි.

"අක්කි මේ.. මම නොකිව්වයි කියන්නෙපා.. මේ කොහේදෝ ඉඳලා ආව මිනිස්සුන්ට ගානට වඩා ළෙන්ගතුකම් පෙන්නන්න ගිහිල්ලා මගෙ නම එහෙම කැත වෙන වැඩ කරන්නෑ හොඳේ.. ඊට පස්සෙ ඒ මිනිස්සු හිතයි ගෙදරට ආව කොල්ලගෙ කරේ එල්ලෙන්න හදන මහ වනචර කෙල්ලො කියලා අපිත්.. ආවෙ බෙහෙත් ගන්නනෙ.. ලොකු හාමුදුරුවො කියන විදියකට සලකලා ආපහු යවනවා මිසක්.. ගානට වඩා ඇයි හොඳයිකම් ඕන නෑ.. ඔයාගෙ කටට ඉතින් බ්‍රේක් නැනෙ.. ඒකයි මම දැන්මම මේ සේරම කියලා ඉවර කළේ.."

එවන් මොහොතක නැගණිය සමග වාද කරන්නට යාම තරම් මෝඩකමක් තවත් නොවන බව චේතනා වටහා ගත්තා ය. ඈ, මල් වට්ටිය ද අතැතිව ඉදිරියට ගමන් කළේ පොළොවට සිනාසෙමිනි.

"ඒ ගමන මොකද හිනාවෙන්නෙ..?"

"බලමුකො.. බලමුකො.. ඉස්සෙල්ලා යංකො ලොකු සාදු මොනවද කියන්නෙ කියලා අහගෙන එන්න.."

"මොනවද ඉතින්.. වෙනදා වගේ ම බේත් හේත් ටික දෙන හැටියි, සාත්තු සප්පායම් ටික කරන හැටියි කියලා දෙයි.."

චේතනා යළිත් අති මහත් සැහැල්ලුවක හිඳ හිනැහුණා ය.

"වෙනදා වගේ නෙමෙයි මේ සැරේ.. කුරුම්බැට්ටි, කුරුම්බා, ගොන් නැඹිලි, කුරුවල්, කොට්ට පොල් වගේද මේ රන් නැඹිලි ගෙඩිය.. ඒකට ටිකක් වැඩිපුර සලකන්න ම වෙයි.."

මානවී, ඉදිරියට තබන පියවර පවා නවතා, සොයුරිය දෙස සසල නෙතින් බැලුවා ය. සොයුරියගේ නිමා නොදකින සරදම් බස් හමුවේ සැබැවින් ම ඈ නුහුරු ම හැඟීම් සමුදායකින් කම්පනයකට ලක්වෙමින් සිටියා ය.

"අනේ මේ.. ඒ නැඹිලි ගෙඩිය ගැන එහෙනම් ලොකු හාමුදුරුවො ම බලා ගත්තදෙන්.. මෙන්න මෙහෙ එනවා ටිකක් පය ඉක්මන් කරලා.. මෙතන නැති මගුල් දොඩව දොඩවා ඉන්නෙ නැතුව.."

චේතනා, යළිත් හිනැහෙන්නට වූවා ය. එවර නම් මානවී සැබැවින් ම කෝපයට පත් වූවාය.

"මොකක්ද අක්කි ඔයාට මේ වෙලා තියෙන්නෙ..? ඒ ගමන ආයෙත් හිනාවෙනවා.. කවුද කින්ද මන්ද මේ මොකුත් නොදැන ගෙදරට ගොඩ උන මේ කසාදත් බැඳපු අනුන්ගෙ මනුස්සයෙක් ගැන එක එක ඒවා ගැන කතා කරන්න ඇත්තට ම ඔයාට ලැජ්ජා නැද්ද..? ඔයාට පිස්සුද..?"

මානවී සැබැවින් ම කෝපයට පත්වී සිටියත්, චේතනා සොයුරියගේ කෝපය මායිම් කළේ ම නැත.





"කවුරු උනත් අනුන්ගෙ වෙන්නෙ.. ඒ කෙනා තමන්ගෙ කියලා අපේ හිතට දැනෙන්න පටන් ගන්නකල් විතරයි නංගි.."

කිසිම දිනෙක ගැඹුරු හැඟීම් සමග ගනුදෙනු නොකළ තම සොයුරිය තෙපළන වදන් හමුවේ මානවී ඒ මොහොතේ නම් නැති ගත්තා ය.

"අක්කි.. මට නම් පුදුමයි ඔයා මේ කියන ඒවා ගැන.. මට තේරෙන්නෙ නෑ.. ඔයා මේ මොනවා කියනවද කියලත්..?"

චේතනා, සියලු සැහැල්ලුකම් අමතක කොට.. ඒ මොහොතේ සැබෑ හදවතට අනුගත වූවා ය. ඈ, තම නැගණියගේ වමත තද කොට අල්ලා ගත්තා ය.

"නංගි.. ඒ ළමයා ලෙඩෙක්.. අද ඉඳන් එයාව බලාගන්න වෙන්නෙ ඔයාට.. මට.. තාත්තට.. ඒ කියන්නෙ අපිට.. කන්න බොන්න හදලා දීලා.. බෙහෙත් දීලා.. රෙදි ටික හෝදලා දීලා.. කැත කුණු අත ගාලා.. ඒ ළමයගෙ හැමදේම අපේ අතින් ඉෂ්ට වෙනකොට.. දවස් දෙක තුනක් යද්දි.. නිකම්ම එයා අපේ කෙනෙක් වෙනවා නංගි.. ඔයාට.. මට.. ඕන උනත් ඒක වළක්වන්න අපි කාටවත් බෑ.. ඒ බැඳීම එහෙම ඇති වෙනකොට.. එයා කසාද බැඳලද.. ලිහලද.. ඒවා වැදගත් නෑ නංගි.."

මානවීගේ හදවත.. වේගයෙන් ගැහෙන්නට වූයේ ය. ඈ, තර කොට තමාගේ සොයුරියගේ සුරත අල්ලා ගත්තා ය.

"බැඳීම.. ඇති කරගන්නවා කියන්නෙ ම මහ දුකක් අක්කි.. ඔයා ඔය කියන දේවල් ඇහුණ ම මට බය හිතෙනවා අක්කි.."

ගඟුලැලිනැන්න සොඳුරු ම ගම්මානයේ ආරක්ෂක පවුර ලෙසින් ගම්මානය වට කොට ගත් නීල වර්ණ මීකැටියාමාන කඳු වළල්ල තේජස්වී දෑසින් බලා සිටියේ ය. බැලූ නෙත් මානයක් පැතිරුණු නිල්ල ගැසූ වෙල් යාය පිස හමා ආවේ සීතල පිනි මුසු පවන් රැල්ලකි. කිරි වෙහෙර ආරණ්‍ය සේනාසනයේ චෛත්‍ය



Uploaded By Sanda

රාජයාණන්ගේ කොත් කැරැල්ල තුරු ලතා සමූහයා මැදින් යාන්තමින් දැස් මානයේ ලැගුම් ගත්තේ ය.

"මෙච්චර වෙලා විහිළු කළාට.. මටත් බය හිතුණා නංගි.. මම නම් කසාද බැඳලා දරුවෙක් ඉන්න අම්මා කෙනෙක්.. ඒත් ඔයා.. කවදා හරි කසාදයක් බැඳලා මේ ගෙදරින් යන්න ඉන්න ගෑනු ළමයෙක්.. පිරිමි ළමයෙක් ඇවිත් ගෙදර නවතිනවා කියන්නෙ.. ඇත්තට ම ලොකු ප්‍රශ්නයක් නංගි.. ඒක ඔයාගෙ අනාගතේට මොන විදියෙ ප්‍රශ්නයක් විදියට බලපායිද කියන්න අපි දන්නෙ නැනෙ නංගි.."

කෙතරම් රෝගීහු ප්‍රමාණයක්, තම නිවසට පැමිණ, නවාතැන් ගෙන හිඳ, තමන්ගෙන් ඇප උපස්ථාන ලබා පිටව් ගොස් තිබුණද, මෙවර තරම් ඇගේ සිත සසල වූ අවස්ථාවක් අතීතයේ දී හමු නොවිණි. සිත තුළ වන අසීමිත සසල බව සඟවා ගෙන ඈ තම සොයුරිය ඉදිරියේ වදන් ගළපා ගත්තා ය.

"අක්කි.. ඔය මොනවා උනත්.. ලොකු හාමුදුරුවො ළඟට ගියා ම නම් ඔය කිසි ම දෙයක් හිතන්නෙපා.. අපි හිතන ඒවා දිවැසින් පේනවා වගේ ලොකු හාමුදුරුවන්ට දැනෙනවා අක්කි.."

මානවී, සැබැවින් ම බිය ගෙන තිබුණා ය. අනෙතාරක් නොමැතිව විවාහ යෝජනා ගලා ආවද, කිසිදු සාධාරණ හේතුවකින් තොරව සැමදා ම ව්‍යර්ථ වී යන මංගල යෝජනාවන් පිළිබඳ කෙසේ වෙතත් තමාගේ ආත්ම ගරුත්වය පිළිබඳව ඇගේ සිතට ඒ මොහොතේ දැනුණේ විසල් බියකි. කතාවෙන් කතාව දෙසෝයුරියෝ පුදබිම වෙත සමීප ව උන්හ.

"පන්සල ළඟටම ආවා නංගි.. අපි ඔය කතා සේරම නවත්තමු.. අපි කියන කරන හිතන දේ කෙසේ වෙතත්.. ඔයා කරන කියන හිතන දේවල් සේරම ලොකු හාමුදුරුවන්ට දැනෙනවා.."

චේතනා කෙටියෙන් කීවේ සංසාරගත සබැඳියාවක සැඟවුණු කතාවකි. සියල්ල සිහිම පසෙකට කල් තැබූ සෝයුරියෝ, සෙමෙන්





පිය තබා වැලි මළුව දිගේ ආවාස ගෙය දෙසට ඇවිද ගියෝ ය. ආවාසගෙයි ඉදිරිපස අංගනයෙහි පිරිස රැඳී උන්හ. සියල්ලෝ ම එකම බැල්මකට හසු කර ගත් මානවී මඳ සිනාවක් නගා ගත්තා ය. ඒ මඳ හිනාවෙන් ම පිරිස පසු කරගෙන ඉදිරියට ගිය මානවී, ගෙලමය ආසනය මත වැඩ උන් නාහිමියන්ගේ පාමුල පසඟ පිහිටුවා වැන්දා ය. චේතනා මදක් නැමී උන් වහන්සේට නමස්කාර කළා ය.

"සුවපත් වේවා..!!!"

ආශිංසනයට වූයේ වචන දෙකක් පමණක් වුවත්, ඒවායේ වන ආධ්‍යාත්මික සහනය, මානවීට පමණක් නොව ගඟුල්ට, සමරසිංහ මහතාට පවා දැනුණේ අතීතයේ කිසිදු දිනයක නොවූ තරමේ ගැඹුරකිනි. ගෙවී යමින් තිබුණු කාලය අමිල බැවින් සරණංකර හිමියෝ කල් වේලා නොගෙන කාරණයට ප්‍රවිශ්ට වූවෝ ය.

"පොඩි දුව.. වන්දනාමාන කරලා එනවද..?"

මානවී, මදහසක් මුව'ග නවරාගෙන, එකත්පස්ව හිඳ ගත්තා ය.

"පස්සෙ පුළුවන් අපේ හාමුදුරුවනේ.."

සරණංකර හිමියන් හා මානවී අතර ඇති වූයේ කෙටි සංවාදයක් ය. එහෙත්, ඒ කෙටි වචන තුළ වූයේ ගැඹුරු අවබෝධයකි. අන් සියල්ලන්ට ම වඩා පහසුවෙන් ගඟුල් ඒ සත්‍යය අවබෝධ කර ගත්තේ ය. ඔහුගේ දෑස් සෘජුව ම යුවතියත්, සරණංකර හිමියනුත් වෙත යොමු වී තිබුණේ අදහාගත නොහැකි විමතියකිනි.

තම පියාගේ මිතුරු මහාචාර්යවරයා ජීවක පරපුරේ නාහිමියන් පිළිබඳ ආරංචිය රැගෙන ආවේ අහඹු මොහොතක ය. තම පියා, තමාගේ අතීත සේවකයකු වූ වනිගසේකර මහතාගේ තොරතුරු සොයාගත්තේ ද අසීරුවෙනි. එසේ සොයා ගත් හෝඩුවාවන්



Uploaded By Sanda

ඔස්සේ පියා සමග තමන් සුවය සොයා මේ ගමන පැමිණියේ ද දැඩි දුෂ්කරතා මධ්‍යයේ ය.

එහෙත්.. සියල්ල අවසානයේ.. සිදුවෙමින් පවතින දෑ විස්මයටත් වඩා ළඟ ආශ්චර්යයට යැයි ගඟුල් තනිව සිතුවේ ය. ඔහු, පැමිණි ලොවට වඩා සපැමිණි ලොව විචිත්‍රවත් වූයේ ය.

සරණංකර හිමියන්ගේ ඉසිවර හඬ ගඟුල්ගේ දැහැන් බින්දේ ය. තමාටත්, නාහිමියන්ටත් මැදින් හිඳ, සෙල් පිළිමයක් සේ නිසසලව නාහිමියන් සමග දොඩන යුවතිය දෙස ගඟුල් බලා සිටියේ විමතියෙන් හයා ගත් නෙතිනි.

"පොඩි දුව... හෙට නිවාඩුවක් දාගන්ට පුළුවන් කියල විශ්වාසද..?"

"ඔෆිස් එකට යවන්න ලියුම් වගයක් තියෙනවා අපේ හාමුදුරුවනේ.. ඒ ටිකත් එක්ක ම ලීව් ෆෝම් එක හත හමාරෙ බස් එකේ යවනවා.. චාමලීට කෝල් කරලා කියනවා ලීව් ෆෝම් එක සර්ගෙන් අත්සන් කරවලා අපර්ණා මිස්ගෙ අතට ම දෙන්න කියලා.."

"බොහොම හොඳයි.. කොයි දේත් අන්න එහෙම පිළිවෙලකට කරනකොට ගැටලු අඩුයි.."

හිස සලමින් එසේ කියූ උන් වහන්සේ, හිස ඔසවා බැලුවේ මානවී දෙස නොව චේතනා දෙස ය. උන්වහන්සේගේ වදන් තුළ සැඟවුණු ගැඹුර හඳුනා ගත් චේතනා අපහසුවෙන් බිම බලා ගත්තා ය. අගක් මුලක් නොදන්නා කතාවක, අතරින් පතර ඇසෙන කුඩා දෙබසක අරුත වටහා ගත නොහැකිව, ගඟුල් පමණක් නොව සමරසිංහ මහතා පවා පසු වූයේ අන්දමන්දව ය.

"ප්‍රතිකාර ටික කෙරෙන විදිය මම පොඩි දුවට පැහැදිලි කරලා දෙන්නම්.. ඔය දරුවා බෝ මළුව පැත්තට ගිහින් ටිකක් නිස්කාංසුවේ ඉඳලා එන්ටකො.. ලොකු දුව.. මේ මහත්තුරුත් එක්ක ගිහින් වන්දනාමාන කරගන්ටකො අප්පච්චියි නංගියි එනකල්.."





උන් වහන්සේ නොකියා කීවේ කුමක්දැයි සියල්ලෝ ම වටහා ගත්තෝ ය. සරණංකර හිමියන්ට උවමනා වී තිබුණේ, රෝගියා මග හැර, රෝගියාගේ උපස්ථායකයන් දැනුවත් කිරීමට ය. සමරසිංහ පිය - පුතු දෙපළගේ හදවත් තුළ වූයේ නොසැහෙන කැළඹිල්ලකි.

"ඔය දරුවට රෝද පුටුවෙන් ම බෝමළුවට යන්ට පුළුවන්.. මේ පියගැට පෙළ නගින්ට උවමනා නෑ.. ආවාස ගේ පිටිපස්සෙන් බෝමළුවට පාරක් තියෙනවා.."

රියදුරු රත්නජීවත්, සමරසිංහ මහතාත් ගඟුල් යළි රෝද පුටුව මතින් හිඳුවා ගත්තෝ ය. චේතනා ඉස්සර වූවා ය.

"යමු මල්ලි.. යමු අන්කල්.."

බෝමළුවට පිවිසෙන තෙක් ම සිව්දෙනා අතර පැවතියේ ගන නිහැඬියාවකි. ආරණ්‍ය සේනාසනයේ වූ දැඩි නිහැඬියාවට, ඒ මුනිවත එක් වූ කල එතැන නිර්මාණය වී තිබුණේ දැඩි නිශ්චලභාවයකි. ගඟුල්, චේතනා දෙස බැලුවේ අසරණ දෑසිනි.

"අක්කෙ.. ලොකු හාමුදුරුවො.. නංගියි, අන්කලුයි තියාගෙන.. අපිව මෙහෙට එව්වෙ ඇයි..?"

චේතනාගේ ළය තුළ ද වූයේ තිගැස්මකි. එහෙත්, ඒ බවක් ඈ පිටතට ඇඟවීමෙන් වැළකී සිටියා ය.

"මල්ලිගෙ තුවාලෙට බෙහෙත් කරන්න වෙන්නෙ නංගිටයි තාත්තටයිනෙ.. ඉතින්.. අපි ඉස්සරහා කියන්න ඕන නැති.. නංගියි තාත්තයි විතරක් දැනගත්ත ම ඇති.. මොනවා හරි කියන්න වෙන්න ඇති.. ඒකයි අපිට යන්න කිව්වෙ.."

චේතනා කියද්දී, ගඟුලල්ටත් වඩා බියපත් වූයේ සමරසිංහ මහතා ය.

"අපිට නොකියන්න ඕන දෙයක්...? මොකක්හරි බරපතල දෙයක්ද දන්නෙ නෑ දුව..?"



Uploaded By Sanda

චේතනාගේ දෑසේ වූයේ හිස්බවක් වුවත්, ඈ ස්ථිරසාර ලෙස හිස දෙපසට සැලුවා ය.

"කොච්චර බරපතල දෙයක් උනත්.. මල්ලිව සනීප කරන්න පුළුවන් හින්දනෙ ලොකු හාමුදුරුවො මල්ලිව බෙහෙත් කරන්න බාර ගත්තෙ.. හැබැයි.. එක දෙයක් තියෙනවා අංකල්.. ලොකු හාමුදුරුවො කියනවට වඩා ඇහිපිල්ලමක්වත් ගහන්න ලෙඩෙකුට අවසර නෑ.. කියන දේ අහන්නෙ නැති හිතුවක්කාර ලෙඩ්ඩුන්ට නම් හාමුදුරුවන්ගෙන් කිසිම සමාවක් නෑ. හාමුදුරුවො කියන දේ ඒ විදියට ම පිළිපැද්දෙ නැත්නම් ලොකු හාමුදුරුවො ඒ ලෙඩාට බෙහෙත් කරන්නෙ නෑ ඊට පස්සෙ.."

බෝමළුව තුළ වන සංවාදය එසේ ඉදිරියට ඇදෙද්දී, සරණංකර හිමියෝ මානවීත්, සමරසිංහ මහතාත් එක ම රේඛාවක ඇඳුණු බැල්මකට හසු කර ගත්තේ අතිශය තීරණාත්මක ලෙසිනි.

"ඇයි අපේ හාමුදුරුවනේ.. මොකක්වත් ප්‍රශ්නයක්ද..?"

නාහිමියෝ යළිත් වතාවක් පියාත්, දියණියත් දෙස එක එල්ලේ බැලුවෝ ය.

"මෙක.. පිළිකාවක් ගානට ඔඩු දුවපු වනයක් පොඩි මල්ලි.. කාරණේ බොහොම බරපතලයි.. රෝගියාගේ තත්වය අසාධ්‍යයි.."

"අනේ දෙයියනේ..!!!"

වනිගසේකර මහතාගේ මුවින් පිටවූයේ ඊට පෙර කිසිදා නොනික්මුණු අන්දමේ ශෝකී රාවයකි. මානවීගේ සුරත පපුවට ගියේ ඉබේට ම ය.

"අපේ හාමුදුරුවනේ.. ඒ කියන්නෙ.. මේ තුවාලෙ සනීප කරන්න බැරි වෙයිද..?"

සරණංකර හිමියන්ගේ ගති ස්වභාවයන් හොඳින් හඳුනන මානවී, කල් වේලා නොගෙන, විමසිය යුත්ත විමසුවා ය.





"පුළුවන් වෙයි.. ඒත් පොඩි දුව.. අපට මේ රෝගියා වෙනුවෙන් නොසෑහෙන්ට මහන්සි වෙන්ට වෙනවා.. පුළුවන්ද ඒ කැපකිරීම කරන්ට..?"

ආගන්තුක අසරණයකු වෙනුවෙන් උපන් කඳුළකින් මානවීගේ දෑස තෙත් වී තිබිණි.

"අපි ළඟට පිළිසරණ පතාගෙන කවුරු හරි එවන්නෙ.. ඒ පිළිසරණ අපි ලබා දෙන්ට ම ඕන හින්දමයි කියලා ඔබ වහන්සේ මට කියලා තියෙනවා.."

සරණංකර හිමියෝ මඳ සිනා නැගුවෝ ය. රෝගියා සුවපත් කිරීමට උන් වහන්සේ තුළ වූ අධිෂ්ඨානයට මානවී නිල් දියවර වත් කළා ය.

"අවුරුද්දක් හමාරක් රෝගියෙක් වෙනුවෙන් පේ වෙනවා කියන්නෙ ලේසි පාසු දුෂ්කර ක්‍රියාවක් නෙමෙයි දරුවො.. ඒ වගේ ම ලේසි පාසු පුණ්‍ය සම්භාරයකුත් නෙමෙයි.."

"එහෙමයි අපේ හාමුදුරුවනේ.."

"මේ ඖෂධ සමහරක් අපේ ඔසු වනයෙ ඇත්තෙත් නෑ.. ඔසු උවමනා වෙන වෙලාවට කවුරු හරි නිල්ගල යවන්ටත් වෙයි පොඩි මල්ලියේ.."

සරණංකර හිමියන්ගේ මුහුණින් ප්‍රකට වූයේ දැඩි කල්පනාකාරී බවකි. සැතපුම් දහයක් දොළහක් දුර ගෙවා ඔසු සොයා වන වැදීම කිසිසේත් ම පහසු කාර්යයක් නොවේ.

"අපේ හාමුදුරුවනේ.. අපි අර මාටින් අයියව ඒ රාජකාරියට කතා කර ගම්මු.. මාටින් අයියා වගේ ඖෂධ පැළෑටි අඳුනන මනුස්සයෙක් මේ පැත්ත පළාතකවත් නෑ.. ලොකු මහත්තයට කියලා ඒ වෙනුවෙන් ගෙවීමක් සූදානම් කර ගම්මු අපේ හාමුදුරුවනේ.."



Uploaded By Sanda

"ඒක බොහොම හොඳයි.. එදා වෙල සරි කර ගන්ට.. ඒ දරු පවුල් රැකෙන්ටත් ක්‍රමයක් පිළිවෙළ වෙන්ට එපායැ.. එහෙම පිරිසිදුවට පැහැදිලිව යමක් ඉෂ්ට වෙනකොට කාට උනත් තමන්ගෙ යුතුකම් වගකීම් කොටස පැහැර හරින්ට බෑ නොවැ.. සමරසිංහ මහත්තයලාට කාසි බාගෙ හිඟයක් නැති එකේ.. මේ දුගී මිනිස්සුන්ට ඒකත් ලොකු පිළිසරණක් වෙයි මයෙ හිතේ.."

"එහෙමයි අපේ හාමුදුරුවනේ.."

සරණංකර හිමියන්ගේ මුවෙහි බොහෝ වේලාවකට පසු සැහැල්ලු මඳ සිනාවක් නැඟිණි. මානවීත්, වනිගසේකර මහතාත් දෙදෙනා ම උන් වහන්සේ දෙස බැලුවේ කුහුල් නෙතිනි.

"පොඩි දුවට.. තවත් බත් මුට්ටියක් උයලා නම් තියන්ට වෙයි.."

හැට හැත්තෑ වියේ පසු වුවත්, මාටින්ට නැඹිලි දෙකක පමණ බත්, වේලකට උවමනා වග නොදැන සිටියකු සිටියේ නැත. මානවී, සොඳුරු හසරැල්ලක් පෑවා ය.

"ඒක නම් මොකක්ද අපේ හාමුදුරුවනේ.. හාල් හුණ්ඩු දෙකක් වැඩිපුර ලිපේ තියන්නම්කො මම.."

මොහොතකට පසු සරණංකර හිමියෝ යළිත් මානවීත්, සමරසිංහ මහතාත් දෙස බැලුවේ ගැඹුරු ප්‍රශ්නාර්ථයකිනි.

"මට මේ තුවාලෙ හරියාකාරව පරීක්ෂා කරගන්ට නම් මේ පිරිලා තියෙන සැරව ගොඩ අහක් කරගන්ට උවමනායි පොඩි දුව.. අද රෑට බෙහෙතක් ගැල්ලුවොත් සැරව පිටට ගලන්ට පටන් ගන්නවා.. පැය තුන හතරක් එක දිගට සැරව පිටට ගලයි.. ඒ පිටට ගලන සැරව ටික මඳ උණුසුම් ජලයෙන් සෝදලා ශුද්ධ පවිත්‍ර කරන්ට ඕන.. පුළුවන්ද පොඩි දුව..?"

මානවී, හැමදාමත් පුරුදු මඳ සිනාව නැඟුවා ය.

"ඔබ වහන්සේ කියන විදියකට කරන්නම් අපේ හාමුදුරුවනේ.."





නාහිමියෝ හිස ඉහළ පහළ සැලූහ. වනිගසේකර මහතා දෙස වරක් බැලූ සරණංකර හිමියෝ මානවී දෙස බැලුවේ තීරණාත්මක දෑසිනි.

"පොඩි දුව.. මේ ලෝකෙට බිහිවෙන ලක්ෂ සංඛ්‍යාත මිනිස්සු අතරින් ඉසිවර දෑත්.. ඉසිවර හදවත් පහළ වෙන්නෙ අතැඟිලි ගාණක් මිනිස්සුන්ට විතරයි.. සුමේධටවත්, සෝභිතටවත් මේ වෙදකම පිහිටන්නෙ නෑ.. ජන්ම පත්‍රවල ඒවා ඒ විදිහට ම සඳහන් වෙලා තියෙනවා.. ඒත් පොඩි දුවගෙ ජන්ම පත්‍රයෙ මහා වෙද පරපුරක ආරම්භය සටහන් වෙලා තියෙනවා.. ඒ දේ සිද්ධ වෙන්ට තව කාලාන්තරයක් ගත වෙන්ට පුළුවන්.. ඒ උනත් මාත් එක්ක ම මේ උතුම් ශාස්ත්‍රයට වැළලිලා යන්ට දෙන්ට එපා දරුවො.. ඉවර තියෙන වෙලාවට ඇවිදින් මගෙන් මේ ශාස්ත්‍රය පුළුවන් තාක් දුරකට දැනගන්ට දරුවො.."

සරණංකර හිමියෝ මානවී හමුවේ එදිනත් ඉදිරිපත් කළේ බොහෝ කලෙක හිඳ ඈ හමුවේ කරන ලද ආයාචනයකි. එතුවක් නම්‍යශීලී නොවූ මානවීගේ හදවත, එදින කුමක්දෝ කරුණක් අරබයා සසල වී තිබිණි.

"ඔබ වහන්සේට හොඳට ම විශ්වාසද අපේ හාමුදුරුවනේ මට වෙදකම පිහිටනවා කියලා.. මගෙ හිතේ මහා දෙගිඩියාවක් තියෙන්නෙ මට හෙදකම මිස වෙදකම ඔබින්නෙ නෑ කියලා.. ඒකයි මං මේ තරම් කාලයක් ඔබ වහන්සේගේ ඉල්ලීම ගැන ඒ තරම් එකඟතාවයක් නොපෙන්නුවේ.."

සරණංකර හිමියෝ සුපුරුදු නිවී ගිය මඳ සිනාව ම නැගුවෝ ය.

"ඔය දරුවගෙ වේල පත්කඩේ ම මං කී වතාවක් බලලා තියෙනවද දරුවෝ..???"

මානවී, එපමණකින් නිහඬ වූවා ය. ඒ නිහඬතාවය, එකඟතාවය ම බව සරණංකර හිමියෝ දැන සිටියහ.



Uploaded By Sanda

"හොඳයි.. එහෙනම් අපි මේ රෝගියාගෙන් ම පටන් ගමු. අවුරුද්දක් හමාරක් කියන්නෙ බොහොම දිග කාලයක්.. පොඩි දුවට මේ වෙදකමේ දිග පළල ගැඹුර මැන ගන්ට ඒක හොඳ කාලයක්.."

සරණංකර හිමියෝ ඒ මොහොතේ එයාකාරයෙන් මානවීට නියත විවරණ දුන්හ. ඈ, පසඟ පිහිටුවා යළිත් වතාවක් වැඳ වැටුණා ය.

"සුවපත් වේවා..!!!"

සරණංකර හිමියන්ගේ ශාන්ත දාන්ත උවන පුරා පැතිර තිබුණේ අපූර්වතම සංහිඳියාවක සෙවණැලි ය. වයස හැත්තෑ ගණන්වල වුවත්, බුලත් විටක් පවා නොසපන උන් වහන්සේට තිබුණේ මුතු දසන් දෙපළකි. දැකුමට පවා ප්‍රසන්න උන් වහන්සේගේ ආරෝහ පරිණාහ දේහය තුළ වූයේ අදහාගත නොහැකි සන්සුන් බවකි.

"උපාසක උන්නැහේ.."

සරණංකර හිමියන්ගේ කාරුණික හඬ.. මදක් උස්ව නැඟුණේ සෙනසුනේ ආවතේවකරු වූ මුදියන්සේ වෙත ය. අසූ පස් වියැති මුදියන්සේ පවා පමණටත් වඩා නිරෝගී සුව අත් විඳින්නෙකු වූයේ ය.

"අපේ හාමුදුරුවනේ.."

උස්, සිහින් සිරුර මදකට නමා මුදියන්සේ විත් නාහිමියෝ ඉදිරියේ එකත්පස් ව සිට ගත්තේ ය.

"අර මහත්තුරුන්ට මෙහෙට එන්ට කියමු බලන්ට.."

"එහෙයි අපෙ හාමුදුරුවනේ.."

හිරු මළගම් යමින් තිබුණු අහසේ සඳු එබිකම් කරමින් හිඳියේ ය. සරණංකර හිමියෝ මානවීත්, ඇගේ පියාත් වෙත පවරා දෙමින් සිටියේ නවන් ජීවිතයක සමස්ත වගකීම ය.



Uploaded By Sanda



යළි ආවාස භූමියට පැමිණි ගඟුල් ඇතුළු පිරිස නාහිමි පා වන්දනා කළෝය. උන් වහන්සේගේ නිවුණු දෑස් අතරේ ගඟුල් ද නිවීම දුටුවේ ය. සුවපත් බව තරම් නිර්වාණයක් ලෞකික ජීවිතය තුළ නොවන බව ගඟුල් ඒ වන විටත් අදහන්නට ගෙන සිටියේ ය. නාහිමියන් පැවරූ කිසියම් කටයුත්තක් සඳහා, චමිර ඒ වන විටත් පූජා භූමියෙන් බැහැර ගොස් සිටියේ ය.

රෝගයෙන් අත් මිදීම සඳහා පිරිය යුතු පිළිවෙත් මාලාව සරණංකර හිමියන් විසින් ම ගඟුල්ට පහදා දෙන ලදී. ගඟුල් ඒ සියල්ලට අනුකූලතාවය දැක්වූයේ විශ්වාස කළ නොහැකි තරමේ ගෞරව බහුමානයකිනි. ගඟුල්ගේ කීකරුකම ඉදිරියේ සරණංකර හිමියන් පවා පළ කළේ පුදුමයකි.

"මේ දරුවා.. මේ තරම් ඉවසීමෙන් මම දෙන උපදෙස් පිළිගන්ට සූදානම් වෙයි කියලා.. මමත් මුලින් නම් හිතුවෙ නෑ.. කොළඹ දිහාවෙ ඉඳන් ඔනෑ තරම් රෝගියො මා ගාවට ඇවිත් තියෙනවා.. ඒත් දරුවො.. තමන්ට සුව වීමේ උවමනාව නැති.. ඒ වෙනුවෙන් කැප වෙන්ට බැරි බොහෝමයක් උදවිය හිස් අතින් ම ආපහු හැරිලත් ගියා.. මේක දුෂ්කර ක්‍රියාවක්.. ලේසියෙන් කෙනෙකුට මේ පිළිවෙත් පුරන්ට බෑ දරුවො.."

සරණංකර හිමියන්ගේ හඬෙහි තිබුණේ පැහැදිලිව ම අවවාදයකි. ගඟුල්ගේ අසරණ දෑස සරණංකර හිමියන්ගේ ඉසිවර දෑස වෙත යොමු වී තිබුණි.

"මේ අසනීපෙ හින්දා.. මට තවත් නැති වෙන්න දෙයක් ඉතිරි

වෙලා නෑ අපේ හාමුදුරුවනේ.. මගේ තාත්තයි, මගේ ජීවිතෙයි ඇරෙන්න මට වෙන නැතිවෙන්න දෙයක් තව ඇත්තෙත් නෑ.. මම කැමති උනත් නැතත්.. මට පුළුවන් උනත්.. බැරි උනත්.. මේ වෙලාවෙ මම ඔබ වහන්සේ කියන දේ අහනවා ඇර වෙන කිසිම පිළිසරණක් නෑ අපේ හාමුදුරුවනේ.. මේ මොහොතෙ ඉඳන් මගෙ ජීවිතේ ඔබ වහන්සේ කියන දේ ම තමයි.."

"සමහර දේවල් මුලදී මුලදී කටුක විදියට දැනෙයි.. ඒත් හිත ඒ කටුකත්වයට පුරුදු වෙනකොට.. ඒක ම සුවයක් විදියට දැනෙන්න ගන්නවා දරුවෝ.. දොම්නසක්, දෙගිඩියාවක් හිතේ තියාගන්ට එපා.. අපි සුවපත් වෙන්ට බලමු.."

පිය - පුතු දෙදෙනා ම නාහිමිපාණන්ට දොහොත් මුදුන් දී වැන්දෝ ය. තවත් මිනිත්තු දහයකට පමණ පසු පිරිස සේනාසන භූමියෙන් පිටවන්නට සරණංකර හිමියන්ගෙන් අවසර පැතූහ.

පුරා හඳ සමීපව සිටියේ පසළොස්වකට ය. පිරිස සේනාසන භූමියෙන් පිටතට පැමිණියේ නිහඬව ම ය. සියල්ලෝ ම එකිනෙකාගේ ලෝක තුළ තනි වී, තම තමාගේ සිතිවිලි සමඟ දොඩමලු වූවා විනා, පොදු වචන ඔවුනට බෙහෙවින් දුරස් විය.

ආරණ්‍ය සේනාසනයේ පිවිසුම් මාර්ගයේ පසෙක ගගුල්ගේ මෝටර් රථය නවතා තිබිණි. සමරසිංහ මහතාත්, වනිගසේකර මහතාත්, රත්නජීවත් එකතු වී ගගුල් රියට නංවා ගැනීමට ආධාර කළෝ ය.

"පුතේ.. ඔය දෙන්නා ජීප් එකේ එන්න.. මම අප්පච්චිච එක්ක එන්නම්.."

මානවී, වහා හඬ අවදි කොට, සමරසිංහ මහතාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා ය.

"නෑ අන්කල්.. මේ කළුවරේ මේ නුපුරුදු පාරවල්වල අන්කල්ට පයින් යන්න බෑ.. අපි ආව විදියට ම යමු.. අන්කල් නගින්නකො.."





"ජීප් එකේ ඉඩ තියෙනවනෙ පුතේ.."

සමරසිංහ මහතාගේ ස්වරය පමණටත් වඩා ආචාරශීලී සේ ම ආදරණීය විය. ගගුල්, මේ සියලු දෑ දෙස බලා සිටියේ සිහිනයෙන් මෙනි. තුරු ලතා අතරින් පෙරී එන සඳ එළිය, මානවීගේ උවන මත ඇතිරී මවා තිබුණේ සොඳුරු ම සිතුවමකි. චන්ද්‍ර කාන්තිය මධ්‍යයේ ඈ සියල්ලන්ගේ ම ලෝකයේ සෞම්‍ය සඳ එළිය වන්නට විවරණ ලබමින් උන්නා ය.

"එහෙනම්.. මෙන්න මේ කම්මැලියව වාහනේ දාගෙන යන්න.. මමයි, තාත්තයි පයින් එන්නම් අන්කල්.. මෙයා තමයි අඩි දෙකක් පයින් යන්න කැමති නැති කම්මැලි අලියා.. අන්කල්ලා වටේ පාර දිගේ එනකොට තාත්තටයි, මටයි මේ වෙල මැද්දෙ පාරෙන් ගෙදරට යන්නත් පුළුවන්.."

මානවීගේ මේ අපූරු ඇවතුම් පැවතුම් සේ ම සැහැල්ලුව ද පිය - පුතු දෙදෙනාට පමණක් නොව රත්නජීවට පවා ගෙන ආවේ පුදුමයකි. ගගුල්, මද සිනා ඇතිව පිරිස දෙස බලා උන්නත්.. ඔහු සිටියේ නොදන්නා දෙවියක් ළයට තුරුළු කරගෙන, සිහිනයක පාවෙමිනි.

"අනේ නංගි.. මට විතරක් බෑ.. ඔයත් යං.."

චේතනා කන්කෙඳිරි ගාන්නට වූවා ය.

"මෝඩි.. එතකොට අපේ තාත්තා තනියම ද ගෙදර එන්නෙ..? නගිනවා ගිහින් කෝලං නැතුව.. මම තාත්තා එක්ක එන්නම්.."

මානවී, තරවටු කළා ය. අක්කා නගාවරුන්ගේ රහස් කන්මන්ත්‍රණය සියල්ලන්ට ම එක් කළේ කුතුහලයකි.

"ඇයි දුව.. අක්කි මොනවද කියන්නෙ..?"

මානවී, සමරසිංහ මහතා වෙත පැවේ ළෙන්ගතු හසරැල්ලකි.



Uploaded By Sanda

"මෙයා මේ හෝඩියෙ පන්තියෙ ළමයෙක් වගේ ලැජ්ජාවෙ ඇඹරෙන්න හදනවා අන්කල්.. මං කිව්වා බොරු කෝලං නැතුව ගිහිල්ලා වාහනේට නගින්න කියලා.."

සමරසිංහ මහතාගේ දෙතොලතර යළිත් ඇඳුණේ අපූර්වතම සැහැල්ලු හසරැල්ලකි.

"ලොකු දුව නගින්නකො.. අපි දන්නවා දැන් නංගි කීයටවත් මේ කළුවරේ මාවයි, තාත්තවයි පයින් යවලා නංගි මේ වාහනේට නගින්නෙ නෑ කියලා.. අපි යමු.. දුව ඉස්සරහින් නගින්න.. මම මල්ලි ළඟින් වාඩිවෙන්නම්.."

සිනාසී හිස සැලූ මානවී, රියදුරු රත්නජීව වෙත හැරුණා ය. සමරසිංහ මහතා තමා කෙතරම් තත්වාකාරයෙන් වටහා ගත්තේ ද යන්න මානවීගේ නිබඳ සොම්නසට හේතු වී තිබිණි. ඈ, රත්නජීවට ඇමතුවේ හදවතේ උපන් ඒ සොම්නස උවන පුරා ම තවරා ගෙන ය.

"අන්කල්.. එහෙනම් පරිස්සමට යන්න.. හිමින් ම යන්න.. මේ වෙලාවට හරියට ඉත්තෑවො පාර හරහා පනිනවා.."

මේ සියල්ල ඇසෙන මුත්, නැසූ කන්ව ගිදින්නට ගගුල් හිත යටින් යුද වැදී සිටියේ, අසීරුවෙන් හෝ හිත අල්ලා තබා ගත යුතු වූ බැවිනි. මේ සොඳුරුකම් කිසිවක් තමාගේ ලෝකයට හිමි නොමැති වග ඔහු දැන සිටියේ ය.

'මම කසාද බැඳපු මිනිහෙක්.. මගේ ගෑනි මාව දාලා ගියාට මම කසාද බැඳපු මිනිහෙක්.. මේ කෙල්ලගෙ හොඳ ගතිගුණ.. හැසිරීම දැකලා.. එක මොහොතකටවත් මේ කෙල්ල ගැන ලෝබකමක් දැනුණොත්.. මට යන්න අපායක් නැතිවෙයි.. මේ කරලා තියෙන පව් හොඳටෝම ඇති.. තවත් නම් පව් කරගන්න බෑ.. මේ තරම් විඳවන්න..'

හෝරා තුන හතරක කාලයක් තුළ, මානවී කෙරෙන් පතළ වූ





මෘදු ගුණාංග හමුවේ, ගගුල්ගේ හදවත සසල වී තිබිණි. එහෙත්, ඒ සසල බව ඔහුගේ හදවත බෙහෙවින් ම බියට පත් කොට තිබිණි.

"චිකේ පුතේ.. මට නම් මේ තුවාලෙ පිරිසිදු කරන්න බෑ.. අපෝ මේ තුවාලෙ ගඳ..!!! ඔයා අර රත්නජීවට හරි සිසිරට හරි කතා කරගෙන මේ තුවාලෙ සැරව ටික අයින් කරවාගන්න.. මට නම් බෑ.. මේ ගඳට මට වමනෙට එනවා.."

ඒ.. අතීත දවසකි. ඒ වචන.. ඔහුගේ ම ආදරණීය අම්මාගේ ය. වාවා ගත නොහැකි වේදනාවකින් ගගුල්ගේ ළය කැකෑරී යන්නට වූයේ ය. සැබැවින් ම ඔහුට ඒ මොහොතේ හැඬුම් ආවේ ය. ගසට පොත්ත මෙන් බද්ධ වී පසුගිය වසර පහළොවක කාලයක් මුළුල්ලේ ම ගගුල් සමඟ ගැවසුණේ ඔහුගේ පියා පමණි. අතිශය සෙල්ලක්කාර ජීවිතයක් ගත කරන තම මව වන් ගැහැනියක තමාගේ බෝසත් පියාට කුමට ලැබුණේදැයි ඔහු අනන්ත වර කල්පනා කර තිබිණි.

සඳඑළිය මැද කණාමැදිරි එළි අපූරු සිතුවම් මවමින් සිටියෝ ය. රත්නජීව රිය ඉදිරියට ධාවනය කළේ පමණටත් වඩා මන්දගාමීව ය.

"අන්කල්.. ඔච්චර හෙමින් යන්නෙ ඇයි..?"

චේතනා, කෙළිලොල් යුවතියක සේ විමසුවා ය. රියදුරු රත්නජීවගේ දෑසේ වූයේ පවිත්‍ර - පීතෘ සෙනෙහසකි.

"කුසේ දරුවෙක් තියාගෙන ඉන්න අම්මා කෙනෙක්නෙ මේ එක්කන් යන්නෙ.. කෙටි දුර උනාට මම මේ යන්නෙ නොදන්න පාරකනෙ දුවේ.. දුවගෙ නංගි දෙතුන් පාරක් ම පරිස්සමට යන්න කියපු එකේ.. තව වැඩිපුර පරිස්සමට යන්න එපායැ දුවේ.."

රත්නජීවගේ වදන් හමුවේ චේතනාගේ ළයට දැනුණේ සියුම් ආඩම්බරයකි. යහපත් සොයුරියකගේ සොයුරිය වීම තුළ ඒ දැනුණු හැඟීම සුවිශේෂී විය.



Uploaded By Sanda

ඇසෙන, දකින, හැඟෙන.. සියල්ල තුළ.. ගගුල් අත් දුටුවේ ම අතීතයේ හිඳ එන වේදනාව ය. තම මවගේ නොසලකා හැරීම පමණක් නොව බිරිඳගේ කෘරතම පිටුපෑම ද වරින් වර සිහිවෙමින් ඒ මොහොතේ ඔහුට වද දෙන්නට වූයේ ය.

"ගගුල්.. මට නම් බෑ.. මේ කාමරේ තවත් ඉන්න.. වෙලාවකට මුළු කාමරේ ම ගඳයි.. මේ බෙඩ් එක පළාතට එන්න බෑ ගඳ.. කොහොමද මම තවත් නහය තියාගෙන මේකෙ ඉන්නෙ..? ඔයාට නහයක් නැද්ද..?"

චාරිකා ගුගුරන්නට වූවා ය. තමාගේ සමස්ත ජීවිතය සුන්නද්දූලි කළ රෝගය හේතුවෙන්, ජීවිතයේ පළමු වතාවට ගගුල් පොඩි දරුවෙකු සේ ඉකි බිඳ හැඬුවේ එදින ය.

"තාරි.. මට නහයක් තිබුණට.. මේ කකුල මගේ ශරීරෙ කොටසක්.. හැමෝම ගඳයි ගඳයි කිව්වට මම මේ කකුල ගලවලා විසි කරන්නද..? කරුමෙට ම හැදුන ලෙඩක් මිසක්.. මම උවමනාවෙන් කරගත්ත දෙයක් නෙමෙ මේ.. මාලනී මේ ෂෙඩ් ෂීට් හැමදා ම මාරු කරනවා.."

තාරිකා, තම සැමියාට සිනාසුණේ අවඥාවෙනි. වසර දෙකක් පුරා තමා පෙම් කළ, හතර වරිගයක නෑදෑ සනුහරේක ආශිර්වාද මැද පතිනිය බවට පත් කර ගත් ගැහැනිය තුළ එවන් විසකුරු ගැහැනියක් සැඟවී සිටියේ ඇයිදැයි එදින ගගුල් පළමු වතාවට පුදුමයෙන් කල්පනා කළේ ය.

"ගගුල් ඔයාට ඇස් නැති උනාට.. වැඩකාරියොත් ඕවා කරන්නෙ නහයවල් අකුළගෙන තමයි.. මං දන්න තරමින් නම්.. අර නාකි රත්නජීව විතරයි අකමැත්තක් නැතුව ඔයාගෙ පස්සෙන් වැටිලා ඉන්නෙ.."

තාරිකාගේ වදනක්, වදනක් ගානේම වූ කෝපය සහ තමා කෙරෙහි ජනිත වී තිබුණු අප්‍රසන්න බව ගගුල් හොඳින් ම වටහා ගත්තේ ය. ඔහු, පළමු සේ ම අවසාන වතාවට අසරණ දෑසින් තම බිරිඳ දෙස බැලුවේ ය.





"තාරි... කියන්න.. මොනවද දැන් මම කරන්න ඕන..?"

"මට මේ රූම් එකේ තවත් ඉන්න බෑ.. ඇත්තටම මට අප්පිරියයි.. ප්ලීස්.. මට වෙන රූම් එකක් ඇරෙන්ජ් කරලා දෙන්න.."

ගගුල්, පමා නොවී හිස සැලුවේ ය. මොහොතක, දෙකක පමාවෙන්, ඔහු යහන අද්දර වූ අභ්‍යන්තර දුරකථනය සුරතට ගත්තේ, ගැහෙන ඇඟිලිවලිනි.

"මාලනී ආන්ටි.."

"පොඩි සර්..?"

"පොඩි මැඩම්ට අර අප්ස්ටෙයා එක කෙළවරේ දකුණු පැත්තෙ තියෙන ලොකු කාමරේ ලෑස්ති කරලා දෙන්න.. ඒකෙ මැඩම්ට අවහිරයක් වෙන බඩු මොනවා හරි තියෙනවා නම් සිසිරත් එක්ක එකතු වෙලා එතන තියෙන පොඩි කාමරේට දාන්න.. තාත්තට කියලා.. ඔෆිස් එකෙන් දෙතුන් දෙනෙක් ගෙන්නලා.. මැඩම්ගෙ අල්මාරිය ඒ කාමරේට දම්මලා දෙන්න.."

"ස්.. ස..ර්..???"

"කිව්ව දේ කරන්න ආන්ටි.."

එතෙකින්.. බොහෝ දෑ නිමා විය. පළමුව.. වසර දෙකක් පුරා ආදරයෙන් යහන බෙදා ගත් කාමරය හැර දමා ගිය ඈ.. තවත් මාස කිහිපයකින්.. නිවස ද.. ඉනුත් මාස කිහිපයකින් මුළුමනින් ම ඔහු වද අතැර දමා තවත් පිරිමියෙකුගේ තුරුළකට ද යන්නට ගියා ය.

හිඳින්නේ කොතැනද නොදැන, ගගුල්ට හැඬිණි. පුතු සමග එක්වී වසර ගණනාවක් වැළපුණු සමරසිංහ මහතාට, තවත් වැළපෙන්නට තරම් සිතක් ඉතිරිව තිබුණේ නැත.

"පුතේ.. අතීතයෙ කිමිදි කිමිදි දුක හොයන්නෙපා පුතේ.. අපිට දැන් අලුත් බලාපොරොත්තුවක් හම්බවෙලා තියෙනවා.."



Uploaded By Sanda

"ඒක මහා පුදුම දුකක් තාත්තෙ.. කසාද ගෑනි කියන්නෙ කොහොම උනත් පිටස්තර ගෑනියෙක්.. එයා මාව අතෑරලා දාපු එක ගැන එදා දුක් උනාට.. අද මම දුක්වෙන්නෙ නෑ.. ඒත්.. මගෙ ම අම්මත්.. මාව අතෑරියා තාත්තෙ.. මගෙ ම අම්මත් මාව පිළිකුල් කළා.."

චේතනා, පිය - පුතු දෙබස අසා සිටියේ විස්මයෙන් හයා ගත් සවනිනි. එහෙත්.. ගගුල් නොදුටු ආලෝකය සමරසිංහ මහතා ඊට හෝරාවකට පමණ පෙර දැක තිබිණි.

"ලේ නෑකම තියෙන.. අම්මා ඔයාව අතෑරියා.. ඇත්ත පුතේ.. නීතියෙන් නෑකම හදාගත්ත.. වයිෆ්.. ඔයාව අතෑරියා.. ඒකත් ඇත්ත පුතේ.. ඒත්.. මීට ටිකකට කලින්.. තවත් ගෑනු ළමයෙක්.. කිසිම නෑකමක් නැතුව, මගෙ පුතා සුවපත් කරන්න.. ලොකු හාමුදුරුවන්ට උදව් කරන්න.. පුංචි ම වෙනස්කමක්වත් නැතුව.. පොරොන්දු උනා නේද පුතේ.. ඉතින්.. මේකත් ඇත්ත.. එතකොට.. අපි දැන් මොකටද දුක් වෙන්නෙ..? පුතේ.. අපි ඔය කාරණාවලින් දැන් කෝකටද පුතේ දුක්වෙන ඕන..???"

දෙකම්මුල් දිගේ ගිලිහී වැටෙන කඳුළු දෙපේළිය පිස දමා ගැනීමට හෝ ගගුල්ට ඒ මොහොතේ උවමනා නොවිණි. ඔහුට දැනෙමින් තිබුණේ ජීවිත කාලය තුළ කිසිදු දිනයක අත් නොවිඳි තරමේ විසල් ආත්මානුකම්පාවකි.

චේතනාට තවදුරටත් නිහඬව බලා හිඳිය නොහැකි විය. ඈ අපහසුවෙන් සිරුර මදක් හරවා, ගගුල් දෙස බැලුවා ය.

"ඔහොම දුක් වෙන්නෙපා මල්ලි.. සනීප කරන්න බැරි ලෙඩෙක් කවදාවත් ලොකු හාමුදුරුවො බාර ගන්නෙ නෑ.. සනීප කරන්න අමාරුයි කියලා කිව්වා නමයි.. ඒත්.. කොහොම හරි සනීප කරන්න පුළුවන් හින්දනෙ මල්ලි ලොකු හාමුදුරුවො මල්ලිට මෙහෙ නතර වෙන්න කිව්වෙ.. මේ අද ම බෙහෙත් කරන්න පටන් ගන්නවා කිව්වෙ.. ලොකු හාමුදුරුවො බෙහෙත් කරයි.. නංගියි, තාත්තයි





මල්ලිව බලාගනියි.. මේ වෙලාවෙ හැමදේටම වඩා උවමනා කරන්නෙ හිතේ විශ්වාසය.. ඒ ඉවසීම නැත්නම් ලොකු හාමුදුරුවො කියන දේවල් පිළිපදින්න අමාරුයි මල්ලි.."

චේතනා, වචන ගළපා ගත්තේ දැඩි සංයමයකිනි. බොහෝ වේලාවකට පසු ගගුල්, පිටත්ලෙන් දෑස හා දෙකම්මුල් පිස දමා ගත්තේ ය.

"නංගිටයි, තාත්තටයි විතරක් නෙමෙයි.. ඔයාටත් මං හින්දා කරදර වෙන්නෙ වෙයි අක්කෙ.. ඔයාලා හැමෝම පව්.. අපි ආව එක දවසට ම පේනවනෙ ඔයාලට මොන තරම් කරදරද කියලා.."

ගගුල්ගේ හඬෙහි වූයේ පැහැදිලි පසුතැවීමකි. චේතනා, යළිත් පිටුපසට හැරී ගගුල් පමණක් නොව සමරසිංහ මහතා වෙත ද මෘදු හිනාවක් පෑවා ය.

"ලෙඩක් දුකක් වෙලා අසරණ වෙච්ච කෙනෙකුට පිහිටක් වෙන එක අපි කවදාවත් කරදරයක් කියලා හිතන්නෙ නෑ.. මල්ලිට දවස් දෙකක් තුනක් යද්දි මගෙ නංගියි, තාත්තයි මොන වගේද කියලා තේරෙයි.. ඒ දෙන්නා හරි කරුණාවන්තයි මල්ලි.. ඔයා පොඩ්ඩක්වත් බයවෙන්න එපා.. ඒ දෙන්නා ගොඩක් ආදරෙන් ඔයාව බලාගනියි මල්ලි.."

චේතනාගේ හඬ ස්ථිරසාර විය. සමරසිංහ මහතා චේතනා දෙස බැලුවේ අතිශය ළෙන්ගතු හදවතිනි.

"නංගියි තාත්තයි විතරක් නෙමෙයි.. ඔයත් මොන තරම් හොඳද දුව..? මල්ලි හින්දා ඔයාටත් කරදර වෙයිද මන්දා.."

චේතනා, එවර පෑවේ මලානික සිනාවකි. පියා හා නැගණිය ඇසුරේ ගෙවන සුව පහසු ජීවිතයෙන් මිදෙන්නට සිදුවීම පමණක් ඇගේ හදවත රිදවා තිබිණි.

"මට ඉන්න වෙන්නෙ නෑ අන්කල්.. ලොකු හාමුදුරුවො



Uploaded By Sanda

කිව්වා මට ආපහු මහත්තයාගේ ගෙදර යන්න කියලා.. තුවාලෙ විෂබීජ දරුවට හොඳ නැතිවෙයි කියලා.."

ඇසුණු දෙයින් ක්ෂණිකව කම්පනයට ලක් වුණු පිය - පුතු දෙදෙනා ම උනුන් මුහුණ බලාගත්තේ පශ්චාත්තාපයෙනි.

"අයියෝ දුවේ.. හරි අපරාධයක්නෙ ඒක.. අපි ආව එකෙන් දුවට නිදහසේ පාඩුවේ ඉන්නත් නැතුව ගියා නේද..? මට හරිම වේදනාවක් දැනුණා ඒක ඇහුවම.. අපි මොකද මේ ප්‍රශ්නෙට කරන්නෙ දුව..?"

චේතනාට යළිත් මෘදු සිනාවක් නැගිණි. සුඛෝපභෝගී මෝටර් රථය කුඩා බොරළු පාර දිගේ ඉදිරියට ඇදුණේ කිසිදු හඬක් නොනගා, බෙහෙවින් මන්දගාමී වේගයකිනි.

"අන්කල්වත්, මල්ලිවත් මොනවත් ම හිතන්න එපා.. ලොකු හාමුදුරුවො දෙයක් කිව්වොත් අපි ඒ විදියටම අහනවා අන්කල්.. ඒක අපි පුංචි කාලෙ ඉඳලම පුරුදු උන විදිය.. ලොකු හාමුදුරුවො දෙයක් කියල ඒක පිළිපැද්දෙ නැත්නම්.. වැරදිච්ච තැන් ගොඩක් තියෙන අය අපේ ගම්වල ඉන්නවා අන්කල්.. ඒ හින්දා අපි නම් ලොකු හාමුදුරුවො කියන දේවල් ඒ විදියට ම අහනවා.."

චේතනාගේ හඬ බිඳී යමින් තිබිණි.

'එකම එක වතාවයි ලොකු හාමුදුරුවො කිව්ව දේ ඇහුවෙ නැත්තෙ.. ඒ වතාවෙ ජීවිතේ හරිගස්සන්න බැරි තරමට ම වැරදුණා මල්ලි' ඒ සිතිවිලි ඈ සිතින් සිතුවා පමණි. වචන බවට හැරවිය නොහැකි තදබල ආත්මානුකම්පාවකින් චේතනාගේ ළය දැවෙන්නට විය.

"ඒක හරි අක්කෙ.. ඔයාට මෙහෙන් යන්න කිව්වා කිව්ව ම අපිට හිත හදාගන්න හරි අමාරුයි.. අපි මහා ලොකු වැරැද්දක් කළා කියලමයි මගෙ හිත නම් මට දොස් කියන්නෙ.."





චේතනාගේ සුරත ඇගේ කුස වෙත ගියේ ඉබේට ම ය. නාහිමිපාණන්ගේ වදන් ඇගේ දෙසවන්හි නින්නාද වන්නා සේ ඇයට දැනිණි.

"ලොකු දුව.."

"අපේ හාමුදුරුවනේ..!"

"මම මේ ටික කියන්නෙ.. ඔය දරුවට බොහොම කරුණාවෙන් දරුවො.. තුවාලකාරයෙක් ගෙදරක ඉන්නවා කියන්නෙ විෂබීජ ගොඩක්.. මේ වගේ සැරව, ඕජස් ගලන වණයක් කියන්නෙ විෂබීජ ගුහාවක්.. ස්වාමි පුරුෂයාගේ ගෙදර උදවිය ඔය දරුවට බොහොම ළෙන්ගතු එකේ.. ඔය දරුවා ඔය කුසේ ඉන්න දරුවගෙ නිරෝගිකමයි, ආරක්ෂාවයි ගැන හිතලා.. ගෙදර ගියොත් හොඳයි දරුවො.. අපි යමක් කරනකොට වටපිටාවෙ හැමෝගෙම යහපත සලකලා බලන්ට ඕන ලොකු දුව.. ඔය දරුවා මාත් එක්ක අමනාප වෙන්ට එපා.."

"අනේ නෑ අපේ හාමුදුරුවනේ.. ඔබ වහන්සේ කරුණාවෙන් යමක් පහදලා දෙන්නෙ අපේ යහපතට කියලා මම දන්නවා.. පන්සලට එන ගමනේදි නංගිත් මට ඔය ටික ඔය විදියටම කිව්වා අපේ හාමුදුරුවනේ.. මගෙ දරුවට ප්‍රශ්නයක් වෙයි කියලා.. ඔබ වහන්සේ කියනවා නම්.. මම ආපහු යන්නම් අපේ හාමුදුරුවනේ.."

චේතනාගේ කල්පනාවලිය පිය - පුතු දෙදෙනාගේ ම සිත් තුළ ඇති කළේ ඉමහත් වේදනාවකි.

"අක්කෙ.. අපි හින්දා ඔයා ගෙදරින් යන්න එපා.. අපි වෙන කොහේ හරි තැනක් නවතින්න හොයාගන්න බලන්නම්.."

චේතනා, තිගැස්සී මෙන් පිය - පුතු දෙදෙනා දෙස බැලුවා ය.

"අපෝ අන්කල්.. එහෙම දෙයක් ගැන හිතන්නවත් එපා.. ඇත්තට ම මට මහත්තයාගෙ ගෙදර කිසිම ප්‍රශ්නයක් නෑ..



Uploaded By Sanda

ඒගොල්ලො හරි ම හොඳ මිනිස්සු.. ඇත්ත කියන්න මම ලැජ්ජා නෑ අන්කල්.. පුංචි කාලෙ ඉඳල ම මම හරි කම්මැලි ගෑනු ළමයෙක්.. ඇත්තට ම මම මෙහෙට වෙලා ඉන්නෙ අපේ මහත්තයාගෙ භාෂාවෙන් කියනවා වගේ සැප ගන්න තමයි.. වෙන නංගි කෙනෙක් නම් මෙලහට මාව එළවලා.. මගෙ නංගි හොඳ හින්දා අතට පයට සේරම කරලා දීලා මාව බලාගන්නවා.."

එසේ කියූ චේතනා මදක් උස් හඬින් හිනැහුණා ය. තොදැනීම රිය නිවස අසලට ළංවී තිබිණි.

ඒ වන විටත් සමරසිංහ මහතාත්, මානවීත් නිවසට පැමිණ සිටි අතර, මානවී යුහුසුලුව රාත්‍රී ආහාරය පිළියෙල කරන්නට ද ගෙන සිටියා ය. කුඩා ගේට්ටු කණුවේ සවි කර තිබූ විදුලි පහනේ මන්දාලෝකය හාත්පස පැතිරී තිබුණේ සඳ එළිය සමඟ පදමට මුසුව ය. මෝටර් රථයේ හඬ ඇසී මුළුතැන්ගෙය තුළ හිඳි මානවී ද, වනිගසේකර මහතා ද ඉක්මන් ගමනින් නිවසේ ඉදිරි දොරටුවෙන් පිටතට පැමිණියෝ ය.

"ප්‍රවේසමට ගෙට යන්න පුතා.."

චේතනා ඉස්සර වෙද්දී, ගඟුල්ට ආධාරක වශයෙන් සමරසිංහ මහතා ඔහු අසලින් ම පිය මැන්නේ ය. වනිගසේකර මහතා මෝටර් රථය ඉදිරියෙන් ගොස් රත්නජීවට සමීප වූයේ ය.

"මේ ගේට්ටු කණු දෙකෙන් වාහනයක් ඇතුළට ගන්න බෑ මහත්තයෝ.. අපි අර චමිර පුතාලගෙ මිදුලෙන් වාහනේ දාමු.."

"පාරෙ වාහන එනවා ඇති නේද මල්ලියේ..?"

"ලොකු වාහන නම් එන්නෙ නෑ.. ත්‍රීවීල්, බයික් තමයි එන්නෙ මහත්තයෝ.."

යාබද නිවසේ පදිංචි, දහවල හිඳ අමුත්තන් සමඟ අතිශය ළෙන්ගතුව උන් තරුණයා - චමිර ද පැමිණ මෝටර් රථය ඔවුන්ගේ ගෙමිදුලට දමා ගන්නට උදව් කරන්නට වූයේ ය.





"අපි වාහනේ දාලා මේ මිදුල අවහිර වෙයිද දන්නෑ නේද පුතා..?"

රත්නජීව, ළෙන්ගතු තරුණයාගෙන් විමසුවේ, සිරිතක් ලෙසිනි. එවන් අති සුඛෝපභෝගී රියක් තම ගෙමිදුලේ නවතා තැබීම පවා ඒ මොහොතේ චමිරගේ හදවතට ගෙනැවිත් තිබුණේ අභිමානයකි.

"අපෝ නෑ අන්කල්.. අපේ ලොරිය එළවළු අරන් දඹුලු ගිහින්.. ආයෙ එන්නෙ හෙට රෑට.. ඒ ආවත් පුංචි අම්මලාගෙ ගෙදර හරි ලොරිය දැම්මහැකි.. අන්කල්ලා යන වෙලාවක් වෙනකල් ජීප් එක මෙහෙම තිබුණාවෙ.."

වනිගසේකර මහතා, චමිර දෙස බැලුවේ, රත්නජීව මෝටර් රථයේ විදුලි පහන් නිවා දමා බිමට බට මොහොතේ ය.

"පුතේ.. රෑට අයියගෙ කකුලෙ බෙහෙතක් ගාන්න තියෙනවා.. පුතාට නිදහසක් තියෙනවා නම් පොඩ්ඩක් ඒ පැත්තට එන්න.."

"මං එන්නම් මාමා.. කීයටද මං එන්න ඕන..?

"කාලා බීලා වැඩ ඉවර උනාම.. පොඩි අක්කා කතා කරයි පුතේ.."

රත්නජීවත්, වනිගසේකර මහතාත් යළි නිවසට පිවිසෙන විට, ගඟුල්, සන්ධ්‍යා වරුව ම හිඳ උන් සුපුරුදු අසුනට බර වී හිඳ ගෙන සිටියේය. ඒ මොහොතේ කෙටි ස්ටූලයක් ඉදිරියෙන් ගඟුල්ගේ පාදයට ළං කළ මානවී, ඒ මත පුළුන් කොට්ටයක් තබා, ගඟුල්ගේ පාදය ඔසවා, ස්ටූලය මතින් තැබුවේ ගඟුල්ගෙන්වත් අවසර ලබා ගෙන නොවේ. ගඟුල්ගේ දෑසට කඳුළු පිරී ආවේත්, ඒ දසුන දුටු පියවරුන් දෙදෙනාගේ ළය මත එක ම ස්වරයක කම්පනයක් ඇඳී ගියේත් ඇසිල්ලකිනි. මානවී, හිස ඔසවා බලා, සියල්ලෝ ම එක ම හසරැල්ලකින් අල්ලා ගත්තා ය. ඇගේ නිතඹ දක්වා දිගු කාල වර්ණ, කැරලි ගැසුණු කේශ කලාපය, ගෙල පාමුලට වන්නට,



Uploaded By Sanda

බුරුලට සිටින්නට කොණ්ඩ කටුවකින් එක්කාසු කොට තිබිණි. රෝස පැහැති බ්ලවුසයක් හැඳි රෝස පැහැ මල් වැටුණු සායට උඩින් ඇ සැහැල්ලුවට චීත්තයක් පටලාගෙන සිටියා ය. මානවීගේ දයාබරිත හැසිරීම ඉදිරියේ ගඟුල් පමණක් නොව සමරසිංහ මහතා පවා සසල වී හිඳියේ ය.

"දැන් පහසුයි නේද අයියෙ..?"

"ඔ.. ඔ..ව්.. නංගි.. තැන්ක්ස්.."

ගඟුල්, ඒ වචන පෙළ ගළපා ගත්තේ පවා අසීරුවෙනි.

"රෑට කෑම ලෑස්ති කරන්න තව ටිකක් වෙලා යනවා.. වෙලාව නම් හත හමාරත් වෙලා.. ඒ උනාට කමක් නෑ.. ප්ලේන් ටී එකක් බොමුද අන්කල්..?"

මානවී, සියල්ලන්ට ම පොදු වූ ඉල්ලීම, කළේ ගඟුල්ගේ පියා දෙස බලාගෙන ය.

"දුවට කරදරයක් නෙමෙයි නම්, හොඳ අදහසක් තමයි නේද පියල්..?"

සමරසිංහ මහතා, මවා ගත් සැහැල්ලුවකින් හැසිරීමට උත්සාහ කළේ, අවස්ථාවේ ආතතිය සමනය කරන්නට මෙනි.

"කහට ටිකක් වක් කරන එක මොන කරදරයක්ද සර්..? අපි තේ ටිකක් බීලා හෙමිහිට මොනවා හරි රත් කරගෙන කමු නේද පුතේ..?"

හෘදයාංගම මිනිසුන් අතර ගෙවෙන සෑම ඉසිඹුවක් ම ගඟුල්ටත් - පියාටත් අප්‍රමාණ සැනසීමක් ම වී තිබිණි.

"අනේ ඔව් අන්කල්.. උයන්න ගොඩක් මහන්සි වෙන්න එපා.. අපිට ඔය මොනවා හරි පොඩ්ඩක් තිබුණ ම ඇති.. අපි ආව වෙලාවෙ ඉඳන් ම අන්කල්ට නිදහසක් නෑ.."





සමරසිංහ මහතා, ගඟුල් වෙත පෑවේ අතිශය සෞම්‍ය සිනාවකි.

"යහපත් දෙයක් කරන්න යද්දි නිදහස නැති උනාට කමක් නෑ පුතේ.. නංගිවත්, මමවත් ඔහොම දේවල් හිතන්නෙ නෑ.. පුතා හිත කලබල කරගන්න එපා.."

මුළුතැන්ගෙය දෙසට යන්නට ගිය මානවී යළි හැරී පිටත ආලින්දයට පැමිණ, තවත් වතාවක් සියල්ලෝ ම වෙනුවෙන් සමරසිංහ මහතා වෙත හැරුණේ ය.

"අන්කල්.. අද හැබැයි.. මේ ලෝකෙ තියෙන සරල ම කෑම වේල තමයි කන්න දෙන්න වෙන්නෙ.. අයියට පිළිහුඩු මොකුත් ම කන්න දෙන්නත් එපා කිව්වනෙ.. සුදු කැකුළු බත් ඉව්වෙ.. පොල් සම්බෝලයක් හදලා, පපඩම් බැදලා, පරිප්පු ටිකක් උයනවා.. එහෙම කන්න පුළුවන් නේද අන්කල්..? හෙට ඉඳලා අපි කන බොන දේවල් ප්ලෑන් කර ගම්මු අයියෙ.. මේ හදිසියෙ මොකුත් විශේෂ දේවල් ලෑස්ති කරන්න බැනෙ.."

ඉහටත් උඩින් වන ආගන්තුක සත්කාර ලෝබකමකින් තොරව දරා ගන්නට පිය - පුතු දෙදෙනා ම දැන සිටියේ නැත.

"ලෝකෙ තියෙන සරල ම කෑම වේලක් විතරක් නෙමෙ.. ඒක මෙ ලෝකෙ තියෙන රස ම කෑම වේල කිව්වොත් නංගිට සතුටු හිතෙයි නේද..? බත්.. අර අපි දවල් කාපු සුදු බත් ම ද..?"

සියලු වේදනාවන් අමතක කොට ගඟුල් විමසුවේ, අපූර්ව ම දඟකාරී හඬකිනි.

"ඔව්.. අපේ කුඹුරෙ වී.. අපේ තාත්තා මහන්සි වෙලා වපුරපු කුඹුරෙන් ගත්ත.. හාල්.. කල් තියාගන්න කියලා වස විස එකතු නොකරපු.. රියල් වයිට් රෝ රයිස් අයියෙ.."

තවත් පිළිතුරක් ගඟුල්ගෙන් හෝ කිසිවෙකුගෙන් අපේක්ෂා නොකළ මානවී ඇතුලුළුගෙට වැදී නොපෙනී ගියේ, ඇගේ සුපුරුදු



Uploaded By Sanda

සැහැල්ලුව සියලඟ දරාගෙන ය. ඈ, මොහොතකින් ඇගේ හුරු පුරුදු ලොව තුළ රජ වූවා ය. ඇගේ දෙතොලතරින් ගීයක් වී මිමිණුණේ ඇගේ හද රැඳි ඒ මිහිරි සැහැල්ලුවයි.

- ආදරයේ රන් විමනේ
මැණික් හදක් පායලා - පායලා..
මැණික් හදක් පායලා..
ජීවිතයේ එළිය මැදින්
සිහින ලොවේ පාවෙලා - පාවෙලා.. -

අමුත්තන් සමඟ මදක් සාමීචියේ යෙදී උන් වනිගසේකර මහතාත්, චේතනාත් මුළුතැන්ගෙය දෙසට පැමිණියේ මානවීට උපකාර කිරීම සඳහා ය. ජීවත්වීමේදී මානවීට තිබුණේ ඇස් දහසක ඉවකි. ඒ මොහොතේ මානවීගේ දෑස යොමු වූයේ චේතනාගේ දෙපා වෙත ය.

"අක්කි.. ඔයාගෙ කකුල් ඉදිමිලා නේද.. යන්න යන්න.. ගිහිල්ල ටිකක් හාන්සි වෙන්න.."

මානවීගේ හඬ තුළ වූයේ ඉල්ලීමක් නොව පැහැදිලි අණ කිරීමකි.

"ඇත්ත තමයි.. ටිකක් ඉදිමිලා තමයි තාත්තා.."

"නංගිටයි, මටයි මේ ටික කරගන්නහැකි.. ලොකු දුව ගිහින් පොඩ්ඩක් හාන්සි වෙන්න.."

"හැබැයි අක්කි.. කිව්වෙ හාන්සි වෙන්න කියලා මිසක් ගොරව ගොරවා නිදාගන්න එහෙම නෙමෙයි හොඳේ.."

චේතනා, හිස හරවා සමච්චල් සිනාවක් පෑවා ය. එහෙත්, එහි තිබුණේ හදවත පුරවා ගත් ආදරයයි.

"බලන්නකො තාත්තා.. මෙයාගෙ නීති.. ඉල්ලීම් එහෙම නෑ.. ඔක්කෝම අණ කිරීම්.. පණ්ඩිතයා..."





"අපොයි මොකද නැතුව.. ඒ පණ්ඩිතකම නැත්තං බලාගන්න තිබුණා මෙයා මෙහෙට වෙලා සැප ගන්න හැටි.. යනවා යනවා.. තාත්තටයි, මටයි මේ වැඩ ටික කරගන්න දීලා.. නැත්තං මට මේ වැඩ අස්සෙ මෙයාගෙ කකුල් අතගාන්නත් වෙයි.."

මානවී කීවේ කෝපයෙන් නම් නොවේ. පවුලක බැඳීම් යනු හුයකින් ඇමිණූ මුතු පොටක් නම්, ඒ මුතු පොට ඉහිරී යා නොදී රැක ගන්නට සියල්ලෝ ම එකා වන්ව කැප කිරීම් කළ යුතු ය. මානවී නොඅඩුව ඉටු කරමින් සිටියේ ඈ සතු ඒ යුතුකම්, වගකීම් කොටස ය.

මානවී, සූදානම් කර දුන් තේ කෝප්ප කිහිපය හා හකුරු කැබලි කිහිපය රැගෙන වනිගසේකර මහතා ඉදිරි ආලින්දය දෙසට ඇවිද යද්දී, නැගණියට මච්චම් සිනාවක් පෑ චේතනා ද පොළොවට හිනැහෙමින් යන්නට ගියා ය.

'අර කොල්ලටත් මෙ බඩ්ඩ එක්ක ලේසි වෙන එකක් නෑ.. මෙයාගෙ නීති එක්ක බෙහෙත් කරගන්න ගිහිල්ලා මේ කොල්ලට බෙහෙතුත් එපා කකුලත් එපා කියලා යන්න හිතෙයිද දන්නෙත් නෑ.. තමන්ගෙ වැඩේ කරගන්න ඕන හින්දා දැන් හොඳ මූණ පෙන්නලා හිනාවෙලා කතා කරලා හිටියට කවුද දන්නෙ මෙගොල්ලොත් ඔය ගොඩක් සල්ලිකාරයො වගේ ආඩම්බර අහංකාර මිනිස්සුද කියලා.. අහිංසකයි වගේ හිටියට අපේ එකත් ඉතින් රූලෙන් පොඩ්ඩ එහෙ මෙහෙ උනොත් නියම වස බඩ්ඩ.. ඉස්කෝලෙ යන කාලෙ කොල්ලො මෙයාට විහිළු කළේ වහා ගිනි ඇවිලෙන සුලුයි කියලනෙ.. දැන් නම් ඒ කුකුල් කේන්තිය නම් නෑ.. ඒත් ඉතින්.. එයා වගේ පිළිවෙළට හිටියෙ නැත්නම් ලෙඩේ පැත්තක තියලා ගඟුල්ටත් ගෝරි ගොඩයි තමයි.. අපේ නංගි වෙලාවකට මහ ගෑනියෙක් වගේ උනාට වෙලාවකට පොඩි ළමයෙක් වගේ.. අනේ මන්දා ඉස්සරහට මොනවා වෙයිද කියලා..'

සිතිවිලි අතරේ උන් චේතනාගේ දෑස පියවී ගියේ ඉබේට ම ය. ඇගේ දෙතොලතර මෘදු මදහසක් ඇඳී තිබිණි. කෑම කාමරය



Uploaded By Sanda

දෙසට ඇවිද යන මානවීට සුළඟට සැලෙන දොර තිරය අතරින් යහන මත දිගාවී හිඳින සොයුරියගේ රුව දෑසට හසු විය. ඇගේ ළය නොදන්නා වේදනාවකින් හිරි වැටී ගියේ ය.

'මෝඩ උනේ නැත්නම් මෙයාට මොන තරම් හොඳ පවුලකට එකතු වෙන්න තිබුණද..? රූපෙට රැවටිලා අර මෙසන් බාස් එක්ක පැනලා ගිහින් මොකක්ද මෙයා කරගත්ත විනාසෙ..? සජිත් අයියලගෙ අම්මලා තාත්තලා, අක්කලා මල්ලිලා හොඳ මිනිස්සු තමයි.. ඒත් ඒ මිනිස්සු රොත්තක් පිටින් මෙයාට ඒ ගෙදර ඉන්න බෑ හිතෙන එකේ කිසිම පුදුමයක් නෑ.. මේගොල්ලො මොන මෝඩකම් කළත්.. ඒ මගේ එකම සහෝදරී.. මට එයාව අහක දාන්න පුළුවන්ද..?'

මානවීගේ මුවින් ගිලිහුණේ දරාගත නොහැකි තරමේ දිගු සුසුමකි. ආලින්දයේ හිඳ මුළුතැන්ගෙයට පැමිණි වනිගසේකර මහතා තම බාල දියණියගේ දිගු සුසුම හමුවේ බියට පත් වූයේ ය.

"පොඩි දුව.. ඇයි පුතේ..?"

මානවී, පියා දෙස බලා මලානික හිනාවක් පෑවා ය.

"අක්කි ගැන වෙලාවකට මට දුකයි තාත්තා.. අර බේබද්දා එක්ක ගියේ නැත්නම්.. මෙයාට මීට වඩා සතුටින් සැපෙන් ජීවත්වෙන්න තිබුණා නේද තාත්තා..?"

වනිගසේකර මහතාගේ මුවින් ද ගිලිහුණේ මානවීගේ සුසුමට නොදෙවෙනි සුසුමකි.

"ඒවා එයා ගෙනාව උරුම කරුම පුතේ.. ඇස් දෙක වගේ ඉන්නෙ දරුවො දෙන්නයි කියලා මේ තාත්තා හිත හදාගෙන සමාව දීලා ගෙට ගත්තට.. එයා කරපු නින්දිත වැඩේට වෙන තාත්තලා නම් සමාවක් දෙන්නෙ නෑ පුතේ.."

"මටත් තාත්තා ඇරුණා ම මේ ලෝකෙ ඉන්නෙ ඔච්චරයිනෙ





කියලා මමත් අමාරුවෙන් හිත හදාගෙන එයාට සමාව දුන්නට.. අර කණමදයා දකිනකොට නම් මගේ ඇගේ මාළු නටනවා තාත්තා.. ඒ වෙලාවට මං ඉවසන්නෙ මගේ සහෝදරීටත් වඩා අර බඩේ ඉන්න දරු පැටියා ගැන හිතලා.."

"මේවා අපි දෙන්නගෙත් පව් පොඩි පුතේ.. මොකක් හරි පවක් ගෙවන්න තියෙන හින්දා තමයි අපිට ම අන්තිමටත් සේරටම කර ගහන්න වෙලා තියෙන්නෙ.."

වනිගසේකර මහතාගේ මුවින් පිටවූයේ බොහෝ කාලයක් මුළුල්លේ සිත තුළ සිර කර ගෙන උන් කලකිරීමක් විය යුතු යැයි මානවී අනුමාන කළේ, තම පියාගේ මුවින් පිටවුණු දිගු සුසුමේ රිද්මයෙනි.

"ඒ කියලා අපි දෙන්නා මෙයාව අතාරින්නයැ තාත්තා.. එයාලා අපි ගැන නොහිතුවට අපි දෙන්නට පුළුවන්යැ එයා ගැන නොහිතා ඉන්න..?"

"බාස්ලා කොච්චර හම්බ කරනවද..? ලක්ෂෙට කොඩිය දාලා වගේ ඕන වෙලාවක පුවානම් කතා නම්.. කෝ ඔය මිනිහා එක ලූණු බිකක තරමෙ දෙයක් මේ වෙනකල් මේ ගෙදරට ගෙනත් තියෙනවද..? හම්බ කරන එකෙන් ගිනි වතුර නානවා.. මට නම් ඕකට එක සත පහකට විශ්වාස නෑ පොඩි දුව.. මූට මේ කෙල්ල ගැන මේ තරමට වගක් නැත්තෙ.. මූට යන යන තැන තව ගෑනුත් ඉන්නවද දන්නෑ.."

වනිගසේකර මහතාගේ පමණටත් වඩා සිහින් වූ හඬ යට නැන්පත්ව තිබුණේ දැවෙන කෝපාග්නියක් සේ ම පිළිකුලකැයි මානවී මොහොතින් වටහා ගත්තා ය. ඈ බියපත් දෑසින් තම පියා දෙස බලා වටපිට බැලුවේ, කිසිවෙකුට හෝ එය ඇසුණාදැයි සැක හැර දැන ගැනීමට ය.

"අනේ තාත්තා.. මොනවද ඔය හිතන්නෙ..?"



Uploaded By Sanda

"දරුවන්ට නොපෙනෙන දුර දෙමව්පියන්ට පේනවා පොඩි පුතේ.."

මානවී, මොහොතක් දෙකක් පියා දෙස බියපත් දෑස රඳවා ගෙන හිඳ, යළිත් ගාමින් උන් පොල් බෑය අතට ගත්තා ය.

"අනේ.. මං දන්නෑ තාත්තා.. මට නම් මේ සිද්ධ වෙන හැමදේම හීනයක් වගේ.."

"ලොකු හාමුදුරුවො ලොකු දුවව එහෙ පිටත් කරන්න කිව්වෙත් ගොඩක් දේවල් ගැන හිතලා වෙන්නැති දරුවො.."

වනිගසේකර මහතාගේ සුසුම් හෙලීම මානවීට නම් දරාගෙන හිඳීම පහසු වූයේ නැත.

"අක්කිව යවන්න මට දුක හිතෙන්නෙ වෙන මොනවත් හින්දා නෙමෙයි.. ඒ මිනිස්සු ඔය කැළේට කොළේට ජීවත් වෙන මිනිස්සුනෙ තාත්තා.. අක්කිට හරියට කන්නවත් නැති වෙයි කියලයි මට බය.. මේගොල්ලන්ගෙ මොළේ මැටි තිබුණට උපදින්න ඉන්න දරුවගෙවත් මොළේ වර්ධනය වෙන්නෙපායැ හරියට.. හරි පෝෂණයක් හම්බ උනේ නැත්නම් ඒ දරුවත් උපදියි කොහෙටවත් නැති විදියට.."

වනිගසේකර මහතා රතු ලූණු වට්ටිය ගෙන ලූණු ගෙඩි කිහිපයක් සුද්ධ කරන්නට වූයේ ය. පොල් බෑය යළිත් මේසය මතින් තැබූ මානවී, තම පියාගේ මුහුණ දෙස බැලුවේ උවමනාවෙනි.

"තාත්තා.. අපි මෙහෙම දෙයක් කරමුද..? මට ගවන්මන්ට් ලෝන් එක ගන්න පුළුවන්.. අපි අර එගොඩහ තියෙන අක්කිගෙ ඉඩම් කෑල්ලෙ ගේ පොඩ්ඩක් හදලා දෙමුද..? මට ඕක හිතිලා හුඟාක් දවස්.. තාත්තගෙන් අහන්න වෙලාවක් එනකල් හිටියෙ.."

වනිගසේකර මහතා එවර නම් තම බාල දියණිය දෙස බැලුවේ නොරිස්සුම් දෑසිනි.





"පොඩි පුතේ.. මම එකක් කියන්නම්.. මේ ඕන නැති බර කරට අරගෙන දුක් විඳින්න ලෑස්ති වෙන්න එපා.. ලෝන් දාලා එයාලට ගෙවල් හදලා දුන්න ම පොඩි දුවගෙ මගුලක් තුලාවක් වෙලාවකට අපි සල්ලි ගස්වලින් කඩන්නද..? හොඳයි කියලා හිතලා බැඳගත්තා නම් ඒගොල්ලො ම බේරේ ගහගත්තදෙන්.. ඔයා මොකටද පුතේ මේ කොහෙවත් යන කරදර ඔළුවෙ දාගන්න හදන්නෙ.. මේ සලකන සැලකිල්ල හොඳටම ඇති.. ඔයා ඔයාගෙ පාඩුවෙ ඉන්න පුතේ.. ඔන්න මේ තාත්තා නොකිව්වයි කියන්න එහෙම එපා.."

තවදුරටත් තම පියා සමඟ ඒ මොහොතේ කිසිවක් සාකච්ඡා කිරීම පලක් නොවන බව වටහා ගත් මානවී, තමා කරමින් උන් කාර්යයේ සිත යොමු කළා ය.

"පොල් සම්බෝලෙ අඹරන්න විතරයි තාත්තා තියෙන්නෙ.. තාත්තා ඉස්සරහට යන්න.. අර තුන් දෙනා තනියමනෙ.. ඒගොල්ලො ඒගොල්ලො කී දෙනෙක් හිටියත්.. පිට තැනකට ආවාම.. ගෙදර අය ගේ ඇතුළට වෙලා හිටියොත්.. ආව අමුත්තන්ට මොනවා උනත් හිතට මදිකමක් දැනෙනවනෙ තාත්තා.."

වනිගසේකර මහතා තම බාල දියණිය දෙස බැලුවේ සෙනෙහසත්, අභිමානයත් මුසුවූ දෑසිනි.

"ඔයා නම් පුතේ.. හත් අට දෙනෙකුට හරියන්න එක පාර හිතනවා.. මට නම් හිතාගන්නවත් බෑ.."

මානවී, තමාට පිටුපා යන පියා දෙස ආදරණීය දෑසින් බලා සිටියා ය.

දිවා ආහාරය සේ ම රාත්‍රී ආහාරය ද ආගන්තුකයන් ට ප්‍රණීත භෝජන සංග්‍රහයක් ම විය. ලද දෙය කෘතවේදීව බාර ගන්නට සමත් උපේක්ෂා සහගත මිනිසුන් මෙලොව දුලබ ය. ආගන්තුකයන් වුවත් සමරසිංහ, පිය - පුතු දෙදෙනාත්, රත්නජීවත් අයත් වූයේ ඒ දුලබ මිනිසුන් අතරට ය.



Uploaded By Sanda

වනිගසේකර මහතාත්, මානවීත් ආගන්තුකයන්ගේ කෘතවේදී, ප්‍රසාදනීය හැසිරීම ඉදිරියේ අපමණ සොම්නසට පත්වූහ.

"වෙලා ගිහිල්ලා හින්දා.. කලබලේට හැදුවෙ අන්කල්.. කෑම නම් රස ද මන්දා.."

මානවී විමසුවේ පසුතැවිලි වන ස්වරයෙනි. එහෙත්, කෑම කාමරය පුරා උණු උණු සුදු කැකුළු බතේ සුවඳත්, පරිප්පු ව්‍යංජනයේ සුවඳත්, පොල් සම්බෝලයේ දෙහි මුසු සුවඳත් නොඅඩුව පැතිරී තිබිණි. දහසක් හැඟුමන් සිතේ තෙරපුණද, එකක් හෝ වදන් බවට පත් කර ගත නොහැකි - ගගුල්, පියාත්, දියණියත් දෙස කෘතවේදී දෑසින් බලා සිටියා පමණි. පුතුගේ මුවින් පිට නොවුණු ළබැඳි හැඟීම්, සමරසිංහ මහතාගේ මුවින් වදන් බවට පත්ව් පිරිස අතරට එක් විය.

"මතක තියාගන්න දූව.. මෙවගේ රෝගියෙකුට ඇප උපස්ථාන කරන්න බාර ගන්නවා කියන එක ලේසි පහසු දෙයක්වත්, පුංචි දෙයක්වත් කියලා අපි හිතාගෙන නෑ දූව.. පුතාට ප්‍රතිකාර කරන්න වෙහෙසෙනවා කියන්නෙ ම පුදුමාකාර ආත්ම පරිත්‍යාගයක්.. ඒ දේවල් වෙනුවෙන් අපි මේ ගෙදරට පය ගහපු වෙලාවෙ ඉඳල ම පුතාලාට ණයගැතියි.. අපි වෙනුවෙන් දූවයි, තාත්තයි කරන්න බාරගත්ත ඒ උසස් පරිත්‍යාගයත් එක්ක බැලුව ම.. මේ ආහාර වේලත් දිව්‍ය භෝජනයක් පුතේ.."

සමරසිංහ මහතාගේ හෘදයාංගම වදන් හමුවේ, මානවීගේ පමණක් නොව සියල්ලන්ගේ ම දෑස් අග කඳුළු නළියන්නට වූයේය. සමරසිංහ මහතා එපමණකින් නොනැවතී, තව තවත් වචන සොයා යන්නට වූයේ ය. නිහඬව ම හිඳීම සදාචාරයට තරම් නොවන බැව් සිතූ මානවී ද, සමරසිංහ මහතාගේ සෙනෙහසට පෙරළා ප්‍රතිචාර දැක්වූවා ය.

"අපේ අම්මා වෙනුවෙන් අන්කල් තාත්තට කොච්චර උදව්





කරලා තියෙනවද..? හැමදේම වගේම කළගුණ අමතක කරන්නත් අපිට කොහොමටවත් බෑනෙ අන්කල්..?"

සිත පෙළන සිතිවිලිවලින් නිදහස් වන්නට මෙන් මානවී නම සොයුරියගේ බත් පතට තවත් බත් හැඳි දෙකක් බෙදුවා ය.

"ඇති නංගි.."

"ඔය දරුවා හාමත් කරන්නෙ නැතුව කනවා අත ගගා ඉන්නෙ නැතුව.."

මානවී, චේතනාගේ කණට ම මුව ළංකොට තරවටු කළාය. අන් කිසිවකුට එවදන් නොඇසුණත්, චේතනාට සම්මුඛව හිඳ උන් ගගුල්ට නම් එය මනාව ඇසිණි.

'මෙක නම් කොච්චි කරලක්ද කොහෙද..? හෙමින් සීරුවෙ පාට් එක දාන ලස්සන..!'

මිහිරි සිතිවිල්ලක් සිතට එබිකම් කොට, ගගුල්ගේ දෙතොල මත මදහසක් සිතුවම් කළේ පොළොව පමණක් සාක්ෂි කොට ය. එහෙත් අනතුරුව සවනට වැටුණු පියාගේ වදන් හමුවේ ගගුල්ගේ ළය මත බෝම්බයක් පුපුරා ගිය කලෙක මෙන් කම්පනයක් ඇති විය.

"කළගුණ මතක තියාගෙන ඒවට සලකන එක වෙන ම දෙයක් දූව.. ඒත්.. දූව කරන්නෙ ඊට වඩා ගොඩක් ලොකු ආත්ම පරිත්‍යාගයක්.. ඒ වගේම.. ඒ පරිත්‍යාගය.. ජීවිත පරිත්‍යාගයක් විතර ලොකු පරිත්‍යාගයක්.. දූව තරුණ දරුවෙක්.. දූව හෙට අනිද්දා විවාහ වෙන්න ඉන්න කෙනෙක්. මේක දූවගෙ ජීවිතේට ගොඩක් තීරණාත්මක අවස්ථාවක්.. එහෙම වෙලාවක දූව අපි වෙනුවෙන් කැප වෙනවා කියන්නෙ ම.. ඒ පරිත්‍යාගයට කියන්න ඕන නමක් මං දන්නෙ නෑ දූව.. ඒ පරිත්‍යාගයෙ වටිනාකම මනින්නෙ කොහොමද කියලත් මං දන්නෙ නෑ.."



Uploaded By Sanda

සමරසිංහ මහතා නෙතග'ට ඉනූ කඳුළු බිඳු දෙකක් වමතේ පිටත්ලෙන් පිස දමා ගත්තේ ය. ඒ වදන් හමුවේ ඇස කඳුළු නොනංවා හිඳින්නට සමත් කිසිවෙකු සිටියේ නැත.

මානවී හැකි තාක් සන්සුන්ව සියල්ලෝ ම එක ම බැල්මකින් අල්ලා ගත්තා ය.

"දෛවය අපිට ඕන ඕන දේවල් කරන්න මේ ජීවිතේ ඇතුළෙ ඉඩ දෙන්නෙ නෑ අන්කල්.. ඒ ඒ අවස්ථාවෙදි අපි කළ යුතුම දේ තමයි අපිට පවරන්නෙ.. අපි මේ හැමදේම කරන්නෙ සතුටින්.. අපි අයියා වෙනුවෙන් කරන දේවල් ණයක්වත් බරක්වත් විදියට හිතට වදයක් කරගන්න එපා අන්කල්.. ප්ලීස්.. දැන් කෑම ටික කන්නකො.."

"නංගිත් දැන් කන්න ප්ලීස්.."

දුක්බර කතාබහට තවදුරටත් ඉදිරියට ඇදී යා නොදී, ගගුල් අසීරුවෙන් වුවත් මුව විවර කළේ ය.

"අයියලා කාලා ඉවර වෙන්නකො.. මම ටක් ගාලා කාලා ඉවර වෙලා අස් කරලා දානකල්.. අයියා වොෂ් රූම් එහෙම ගිහිල්ලා එන්න.. අපි රෑ දහය වෙනකොට බෙහෙත් ටික ගාමු.. හෙට උදේ හය හමාර විතර වෙනකොට ලොකු හාමුදුරුවො වඩියි.."

හෝරා බාගයක පමණ ඇවෑමෙන් සියල්ලෝ ම කා බී අහවර වූ පසු, මානවී යුහුසුලුව මුළුතැන්ගෙය අස්පස් කරන්නට වූවා ය. මුළුතැන්ගෙයට යාබදව පිටත මිදුල දෙසින් පිහිටා ඇති නාන කාමරය වෙත යන්නට ගගුල් පැමිණියේ ඒ මොහොතේ ය.

"අයියට ඇඟ හෝදගන්න මම උණුවතුර දාලා තියෙන්නෙ.."

මානවී වෙත කෘතවේදීත්වය පුද කළ ගගුල්, රත්නජීවගේ උපකාරයෙන් නාන කාමරයට වැදී, දොරගුළු දමා ගත්තේ ය.

මුළුතැන්ගෙය අස්පස් කරන මානවීට මොහොතකින් මුළු





වටපිටාව ම අමතක වී ඇගේ පුරුදු සැහැල්ලුව මතුවී ආයේ ය. වෙනදා මෙන් නොව ඇගේ ආත්මීය හඬෙහි කිමිදෙන්නට දෙසවනක් විවර වී ඇති වග ඈ මොහොතකට හෝ නොසිතුවා ය.

- වසන්තේ නිදා උන් යොවුන් කෝකිලාවන්
ගයන්නේ සුපෙම් ගීත හේමන්තයේදී
වසන්තේ ළපල්ලෙන් වැසී උන් කුසුම් කැන්
නටන්නේ පිපී දැන් හේමන්තයේදී..

විලාපෙන් විඩා වී රැඳී මං තලාවේ
වැසී අන්ධකාරෙන් වැටී මං මුළාවේ
වලාවක් ලෙසින් මා ඇදෙද්දී අයාලේ
ඔබෙන් නෙත් ලැබුයේ හේමන්ත කාලේ..

සුසුම් ලා දිවා රෑ වෙළී හුදෙකලාවේ
එපා වී සියල්ලන් පළා ආ වෙලාවේ
තුෂාරෙන් උදා වූ සඳක් සේ නිශාවේ
ඔබයි නෙත් සැදුයේ හේමන්ත කාලේ..-

මානවී, පියවි ලොවට පැමිණියේ, නාන කාමරයේ දොරගුළු විවර වන හඬිණි. තමාගේ මධුර මනෝහර ගී හඬ හමුවේ මියැදී උන් ආත්මයක් ලොවට ම රහසේ පණ ලබමින් උන් වග ඈ වැරදී හෝ නොසිතුවා ය. එහෙත්, දෛවය සියලු අවස්ථාවන් නිර්මාණය කරමින් සිටියේ සංසාරගත හමුවීමක ජීවමාන සාක්ෂි එකින් එක එකට අමුණමිනි.



Uploaded By Sanda

රාත්‍රියි.. දෛවෝපගත විය. එය.. බියකරු සිහිනයක් සේ රුදුරු වුවත්, ගගුල්ගේ ලෝකයේ අපේක්ෂාවේ නව සඳ උදා වූ සොඳුරු රාත්‍රිය ද විය.

ඕජස් ගලන, දුගඳ හමන තුවාලය වසා ඔතා තිබූ වෙළුම් පටි ඉවත් කරන මොහොතේ, මානවී සැබැවින් ම සිත යටින් පිළිකුල් භාවනාව වඩන්නට වූවා ය. සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයකුගේ හදවතට පිවිසෙන අප්‍රසන්න හැඟීම් කිසිවක් ඇයට නොදැනුණේ, ඇගේ සමාධිගත සිතට පින් සිදු වන්නට ය.

"නංගි.. අනේ.. මං දන්නෙ නෑ.. ඔයාටත් අප්පිරියා හිතෙයි මාව.. ප්ලීස්.. මම රත්නජීව අන්කල්ට කියන්නම් තුවාලෙ පිරිසිදු කරලා දෙන්න කියලා.."

ගගුල්ගේ කඳුළු බේරෙන දෑස දෙස බැලීම පවා මානවීට වේදනාවක් ම වූයේය. තමාගේ නිවසට පැමිණ, තමාට ඔහු හමුව, ගෙවී ගිය හෝරා ගණනාවට ම පසු, පළමු වතාවට මානවී ගගුල්ගේ දෑස දෙස ඍජුව බැලුවා ය.

"රත්නජීව අන්කල් මොකටද අයියෙ.. මමනෙ ඔයාට බෙහෙත් කරන්නෙ.. ලොකු හාමුදුරුවො මටනෙ කිව්වෙ ඔයාට බෙහෙත් කරන්න කියලා.. දැන් ඉතින් ඒක වෙන කවුරුවත් කරලා හරියන්නෙ ම නෑ.."

ගගුල්ගේ දෑසින් කඳුළු රූරා වැටුණත්, තරුණයාගේ සිත සැනසිය යුතු බැවින්, මානවී අසීරුවෙන් හෝ හිනැහෙන්නට උත්සාහ දැරුවා ය. එමිරත්, වනිගසේකර මහතාත් මාරුවෙන්





මාරුවට තුවාලය පිරිසිදු කිරීමට අවශ්‍ය මඳ උණුසුම් ජලය හා සෙසු අවශ්‍යතා ඉටු කර දුන්හ. චේතනාට කාමරයෙන් පිටතට පැමිණීමට පවා තහංචි වැටිණ. සමරසිංහ මහතා පුතුගේ අසුනට ආසන්න අසුනක හිඳගෙන, පාදයේ ඉහළ කොටස පිරිමදිමින් සිටියේ ය. ඔහුගේ දෑසින් ද කඳුළු ගිලිහී වැටෙමින් තිබිණි. රත්නජීව, මානවී විසින් ගගුල්ගේ තුවාලය පිස දමනු ලබන ගෝස් කැබලි ගෙන ගොස්, පිටත පිහිටි ජල කරාමයකින් සෝදා විටින් විට ඈ වෙත ගෙනැවිත් දෙමින් සිටියේ ය.

උදාවී තිබුණේ පුදුමාකාර හෝරාවකි. විනාඩි හතලිස් පහක පමණ කාලයක් අඛන්ඩව පිරිසිදු කළත්, තුවාල සිදුරු තුළින් පිටතට ගලා එන කුණු ලේ හා සැරව ධාරාවන්හි කිසිදු අඩුවක් නොවිණි.

සන්ධ්‍යාවේ මානවීගේ සිත තුළ පිරී පැවති අධිෂ්ඨානය පවා ඒ මොහොත වන විට සෙලවී තිබිණි. ඇගේ සිත තුළ ප්‍රථම වතාවට බියක් පිළිබඳ හැඟීමක් හොල්මන් කරන්නට විය. ඇගේ මුහුණේ වූයේ අවිනිශ්චිත තිගැස්මකි. අන් කිසිවෙකුට නොදැනුණත්, වනිගසේකර මහතාට තම දියණියගේ වෙනස හොඳින්ම වැටහිණි. ඔහු, දියණියට සමීප වී, ඈ දෙස බැලුවේ උග්‍ර ප්‍රශ්නාර්ථයෙනි.

"ඇයි පුතේ..?"

මානවීට පළමුව බැලුණේ ගගුල් දෙස ය. දෙවනුව, ඈ සමරසිංහ මහතා වෙත දෑස් යොමු කළා ය. සිව් දෑසේ ම වූයේ අපේක්ෂා භංගත්වයේ කලකිරුණු, මූසල සලකුණු ය. එසේ ම.. යථාර්ථය බෙහෙවින් ම කටුක වූයේ ය. නීරස වූයේ ය.

"මෙතන කකුලක් නෑ තාත්තා..???"

මානවී, කෙටියෙන් කියූවෙහි අරුත සියල්ලෝ ම සැණෙකින් වටහා ගත්තෝ ය. වනිගසේකර මහතා,.තුවාලය දෙසට එබී බැලුවේ ය.

"මේ බලන්න තාත්තා.. පිටි පතුල කළු වෙලා ඒ උඩින් පුස්



Uploaded By Sanda

බැඳිලා වගේ සුදු වෙලා.. මේක එක තුවාලයක් නෙමෙයි.. මෙතන තියෙන්නෙ වෙන වෙන ම සැරව පිටට ගලන තුවාල සිදුරු හතක් අටක්.."

කාලය, තත්පර, විනාඩි වෙමින් ගෙවී ගියේ, සියල්ලෝ ම කඳුළේ, සුසුමේ, කාන්සියේ, ශෝකයේ, පරාජයේ පතුලේ ම ගිල්වමිනි.

"අනේ නංගි..!!!"

ගගුල්, වේදනාවෙන් ඇඹරෙන්නට වූයේ ය. මානවී, ආයාසයෙන් වුවත් සිත දැඩි කර ගත්තා ය.

"ප්ලීස් අයියෙ.. කොහොම හරි ඉවසන්න.. හරියට තුවාල පිරිසිදු උනේ නැත්නම් මේ බෙහෙත ගාලා වැඩක් නැතිවෙයි.. එහෙම උනොත් උදේට ලොකු හාමුදුරුවන්ට හරියට තුවාලෙ බලාගන්න බැරි වෙනවනේ.."

ඈ, දන්නා වචනවලින් පහදන්නට උත්සාහ දැරුවා ය. බොහෝ වේලාවක් තරුණයාගේ කඳුළු වැහෙන දෑස යොමුවී තිබුණේ මානවීගේ සිහින් දිගු ඇඟිලි වෙත ය. කඳුළු අතරින් වුවත් ඔහුගේ හදවතට ගොඩ වූයේ පහන් වූ කල්පනා ය.

'කැලේ පිපෙන මල්.. ලස්සනිනුත් වැඩියි.. සුවඳිනුත් වැඩියි.. මට දැනෙන මානවීත් ඒ වගේ..!'

යුවතිය පිළිබඳව ගගුල්ගේ හදවතට දැනුණේ දරාගත නොහැකි වේදනාබර හැඟුම් සමුදායකි.

'මට නම් මානවී ගැන අදහාගන්නවත් බෑ.. කිසිම පිළිකුලක් නැතුව මේ ජරා ගොඩ කොහොම අතගානවද කියලා මට හිතා ගන්නවත් බෑ.. පව් දෙයියනේ..'

ගගුල්, බොහෝ අසීරුවෙන්, වචනයක් දෙකක් සොයා ගත්තේ, නිහඬව ම බලා හිඳ බැරි ම තැන ය.





"නංගි ඔයාගෙ අත් දෙකේම සැරව ගෑවිලා නේද..?"

මානවී, හිනැහෙන්නට වෑයම් කළා ය.

"ඉතින් ගෑවුණා ම මොකෝ අයියෙ.. වතුරෙන් හෝදලා දැම්මම මේ මොනවත් මගෙ අතේ නෑ.."

හෝරාවක් පමණ ගත කොට තුවාලයෙන් ගලා යන සැරව පාලනය කර ගන්නට සමත් වූ මානවී, නාහිමිපාණන් විසින් ලබා දුන් ඖෂධය, ගගුල්ගේ පාදයේ පිටිපතුලේ හා වළලුකරින් මදක් ඉහළට වන තෙක් ගැල්ලුවා ය.

"පැයක් විතර යනකොට කැක්කුම ඇවිත්.. ආයෙමත් සැරව ගලන්න පටන් ගනියි අයියෙ.. එතකොට අපි ආයෙ පිරිසිදු කරන්න පටන් ගම්මු.."

මානවී, ගගුල් ඉදිරියේ අසුන්ගෙන උන් කෙටි බංකුවෙන් නැගී සිටියේ එසේ කියාගෙන ය. ඈ, කිසිවක් පිළිබඳව පරතෙරට නොසිතුවා ය. ඇයට උවමනා වූයේ තමා වෙත සොබා දහමේ නියතයෙන් පැවරුණු වගකීම නිසියාකාරව ඉටු කරන්නට පමණි. සමරසිංහ මහතාගේ පවා මුව ගොළු වී තිබිණි.

"දුවේ.. ඔයා මේවා කොහොම කරනවද මට තේරෙන්නෙ නෑ.. හැමෝම පිළිකුල් කරන දේ දුවට කොහොමද මේ තරම් සාමාන්‍ය දෙයක් උනේ.. මට හිතාගන්වත් බෑ.. මම පියල්ව හොයා ගෙන ආවෙ.. ලොකු හාමුදුරුවො ළඟට යන්න පිළිවෙළක් හදාගන්න මිසක්.. මෙහෙම මේ තරම් ලොකු දේවල් බලාපොරොත්තුවෙන් නම් නෙමෙයි.."

සමරසිංහ මහතාගේ හඬට මුසුව තිබුණේ පුදුමාකාර පසුතැවීමකි.

"අන්කල්.. ඇයි.. ඔය තරම් දුක් වෙන්නෙ..? මේ උදව්ව මෙහෙම කරන එක මට ප්‍රශ්නයක් නෙමෙයි.."



Uploaded By Sanda

සෝදාගෙන පැමිණි දැත්, රෙදි කැබැල්ලකින් පිස දමමින්, මානවී, සමරසිංහ මහතාට පිළිතුරු දුන්නේ කිසිදු බරක් හදවතට වැද්ද නොගෙන ය.

"ඒත් පුතේ.. මට බලන් ඉන්න හරි අපහසුයි.. පුතාගෙ අම්මත් එයාව ඇත් කරලා දැම්මා මේවා බලන්න බෑ අප්පිරියයි කියලා.. ඉතින්.. මම කොහොමද දුව මේක මෙහෙම කරනවා බලන් ඉන්නෙ..?"

මානවීට, කුමක් කිව යුතු දැයි යන්න පවා වටහා ගත නොහැකි විය. ඇයට, හෝරා ගණනාවක් මුළුල්ලේ තමාගේ ඇස ගැටුණු ගඟුල්ගේ කඳුළු වැකුණු දෑස් මැවි මැවී පෙනෙන්නට වූයේ ය.

"අන්කල්.. අයියව සනීප කරගන්න මට පුළුවන් උදව්වක් මම කරන්නම්.. ඒ තුවාලෙ පිළිකුලක් වෙන්නෙ මම ඒ තුවාලෙ මගේ හිතින් බදා වැළඳ ගත්තොත් විතරයි.. මට එහෙම හැඟීමක් නෑ අන්කල්.. අයියා මේක සංසාරෙ කරපු මොනවා හරි පවක ගෙවන්න තියෙන කර්මයක්.. මම.. අන්කල්.. රත්නජීව අන්කල්.. මගේ තාත්තා.. අපි හැමෝම මේ පව ගෙවලා ඉවර කරන එකේ කොටස්කාරයෝ.. ඒ හින්දයි දෛවය අපි අපිට මේ විදියට මුණ ගැස්සුවෙ අන්කල්.. කිසිම දේකට දුක්වෙන්න එපා.. අපි අයියව සනීප කරගෙන ඉමු අනිත් සේරටම කලින්.."

"මගෙ හිතේ ගොඩක් දේවල් තියෙනවා පුතේ.. ඒවා වචන කරන්නයි මම දන්නෙ නැත්තෙ.. ඔයා වෙනුවෙන් මම මොනවද කියන්න ඕන කියලා මම දන්නෙ නෑ පුතේ.. මේ වෙලාවෙ මම දන්න වචනවලින් මට කියාගන්න පුළුවන් මෙච්චරයි.. මමයි, මගෙ පුතයි දෙන්න ම දුවට ණයගැතියි.."

බොහෝ කාලයක් තම පුතු වෙනුවෙන් අපමණ දුක් දැරූ දයාබර පියාණන් දෙස, මානවී බැලුවේ අනුකම්පාව පුරවා ගත් දෑසිනි.





"අනේ ප්ලීස් අන්කල්.. ඔච්චර මං ගැන වදවෙන්න එපා.. මට මේවා ගාණක්වත් නෑ.. කවුරු හරි විශේෂ ලෙඩෙක් බෙහෙත් අහගෙන ආවොත්, ලොකු හාමුදුරුවො අපේ දිහා තමයි නවත්තන්නෙ.. අවුරුදු දහයෙ දොළහෙ ඉඳන් මම ලෙඩ වෙලා එන අයට උදව් කරලා තියෙනවා අන්කල්.. වෙනස තියෙන්නෙ.. ගඟුල් අයියට බෙහෙත් කරන්න ටිකක් වැඩිපුර කාලය ගතවෙනවා කිව්ව එක විතරයි.."

ප්‍රායෝගිකව මුහුණ දීමට සිදුවිය හැකි තත්වය කෙතරම් බැරෑරුම් වුවත්, මානවී, ඒ මොහොතේ හැකිතාක් සැහැල්ලු වීමට වෙර දැරුවා ය.

"මේ ගෙදර දොරේ වැඩයි.. රස්සාව කරගන්න එකයි.. මේ සේරම අස්සෙ දුව කොහොමද මේ වගේ රෝගියෙකුගෙ සාත්තු සප්පායම් කරන්නෙ..? මට දැන් ඔළුවට වද දෙන ප්‍රශ්න ඕවා තමයි දුව.. මම.. දුවට පහසු වෙන්න.. රත්නජීව මෙහෙ නවත්තලා යන්නද දුව.. මේ වෙලාවෙ මට කරන්න ඕන මොනවද කියලා කිසිම දෙයක් පැහැදිලිව ඔළුවට එන්නෙ නෑ දුව.."

සමරසිංහ මහතාගේ වදනක් වදනක් ගානේම තැවරී තිබුණු අසරණකම දරා ගත නොහැකි වූයේ මානවීට ය. මහේශාක්‍ය යැයි ලොවට පෙනෙන ජීවිත තුළ වන අනන්ත වූ අසරණභාවයන්, ඛේදවාචකයන් කොතෙක් නම් ඇත්දැයි මානවී මොහොතකට කල්පනා කළා ය.

තමා වන් කුරා කුහුඹු මිනිස් ප්‍රාණියකු ඉදිරියේ, සද්ධන්ත පෞරුෂයකින් හෙබියා වූ මේ වියපත් මිනිසා, යදියකු වී ඇති අන්දම මානවී දරා ගත්තේ දරුණු සොවකිනි.

"රත්නජීව අන්කල් තියලා ගිහින් අන්කල් කොහොමද එහෙ වැඩ ටික මැනේජ් කරගන්නෙ..? රත්නජීව අන්කල් ළඟ නැති උනොත් අන්කල්ගෙ අත කැඩුණා වගේ තියෙයි.. අනික.. අයියා නැති එකේ.. දැන් අන්කල්ට තමයි එයාගෙ බිස්නස් එක රන් කරන්න වෙන්නෙත්.. නේද..?"



Uploaded By Sanda

සමරසිංහ මහතාගේ හදවතට මොහොතින් මොහොත දැනෙන්නට වූයේ, සසරේ හුරු පුරුදු තමාගේ ම දියණිය තමාට අහඹු මොහොතක හමු වූයේ ය යන හැඟීම ම ය.

"ඒවා නම් එහෙම තමයි දුව.. අනික ඒ වැඩ ගැන මට ලොකු අවබෝධයකුත් නෑ.. මොකද මම කිසිම වෙලාවක දරුවන්ගෙ ව්‍යාපාරික කටයුතුවලට ඇඟිලි ගැහුවෙ නෑ.. රත්නජීවට නම් පුතාගෙ වැඩ ගැන තරමක හොඳ අවබෝධයක් ඇති.. පුතත් එක්ක අවුරුදු තුන හතරක් ම එහෙ මෙහෙ ඇවිදපු හින්දා.."

මානවී, සමරසිංහ මහතා වෙත මෘදු සිනාවක් පෑවා ය. ගතවූ හෝරා කිහිපයේදී දැනුණු, හැඟුණු දෑ අතරින් සමරසිංහ මහතා වඩාත් ම ප්‍රිය කළේ හිත නිවා සනසාලන ඇගේ ඒ මෘදු ගුණය ය.

"අන්කල් යන්න.. අපි පුළුවන් විදියකට මේ දේවල් ටික කරගන්න බලන්නම්.. චමිර මල්ලිත් ඉන්නවනෙ.. මල්ලිත් පුළුවන් විදියට උදව් කරයි.. බෙහෙත් හොයන, කොටන වැඩේ ලොකු හාමුදුරුවො මාටින් මාමට බාර දෙයි.. මාටින් මාමට නම් සාධාරණ ගෙවීමක් කරන්න වෙයි අන්කල්.."

සමරසිංහ මහතා, මානවී දෙස බැලුවේ පෙරටත් වඩා අසරණ දෑසිනි.

"නිස්කාරණේ ලක්ෂ කෝටි ගණන් වියදම් කරපු එකේ.. ඒ මනුස්සයට උපකාරයක් කරන එක මොන තරම් වටිනා දෙයක්ද දුව.. එහෙම කෙනෙක් ඉන්න එක ම මොන තරම් සැනසීමක්ද අපිට.. මම දුවට මුදල් ටිකක් දීලා යන්නම්.. වැඩේ පටන් ගන්නකොට ම ඒ මනුස්සයට කීයක් හරි දුන්න ම හිතත් සන්තෝස වෙයිනෙ දුව.."

මානවී, යළිත් වතාවක් මෘදු සිනාවකින් යුතුව සමරසිංහ මහතා දෙස බැලුවා ය.

"ඇත්ත අන්කල්.. පටන් ගන්නකොටම හිත සන්තෝස උනාම



Uploaded By Sanda



මාටින් මාමා කැප වෙලාම අපේ වැඩේ කරලා දෙයි.. ගම්වල මිනිස්සු ගොඩක් දෙනෙක් අනුන්ගෙ දුකට තාමත් සංවේදියි අන්කල්.. මේ අහල පහළ ඉන්න අයත් අපිට උදව් කරයි.. ඒ හින්දා අන්කල් හිතේ කරදරයක් නැතුව ගිහින් එන්නකො.."

සමරසිංහ මහතාගේ දෑස තුනී කඳුළු පටලයකින් වැසී ගොස් තිබිණි.

"දුවටයි, තාත්තටයි පුතාගෙ හැම කරදරයක් ම බාර දීලා හිත හදාගෙන මම යන්නෙ කොහොමද දුව..?"

"අන්කල්, අයියා ගැන හිතලා මේ ගමන යන්න.. එයා ආපහු එන දවසකට.. එයා කරගෙන ආව ව්‍යාපාර ටික හරි පරිස්සම් කරලා තියන්න ඕනනෙ නේද අන්කල්.. මෙච්චර කල් අයියට නැතිවෙච්ච දේවල් හොඳටම ඇතිනෙ නේද..? පතුලට ම වැටුණොත් අයියට නැගිට ගන්න බැරි වෙයිනෙ අන්කල්.. අද කාලෙ කිසිම දෙයක් පිට මිනිස්සුන්ට බාර දීලා පැත්තකට වෙලා ඉන්න හොඳ නෑ අන්කල්.."

ඇගේ වචන අතිශය සරල වුවත්, ඒ වචන තුළ වල ජීවන දර්ශනය කිසිසේත් ම සරල නොවන බව සමරසිංහ මහතා දැන සිටියේ ය. කෑම කාමරයේ මේසය අසල, පුටු දෙකක හිඳ කතා බහ කරමින් උන් මානවීත්, සමරසිංහ මහතාත් එක් වර ම ගොළු වූයේ, ගඟුල්ගේ කෙඳිරිලි හඬ වඩාත් උත්සන්නව නැගෙන්නට වූ බැවිනි. පුටු වනෙහි දමා තිබූ චිත්තය අතට ගත් මානවී හිඳ උන් තැනින් වහා ම නැගී සිටියා ය.

"අයියා හොඳට ම කෙඳිරි ගානවා අන්කල්.. යමුකො බලන්න.."

සමරසිංහ මහතා මානවී පසුපස වැටුණේ අජීවී යන්ත්‍රයක් මෙනි. ඔහුට සිතන්නට අප්‍රමාණ ප්‍රශ්නාර්ථයක් ළය තුළ පෙරළෙමින් තිබිණි.

මානවී, මානවීගේ පියා, ගගුල්ගේ පියා සේ ම රත්නජීව ද ගගුල් නිදා උන් කාමරයට පිවිසියේ එක ම මොහොතක ය.

"අයියෙ.. ඇයි.. ගොඩක් කැක්කුමද තුවාලෙ..?"

මානවී විමසුවේ මොනවා හෝ ම විමසිය යුතු බැවිනි. නොවේ නම් ඈ, ඒ විශාල වණය අසීමාන්තිකව වේදනා ගෙන දෙන වග නොදැන සිටියා නොවේ.

"අයියෝ.. මේ තුවාලෙ කැක්කුමයි, දැවිල්ලයි ඉන්න බෑ නංගි.. අනේ තාත්තේ.."

ගගුල් හඬන්නට වූයේ නොදරුවෙකු මෙනි. සමරසිංහ මහතාට ද නොදැනීම හැඬිණි. ඔහු, තම පුතුගේ යහනත ඉහ ඉද්දරින් හිඳ ගනිද්දී, අසල වූ පුටුවක් ඇද ගත් මානවී පය පාමුලින් හිඳ ගත්තා ය. මානවීගේ ළයට ද දැනුණේ ඉවසා ගත නොහැකි වේදනාවකි.

"අනේ අයියෙ.. ප්ලීස් ඉවසන්න.. අවුරුදු ගාණක් ඉවසුවා වගේ තව චුට්ටක් ඉවසන්න.. දෙයියන්ගෙ පිහිටෙන් බුදුන්ගෙ සරණින් මේ බෙහෙත් කරනකොට ඔයාට සනීප වෙනවා.. කොහොම හරි ඉවසගෙන ඉන්න අයියෙ.. තව විනාඩි විස්සකින් මේ බෙහෙත් ටික හෝදලා දානවා.. එතකොට ඔය දැවිල්ල අඩුවෙලා යයි.."

අසාමාන්‍ය වේදනාවකින් හඬා වැළපෙන තරුණයා ඉදිරියේ ගහක් ගලක් සේ හිඳින්නට මානවී දැන නොසිටියා ය. පුතු විඳින වේදනාව ඉවසා ගත නොහැකි වූ සමරසිංහ මහතා කාමරයෙන් පිටව ගියේ, දෑසින් ගිලිහෙන කඳුළු පිටත්ලෙන් පිස දමමිනි. මානවී, තම පියා දෙස බැලුවා ය.

"තාත්තෙ.. කකුලට පොඩ්ඩක් හුළං වදින්න ෆෑන් එකක් දාමුද..? සාලෙ තියෙන පෙඩස්ටල් ෆෑන් එක ගේනවද..? තාත්තගෙ ටේබල් ෆෑන් එක ගේනවද..?"

පරිසරයේ වන දහසකුත් වේදනාවන් මැදින් වුවත් රත්නජීවට





පවා සිතුණේ තමන් පැමිණියේ කෙතරම් නම් සමෘද්ධිමත් මිනිසුන් සමූහයක් මධ්‍යයට ද යන්නයි. වර්තමාන ශ්‍රී ලාංකික ගම යනු අතීත ශ්‍රී ලාංකික ගම නොවේ. අතීත ගමෙහි වූ විභූතියට වඩා වර්තමාන ගම තුළ වන විභූතිය වෙනස් ය. දියුණු ය. ස්වභාව ධර්මයාගේ අමිල සම්පත් සමඟ බොහෝ භෞතික සම්පත් ද මුසු වී අවසාන ය. ගම සේ ම ගමෙහි වෙසෙන මිනිසුන් ද බෙහෙවින් ම ඉදිරිගාමී ය.

ගගුල් හෝ සමරසිංහ මහතා හෝ අපේක්ෂාවෙන් පැමිණියේ මෙවන් සුව පහසු පරිසරයක් නොවේ. සැබවින් ම ඔවුන් පැමිණි ගමනාන්තයෙහි ප්‍රශ්නයකට වූයේ අගනුවර සිට ඇති දුර බැහැර බව පමණි. ඒ හැර කිසිදු සාධකයක් ඔවුනට අපහසුවක් දැනවූයේ නැත.

ඒ සියල්ලට ම වඩා අරුමය වූයේ.. මෙතරම් මිනිස්කමින් සොඳුරු මිනිසුන් අතරට පැමිණෙන්නට ඔවුන් කිසිසේත්ම අපේක්ෂා කොට නොතිබුණු එක ය.

ගගුල්, හැඬුම් පාලනය කර ගන්නට දැඩිව දෙතොල් එකිනෙක මත තෙරපවා ගත්තේ ය. කඳුළු වැගිරෙන දෑස ආවරණය වන සේ සුරත දෑස මතින් දමා ගත්තේ ය. වනිගසේකර මහතා මේස පංකාව රැගෙන ආවේ ය.

"මේක මේසෙ උඩින් තියලා දාමු පුතේ.. නැත්නම් කාමරේට අවහිරයි.."

වනිගසේකර මහතා, විදුලි පංකාව ක්‍රියාත්මක කොට, එය ගගුල්ගේ පාදය ඉලක්ක වන සේ හරවා තැබුවේ ය.

"මම උණු වතුර මුට්ටිය බලලා එන්නම් පුතේ.."

වනිගසේකර මහතා කාමරයෙන් පිටව ගියේ එසේ කියාගෙන ය. මානවී, රත්නජීව වෙත හැරුණා ය.

"අන්කල්.. අර අයියගෙ බෑග් එකේ ගෝස් වගයක් තියෙනවා



Uploaded By Sanda

කිව්වා නේද..? අරගෙන එනවද..? පරණ රෙදි නම් ගෙයි ඇති.. ඒත් ඒවා මේ හදිස්සියට හොයන්න බෑ.. හොයා ගත්තත් උණු වතුරෙන් තම්බලා හෝදලා මිසක් තුවාලෙ පිරිසිදු කරන්න පාවිච්චියට ගන්න බෑ.."

මානවීගේ මානව ගුණය ඉතිරෙන වදනක් වදනක් ගානේ ම ගගුල්ගේ මුවින් නැගෙන ඉකිය තීව්‍ර විය. තුවාල සිදුරු පිරුණු පිටි පතුලේ නම් අත තබා ඇඟිලි තුඩක් තබන්නට තරම්වත් නිරෝගී ඉඩක් ඉතිරිව නොතිබිණි. ගගුල් නිදා උන් යහනට තවත් බිඳක් තම පුටුව ළං කර ගත් මානවී, ඔහුගේ පාදයේ වළලුකරට ඉහළින් ප්‍රදේශය හා විළුඹ හා යටිපතුල මෘදුව පිරිමදින්නට වූවා ය.

"නංගි.. දෙයියනේ.. මොනවද මේ වෙන්නෙ..? මේ කරුමක්කාර තුවාලයක් හින්දා.. කසාද බැඳපු ගෑනිට විතරක් නෙමෙයි මාව හදපු අම්මටත් එපා උන මිනිහෙක් මං.. ඒත්.. එහෙම වෙච්ච මට.. ඔයා මේ කොහොමද සලකන්නෙ..?"

"අයියෙ.. ආයෙත් අපි ඒ දේවල් කතා කරන්නෙ ඔයා සනීප උනාට පස්සෙ.. එතකල්.. ඒ දේවල් කතා කරන්න ඔයාට තහනම්.. ඔයා මං කියන දේ ඇහුවෙ නැත්නම්.. මං ලොකු හාමුදුරුවන්ට කියනවා අපි කියන දේ අහන්නෙ නැති කෙනෙක්ව බලාගන්න මට නම් බෑ කියලා.."

එතෙක්, දෑස වසංගාගෙන, ඒ මත්තේ තබාගෙන උන් සුරත ඉවත් කර ගත් ගගුල්, දෑස විසල් කොට මානවී දෙස බැලුවේ ය. කඳුළින් පෙඟී, රතුව ගිය දෑසේ ඒ මොහොතේ වූයේ අප්‍රමාණ වූ විස්මයකි.

"නං.. ගී..!!!"

"මම මනුස්සකම මනින විදියට නම්.. අයියෙ.. මේ තුවාලෙ නෙමෙයි.. ඔයා ඔය මතක් කරන අතීතයයි, මට අප්‍රසන්න.. ඒවා අහන්න මට කොහෙත්ම ඕනකමක් නෑ.. ඒවා මතක් කර කර ඔයා වද වෙන හැටි බලන්නත් මට ඕනකමක් නෑ.. ඔය අතීතෙ පැත්තකට





විසි කරලා, ඔයාව සනීප කරන්න අපිට උදව් කරන්න අයියෙ.. අපි හැමෝම මේ හැමදේම කරන්න බාර ගත්තෙ ඔයා සනීප වෙනවා බලන්න.. ලොකු හාමුදුරුවො මගෙනුයි, මගේ තාත්තාගෙනුයි ලොකු ඉල්ලීමක් කළා.. ඒ ඉල්ලීම හරියට ඉෂ්ට කරන්න අපිට උදව් කරන්න අයියෙ.. අපි බාරගත්තෙ ඔයාව තනියම මිසක්, ඔයාගෙ වටේ ඉස්සර හිටපු මිනිස්සුත් එක්ක නෙමෙයි.."

මානවී, මදක් තදින් කියා සිටියා ය. ගගුල්, ඈ දෙස බලා සිටියේ, සැබැවින් ම බියපත් දෙනෙතිනි.

"සොරි නංගි.. වෙරි සොරි.. මට සමාවෙන්න.."

ගගුල් යළිත්, හිස පසෙකට හරවා ගෙන දෑස් මතින් සුරත දමා ගත්තේ ය.

"මනුස්සකම කියන්නෙ මොන වගේ දෙයක්ද කියලා අලුතින් ඉගෙන ගන්න බලන්න අයියෙ.. ඒක හරියට වැටහෙන දවසකට.. අපි කරන මේ දේවල් ගැන.. අයියට පුදුමයක් නෙමෙයි.. පුදුමාකාර ලස්සන හැඟීමක් දැනෙයි අයියෙ.. මනුස්සකම කියන්නෙ එච්චරට ම ලස්සන දෙයක්..!!!"

ගෙවී යමින් තිබුණු රාත්‍රිය.. සැබැවින් ම බිහිසුණු රාත්‍රියක් වූයේ ය. තවත් විනාඩි ගණනාවකට පසු ගගුල්ගේ පාදයේ ගල්වා තිබුණු ඖෂධය සෝදා ඉවත් කළ අතර, අහොරක් නොමැතිව ගලන සැරව හා කුණු ලේ සෝදා, පිස දමා, ඉවත් කිරීමට මානවීට ඇගේ පියා හා රත්නජීවගේ සහයෝගය නොමදව ලැබිණි. ගගුල්ගේ ඉහ ඉද්දරින් හිඳගෙන, වේදනාවෙන් දඟලන තම පුතු සන්සුන් කිරීමට සමරසිංහ මහතා උත්සාහ කරමින් සිටියේ ය.

මානවීට, තුවාලය මතින් දෑත ඉවතට ගන්නට බිඳක හෝ ඉස්පාසුවක් ලැබුණේ නැත. හෝරා තුන හමාරක් තිස්සේ ඉස්පාසුවක් නොවූ මානවීගේ දෑත දෙස සමරසිංහ මහතා බලා සිටියේ වේදනාවෙනි.



Uploaded By Sanda

"දුව.. අමාරුයි නේද පුතේ.. මම ටිකක් පිහදාන්නද දැන්..?"

මානවී, වෙහෙසකර දෑස ඔසවා ගගුල් දෙස බලා, දෙවනුව සමරසිංහ මහතා දෙස බැලුවා ය. සැබැවින් ම ඇගේ දසැඟිලි පමණක් නොව උරහිස් පවා රිදුම් දෙමින් තිබිණි.

"මේ තුවාල දෙකකින් සැරව විදිනවා අන්කල්.. මට හිතාගන්න බෑ අන්කල්.. දැන් පැය තුනහමාරක්.. මේ තරම් සැරව ගොඩක් මේ කකුල ඇතුළෙ තියෙන්නෙ කොහොමද කියලා..?"

එක ම ඉරියව්වකින් හිඳ මානවීගේ තුනටිය ඇදුම් කන්නට විය. උණු දිය බඳුනක් රැගෙන යළි කාමරයට පැමිණි තම පියා දෙස මානවී බැලුවේ අසරණ දෑසිනි. දැඩි සේ වෙහෙසට පත්ව හිඳින තම පියා කෙරෙහි ද මානවීට දැනුණේ ඉමහත් වේදනාවකි.

"තාත්තා.. මේ බලන්නකො.. අයියගෙ තොල් දෙකත් වේලිලා.. උණුවෙන් බොන්න මොනවා හරි දීලා ඉමු.. හැමෝට ම අමාරු ඇතිනෙ.. කෝපි ටිකක්වත් වක් කරන්න පුළුවන්ද තාත්තා..?"

වනිගසේකර මහතා තම දියණිය දෙස බැලුවේ ගෞරවයෙනි. ඇගේ ඉසිවර දෑත ගැන ඔහුට තිබුණේ දැඩි විශ්වාසයකි.

"මම මේ අහන්න හැදුවා විතරයි පුතේ.. මම වක්කරන්නම්.."

අලුයම දෙක පමණ වන විට, ගගුල්ගේ තුවාලවල වේදනාව කෙමෙන් කෙමෙන් අඩුවී ගොස්, සෙමින් සෙමින් ඔහු වෙත නින්ද ළඟා වූයේ ය.

ඒ දුටු, සමරසිංහ මහතාගේ දෑසේ තම පුතුවෙන් වෙන උපන් කඳුළු යළි අලුත් විය. ඔහු, මානවීත්, වනිගසේකර මහතාත් වෙත හැරී දෑත් එකතු කළේය.

"පින් සිද්ධ වෙනවා පුතේ.. පින් සිද්ධ වෙනවා පියල්.. මේ පින නම් මේ ආත්මෙම පියල්ටයි, දරුවටයි පල දෙනවාමයි.. මේ කරපු දේට පින් සිද්ධ වෙනවා.."





"අනේ ඇයි අන්කල් අපිට ඔය තරම් පින් දෙන්නෙ.. තාත්තයි, මමයි මේ කරන්නෙ අපිට කරන්න පුළුවන් උදව්වනේ.."

"දන්නවද පුතේ.. දන්නවද පියල්.. මේ දරුවා අවුරුදු පහකින්වත් මෙහෙම නිදාගෙන නෑ.. මොන තරම් වේදනාවක් විඳින්න ඇත්ද..? මොන තරම් සැනසීමක් දැන් දැනෙනවා ඇත්ද මෙහෙම හොඳට නින්ද ගියා නම්..? අනේ.. උන් වහන්සේට බුදු බව අත්වෙන්න ඕන.. ලොකු හාමුදුරුවා මගෙ දරුවව සනීප කරයි.. මට දැන් ඒක ඉර හඳ වගේ විශ්වාසයි.."

ගගුල්ගේ සිරුර වැසෙන සේ පොරවනය සැකසූ මානවී, වැඩිහිටියන් තිදෙනා සමඟ කාමරයෙන් පිටතට පැමිණියේ, විසල් සැනසීමක් ළයෙහි දරාගෙන ය.

මිනිත්තු දහයක් පමණ ආලින්දයට වී මදක් වෙහෙස නිවා ගත් සියල්ලෝ ම නින්දට සූදානම් වන මොහොතේ, මානවී යළිත් දෙගිඩියාවට පත් වූවා ය.

"අන්කල්.. වැඩිය පහසුකම් නම් නෑ.. අන්කල්ට මං තාත්තගෙ ඇඳ ලෑස්ති ළා.. රත්නජීව අන්කල්ට නම් අයියගෙ කාමරේ බිම පැදුරක් දාලා තමයි නිදාගන්න වෙන්නෙ.. කමක් නෑ නේද..?"

"අනේ පුතේ.. මේ මොනවා කියනවද..? අපි පහුගිය කාලෙ විඳපු දුක්වල හැටියට අපි අද මේ ඇවිත් තියෙන්නෙ දිව්‍ය ලෝකෙකට.. ඕවා ගැන නම් කතා කරන්නවත් එපා.. අපි නිදාගන්නම්.. දුවත් දැන් ගිහිල්ලා නිදාගන්න.."

කෙතරම් වෙහෙස වුවත්, මානවී මෘදු මදහසක් නැගුවා ය.

"මට දැන්ම නිදාගන්න විදියක් නෑ අන්කල්.. හයේ බස් එකේ ඔෆිස් එකට යවන්න තියෙන ලියුම් ටික ලියන්න තියෙනවා..."

සමරසිංහ මහතා ගේ මුව ගොළු වී තිබුණේ, කිව යුත්තේ කුමක්දැයි තෝරා බේරා ගත නොහැකි වූ බැවිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යැවිය යුතු ලිපි කිහිපය සකස් කර, කවරයක බහා



Uploaded By Sanda

මුද්‍රා තැබූ මානවී, නිවාඩු අයදුම් පත්‍රය ද එම කවරය තුළම බහාලූවා ය. ඈ නිදි යහනට යන විට අලුයම තුනයි තිහ පමණ වී තිබිණි. ඈ, තම ජංගම දුරකතනයේ එලාම් ඔරලෝසුව පහයි තිහ ලෙස සටහන් කළා ය.

ඉසිඹුවකුදු ඉස්පාසුවක් නොමැතිව, දවසේ මෙහෙවර නිමා කළ මානවීගේ දෑස කල් වේලා නොගෙන ම පියවී ගියේ ය.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

පසුදින උදෑසන සරණංකර හිමියෝ කියූ වේලාවට ම වැඩ ම කළහ. උන් වහන්සේට අසුන් පැනවූ නිවැසියෝ එකත්පස් වූහ.

"අපේ හාමුදුරුවනේ.. ඔබ වහන්සේට ගිලන්පස ටිකක් ලෑස්ති කරන්නද..?"

"අවශ්‍ය නෑ දරුවෝ.. මම හීල්දානය වළඳලයි ආවෙ.."

"එහෙමයි හාමුදුරුවනේ.."

ගඟුල්ගේ තුවාල පිරික්සමින් නිහඬව ම පසුවන සරණංකර හිමියන්ගේ මුවින් කිසියම් හෝ වචනයක් පිටවෙන තුරු සියල්ලෝ ම බලා සිටියෝ ය. පරිසරය පුරා ම පැතිර තිබුණේ කැලි කැපිය හැකි ගන නිහැඬියාවකි. හෝරාවකට ආසන්න කාලයක් උන් වහන්සේ නිහඬව ම තුවාල පරීක්‍ෂා කරන්නට වූහ. පෙර දින මානවීටත්, වනිගසේකර මහතාටත් රෝගයේ සැබෑ තත්වය හෙළි කර තිබූ බැවින්, ඒ මොහොතේ සියල්ලෝ ම ඉදිරියේ කිසිවක් කීමට උන් වහන්සේට උවමනා නොවිණි.

"පොඩි දුව.. මාටින් උන්නැහේට එන්ට කියමු.."

ගෙමිදුල කෙළවර පිහිටි පිහිඹියා ගස පාමුල කෙටි බංකුව මත හිඳ උන් මාටින්, මානවී එනු දැක හුනස්නෙන් නැගිට්ටේ කර තිබූ තුවාය ද දෑතට ගනිමිනි.

"මාමා.."





"ආරච්චි නෝනා.."

"ලොකු හාමුදුරුවො කතා කරනවා මාමා.."

මාටින්, පෙරටු කොට ගත් මානවී, යළි ආලින්දයට පිවිසියා ය. සරණංකර හිමියෝ ගඟුල්ගේ පාදය වෙත තබා උන් දෑස ඔසවා මාටින් දෙස බැලුවේ ය.

"මාටින් උන්නැහේ.. මේ දරුවගෙ බෙත් හේත් ටික හොයලා දෙන රාජකාරිය බාරගන්ට පුළුවන්ද..?"

"ඇහැකියි අපේ හාමුදුරුවනේ.."

"සුමානෙකට සැරයක් ඔසු වනයෙ නැති ඖෂධ හොයාගෙන එන්ට නිල්ගල යන්ටත් වෙනවා.."

"මට පුරුදු ගමන නොවැ අපෙ හාමුදුරුවනේ.."

"උදේට හවහට ඇවිත් බෙහෙත් ටික කොටලා කාරිය දෙන්ට මාටින් උන්නැහේට අපහසුවක් තියෙයිද..?"

"දැන් මට ඇති වැඩක් නෑ නොවැ අපෙ හාමුදුරුවනේ.. වලව්වෙ අද කුඹුරත් අනුර මහත්තයා අර ජයම්පති කොලුවට දුන්නනෙ මේ අපේ ලොකු කොල්ලත් එක්ක ආරෝවක් හදාගෙන.. දැන් ඉතින් අපේ මහ උන්දැයි මායි වේලක් හරි කරගන්නෙත් බොහොම අපහසුවෙන් තමයි අපේ හාමුදුරුවනේ.."

සරණංකර හිමියෝ, මාටින්ගෙන් මුදා ගත් දෑස සමරසිංහ මහතා වෙත රැඳෙව්වේ ය.

"ලොකු මහත්තයෝ.. එහෙනම් මුන්නැහේ එක්ක ගාණක් මිම්මක් කතා කරගත්තොත් හොඳයි.. දෙපාර්ශවයට ම අගතියක් නොවෙන ආකාරයට ඒ කාරණාවත් දැන්ම ම කතා බහ කරලා අහවරක් කරගන්ට.. පොඩි දුවත් ආණ්ඩුවෙ රාජකාරියකට බැඳිලා ඉන්න එකේ තියෙන කාල සීමාව බොහෝ ම සීමිතයි.. ඒක හන්දා මේ දරුවගෙ ඖෂධ පිළියෙළ කරන රාජකාරියට වෙන්වෙච්ච



Uploaded By Sanda

කෙනෙක් ඉන්ට ම ඕනෑ.. ඒවා කතාබස් කරගෙන පිළිවෙළක් කරලා මහත්තයා හෙට පාන්දරින් ම ගම් රටවල් බලලා පිටත් වෙන්ට.. එහෙත් රාජකාරී සේරෝම මේ වෙනකොටත් අපිළිවෙළ වෙලා ඇති නොවැ මහත්තුරු එහෙ නැති කොට.. අපි අපේ වෙදකම පටන් ගන්නං.. අනික තමයි මහත්තයෝ කලබලෙන් ආපහු මෙහෙ එන්ට කරදර නූනට කමක් නෑ.. ඔය මාසෙකට හමාරකට වතාවක් දරුවා බලලා යන්ට ආවා ම හොඳටෝම ප්‍රමාණවත්.. මහත්තයා ඇවිත් යන්ට.. වෙන වෙන අමුත්තො නාවට කාරි නෑ.. පිරිවර ගලන්ට පටන් ගත්තොත් අපිට මේ වෙදකම නිසියාකාරව කරගන්ට අපහසු වෙනවා.. පැහැදිලියි නොවැ මහත්තයෝ.."

"එහෙමයි අපේ හාමුදුරුවනේ.."

සරණංකර හිමියෝ ගගුල් ඉදිරියෙන් නැගී සිටියෝ ය. ගගුල් හිඳ උන් අසුනින් නැගී සිටින්නට වෙර දරද්දී, උන් වහන්සේ ඔහු වළකාලූහ.

"හ්ම්.. හ්ම්.. ඔය දරුවා නැගිටින්ට උවමනා නෑ.. ඔය දරුවා මගෙ රෝගියා.. චීවරය දරාන හිටියට මෙතනදී මං ඔය දරුවගෙ වෙදැදුරා.. වෙදෙක් කවදාවත් අපහසුවෙන් පීඩා විඳින රෝගියෙකු ගෙන් බුහුමන් බලාපොරොත්තු වෙන්නෑ.."

කෘතවේදී දෑසින් නාහිමිපාණන් දෙස බැලූ ගගුල් දෑත් නළලත තබා නාහිමියන් වැන්දේ ය.

"සුවපත් වේවා..!!!"

පිරිස, යළිත් එකත්පස් වූහ.

"අපේ හාමුදුරුවන්ට දැන්වත් ගිලන්පස ටිකක් සූදානම් කරන්නද..?"

වනිගසේකර මහතා විමසුවේ ය. උන්වහන්සේ මඳ සිනා පාමින් ආලින්දයෙන් පිටතට අඩියක් තැබූවෝ ය.





"ඔය විකාල භෝජනය මගෙ පිළිවෙතේ නෑ නොවැ පොඩි මල්ලියේ.."

සියල්ලෝ ම උන් වහන්සේට පසඟ පිහිටුවා වැන්දෝ ය. චේතනා පමණක් මදක් නැවී නමස්කාර කළා ය.

"සුවපත් වේවා..!!! ලොකු දුව.. මම ඊයෙ කියපු කාරණාව ගැන සැලකිල්ලෙන් කල්පනා කරලා බැලුවද..?"

"එහෙමයි අපෙ හාමුදුරුවනේ.. මේ සති අන්තෙ සජිත් ගෙදර එනවා කිව්වා.. එයා ආවා ම මම මහගෙදර යන්නම්.."

සරණංකර හිමියෝ චේතනා දෙස උවමනාවෙන් බැලුවෝ ය. උන් වහන්සේගේ දෑසේ වූයේ, නිරන්තර දක්නට ලැබෙන මෘදු කාරුණික ගුණ අභිබවා ගිය බැරෑරුම් බවකි.

"ලොකු දුවට මම ස්වාමි පුරුෂයා ඉන්න ඉසව්වකට යන්ට කියලා කිව්වෙ, කුසේ ඉන්න දරුවගෙ ආරක්‍ෂාවට වගේ ම.. ඔය දරුවගෙ ස්වාමි පුරුෂයාගේත් බොහොම නරක දසාවක් මේ දවස්වල ගතවෙන්නෙ.. දෙන්නා දෙමහල්ලො සමීපයෙ ගැවසුණොත් අඩු තරමින් ඒ උවදුරුවලින් අතුරු ආන්තරාවලින් ටිකක්වත් දුරු කරගන්ට පුළුවන් වෙයි.. මෙහෙන් යන්ට කලින් පන්සල පැත්තේ ඇවිත් යන්ට දරුවො.."

චේතනා මුවින් නොබැණ හිස පමණක් සැලුවා ය. ඇගේ දෑසේ අහේතුක කඳුළු පොකුරක් ම නළියමින් තිබිණි. තමාගේ පියාත්.. නැගණියත් ඇසුරේ ගෙවන සුවදායි ජීවිතය හැර දමා ස්වාමි පුරුෂයාගේ නෑ සනුහරය වෙත යාමට ඇ නොරිසි වුවත්, සරණංකර හිමියන්ගේ වදනකට පිටුපා යන්නට ඇයට හැකියාවක් නොවිණි. ජීවිතයේ එක ම වතාවක් උන්වහන්සේ දුන් අවවාද, අනුශාසනා වලට කන් නොදුන් හිතුවක්කාරමට, දැන් පමණටත් වඩා තමා දඬුවම් විඳින බව ඇ දැන සිටියා ය.

විරැකියාවෙන් පෙළෙන, කුලහීන තරුණයෙකු සමග පවත්වන



Uploaded By Sanda

ඇයි හොඳයියෙන් කිසිවකුට යහපතක් නොවන බව තම වැඩිමහල් දියණියට එත්තු ගන්වන්නට නොහැකිම වූ තැන, වනිගසේකර මහතා නාහිමිපාණන් ලවා ද කිහිප වතාවක් ඇයට අවවාද කෙරෙව්වේ ය. එහෙත් ඒ සියල්ල ගඟට කැපූ ඉනි බවට පත් කරමින්, චේතනා ඒ තරුණයා සමග හොර රහසේ පැන ගියා ය. කළ නොහොබිනා ක්‍රියාවෙන් කොතරම් කෝපයට, ශෝකයට පත් වුවත්, දරු ගැබක් කුස දරාගෙන, දුක් පීඩා වැලක එල්ලී යළි නිවසට පැමිණි දියණිය හෝ සොයුරිය ප්‍රතික්ෂේප කරන්නට වනිගසේකර මහතාට හෝ මානවීට නොහැකි වූයේ, සියල්ලට ම ඉහළින් ඔවුන් ගුරු කොට තැකූ මනුෂ්‍යත්වයට පින් සිදු වන්නට ය.

බොහෝ දෑ දරා ගනිමින්.. කාලයේ ගංගාව.. කිසිවක් සිදු නොවන සේ.. ගලා යයි.. එය.. සනාතනික ලෝක ධර්මතාවය යි.

සරණංකර හිමියන් පිටත්ව ගිය පසු.. මානවී තම පියා දෙසට හැරුණා ය.

"තාත්තා.. මං ඊයෙ රෑ කල්පනා කළේ.. අයියට මේ විසිටර්ස් රූම් එකේ ඉන්න එක කරදරයි.. බාත්රූම් එහෙම යන්න අපහසුයි.. අනික.. අයියා තනියම එළියෙ කාමරේ තියලා අපිට රෑට මෙතනින් සාලෙ දොර වහන්නත් බෑනෙ.. මං හිතුවෙ.. මගෙ ලොකු කාමරේ අයියට දීලා.. කෑම කාමරේ ළඟ පොඩි කාමරේට මම යන්නම්ද කියලා තාත්තා.."

වනිගසේකර මහතා ද හිස සැලුවේ කල්පනාකාරීව ය.

"මමත් ඒකමයි කල්පනා කළේ පුතේ.. අද ඉඳලා හෙට යන ගමනක් නෙමෙයිනෙ.. ඉන්නකල් ඉන්න පුළුවන් විදියට සැප පහසුම් සපයන එක අපේ යුතුකමනෙ පුතේ.. මගෙ පුතාට කමක් නැත්නම් අපි එහෙම කරමු.."

මානවී, හුරුපුරුදු මෘදු මදහස නැගුවා ය.





"වෙලාවකට මට පුදුමත් හිතෙනවා.. මේක මහ පුදුම හමුවීමක්.. මම නම් ජීවිතේට මේ වගේ දෙයක් බලාපොරොත්තු උනේ නෑ පුතේ.."

"පවුලෙ අනිත් අය නම් කොහොමද දන්නෙ නෑ.. ඒත් තාත්තා.. අන්කලුයි, ගගුල් අයියයි නම් හරි නිහතමානියි වගේ.."

"ලොකු සර් නම් හරිම මනුස්සකම තියෙන කෙනෙක් තමයි පුතේ.. මම පුතාට කියලා තිබුණෙ.. ඒත්.. දරුවො ගැන නම් මම දැනන් හිටියෙ නෑ.. පෙනුමට නම් බොහොම හොඳයි වගේ.. ගගුල් පුතාට සෑහෙන වත් පොහොසත්කමකුත් ඇති.. වාහන අසූවක් විතර තියෙන ට්‍රාන්ස්පෝට් ඒජන්සි එකක් කියන්නෙ.. පොඩි පහේ ව්‍යාපාරයක් වෙන්න බෑනේ.."

"අනේ මන්දා තාත්තා.. මොනවා තිබුණත් ඇති වැඩේ මොකක්ද මේ කකුලක් එක්ක විඳින දුක බැලුවම.. මොනවා නැති උනත්.. මේ මාස තුන හතරකට සැරයක්වත් ඔළුවෙ කැක්කුමක්වත් හැදෙන්නෙ නැති නිරෝගිකම අපිට මොන තරම් සම්පතක්ද තාත්තා..?"

"සහතික ඇත්ත පුතේ.. ඒ කතාව නම් මසුරන් ඇත්ත.. හැම තිස්සෙ ම කොතන හරි අමාරුවක් තියාගෙන කෙඳිරි ගාන මිනිස්සු මැද්දෙ.. මගෙ පුතයි, මායි අත් විඳින නිරෝගී සුවය මොන සැපයක්ද කියලා හිතෙන්නෙ අර දරුවා අර විඳින අපා දුක දැක්කම තමයි.."

වනිගසේකර මහතාත්, මානවීත් දෙදෙනා ම තම තමා කෙරෙහි ම උපන් අභිමානයකින් හදවත සොම්නසින් පුරවා ගත්හ.

"එහෙනම් තාත්තා.. අපි දැන්ම කාමරේ අස් කරලා දාමු.. අන්කල්ලා ඉන්න වෙලාවෙ අස් කරගත්තොත් ලේසියි.. මගෙ අල්මාරිය තමයි ප්‍රශ්නෙ.. කමක් නෑ හැම වෙලාවෙම ඕක අරින්න ඕන වෙන්නෙ නෑනෙ.. නේද තාත්තා..? එහෙම උනොත් පස්සෙ අල්මාරිය කෑම කාමරේ පැත්තකට හරි දාගන්න බැරියැ."



Uploaded By Sanda

මේ සියල්ල දෙස නිහඬව බලා උන් චේතනා, තම නැගණිය වෙත හැරුණා ය.

"ඉතින් නංගි.. මම ගෙදර යන එකේ.. ඔයාට මගේ කාමරේ හිටියහැකිනෙ.. කෑම කාමරේ ළඟ කාමරේ පොඩියිනෙ.. සාරියවත් ඇඳගන්න ඉඩ තියෙන්නෙපායැ නංගි.. ඉතින් ඔයාට ඩ්‍රෙසින් ටේබල් එකවත් දාගන්න ඉඩ නැතේ.. මේ මගේ කාමරේට එන්න නංගි.."

මානවී, අමුතු ම සිනාවක් පා හිස සැලුවා ය.

"අපෝ බෑ අක්කි.. ඔයාගෙ කාමරේ ඔයා ආව වෙලාවට ඉන්න ඔහේ තිබුණාවෙ.. අනික.. ඔයා ඔය යනවයි කිව්වට.. ගිහින් දවස් කීයක් ඉදියිද කියලත් මට නම් ෂුවර් නෑ.."

මානවී කියද්දී... චේතනා තිගැස්සුණා ය. එහෙත්, මානවී මුවින් කීවාට වැඩි යමක් මානවීගේ සිත තුළ හොල්මන් කරන්නට විය.

"එයා මගෙ අක්කි තමයි.. ඒත් එයාගෙ මිනිහා මහා අවලමෙක්.. ඔය ජරා සතා ලැගපු තැනක ඉන්නවා තියා පය තියන්නවත් මම කැමති නෑ.."

සිත තුළ අරක් ගත් ද්වේශයක් නොවුණත්, මානවීගේ සිත තුළ තම සොයුරියගේ සැමියා කෙරෙහි වූයේ පැහැදිලිව ම අප්‍රුලකි. නොමනා සිතිවිලි දිගේ දුර යන්නට සිතට ඉඩ නොදුන් මානවී, වහාම සොයුරිය අසලින් ඉවත්ව ගොස්, පිරිසට උදෑසන ආහාරය මේසයට සූදානම් කළා ය.

"අයියෙ.. කෑම කන්න යමු.. ඔයාට යන්න අමාරු නම් මම මෙහෙට බෙදලා ගෙනත් දෙන්නද..?"

ගඟුල්ගේ දෑසේ ඇසිල්ලකටත් අඩු කාලයකදී විසල් කඳුළු බිඳු දෙකක් නළියන්නට වූයේ ය. මානවී, ගඟුල් දෙස බැලුවේ විසල් ප්‍රශ්නාර්ථයකිනි.



Uploaded By Sanda



"ඇයි අයියෙ.. ගොඩක් අමාරුද..?"

ගඟුල්, දෙතොල් පට සපාගෙන, හිස දෙපසට සැලුවේ මානවීගෙන් දෑස හංගාගෙන ය.

"එහෙනම්..?"

ගඟුල්, දිගු සුසුමක් හෙලුවේ ය. දිගු සුසුමක් යළි ඉහළට ඇද ගත්තේ ය.

"එක ම එක දවසකින්.. එක ම එක පැය විසි හතරකින්.. මගෙ මුළු ලෝකෙම වෙනස් උනා කියලා මට දැනෙනවා නංගි.. හරියට ම ඊයෙ උදේ නවයයි හතලිස් පහට.. අපි ඔයාගෙ ගෙදරට ආවා.. බලන්න.. අද.. දැන් වෙලාව.. හරියට ම නවයයි හතලිස් පහයි.. එක ම එක දවසයි.. මුළු ජීවිතේ ම හැඩය වෙනස් උනා.."

මානවීගේ දෑස පුදුමයෙන් විසල් වී තිබිණ.

"ඉතින්.. ඒ වෙනස.. හොඳ නැද්ද අයියෙ..???"

මානවී, සරල ම වචනවලින් විමසුවේ ගඟුල්ට එකවර පිළිතුරක් දීගත නොහැකි තරමේ ගැඹුරු පැනයකි.

"හොඳයි.. ඒත් දුකයි.."

මානවීගේ විමතිමත් දෑස කුඩා වී, නළල රැළි ගැන්විණ.

"හොඳයි..??? ඒත් දුකයි..???"

ඈ, ගඟුල්ගේ ම වචන යළිත් ප්‍රතිරාවනය කළා ය.

"අයියා.. මොනවටද ඔය තරමට දුක් වෙන්නෙ..?"

"මට මහා අසරණකමක් දැනෙනවා නංගි.."

"ඇයි.. ඇයි.. අයියෙ.. තිබ්බව අසරණකමට.. සරණක් හොයාගෙන නේද ඔයා මේ ගමන ආවෙ..? ඇයි..? අයියට ලොකු හාමුදුරුවන්ගෙ

ශාස්ත්‍රය ගැන විශ්වාස නැද්ද..? මමයි, මගෙ තාත්තයි ඔයාව බලා ගනියි කියල විශ්වාස නැද්ද..?"

මානවීගේ අවසන් පැනය ගඟුල්ගේ හදවතේ ඇනුණේ පිහි තුඩක් පරිද්දෙනි.

"මොනවද නංගි ඔයා ඔය අහන්නෙ..?"

"මොනවද අයියා එහෙනම් ඔය කියන්නෙ..?"

ගඟුල් යළිත් දෙතොල් සපා ගත්තේ ය.

"මං හින්දා.. ඔයාට මොන තරම් කරදර ගොඩක් විඳින්න වෙයිද නංගි.. කීයක් දේවල් ඔයාට මං වෙනුවෙන් කරන්න සිද්ධ වෙනවද..? කන්න බොන්න හදන්න.. බෙහෙත් කරන්න.. නාවන්න.. රෙදි සෝදන්න.. මොන බැඳීමකටද දෙයියනේ ඔයාට මේවා කරන්න සිද්ධ වෙන්නෙ..?"

මානවී, මොහොතක් කල්පනා කළා ය. පමණට වඩා මෘදු වුවහොත් ගඟුල්ගේ හදවත පෙළන සෘණ සිතිවිලි දාමය පාලනය කිරීම දුෂ්කර වන බව ඈ ඉවෙන් මෙන් වටහා ගත්තා ය.

"ආයෙ.. කවදාවත් අයියා මගෙන් ඔය ප්‍රශ්නෙ අහන්නෙපා.. ඔයාගෙ අන්තිම ප්‍රශ්නෙට උත්තරේ.. ඒ බැඳීම.. මනුස්සකම..!!! සංසාරෙ ම පුරුදු වෙලා ආත්මෙන් ආත්මෙට අරගෙන ආව.. මනුස්සකම..!!!"

මානවී, එයින් ද නොනැවතුණා ය.

"කන්න බොන්න හදලා දෙන්නම්.. බෙහෙත් කරන්නම්.. නාවන්නම්.. රෙදි හෝදලා දෙන්නම්.. සේරම කරන්නම්.. ඒත්.. අයියා අපිව හිතට බරක් කරන්න එපා.. සිංගප්පූරු ගිහින් කකුල කපාගෙන එනවට වඩා.. මේ වංකගිරියට ඇවිත් සනීප වෙන්න පුළුවන් නම් හොඳයි කියලනෙ අයියා මේ ගමන ආවෙ.. අපිව එපා.. ලොකු හාමුරුදුරුවන්ව විශ්වාස කරන්න.. එතකොට.. ඔයාට





සනීප වෙයි.. ඊට පස්සෙ.. ආයෙමත් ඔයාගෙ ලෝකෙට ගිහින්.. නැවතුණ තැනින් ජීවිතේ පටන් ගන්න.. එතකොට.. මේ කතාව ඉවරයි..!!! හැමෝම බලන් ඉන්නවා.. යමු අයියෙ කෑම ටික කාලා එන්න.."

යුවතිය ඉදිරියේ කියා ගන්නට දහසකුත් එකක් දෑ සිත තුළ පෙළගැසුණ ද, මානවීගේ වදන් හමුවේ, ඔහුගේ මුව ගොළු විය. එහෙත්, වේදනාව මැදින් වුවත්, ඔහුගේ හදවතට දැනුණේ අපූර්වතම මිහිරකි.

'කොච්චි කරල..! වචනයයි එහෙ මෙහෙ උනේ.. මදිද කියපු ටික.. අම්මෝ.. හොඳයි වගේ හිටියට මේ කෙල්ල මාර වසයි තමයි.. කට වැරදුණොත් වසලා හමාරයි වගේ..'

ගඟුල්, සිතින් සිතුවා පමණි. මානවී, රෝද පුටුව පිටුපසින් තල්ලු කරගෙන ආලින්දයට පැමිණියා ය. ගඟුල්ගේත්, මානවීගේත් මුහුණුවල වූ අඳුරු වලාකුළු දුටු සමරසිංහ මහතාගේ සිත සසල විය.

"දුව..??? ඇයි පුතේ..? මොකද උනේ..?"

මානවි, ගඟුල් දෙස බැලුවේ මවා ගත් නොරිස්සුමකිනි. ඒ, නිරායාසයෙන් පැන නැගුණු ව්‍යාජ රංගනය ගැන දැන සිටියේ ඇගේ හදවත පමණි.

"මං දන්නෑ අන්කල්.. අපි මෙච්චර කියද්දිත් අයියා පිස්සු කියවනවා.. එයාට අපි විශ්වාස නැද්ද දන්නෙ නෑනෙ.. වෙන වෙන ඒවා හිතන්නෙ.. සනීප වෙන්න උවමනාවක් නැත්ද කොහෙද..? අන්කල් යන්න කලින් හොඳ බ්‍රේන් වොෂ් එකක් දීලා යන්න.. නැත්නම් අපි මහන්සි උනාට මේ කකුල සනීප කරන්න බැරි වෙයි.."

මොහොතක් තුෂ්නිම්භූතව බලා උන් සමරසිංහ මහතාගේත්,



Uploaded By Sanda

වනිගසේකර මහතාගේත් දෙදෙනාගේ ම මුව මත ඇඳී ගියේ නොදන්නා සොම්නසකට ඉපදුන සොඳුරුම හසරැල් බිඳකි. සමරසිංහ මහතා, තම සගයාට ඉඟි මැරුවේ ය.

"මට පේන්නෙ.. බෙහෙත් කිරිල්ල පැත්තක තියලා.. පියල්ට දෙන්නගෙ රණ්ඩු බේරන්න වෙයිද දන්නෙත් නෑ.."

පියවරුන් දෙදෙනා නොදන්නා හේතුවක් ගුරු කොට ගෙන සැහැල්ලුවේ සිනාසුණෝ ය.

"ඔය හිටියට අපේ පොඩි දුවත් හිනි කටු අත්තක් තමයි සර්.. මොකක් හරි දෙයක් දෙපාරක් තුන්පාරක් කියන්න වුණොත් කෙල්ලට අසූ හාරදාහට නගිනවා.. පුතා මොකක් හරි කියලා ඇති අපිට කරදරයි වගේ කතාවක්.. එහෙම ඒවට තමයි එයාට වැඩිපුර ම කේන්ති යන්නෙ.. ඔවා දෙවෙනි තත්පරේදි එයාට අමතකයි සර්.. අපි ඔවා නොදැක්කා වාගේ හිටිය ම ඉවරයි.. යමු යමු.. සර්.. දහයත් උනා.. කෑම ටික කාලා ඉමු.."

සියල්ලෝ ම උදෑසන කෑම මේසයට අසුන් ගත්තේ, පොදුවේ නොපෙන්නුවාට, සිතු තුළ සඟවා ගත් ප්‍රමෝදයකිනි. ඒ සොම්නස ජනිත කරවූ හේතුව කුමක්ද යන්න පමණක් කිසිවෙකුත් නොදැන සිටිය හ.

"ෂා.. ඉඳිආප්ප..! අල හොදියි.. පොල් සම්බෝලයි.."

උද්දාමය පළ කළේ සමරසිංහ මහතා ය. මානවී, පුදුමය රැඳි දෑසින් සමරසිංහ මහතා දෙස බලද්දී, පිළිතුරු දෙන්නට ඉදිරිපත් වූයේ ගඟුල් ය.

"අපේ තාත්තගෙ ෆේවරිට් කෑම.. හැමදාම ඉඳිආප්ප දුන්නොත් හැමදාම හරි කයි.."

ගඟුල් කීවේ, හිඳ උන් රෝද පුටුවෙන්, කෑම මේසයේ අසුනකට මාරු වෙමිනි.



Uploaded By Sanda



"හරි.. හරි.. එහෙනම් ආයෙ අන්කල් එන දවසට ඉඳිආප්ප ලෑස්ති කරන්නම්කො.. හොඳ පොළොස් ඇඹුලක් එහෙම උයලා.."

මානවී කීවේ ගණනකට හෝ නොගෙන ය. ඒ මොහොතේ තමාට තම නීත්‍යානුකූල ලේලිය වූ තාරිකා සිහි වූයේ මොන කරුමයකටදැයි සමරසිංහ මහතා සිතුවේ ම විස්සෝපයෙනි.

'අවුරුදු තුනක් එක වහල යට හිටියා.. අසනීපෙකට බෙහෙත් පෙත්තක් බොන්න එක වතුර උගුරක් දීලා නෑ.. අපි ගැන කිසිම හැඟීමක් බැඳීමක් නැති මිනිස්සුන්ව නේද අපි හැමදාම ඔළුව උඩ ම තියාගෙන ඉඳලා තියෙන්නෙ..?'

ඒ සංසන්ධනයේදී නොසිතූ ලෙසින් සමරසිංහ මහතාගේ හදවත පෑරිණි. ඔහුගේ මුවින් ගිලිහුණේ දිගු සුසුමකි. මානවී, යළිත් බැලුවේ බියපත්ව ය.

"අන්..කල්.. ඇයි..???"

"නෑ දුව.. මෙච්චර මේ වැඩ අස්සෙ ඉඳිආප්පත් තැම්බුවද..? ඊයෙ රෑ පැය දෙකක්වත් නිදාගත්තෙත් නෑ නේද..?"

මානවී, යළිත් සොඳුරු ම මදහසක් තිළිණ කළා ය.

"අනේ නෑ අන්කල්.. අපි ඉඳිආප්ප තැම්බුවෙ නෑ.. පහළ ගෙදර ලලිතා නැන්දා කඩේට දාන්න ඉඳිආප්ප තම්බනවා.. එහෙන් ගත්තෙ.."

"එහෙනම් කමක් නෑ.. මං හිතුවා මෙච්චර මේ කරදර අස්සෙ දුව ඒකටත් වද උනාද කියලා.."

සියල්ලන්ට ම සරිලන පිළිතුරක් දෙන්නට ඒ මොහොතේ ඉදිරිපත් වූයේ වනිගසේකර මහතා ය.

"ගම්වල ජීවිතේ දැන් ඉස්සර වගේ දුෂ්කර නෑ සර්.. වාණිජ අරමුණුත් එක්ක මුහුවෙලා ගම්වල මිනිස්සුන්ගෙ ජීවිතත් දැන්

තරමකට දියුණු වෙලා තියෙන්නෙ.. ප්‍රවාහන පහසුකම් තියෙනවා.. සන්නිවේදන පහසුකම් තියෙනවා.. ගමේ තියෙන හැමදේම නගරෙට ගෙනිච්ච ගමන් සල්ලි කරගන්න පුළුවන්.. මිනිස්සුන්ට අගහිඟකම් අඩුයි.. සමහර වෙලාවලට ගම්වල මිනිස්සු නගරෙ ජීවත්වෙන මිනිස්සුන්ට වඩා පහසුවෙන් ජීවත්වෙනවා.."

"ඒක නම් ඇත්ත පියල්.. දවසක් දෙකක් මෙහෙම ඇවිත් ජීවත් වෙනකොට තමයි ඒවා හරියට ම තේරෙන්නෙ.."

රත්නජීව, කෑම පිඟාන ද රැගෙන ආලින්දය දෙසට යන්නට හැරෙනු දුටු මානවී, වහා ම ඔහුගේ ගමන වැළැක්වූවා ය.

"අන්කල් කොහෙද ඔය යන්නෙ.. මෙහෙන් ඉඳගෙන කන්න.."

"නෑ දුවේ.. මං ඉස්සරහට යන්නම්.."

රත්නජීව පත්වී ඇති අපහසුතාවය වටහා ගත් මානවී, සැහැල්ලු සිනාවක් නංවාගෙන, රත්නජීවගේ අතකින් අල්ලා නවත්වා ගත්තා ය. කෑම මේසයේ පුටුවක් ද ඇද දුන් ඈ, අවංචල දෑසින් වැඩිහිටියා දෙස බැලුවා ය.

"මේ ගෙදර.. අන්කල්ගෙ ලොකු බොස්ගෙයි.. පුංචි බොස්ගෙයි.. කොළඹ බංගලාව නෙමෙයි.. මේක.. මේ ගමේ.. දුප්පත් ගෙදරක්.. අර දොරෙන් ඇතුළට ආව කාට වුණත්.. ගෙදර ඇතුළෙදි.. සැලකෙන්නෙ.. එකම විදියට.. ඒ හින්දා අන්කලුත් ඔහොම ඉඳගෙන.. ඇතිවෙන්න බෙදාගෙන.. බඩ පිරෙන්න කන්න.."

සෑම දෙනෙතක් ම මානවී වෙතට යොමු වූයේ විස්මයෙන් විවර වූ ගමන් ම ය.





පිළිසු දින උදෑසන හතරට පමණ අවදි වූ මානවී, උදෑසන ආහාරය සඳහා කැකුළු බත් ටිකක් උයා, පොල් සම්බෝලයක් සාදා, අල තෙල් දැම්මා ය. ඈ තම පියාගේ මුහුණ දෙස බැලුවේ කරදරයට පත්වූ සිතිනි.

"අයියට මස් මාංශ දෙන්න හොඳ නෑ කිව්ව හින්දා, කන්න උයන දේවල් හිතාගන්න අමාරුයි තාත්තා.."

"ඒක නම් ඇත්ත පුතේ.. ගගුල් පුතා රෝගියා හින්දා එයාව පරිස්සම් කරන එක අපේ යුතුකම.. අපි එහෙම කරන්නෙ ඒ දරුවව සුවපත් කරන්න ඕන හින්දනේ.. ගගුල් පුතා නොකෑවට කමක් නෑ.. අනිත් අයට මොනවා හරි හදමු පුතේ.."

"ඒක නම් ඇත්ත තාත්තා.. මම මේ හිත හිතා හිටියෙ අක්කිට කන්න දෙන්න මොනවා හරි හදන්න ම එපායැ.. එයාට එළවළුයි, බතුයි විතරක් දෙන්න බෑනෙ.. මොකක්ද කොහොමද කරන්නෙ කියලා මට මේ හිතාගන්න බැරුව හිටියෙ.."

වනිගසේකර මහතා තම දියණිය දෙස බැලුවේ කරුණාවෙනි. මනුෂ්‍යත්වය නාමයෙන් මේ සියල්ල උර දරා ගත්තත්, තම දියණියගේ අනාගතයට ඒ මිනිස්කම ම පාරා වළල්ලක් වීමට ඉඩ ඇතැයි හැඟුණු මොහොතේ, වනිගසේකර මහතාගේ හදවතට පිවිසියේ සියුම් බියකි. එහෙත්, ඒ මොහොතේ ඔහු තම හැඟීම් දියණියට දැනවීමට උත්සාහ දැරුවේ නැත.



Uploaded By Sanda

"එහෙනම්.. ලුණු ටිකක් වැඩිපුර දාලා.. කීලං කරවල කෑල්ලක් තෙල් දාන්නං තාත්තා..?"

"එහෙම කරමු පුතේ.."

චේතනා අවදි වී මුළුතැන්ගෙයට පැමිණියේ ඒ මොහොතේ ය.

"අක්කි.. ඔය තියෙන වතුර ටිකෙන් ඔයාගෙ තේ එක හදාගෙන.. වතුර එකක් කෙට්ල් එකට දාන්නකො අන්කල්ලට තේ හදන්න.."

චේතනා, සැමියාගේ නිවසට පිටත් කර හරින්නැයි කී මොහොතේ පටන් මානවී පසු වූයේ සිතෙහි පටවා ගත් අසාමාන්‍ය බරකිනි. කුසෙහි දරුවෙකුත් දරාගෙන හිඳින සොයුරිය පිටත් කර හරින්නට ඇයට සිත එකඟ කර ගත නොහැකි වූයෙන්, කළ යුත්තේ කුමක්දැයි ඈ සිටියේ ම දස අතේ කල්පනා කරමිනි.

චේතනා තම සොයුරියගේ අසාමාන්‍ය කල්පනාව ප්‍රශ්නයක් වූයෙන්, පියා එහෙ මෙහෙ වන තුරු හිඳ, ඈ සොයුරිය වෙත දෑස රැඳෙව්වා ය.

"ඇයි නංගි.. මොනවද ඔය තරම් කල්පනා කරන්නෙ..?"

කිසිවක් හමුවේ කල් මරමින් කාලය ගත කිරීම මානවීගේ සාමාන්‍ය පුරුද්ද නොවුණු බැවින්, ඈ ඒ මොහොතේත් තමාට දැනුණු හැඟුණු දෑ වචන බවට පත් කළා ය.

"මං කල්පනා කළේ ඔයා ගැන අක්කි.. වෙන මොනවත් නෙමෙයි.."

පිළියෙළ කරගත් තේ කෝප්පය අතට ගෙන, අසල ම වූ පුටුවට බර වූ චේතනා තම සොයුරිය දෙස බැලුවේ අසරණ දෑසිනි.

"මං ගැන..? ඇයි නංගි..?"





"ලොකු හාමුදුරුවො ඔයාව යවන්න කිව්වට.. ඔය දරුවත් බඩේ තියන් ඉන්න ඔයාව මට එහෙම එක පාරට ම හිත හදාගෙන යවන්න බෑ අක්කි.. මම මනුස්සයෙක්.. මට එහෙම කරනවා තියා හිතන්නවත් බෑ.."

චේතනාට, හැඬිණි. නොසිතූ මොහොතක හැඬිණි. තමා පිටුපා ගියේ රත්තරන් හදවතක් හිමි පියෙකුටත්, සොයුරියකටත් වග දැනෙද්දී, ඇගේ ළයට දැනුණේ ඉහිලුම් නොදෙන ශෝකයකි.

"මං දන්නවා.. මම ඔය දෙන්නා ගැන නොහිතුවට.. තාත්තයි, නංගියි මං ගැන කොච්චර හිතනවද කියලා..?"

"දැන් ඔයා අඬන්නෙ මොකටද අක්කි..? අපි කිව්වෙ නෑනෙ ඔයාව යවනවා කියලා.."

වනිගසේකර මහතාට ද දෙසෝයුරියන්ගේ සංවාදය සවනට වැටී තිබිණි.

"මං දන්නෑ නංගි.. මට තේරෙන්නෙ නෑ මොකුත්.. කරගත්ත මෝඩකම් ගැන දුක්වෙනවා පසුතැවෙනවා ඇරෙන්න මට වෙන කරන්න දේකුත් නෑ දැන්.. මං අසරණයි තාත්තා.. මං අසරණයි.."

"හරි.. හරි.. දැන් නාඩා ඉන්න ලොකු දුව.. මොනවා හරි බලලා කරමු.. ලොකු සර්ලව පිටත් කරන්න ඕන.. අර දරුවගෙ කකුලෙ බෙහෙත් ගාන්න ඕන.. කොච්චර වැඩ තියෙනවද ලොකු දුව.. දැන් අඬන්නෙ නැතුව ඔය කිරි එක බීලා ඉන්න.."

මානවී, ඒ මොහොතත් අතිශය තීරණාත්මක මොහොතක් බවට පත් කර ගත්තාය.

"තාත්තා.. මම මේක පැය ගාණක් තිස්සෙ කල්පනා කළා.. මෙයාගෙ මහත්තයා මෙසන් බාස් උනාට.. එයා, මෙයාට මේ ආත්මෙ නම් ගෙයක් හදලා දෙන එකක් නෑ.. ඒ කියලා ඉතින් තාත්තටයි, මටයි මෙයාව අහක දාන්න බෑනෙ.. අර රොත්තක් මැදට ගිහින් වැටුණම ඔයාට හරියට කන්නවත් හම්බ වෙන්න නෑ



Uploaded By Sanda

කියලා මං දන්නවා.. එහෙම උනොත්.. තාත්තටයි, මටයි මෙහෙ ඉඳන් උයාගෙන කන්න පුළුවන්ද..?"

වනිගසේකර මහතා, තම බාල දියණිය වෙත හැරුණේ ය.

"අපි දෙන්නා කියලා මොනවා කරන්නද පුතේ.. දැන දැනමනෙ මෙයා ඔය දූකට වැටුණේ.."

මානවීට, චේතනාට හෝ වනිගසේකර මහතාට වචනයකට හෝ ඉඩක් නොවුණේ, ගගුල්, රත්නජීව සමගින් මුළුතැන්ගෙය හරහා නාන කාමරයට යන්නට පැමිණි බැවිණි. චේතනාගේ කම්මුල මත ඇඳුළු කඳුළු පාරවල් දෙක තුන පිස දමා ගැනීමට හෝ ඇයට අවසරයක් නොවිණි. ගගුල්, චේතනා දෙස බලා, මානවී දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයෙනි.

මානවී, වහා ම කරමින් උන් කාර්යය නවතා, නාන කාමරයේ දොර විවෘත කර දුන්නා ය.

"අයියෙ.. අර පුටුව එහෙම ම අයිනෙ තිබුණාවෙ.. ඔයාට ලේසියිනෙ.. ඇතුළට ගිහින් වාඩිවෙන්නකො.. මම කකුලෙ ඉටිමල්ල දාන්නම්.."

ගගුල් හිස සැලුවා පමණි.

"නංගි.."

"ම්.."

"ඇයි අර අක්කා අඬන්නෙ..?"

"ආ.. ඒ.. මේ පොඩි දූකක් දැනිලා.."

මානවී, සැහැල්ලු වන්නට වෙර දැරුවත්, ගගුල් එය විශ්වාස කළේ නැත. තමාගේ පය පාමුල පහත් වී, ඉටි බෑගය ගෙන පාදය ආවරණය කරන යුවතිය දෙස ම ගගුල්ගේ දෑස යොමු වී තිබුණත්, ඇ වැරදී හෝ හිස ඔසවා ඔහු දෙස බැලුවේ නැත.





"ඔන්න හරි.. දැන් කකුල තෙමෙන්නෙ නෑ.. ඉක්මනට මූණ හෝදගෙන, ඇඳුම් මාරු කරගෙන එන්නකො.. මම තේ හදලා තියන්නම්.. ඇඳගෙන ඉන්න ඇඳුම් ටික අර බේසමට ම දාන්න.. ඔන්න මං ගියා.. දොර වහගන්න අයියෙ.."

මානවී, නාන කාමරයෙන් පිටත්ව යන්නට සූදානම් වෙද්දී, ගගුල් යන්නට නොදී, ඇගේ සුරතින් අල්ලා ගත්තේ, හිතා මතා හෝ, ඇගේ අවසර ගෙන හෝ නොවේ. ඒ සියල්ල.. දෛවයේ අහඹු සැලසුම් විය.

"ප්ලීස්.. කියලා යන්නකො.. ඇයි ඔයාගෙ අක්කි අඬන්නෙ..?"

මානවී, මොහොතක් තරුණයා දෙස බලා උන්නා ය. අනුන් සතු උයනක පිපි මලක් දෙස, එතරම් විවෘත දෑසකින් බලන්නට තමාට සවි දුන්නාට, ඇ තමාගේ දෛවයට ස්තුතිවන්ත වූවා ය.

"කියන්න ම ඕනද..? ඊට වඩා කිසිම අවසරයක් නැතුව නොදන්වා ගෑනු ළමයෙකුගෙ අතකින් ඔහොම අල්ලා ගන්න සිරිතක් තියෙනවද..?"

ගගුල්, ඒ මොහොතේ, මානවී දෙස බැලුවේ පෙර කිසිදා යුවතියක දෙස නොබැලූ වෙනස් ම දෑසකිනි.

"ඔයාට මට කියන්න ම වෙනවා නංගි.. මට හිතෙනවා අක්කට අඬන්න උනේ මං ආව හින්දා.. කියලා.."

මානවී, තිගැස්සී ගගුල් දෙස බැලුවා ය. තව දුරටත්.. ඔහුට බොරු කියා තමාට සඟවා ගන්නට සත්‍යයක් නොවන බව ඇ පසක් කර ගත්තා ය.

"අයියෙ.. අපිට අක්කිත් ඕන.. ඔයත් ඕන.. මමයි තාත්තයි.. ඔය දෙන්නව ම බලාගන්න ඕන.. ඒ හින්දා.. මම මොකක් හරි උත්තරයක් හොයන්නම්.. අයියට ඒවා හිතන්න තහනම්.. තේරුණානේ.."



Uploaded By Sanda

මානවී, සෙමින්, තරුණයාගේ සුරතින් තමාගේ සුරත මුදා ගත්තා ය. ගගුල්.. මානවී දෙස බලා සිටියේ දෑස් අදහාගත නොහැකිව ය. හදිසියේ තමා ඉදිරියේ ප්‍රාදුර්භූත වූ ප්‍රතිමාවකට පණ ලැබී.. ඒ ප්‍රතිමාව තමා ඉදිරියේ හිඳ දොඩන කරුණාභරිත වදන් අදහාගත නොහැකිව.. ඔහු මොහොතක් ගල් ගැසී බලා සිටියේ ය. ජීවිතයට කුමක් සිදුවන්නට යන්නේදැයි ඔහු ම දැන සිටියේ නැත.

'දෙයියනේ.. මොනවද ඒ මානවී කියලා ගියේ.. අපිට.. අක්කත් ඕන ඔයත් ඕන..!'

ඒ වදන් දෙසවන් තුළ රඳවා ගන්නට මෙන් ගගුල්, මොහොතකට දෑතින් ම දෙසවන් වසා ගත්තේ ය.

'අක්කත් ඕන.. ඔයත් ඕන..!!!'

ගගුල්.. යළි යළිත් සිහි කළේ හද පුරවා ගත් ලෝබකමකිනි.

විනාඩි දහයක පමණ කාලයක් බලා හිඳ බැරි ම තැන, මානවී නාන කාමරයේ දොරටුවට තට්ටු කළා ය. එතෙක් වේලා අලුත් ජීවිතය හා සබැඳි අනේක විධ සිතිවිලි සමඟ කල්පනා ලොවක කිමිදී උන් ගගුල් පියවි ලොවට පිවිසියේ ඒ මොහොතේ ය.

"අයියෙ.. ඇයි පරක්කු.. මේ තේ එක නිවෙනවා.."

මානවීගේ හඬ ගගුල්ගේ දෙසවනට වැටුණේ මිහිරි ම ගීතයක පදවැල් ලෙසිනි.

"සර්.. තේ එක ගේන්ඩද..?"

අතීත දිනවලදී දුරකථනය ඔස්සේ නැගුණු මෙහෙකාරියගේ ඒ බයාදු හඬට වඩා, මානවීගේ සජීවී, ළෙන්ගතු හඬ ඇසීම පවා කවර වාසනාවක්දැයි සිතමින් ගගුල් වහා ඇඟපත දොවා ගත්තේ ය. ආගන්තුක සුරපුරයේ මනුෂ්‍යත්වයෙන් පිරි මනරම් බව විසින් ඔහුගේ හදවත සොම්නසින් පුරවා තිබිණි. මුළුතැන්ගෙය තුළ වන





දහසකුත් කටයුතු අතරේ මානවීගේ මුවින් ගිලිහෙන සොඳුරු ම පදවැලක් ගගුල්ගේ සවන් සිප ගන්නට වූයේ ද ඒ අතර ය.

- හඬන්න ළංව ඇති ඔබේ නුවන් පුරා
ඇඳෙන්නෙ ජීවිතේ කතාව දෝ
හෙළන්න බැරිව ලතවෙනා සුසුම් සදා
කියන්නෙ ජීවිතේ මුළාවදෝ..

තරු ඇසක් ඇරී උදා ගිරේ
බිම්මලක් මුවින් හිනා නැගේ
තරු ඇසේ කතා මියේ ද
බිම් මලේ හිනා මැකේ ද
මේ.. වෙනස දෝ ආදරේ..

සඳ රැහැන් වැටී සුනිල් දියේ
කුමුදු මල් දෙතොල් විදා පිපේ
හිරු ඇවිත් එමල් දවා ද
ඒ දුකත් වසන්ව යා ද
මේ අරුත දෝ ආදරේ.. -

ගගුල්, නාන කාමරයෙන් පිටතට පැමිණි, පෙර දින දක්වා මානවීගේ කාමරය වූ, එහෙත් පසුව ගගුල් වෙනුවෙන් වෙන් කළ කාමරයට ගිය පසු, මානවී ඔහුගේ උදෑසන තේ කෝප්පය රැගෙන ඔහු පසුපසින් ම කාමරයට ගියා ය. කාමරයට පිවිසුණු මානවී දෙස ගගුල් බැලුවේ කෘත ගුණ පිරි දෑසිනි.

"ගොඩක් පින් නංගි.."

"මොනවටද දෙයියනේ..? පින්.. පින්.. පින්.. ඇයි මේ හැම තිස්සෙ..???"

"අවුරුදු ගාණකට පස්සෙ මට හොඳට නින්ද ගියා.."



Uploaded By Sanda

"ඉස්සරහට හැමදාම හොඳට නින්ද යයි අයියෙ.. පින් දෙන්න ඕන මට නෙමෙයි.. අපේ ලොකු හාමුදුරුවන්ට.. පුළුවන් තරම් කැප වෙලා අපි මේ අසනීපෙ සනීප කරගමු අයියෙ.."

මානවී, යහන මත හිඳ ගත් ගඟුල් වෙත තේ කෝප්පය දිගු කළා ය. දෝතින් ම තේ කෝප්පය බාර ගත් ගඟුල් එය උකුළ මතින් තබා ගත්තේ ය.

"ඇයි.. මට.. මේ කාමරේ දුන්නෙ නංගි.. ජීවිත කාලෙ ම ඔයා හිටිය කාමරේ.. ආවා විතරයි.. කිසිම ලෝබකමක් නැතුව දීලා අයින් උනා..?"

"මම අයියට මගෙ කාමරේ දුන්නෙ.. ගෙදරට තියෙන ලොකු ම කාමරේ මේක හින්දා.. අනික.. මගෙ කාමරේ කියලා.. මේකෙ කොහෙද ගහලා තියෙන්නෙ..? හදිස්සියෙ මැරුණොත්..? මේවා සේරම දාලා යන්නෙපායැ අයියෙ.. ඔයා ඕවා හිතන්න එපා අනේ.."

ඈ, නොදැරියක මෙන් කියවාගෙන යද්දි, පුදුම නොවී හිඳින්නට ගඟුල් දැන සිටියේ නැත.

"මං දෙයක් කියන්නමයි කාමරේට ම ආවෙ අයියෙ.."

ගඟුල්, මානවී දෙස දෑස් විදා බැලුවේ ය.

"අන්කල් යනවා කිව්ව ම.. ඔයාට ගොඩක් දුක ඇති තමයි අයියෙ.. ඒත්.. ඔයා අන්කල්ට ඒ දුක පෙන්නන්න එපා.. හිතේ නිදහසෙන් අන්කල්ට යන්න දෙන්න අයියෙ.."

ගඟුල්, කාලාන්තරයකට පසු සොඳුරු ම සොඳුරු මදහසක් මුවගට නගා ගත්තේ ය.

"මං.. එහෙම ඉන්නම් නංගි.."

"හිතට කොච්චර දුක උනත්.. ඔයා සනීප වෙනවා තරම් සුවයක් ඔයාට නැනෙ අයියෙ.. ඒ හින්දා.. අනිත් හැමදේම ටික කාලෙකට අමතක කරලා.. ලෙඩේ සනීප කරගන්න බලමු.."



Uploaded By Sanda



මානවී කීවේ, මවක, කුඩා දරුවෙකුට යමක් පහදා දෙන්නාක් බඳු මෘදු හඬකිනි.

"තේ එක හරි ම රහයි.. තැන්ක් යූ නංගි.."

"ඒක ටිකක් නිවුණත් එක්ක.. කොහෙද අයියා ඉතින් බාත්රූම් එක අස්සට වෙලා කල්පනා කර කර හිටියනේ.."

"ඔයා කොහොමද එහෙම කියන්නෙ..? ඔයාට දිවැසුත් තියෙනවද නංගි..?"

"ඕකට ඉතින් දිවැස් ඕනයැ.. වෙච්ච දේ නොතේරෙන්න මං පොඩි බබෙක්යැ.. මොනවා හරි දෙයක් ගැන අයියා දිගට හරහට කල්පනා කරන්න ඇති.."

මොහොතින් මොහොත පුදුමයෙන් විසල් වන ගඟුල්ගේ දෙනෙත් මග හැරි මානවී, කාමරය සිසාරා දෙනෙත් දිවෙව්වා ය.

"මං මේ අල්මාරියත් කොහෙට හරි දාන්නම් අයියෙ.. එතකොට ඔයාට කාමරේ තවත් නිදහස්.."

"පිස්සුද නංගි.. ඒක එහෙම තිබුණාවේ.. මට මේ ඇඳ තිබුණාම හොඳට ම ඇති.. හතර දෙනෙකුට විතර අත පය දිගෑරලා නිදාගන්න පුළුවන් ඇඳ මට දීලා අර පුංචි ඇඳේ නිදාගන්න ගියා.. ඒ මදිවට අනිත් ඒවත් අස් කරන්න අහනවා.. පිස්සුද ඇත්තට ම..?"

සමරසිංහ මහතා, මානවීගේ කාමරයට පැමිණියේ සිනා මුසුව ය.

"ඒ ගමන මොකද..? ආයෙත් රණ්ඩුවක්ද..?"

"නෑ අන්කල්.. මම මේ අයියා තේ එක බොනකල් ළඟට වෙලා හිටියෙ... නැත්තං ඒකත් අතේ තියන් තේ එක නිවෙනකල් කල්පනා කරයි.."

සමරසිංහ මහතා යුවතිය දෙස බැලුවේ ගෞරවයෙනි.

"දැන් පුතා මොනවා කල්පනා කරන්නද දූව.. ගෙදර හිටියට වැඩිය දහස් ගුණයක් සුවපහසු තැනක් හම්බ වෙලා තියෙනකොට.. ලොකු හාමුදුරුවන්ගෙ වචනෙ විශ්වාස කරගෙන ඉන්නවා මිසක්.. මගෙ පුතාට වෙන කල්පනා කරන්න දෙයක් නෑ දැන්.."

සමරසිංහ මහතා කීවේ ස්ථිර සාර හඬකිනි.

"මං අයියට කියන්න හැදුවෙ අන්කල්.. අන්කල්ට තනියම හැමදේම කරගන්න බැනෙ.. බිස්නස් එකේ වැඩ ටික ඔන් ලයින් හැන්ඩ්ල් කරන්න පුළුවන්නෙ අයියට මෙහෙ ඉඳන් ම.. අන්කලුත් බිස්නස් එකේ සේරම දේවල් ගැන දන්නෙ නෑ කිව්ව එකේ.. පිට මිනිස්සුන්ට ඕවා පාලනය කරන්න දෙන්න නරකයි.. ඒ මිනිස්සු ඒවා එයාලට ඕන ඕන විදියට කරන්න ගත්තොත් ඒවා විනාශ වෙලා යයි අන්කල්.."

සමරසිංහ මහතා මානවී දෙස බැලුවේ පුදුමය පුරවාගත් දෑසිනි.

"දූවත් නොදන්න දෙයක් නෑ බලන් ගියා ම.. ඒක ඇත්ත දූව.. කවදාවත් බිස්නස් එකක් පිට මිනිස්සු අතට යන්න දෙන්න හොඳ නෑ.. ගියොත් ගියා ම තමයි.."

ගඟුල්, සාවඥ සිනාවක් කට කොනකට නගා ගත්තේ ය.

"බිස්නස් එකක් කියන්නෙත් ගෑනියෙක් වගේ තමයි.. අනුන්ගෙ අතට ගියොත් බිස්නස්වලයි, අනුන්ගෙ අතට ගිය ගෑනුන්ගෙයි කිසි වෙනසක් නෑ.."

කතාව හැරවෙන්නට ගියේ වෙනත් ම අතකට ය. මානවී, වහාම ගඟුල්ගේ පියා දෙස බලා දෑසින් කුමක්දෝ ඉඟි කළා ය.

"අන්කල්.. තව චුට්ටකින් උදේට කාලා.. දවල් වෙන්නෙ නැතුව පිටත් වෙන්න.. ඊට පස්සෙ.. අයියගෙ බෙහෙත් ටික ගාලා.. මම ඔෆිස් එකට ගිහිල්ලා එන්න යනවා.."





එතෙක් වේලා සැදී තිබුණු ගඟුල්ගේ සිත එහෙම ම කඩාගෙන වැටිණි.

"නංගි.. අද වැඩට යනවද..?"

"ඔව් අයියෙ.. මං ඊයෙ විතරයි නිවාඩු දැම්මෙ.. පැය දෙකයි.. මම අද මගෙ වසමට යන්නෙ.. දොළහා වෙනකොට මං ආපහු එනවා අයියෙ.. තාත්තා ගෙදර ඉන්නවනෙ.. මං චමීර මල්ලිට කියන්නම් ටිකක් ඇවිල්ලා ඉන්න කියලා.. එතකොට අයියට පාළු නෑනෙ.."

පියාටත්, පුතාටත් තනි වන්නට ඉඩ දී, මානවී කාමරයෙන් ඉවත ගියේ මදහසක් මුව'ග රඳවාගෙන ය.

ගඟුල් අසරණ ලෙස හිස දෙපසට වැනුවේය. එහෙත්, ඒ හා සමග ම ඔහුගේ හදවත.. ඔහුගෙන් බොහෝ දෑ විමසන්නට වූයේ ය.

'එක අතකින් මම මානවීගෙනුයි, අන්කල්ගෙනුයි මීටත් වඩා මොනවා බලාපොරොත්තු වෙන්නද.. තාත්තා කිව්වා හරි.. තව ම කසාදයක්වත් බැඳලා නැති මේ කෙල්ල එයාගෙ ජීවිතේ තමයි මං වෙනුවෙන් මේ පරිත්‍යාග කරලා තියෙන්නෙ.. මේ ණය මම කවදා කොහොම ගෙවන්නද මන්දා..'

සමරසිංහ මහතා, කුඩා මේසය අද්දර තබා තිබූ පුටුව ඇද ගෙන පුතුට වඩාත් සමීපව හිඳ ගත්තේ ය.

"පුතේ.. මං දැන් ගියාට කමක් නැද්ද පුතේ..?"

"කමක් නෑ තාත්තෙ.. සති අන්තෙ තාත්තා ආපහු එනවනෙ..?"

"නොවරදවා ම එනවා පුතේ.. ඒ එනකොට සයින් කරන්න තියෙන චෙක්ස් එහෙම අරගෙන එන්නම්.. තව මොනවද ගේන්න ඕනෙ පුතේ..?"



Uploaded By Sanda

"දැනට නම් මොනවත් නෑ තාත්තේ.. මොනවා හරි තිබුණොත් මං කෝල් කළා ම කියන්නම්.. ඒක නෙමෙයි තාත්තෙ.. අපි මෙහෙට මොනවද කරන්නෙ..?"

ගඟුල්, එය විමසුවේ මදක් හඬ බාල කොට ය. පුතුගේ ක්‍රියාව සමරසිංහ මහතාට සිනා ගෙන ආවේ ය.

"පුතා.. මොකද ඒ ටික හරි හෙමින් ඇහුවෙ..?"

"අම්මෝ තාත්තෙ.. අර වස බඩ්ඩට ඇහුණොත් මට ඕකට බැණුම් අහන්න වෙයි.. දන්නවනෙ හැටි.. අපෙන් දෙයක් ගන්න නම් කැමති වෙන එකක් නෑ.. දෙන දෙයක් අපිට ඉතින් බලහත්කාරයෙන් තමයි ගෙනත් දෙන්න වෙන්නෙ.."

"අපොයි ඔව්.. ඇහුණොත් අපි දෙන්නට ම බනියි තමයි.. මම එනකොට හිතලා මොන මොනවා හරි ගේන්නම්කො පුතේ.. මේ මිනිස්සුන්ට බරක් වෙන්නෙ හොඳ නෑ පුතේ.. එහෙම උනොත් අපිට මහ පවක් සිද්ධ වෙන්නෙ.."

ගඟුල්ගේ පියා එතෙකින් නොනැවති, තම පුතු දෙස බැලුවේ, සැනසීම පුරවා ගත් දෑසිනි.

"අර දරුවට වස බඩ්ඩ කියන්නෙපා පුතේ.. පව්.. ඒ ළමයගෙ හොඳ වැඩිකම තමයි ඒ සැර වැර වගේ අපිට පේන්නෙ.."

ගඟුල්ගේ මුව මත ඇඳී ගියේ අපූර්වතම හැසරැල්ලකි. පුතුගේ සමස්ත ජීවිතයේ සැනසීම එහි විණැ'යි සමරසිංහ මහතා ඒ මොහොතේ හඳුනා ගත්තේ නැත.

"අනේ නෑ තාත්තෙ.. මම විහිළුවට කිව්වෙ.. මගෙ ම අම්මත් එපා කිව්ව මාවනෙ තාත්තෙ එයා මේ ජීවිතේ පරදුවට තියලා බාර ගත්තෙ.. කවද හරි මේ තාත්තටයි, දුවටයි කකුල් දෙක ළඟ වැටිලා සැලකුවත් අපිට පව් නෑ තාත්තෙ.. අවුරුද්දක් විතර බෙහෙත් කරන්න වෙනවා කිව්ව ම.. එච්චර කාලයක් නවත්තගෙන සාත්තු සප්පායම් කරන්නෙ කොහොමද කියලා වෙන මිනිස්සු නම් බයේ





වෙව්ලයි.. ඒත්.. ඒ වෙලාවෙත් මේ තාත්තගෙයි, දුවගෙයි මූණුවල තිබුණෙ යාන්තමට තැවරිච්ච ලස්සන ළා පාට හිනාවක්.. ඒ මනුස්සකමට දෙන්න ඕන නම මොකක්ද කියලා මම නම් දන්නෙ නෑ තාත්තෙ.."

පිය පුතු දෙදෙනා ම කතා බහ නවතා ගත්තේ, මානවී යළි ඔවුන් අතරට ආ බැවිනි. ඇගේ මන්දස්මිතය ළඟ තමාගේ හදවත මෙතරම් නිවී පහන් වන්නේ කෙසේදැයි ගඟුල් තනිව කල්පනා කළේ ය.

"අන්කල්.. කෑම ලෑස්තියි.. යමු.. කාලා හිමින් ලෑස්ති වෙන්න.. මාටින් මාමත් ආවා බෙහෙත් ටික අරගෙන.. අයියෙ.. මම බෙහෙත් ගාලා යන්නම්.. සැරව ගලනවා නම් තාත්තට කතා කරන්න හොඳේ.. බෙහෙත් ටික අයින් වෙන්නෙ නැති වෙන්න හිමින් පිහදාන්න ඕන.. ඔයා පිහදාන්න එහෙම යන්නෙපා අයියෙ.. තේරුණාද..? මොකද තුවාල පාරාගෙන බෑ.."

ගඟුල් සියල්ලට ම හිස සැලුවේ ය.

ඒ.. ගඟුල්ගේ ජීවිත මල් වසන්තයේ ඇරඹුම වූයේ ය. එහෙත්.. කිසිවකුත් නොදැන උන් ඒ සත්‍යය දැන සිටියේ ඉසිවර නුවණින් සියල්ල දැන උන් සරණංකර හිමියෝ ම පමණි.

සමරසිංහ මහතා සහ රත්නජීව පිටත්ව යන්නට සූදානම් වූ මොහොතේ ගඟුල්ගේ හදවත කඩා වැටිණි. කුමක්දෝ නොදන්නා තනිකමක හැඟීමක් විත් ඔහුගේ ඇතුළාන්තය වෙළා ගත්තේ ය. එහෙත්, ඒ කිසිඳු දුක්බර හැඟීමක් පිතට නොපෙන්නා හිඳීමට ගඟුල් වෙර දැරුවේ ය.

"තාත්තෙ.. පහුගිය ටිකේම රත්නෙ අන්කල් මං හින්දා පුදුම දුකක් වින්දෙ.. මේ සතිය අන්කල්ට නිවාඩු දීලා ගෙදර ගිහිල්ලා එන්න කියන්න.. තාත්තට සිසිර එක්ක යන ගමනක් යන්න පුළුවන්නෙ.. මාධවීට කියන්න අන්කල්ගෙ ලීව්වලින් අඩු කරන්න එපා කිව්වා කියලා.."



Uploaded By Sanda

"මම කොහොමත් හිතන් හිටියෙ එහෙම තමයි පුතේ.. මේ මනුස්සයට නිවනක් තිබුණෙ ම නෑ පහුගිය ටිකේ.."

පිය - පුතු දෙදෙනාට පමණට වඩා පමා වෙමින්, ශෝක වෙමින් හිඳින්නට මානවී කාලයේ අවකාශය ඉතිරි කළේ නැත. පළමුව ඈ සමරසිංහ මහතාගේ දෙපා මුල දණ ගැසුවා ය. එතෙක් කාලයක් දණ ගසා වඳින දරුවන් නොවූයෙන්, මානවීගේ ඒ වැඳුම සමරසිංහ මහතාට මහ මෙරක් වූයේ ය. ඔහුගේ සිත තුළ මානවී කෙරෙහි ඉපදී තිබුණේ තමාගේ ම දියණියක විෂයයේ ඉපදෙන සෙනේබර හැඟුම් සමුදායකි.

"තෙරුවන් සරණයි දුවේ.. කරන හැමදේටම ගොඩක් පින්.."

"අයියව.. අපිට පුළුවන් තරමින්.. හොඳින් බලාගන්නම්.. අන්කල් දුක් නොවී ඉන්න.."

සමුගන්නා මොහොතේ පිය - පුතු දෙදෙනාගේ ම දෑස් තුළ නළියන කඳුළු බිඳු දෙකක් වුවත්, පිය - පුතු දෙදෙනා ම තම තමාගේ කඳුළු සඟවා ගැනීමට දරන ආයාසය මානවී දුටුවා ය. එයින්, ඇගේ සිත මදක් සුවපත් විය.

රත්නජීව විසින් පදවා ගෙන යනු ලබන, සමරසිංහ මහතාගේ මොන්ටෙරෝ රිය ඇසිල්ලකින් තුරු ලතා අතරේ සැඟවී ගියේ ය.

මානවී, ගගුල් දෙස බැලුවේ, පෙර දිනයට වඩා බොහෝ සෙයින් ළෙන්ගතු දෑසිනි.

"අයියෙ.. මේ.. හැමදේම.. ඔයා සනීප වෙන්න ඕන හින්දනේ.. අපි ඉන්නවනේ.. දුක හිතන්නෙපා හොඳේ..."

ආලින්දයේ දොර උළුවස්සට හේත්තු වී හිඳින සොයුරිය දෙස මානවී බැලුවේ හිස් දෑසිනි.

"අක්කි.. යන්න ගිහිල්ලා තාත්තවත් අඬ ගහගෙන කන්න..



Uploaded By Sanda



මට එනකොට අස් කරලා දාල ම යන්න පුළුවන්.. අර මාටින් මාමා කෑම කාලා ඉවරද කියලත් බලන්න අක්කි.. බත් මදි නම් තව බත් ටිකක් බෙදලා දෙන්න.."

චේතනා, පිටව ගිය පසු ගගුල් හිස හරවා මානවී දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයෙනි. මානවීට, ඔහුගේ සිතැඟි මනාව වැටහිණි.

"අයියට තේරෙනවා නේද අපේ අක්කිට පිට ගෙදරක ගිහිල්ලා ඉන්න බැරි හේතුව... කිසිම දෙයක් ගැන ගාණක් නෑ.. ඔහේ ඉන්නවා අයියෙ.. හැමදේම ඇඟිල්ලෙන් ඇන ඇන කියන්න ඕන.. අයියා පුටුවෙ ඉඳන් කකුල ස්ටූල් එක උඩ තියාගෙන ඉන්නවද..? ඇඳට ගිහින් හාන්සි වෙනවද..?"

ගගුල්, මොහොතක් කල්පනා කළේ ය. මානවීගේ දෑස කලබලයෙන් හෝරා යන්ත්‍රයේ කටු අතර නතර විය. පෙරවරු අටයි දහය ලෙස එහි සටහන්ව තිබිණි.

"නංගි වැඩට යන්න.. ගියාට පස්සෙ මම කාමරේට යන්නම්.."

හිස සැලූ මානවී, වහා ම මුළුතැන්ගෙය දෙසට ගොස් මද උණුසුම් ජල බඳුනක් රැගෙන ආවේ ගගුල්ගේ පාදය සෝදා පිරිසිදු කරන්නට ය. විනාඩි දහයක පමණ කාලයකින්, තුවාලය පිරිසිදු කළ මානවී, සරණංකර හිමියන් එවා තිබූ ඖෂධ ආලේපය, පාදයේ ගල්වන්නට වූයේ ගගුල්ගේ වේදනාකාරී මුහුණ දෙස නොබලමිනි.

"අයියෙ මම පුළුවන් තරම් බලන්නෙ.. ඔයාට කකුලෙ තුවාලයක් තියෙනවා කියලා අමතක කරවන්න.. අයියගෙ හිත වෙන දේකට යොමු වෙනකොට.. වේදනාව ටිකක් හරි අමතක වෙනවනේ.."

"ඒක නම් ඇත්ත නංගි.. මෙහෙට ඇවිත් ගෙවිලා ගිය දවස් දෙකට මට තුවාලෙ වේදනාව පුදුම විදියට අඩුවෙන් දැනුණෙ.. ලොකු හාමුදුරුවොත් මට යනකොට කියලා ගියෙ.. කකුල අමතක

කරලා.. පුළුවන් තරම් වෙන දේවල්වලට හිත යොමු කරන්න කියලා.. තුවාලෙ අපි සනීප කරන්නම්.. මහත්තයා මහත්තයගෙ හිත සනීප කරගන්න කියලා මට ලොකු හාමුදුරුවො කිව්වා නංගි.."

"ඒකනෙ.. කොච්චර වටිනා උපදේශයක්ද අයියෙ.. අපි එහෙම කරමු.."

මානවී, පාදයේ ඖෂධ ගල්වා අවසන් කොට, සිනාමුසු මුහුණින් ගඟුල් දෙස බැලුවා ය.

"නංගි.. අටහමාරයි වෙලාව.. යන්නෙ කීයටද..?"

"අටයි හතළිස් පහට.. අයියෙ.."

"විනාඩි පහළොවයි තියෙන්නෙ තව.. ලෑස්ති වෙන්න වෙලාව ඇතිද..? තව කෑවෙත් නෑනෙ ඔයා..?"

"අපෝ ඇති.. මූණ හෝදන්න විනාඩි පහයි.. ඔසරිය ඇඳගන්න විනාඩි පහයි.. කන්න විනාඩි පහයි.. ඒ වෙලාව හොඳටම ඇති.."

තමාගේ ඇස් ඉදිරියේ දඟ පාන ආශිර්වාදයේ විදුලි රේඛාව දෙස, නිර්ලෝභී දෑසින් බලන්නට ඔහුගේ තුරුණු හදවත දැන සිටියේ නැත. මොහොතින් මොහොත තමාගේ හදවත තුළ මානවී කෙරෙහි මෝදු වන සියුම් තෘෂ්ණාවට දිය හැකි නම කුමක්දැයි ගඟුල් යටි සිතින් සිතුවේ ය.

නිවස සිසාරා එතෙක් දඟ පෑ සමනලිය, සංවර ලෙස ඔසරියකින් සැරසී, තමාගේ ගෙන යා යුතු අඩුම කුඩු ම සොයා තවත් වට දෙක තුනක් නිවසේ එහෙ මෙහෙ ඇවිද ගියේ ගීයක් ද මුමුණමිනි. කෙතරම් වැඩ අධික, බැරෑරුම් අවස්ථාවක වුවත් ඈ හැසිරෙන මේ අපූර්ව සැහැල්ලුව කෙතරම් නම් චමත්කාරජනකදැයි ගඟුල් කල්පනා කළේ, දෙතොලතර ඇඳගත් සොඳුරු ම හසරැල්ලක් සමගිනි.





- ගඟුලේ බිඳෙන හීන හිනා මගේ
වඳුලේ ඇසෙන මිහිරි කතා මගේ
පෙම පිදූ නොසංගා
හී දැරූ අනංගා
ඔබ ළඟින් රුවක් ලෙසින් හිඳිමි
කුල ගෙය දෙව්ලොව සදිසී..!!! -

ගීත ඛණ්ඩය කෙළවර වූයේ 'තාත්තා' යන ආමන්ත්‍රණයෙනි. ඒ ඇසූ ගඟුල්ගේ මුවින් ලොකු සිනාවක් පිට පැන්නේ ය. පිටව යන්නට සූදානම් ව, අත්බෑගය, ලිපි ගොනු ආදිය දැමූ තවත් බෑගයක් හා හෙල්මටය රැගෙන ආලින්දයට පැමිණෙන මානවීට, ගඟුල්ගේ මුව රැඳි අපූරු හසරැල්ල දෑසට හසු විය.

"අයියෙ.. මොකද හිනාවෙන්නෙ..?"

"නෑ.. නිකම්.."

"නිකම්..? ඒක නම් කොහොමටවත් වෙන්න බෑ.. නිකම් හිනාවෙන්නෙ පිස්සො කියලා කතාවක් තියෙනවා ඔයා අහලා නැද්ද..?"

මානවී, හිනැහුණේ සැහැල්ලුවට ය.

"ඒ සිංදුවෙ අගට තාත්තා කියලා කෑල්ලකුත් තියෙනවද..?"

"ආ.. ඒකටද අයියා හිනා උනේ.. ඒ වචනෙ ඉතින් මගෙ ජීවන ගීතෙනෙ.. මගෙ කොයි කතාවත්, සිංදුවත් ඉවර වෙන්නෙ ඔය වචනෙන් තමයි.."

නිවසේ වට මිදුල දිගේ පැමිණ, වනිගසේකර මහතා පා පිස්නාවේ දෙපා පිස දමමින් ආලින්දයට ගොඩ වූයේත්, චේතනා නිවස තුළ හිඳ ආලින්දයට පැමිණියේත් එක ම විට ය.

"පොඩි දූව.. හොඳට ම පරක්කුයි පුතේ.. පරිස්සමට යන්න ඕන..!"



Uploaded By Sanda

"මං පරිස්සමට යන්නම් තාත්තා.."

මානවී, සිනාමුසුව තිදෙනා දෙස ම බැලුවා ය.

"දොළහ වෙනකොට මං එනවා තාත්තා.. මං ඇවිත් උයන්නම් ටක් ගාලා.. තාත්තා කරදර වෙන්නෙපා.. අයියට ඉතින් මේ කැළේ කොළේ දේනෙ කන්න උයලා දෙන්න තියෙන්නෙ.. ඒ හින්දා උයන එකේ කිසි කරදරයකුත් නෑනෙ.."

මානවී, ඒ සිනා මුසු දෑසින් ම ගඟුල් දෙස බැලුවා ය.

"තාත්තා තේ හදලා දෙයි අයියෙ.. බොන්න හොඳේ.. පහුගිය කාලෙ ම හරි හැටි නින්දක් නැති එකේ.. කම්මැලි හිතුණොත් නිදාගන්න ටිකක්.."

සැහැල්ලු සිනාවක් දෙතොලතර තවරා ගත් ගඟුල්, මානවී දෙස බලා චේතනා දෙස බැලුවේ ය.

"ඇයි නංගි තාත්තා තේ හදන්නෙ.. මේ අක්කා ඉන්නෙ.. ඕන උනොත් මං අක්කගෙන් තේ එකක් ඉල්ලගන්නම්කො.."

අත තිබූ ගමන් මළු දෙක ස්ටූලය මත තබමින්, මානවී තම සොයුරිය දෙස බැලුවේ අවඥා සහගත සිනා රැල්ලක් දෙතොල කොන ඈඳගෙන ය.

"ආ..පෝ.. අයියෙ.. මෙයාද..? මෙයා තේ හැදුවොත්.. අද අයියා තේ බොන අන්තිම දවස තමයි.."

සියල්ලෝ ම සිනා සයුරේ ගිල්වමින් කියූ මානවී, තම පියාගේ දෙපා නමැද, සොයුරිය ඉදිරියේ ද පහත් වී වැන්දා ය.

සියුම් අපහසුතාවක් විත් හදවත වෙළාගත්ත ද, ඈ, ගඟුල් ඉදිරියේ ද පහත් වී දෑත් එකතු කළා ය.

"ගිහින් එන්නම් අයියෙ.. පරිස්සමට ඉන්න හොඳේ.."





එහෙත්, සිනාමුසුව උන්නත්, මානවී තමාට ද නමස්කාර කළ මොහොතේ, ගඟුල්ගේ උගුර මුල යමක් සිරවී, මුළු ළය ම ඇදුම් කන්නට විය.

'මේ කෙල්ල.. මොකක්ද මේ කළේ..? මට වැන්දා නේද..??? පළවෙනි ම වතාවට.. කෙනෙක් මට වැන්දා නේද මේ..???'

ඒ මොහොතේ තමා සිතිය යුත්තේ මොනවාදැයි, තම සිතට දැනුනේ හැඟුණේ මොනවාදැයි සිතා ගන්නට පවා නොහැකි වූ ගඟුල්ගේ මුව ගොළු වී, මොහොතකට දෙකකට සෙල් පිළිමයක් සේ නිසල වූයේ ය.

නිවසේ වම් පසට වන්නට සාදා තිබූ කුඩා ගරාජයෙන් තම ස්කූටරය පිටතට ගත් මානවී, එය පණ ගන්වා ඉදිරියට ගත්තේ ද සුපුරුදු සැහැල්ලුවෙනි. තිදෙනාට ම පොදුවේ අත වැනූ මානවී, සිනා මුසුව පිටවී යන අන්දම ගඟුල් බලා සිටියේ ගල් ගැසීගෙන ය.

'සිද්ධ වෙන හැමදේ ම.. ෆිල්ම් එක් වගේ.. ලස්සනයි.. කිරිල්ලි වගේ බයික් එකේ නැගලා ගිය රිලැක්ස් එක..??? ගමේ කෙල්ලෙක් උනාට.. මොකක්ද මේ කෙල්ලගෙ තියෙන මේ ඇට්‍රැක්ටිව් පර්සනැලිටි එක...??? සේරටම වඩා මට ලස්සන අර කළු පාට ඉණට දිග කර්ලි හෙයා එක.. දකිනකොට අත ගාලා බලන්න තරම් ලෝබ හිතෙනවා..'

මොහොතකින්, ගඟුල්ගේ හදවතට දැනුණේ තමා මහා වරදක් කළාක් බඳු පසුතැවීමකි.

'මටත් පිස්සු.. මොනවද මම මේ හිතන්නෙ..? මම කසාද බැඳපු මිනිහෙක්.. ඒ මදිවට කවදා හරි හොඳ වෙයිද කියලා දන්නෙවත් නැති ජරා ම ලෙඩක් හැදිලා තියෙන මිනිහෙක්.. තවත් ගෑනු ළමයෙක් ගැන මොහොතකටවත් හිතන්නවත් මට අයිතියක් තියෙනවද..? ඊටත් එහෙම හිතන එක මොන ගුණමකුකමක්ද..?'



Uploaded By Sanda

ගඟුල්ගේ කල්පනාවලිය බිඳ වැටුණේ, චේතනාගේ හඬිනි.

"මල්ලි.. මොනවද කල්පනා කරන්නෙ..?"

චේතනා, ඒ සම්ප්‍රදායික පැනය විමසුවේ, සිරිතට මිස නිශ්චිත අරුතක් ඇතිව නොවේ.

"මොකුත් නෑ අක්කෙ..?"

චේතනාගේ මුහුණේ සැහැල්ලු හසරැල්ලක් ඇඳිණි.

"මොකුත් නැති බව.. මූණ දිහා බැලුවම පේනවා.."

ගඟුල් ද, චේතනාගේ සැහැල්ලුවට එක් වන්නට වෙර දැරුවේ ය.

"ඇත්තට ම.. මං කල්පනා කළෙ ඔයාගෙ නංගි ගැන අක්කෙ.. මානවී හරියට නිකම් පුංචි මැෂින් එකක් වගේ.. වැඩ.. වැඩ.. වැඩ.. ඒ උනත් එයාගෙ මූණ ඕන වෙලාවක හිනාවෙන් පිරිලා.. ඕන වෙලාවක සිංදුවක් කියාගන්න ගමන් නේද ඉන්නෙ..? මට නම් හරි පුදුමයි.. ඔච්චර වැඩ ගොඩක් එක්ක ඔහොම සැහැල්ලුවෙන් ඉන්න ගෑනු ළමයෙක් මං දැක්කමයි.."

ගඟුල්ට සමීපයේ ම වූ අසුනකට බර වූ චේතනා, දිගු සුසුමක් හෙළා මලානික සිනාවක් පෑවා ය.

"අපේ නංගි.. ගොඩක් හොඳ ළමයෙක් මල්ලි.. ඒකයි මොන ප්‍රශ්න ආවත්.. හිනාවෙලා ඒවට මූණ දෙන්න එයාට පුළුවන් වෙලා තියෙන්නෙ.."

ගඟුල් චේතනාට සවන් දෙන්නට වූයේ, රසවත් කතන්දරයකට උද්යෝගයෙන් සවන් දෙන කුඩා දරුවෙකු මෙනි.

"පුංචි කාලෙ ඉඳන් නංගිට ගමේ අය උනත් හරි ම ආදරෙයි මල්ලි.. අපේ නංගිත් මිනිස්සුන්ට පුදුම ආදරෙයි.."





"ඒක හින්දා වෙන්න ඇති එයා මේ වගේ රස්සාවක් තෝරා ගන්න ඇත්තෙත්.. කැම්පස් ගිහින් ඩිග්‍රි ගන්න හුගාක් අය හොයන්නෙ සීතල කාමරවල කැරකෙන පුටුවල ඉඳන් කරන්න පුළුවන් ජොබ්ස්.. මෙහෙම ෆීල්ඩ් එකට බැහැලා වැඩ කරන්න පුළුවන් ජොබ් එකක් උවමනාවෙන් හොයා ගන්නවා කියන්නෙ ම.. මිනිස්සුන්ට සේවය කරන්න ඕනකමට හොයාගත්ත රස්සාවක් කියන එකනෙ.. ඒ හැඟීම කොච්චර වටිනවද අක්කෙ..?"

චේතනා, ගඟුල් හා එකඟ වී හිස සැලුවා ය.

"අක්කෙ.. මාව වරදවලා තේරුම් ගන්න එපා ප්ලීස්.. මගෙ හිතට බරක් නිසයි මම මේ ප්‍රශ්නෙ අහන්න ඕන කියලා හිතුවෙ.. ප්ලීස්.. මාව වරදවලා නම් තේරුම් ගන්න එපා.."

චේතනා, ගඟුල්ගේ ආයාචනාත්මක හඬ අසා සිටියේ පුදුමයෙනි.

"ඕන දෙයක් අහන්න මල්ලි.. ඔයා දැන් මේ ගෙදර කෙනෙක්.. ඔයත් හැමදේම දැනගන්න ඕනනේ.. අහන්න මල්ලි.. මම ඔයාව වරදවා හිතන්නෙ නෑ.."

ගඟුල් හිත අල්ලා ගත්තේ ආයාසයෙනි. ලැබෙන පිළිතුර කුමක් වුවත් ඔහු සවිමත්ව ඒ සියල්ල දරා ගත යුතුව තිබිණි.

"මානවී.. තාම මැරි කළේ නැත්තෙ ඇයි අක්කෙ..?"

චේතනා, දිගු සුසුමක් ඉහළට ඇද ගත්තා ය.

"මල්ලි.. ඔය ප්‍රශ්නෙ හරි ම ඉක්මනට මගෙන් අහයි කියල මං දැනගෙන හිටියා.."

"ඇත්තට ම ඔව් අක්කෙ.. මට ඒ ප්‍රශ්නෙ ඉක්මනට අහන උවමනාවක් තිබුණා.. ඒක මට මානවීගෙන් අහන්න පුළුවන්කමක් තිබුණෙ නෑ.. මොකද එයාගෙ හිත රිදෙන දෙයක් අතීතෙ වෙලා තිබුණා නම්.. මම ඒ ප්‍රශ්නෙ ඇහුවොත් ආයෙමත් එයාගෙ හිත රිදෙනවනෙ.."



Uploaded By Sanda

"අනේ නෑ මල්ලි.. එහෙම කිසිම දෙයක් නෑ.. නංගි හැමදාම කියන්නෙ.. ගොඩක් පිරිමි හරිම ආත්මාර්ථකාමියිලු.. ඇත්තටම ගෑනියෙකුට ආදරේ කරපු පිරිමියෙකුට තාම එයා දැකලා තියෙන්නෙ අපේ තාත්තා විතරලු.. නංගි කවදාවත් පිරිමි ළමයෙක් එක්ක සම්බන්ධයක් තිබ්ලා නෑ මල්ලි.. මම සජිත් එක්ක යාළුවෙලා කරගත්ත මෝඩකම් දැකලා.. පුළුවන් නම් එයා කසාද නොබැඳ ම ඉඳී.. ඒත්.. එයා එහෙම තීරණයක් ගන්නෙ නෑ තාත්තා පව් කියලා.."

චේතනා, කිසිදු වාරණයකින් තොරව, සියල්ල වමාරමින් උන්නා ය. නිශ්චිත හේතුවක් හඳුනා නොගත්තත්, ගගුල්ගේ හිත තුළ කුමක්දෝ සැහැල්ලුවක් පැතිරී තිබිණි.

"මං හිතුවා අක්කෙ.. මානවීට කවුරුත් නැතුව ඇති කියලා.. එයාට කවුරු හරි පිරිමි ළමයෙක් හිටියා නම්.. මං ළඟ එයාට එච්චර සැහැල්ලුවෙන් හැසිරෙන්න බෑ කියලා මං දන්නවා.."

ගගුල්ගේ හදවත මහා සොම්නසකින් ඉපිලෙන්නට විය. ඈ නිදහස් විහඟක වුවත්, තමා තවකෙකු හා බැඳුණු අසරණයකු වග ඔහුට ඒ මොහොතේ බිඳකට හෝ සිහිපත් වූයේ නැත.

" දැන් අවුරුදු දෙකක විතර ඉඳන් තාත්තා නංගිට ප්‍රපෝසල්ස් බලනවා.. ප්‍රපෝසල්ස් පහක් ආවා.. ඒ එකකටවත් නංගි කැමති උනේ නෑ මල්ලි.."

කතාවේ වැදගත් ම කොටස එය නොවේදැයි ගගුල්ට සැණෙකින් සිතිණි. ඔහු, චේතනාගේ උවන දෙස බලා සිටියේ පෙරටත් වඩා වැඩි උනන්දුවකිනි.

"ඇයි මානවී ඒවට කැමති නැත්තෙ..?"

චේතනාගේ දෙතොලතර යළිත් ඇඳී ගියේ සැහැල්ලු හසරැල්ලකි.

වනිගසේකර මහතා ආලින්දයට පැමිණියේ ඒ මොහොතේ ය.





"පුතාට දවල් වෙලා නාගන්න මම වතුර මුට්ටියක් ලිපේ තිබ්බා.."

"අනේ.. ඇයි අන්කල් ඒ..?"

"ලොකු හාමුදුරුවො කියන දවසක් වෙනකල් උණු වතුර තමයි නාන්න වෙන්නෙ පුතේ.."

"මං හින්දා අන්කල්ලට මොන තරම් කරදරද..? මේවට මං කොහොමද සලකන්නෙ අන්කල්..?"

වනිගසේකර මහතාගේ මුව මත වූයේ යතිවරයකුගේ බඳු කරුණාභරිත හසරැල්ලකි.

"පුතා සනීප වෙනවා කියන්නෙ.. අපිට සැලකුවා වාගේ තමයි පුතේ.. ගිලනුන්ට උපස්ථාන කරනවා කියන්නෙ සුළු පටු පිනක් නෙමෙයි.. පුතා මේ උදා කරලා දීලා තියෙන්නෙ අපිට ඒ පින් රැස් කරගන්න අවස්ථාව.. පුතා ඒ ගැන සතුටු වෙනවා මිසක් දුකක් හිතන්නෙපා.."

ගගුල්, දැස්, දෙසවන් හයා බලා සිටියේ අදහාගත නොහැකි ව ය.

"වංකගිරියකට කියලා හිතලා.. මං ඇවිත් තියෙන්නෙ.. දිව්‍ය ලෝකෙකටද අන්කල්..?"

"හැමදේම අපි බාරගන්න විදියට තමයි පුතේ.. පුතාට හිතෙනවා නම්.. අපි අතරෙ ඉන්න එක දිව්‍යලෝකෙ ඉන්නවා වගේ කියලා.. ඒක එහෙම තමයි.. හිතට දැනෙනවා නම් ඒ සුවය.. ඊට වඩා සුවයක් මේ ලෝකෙ නෑ පුතේ.."

ගගුල්ට දැනුණේ බුදු බණක් ඇසුවාක් වැනි සුවදායී හැඟීමකි.

"මං පුතේ.. මිරිස් පාත්ති ටිකට වතුර ටිකක් දාලා එන්නං.. අක්කා ඉන්නවනේ.. පුතාට පාළු නැනෙ.. මං චමීර පුතාට කිව්වා..



Uploaded By Sanda

පුතාට මොනවා හරි ඕනකමක් උනොත් මං එන්න කලින්.. චමිර පුතාගෙ ටෙලිෆෝන් එකට කොල් එකක් දෙනවද පුතේ.. පුතාට බාත්රූම් යන්න ඕන නම්.. දැන් ගිහිල්ලා එමු මාත් එක්ක.."

අතිශය හිතෛෂීවන්ත වැඩිහිටියා කෙරෙහි ගඟුල්ගේ ළයෙහි පිළිසිඳුණේ අප්‍රමාණ වූ පීත්‍ර සෙනෙහසකි.

"අනේ නෑ අන්කල්.. අන්කල් වෙලට ගිහිල්ලා එන්න.. මට මොනවත් ඕන නෑ.. මම ටිකක් හාන්සි වෙලා ඉන්නම්.."

ගඟුල්, හිඳ උන් අසුනින් යළිත්, රෝද පුටුවට මාරු වූයේ වනිගසේකර මහතා වෙත හෘදයාංගම හසරැල්ලක් තිළිණ කරමිනි.

"මට ක්ලචර්ස් පාවිච්චි කළා නම් මීට ලේසියි අන්කල්.."

"ඒ උනාට කකුල වෙහෙස කරවන්න එපා කියලා ලොකු හාමුදුරුවො කිව්වනෙ පුතේ.. මං ගිහිල්ලා එන්නම් පුතේ.. කෝකටත් මං මගෙ ටෙලිෆෝන් එක සාක්කුවෙ දාගෙන යන්නංකො. පුතා මේ නොම්මරේ ඔය ෆෝන් එකට දාගන්නකො.."

වනිගසේකර මහතාගේ දුරකථන අංකය ගඟුල් තම දුරකථන මතකයට ඇතුළු කර ගත්තේ Thaththa - Manawee ලෙසිනි. එය දකිද්දී පවා ඔහුගේ හදවතට අමුතු ම හැඟීමක් කාන්දු වූයේ ය.

වනිගසේකර මහතා පිටත්ව ගිය ඉසව්ව දෙස මොහොතක් බලා උන් ගඟුල්, කාමරය දෙසට යන්නට රෝද පුටුව හරවා ගත්තාටත් පසු, යළිත් වතාවක් චේතනා දෙස බැලුවේ ය.

"අර කතාවෙ ඉතිරි ටිකත් දැන්ම අහගත්තා නම් හොඳයි කියලා හිතෙනවා අක්කෙ.."

චේතනාගේ මුව මත ළබැඳි හසරැල්ලක් මැවිණි.

"මොකක්ද.. නංගිගෙ ප්‍රපෝසල්ස් කතාවද..?"

"හ්ම.."





ගඟුල් මුළුමනින් ම අවංක වූයේ ය.

"එක ප්‍රපෝසල් එකක් ආවා මල්ලි.. ඒ මනුස්සයා ආව ගමන් ම ඇහුවෙ නංගිගෙ මාසෙ පඩිය කීයද කියලා..?"

"ඉතින්..?"

"එතනින් ම ඒ යෝජනාව ඉවරයි.. ගෑනිට වඩා ගෑනිගෙ පඩිය වටින මිනිහෙක් එක්ක මොන කසාදද කියලා නංගි මූණට ම ඇහුවා.."

ගඟුල් යළිත් වතාවක් චේතනාට සවන් දුන්නේ කතන්දරයකට සවන් දෙන්නාක් මෙනි.

"තව මනුස්සයෙක් ආවා.. ඒ මනුස්සයත් ආව ගමන් ඇහුවෙ මෙ ගේ ලියලා තියෙන්නෙ නංගිටද කියලා.. නංගි එයාගෙනුත් මූණට ඇහුවා කසාද බඳින්න හිතන් ආවෙ ගේ ද මාව ද කියලා.."

තමාට මුහුණ දෙන්නට සිදුවූ අත්දැකීම් ඇසුරේ, පිරිමින් යනු ආත්මාර්ථකාමී කොට්ඨාශයක් ලෙස මානවී විසින් හඳුනා ගනු ලැබීමෙ කිසිදු වරදක් නැතැයි ගඟුල් මොහොතකට සිතුවේ ය.

"තව ප්‍රපෝසල් එකක් ආවා මල්ලි.. ඒ මනුස්සයා ලෑස්ති උනේ නංගිව බැඳගෙන මෙහෙ නවතින්න.. ගෑනිගෙ දේපල බලාගෙන එන මනුස්සයෙක් එක්ක කවදාවත් හොඳින් ඉන්න ලැබෙන්නෙ නෑ කියලා නංගි ඒ මනුස්සයටත් කැමති උනේ නෑ.."

ගඟුල්, හිස් දෑසින් බලාගෙන ඔහේ අසාගෙන සිටියේ ය.

"තව මනුස්සයෙක් ආවා.. ඒ මනුස්සයා ප්‍රපෝසල් එක ඇවිල්ලා ගෙවල් දොරවල් බලලා යන්න ආව දවසට දවස් දෙකකට පස්සෙ ඇවිත් බලෙන් ම එදා රෑ ගෙදර නවතින්න හැදුවා.. ආයෙ බල බල හිටියෙ නෑ, නංගි ඒ මනුස්සයට ඒ වෙලාවෙම බැනලා එලවා ගත්තා.. ඔවා මේවා හින්දා නංගිට ප්‍රපෝසල්ස් තිත්ත වෙලා හිටියෙ.. ඒ අතරෙ තමයි මාධවගෙ ප්‍රපෝසල් එක ආවෙ.."



Uploaded By Sanda

ගගුල්, චේතනා දෙස බැලුවේ කුහුල් පිරි දෑසිනි.

"කවුද අක්කෙ මාධව..?"

"නංගිලත් එක්ක එකට වැඩ කරන ආරච්චි මහත්තයෙක් මල්ලි.."

"ඉතින් හොඳයිනෙ අක්කෙ.."

චේතනා, උපහාසයෙන් මුව කොන ඇද කළා ය.

"හොඳයි තමයි.. මාධව නංගිට කියලා.. එයාගෙ අම්මට වැඩ පල කරගන්න බැරුව එක්තැන් වෙලා ඉන්නෙ කියලා.. රස්සාවෙන් අස්වෙලා ගෙදර නවතින්න කියලා.. ඒ විතරක් නෙමෙයි.. එයාගෙ වෙඩින් එකට කලින් නංගිගෙ වෙඩින් එක ගන්න ඕන කියලා.. මේ ගේ උගස් තියලා බෑන්ක් ලෝන් එකක් අරන් දෙනවද අහලා.. කසාද බඳින්න කලින් ම මේ මිනිස්සු මෙහෙම නම්.. බැන්දට පස්සෙ මොනවා නොකරයිද මල්ලි..? නංගි පහුගිය දවස්වල හිටියෙ මාරාවේශ වෙලා වගේ.. පිරිමි එක්ක පුදුම කේන්තියකින් හිටියේ.. අපේ මනුස්සයා මට සලකන්නෙ, බලන්නෙ නෑ කියලත් නංගි ඉන්නෙ හරිම කේන්තියෙන්.. එයාගෙ හිත හදාගන්න තව කාලයක් යයි මල්ලි.. එයා දැන්ම නම් කසාද බඳිනවා තියා කසාදයක් ගැන කතා කරන්නවත් කැමති වෙන එකක් නෑ.."

ගගුල්ගෙ මුවින් ගිලිහුණේ දිගු ම දිගු සුසුමකි. මානවීට හමු වූ පිරිමින් සියල්ල ආත්මාර්ථකාමී කුහකයන් නම්.. තමා හැර දමා ගිය තම බිරිඳ තාරිකාට හමු වූ මේ පිරිමියා, පරාර්ථකාමියකු නොවේ දැයි ගගුල් අනොරක් නොමැතිව කල්පනා කළේ ය.

"මං එයාට මොන තරම් ආදරේ කළාද..? මොන තරම් කැප කිරීම් එයා වෙනුවෙන් කළාද..? එයාගෙ දෙපා මුලට හැමදේම ගෙනත් දුන්නා.. ගෑනියෙකුට මේ ලෝකෙ දෙන්න පුළුවන් හැම සැපක් ම මම එයාට දුන්නා.. එහෙම කරපු මාව ම එයා කුණු මාළු ගොඩක් වගේ.. පැත්තකට විසි කරලා.. යන්නම යන්නත් ගියා.."





ගගුල්ගේ හීල්ලීම අසා චේතනා කම්පාවට පත් වූවා ය. ඈ, තිගැස්සී ගගුල් දෙස බැලුවා ය.

"මල්ලි.. ඇයි..?"

"මේ ලෝකෙ මහ පුදුමාකාර තැනක් අක්කෙ.. ආදරේ අඳුනන මිනිස්සුන්ට ආදරේ අඳුනන මිනිස්සු හම්බ වෙන්නෙ නෑ.. ආදරේ ඕනවටත් වඩා ලැබෙන මිනිස්සු ඒ ආදරේ පරිස්සම් කරගන්න දන්නෙ නෑ.. මං දන්නෙ නෑ එහෙම වෙන්නෙ කොහොමද කියලා..?"

"ආදරේ කරන කාලෙ ඉන්න මිනිස්සු නෙමෙයි කසාද බැන්දට පස්සෙ ඉන්නෙ.. අපි මේ තරම් විඳවන්නෙ ඒකයි මල්ලි.."

චේතනාගේ දෑස් මුලට කඳුළු අහුරක් ම රොක් වී තිබිණි.

"ඒක නම් ඇත්ත අක්කෙ.. ඔයත් ඕවා දැන් කල්පනා කරන්නෙපා.. මම පොඩ්ඩක් නිදාගන්න යනවා.."

චේතනා, අසරණ ලෙස හිස දෙපසට සැලුවා ය.

"මම මේ විස්තර සේරම කිව්වා කියලා මල්ලි, නංගිට අගවන්න එපා.. නංගිට කේන්ති යයි මල්ලි.. එයා ආස නෑ කවුරුවත් එයාට අනුකම්පා කරනවා බලන්න.."

"නෑ.. මං අගවන්නෙ නෑ අක්කෙ.."

ගගුල්, කාමරය වෙත ගියේ දැඩි කල්පනාකාරී බවකිනි.

කුමක්දෝ හේතුවක් කරණකොට ගෙන, තමාගේ ජීවිතය ගැන අලුතින් ම හිතන්නට ඔහුගේ ඇතුළු හදවත ඔහුට බල කරමින් සිටියේ ය.

SL UNLIMITED The spirit of Sri Lankan e-Community

Uploaded By Sanda

**ජීවිතයට** ඉර ඇහැරිණැ'යි ගඟුල්ට දැනුණේ, සහමුලින් ම ආගන්තුක පරිසරයක, කිසිසේත් ම ආගන්තුක නොවන ළබැඳියන් සමග ජීවත් වෙන්නට පටන් ගත් පසුව ය. නිතර ඇස ගැටෙන ලෝකයට වඩා, නොදකින, නොපෙනෙන ලෝකය කෙතරම් චමත්කාරජනකදැයි ගඟුල් නිසොල්මනේ කල්පනා කරන්නට වූයේය.

කල්පනාව අතරේ ගඟුල්ගේ දෑස් පියවී ගියේ කොයි මොහොතේදැයි ඔහු ම දැන සිටියේ නැත. සිහිනයෙන් සේ ඔහු අවදි වූයේ දුරකථනය නාද වන හඬිනි. මානවීගේ කාමරයේ බිත්ති ඔරලෝසුව රඳවා තිබුණේ සෘජුවම දෑස රැඳෙවෙන අයුරිනි. එහි පෙරවරු එකොළහයි හතලිස් පහ ලෙස සටහන්ව තිබිණි.

"තාත්තෙ.."

"අපි ගෙදර ආවා පුතේ.."

"මෙච්චර ඉක්මනට ගියාද..?"

"අද පාරවල් හරිම නිදහස් පුතේ.. ට්‍රැෆික් අහු උනේ ම නෑ.. කඩවතින් හයිවේ එකට දාගත්තා.."

මොහොතකට පිය - පුතු දෙදෙනා ම දුරකථනයේ දෙපස හිඳ ගොළු වූහ.





"පහුගිය ටිකේ ම මං හින්දා තාත්තට විවේකයක් තිබුණෙ ම නෑනෙ.. අදවත් ටිකක් රෙස්ට් කරන්න.."

සමරසිංහ මහතා හදවතට දැනුණු අවංකම හැඟීම් පුතු ඉදිරියේ වචන බවට පත් කළේ නිර්ලෝභීව ය.

"අමුතුවෙන් විවේක ගන්න දෙයක් නෑ පුතේ.. මොන තාත්තද කැමති තමන්ගෙ දරුවගෙ කකුල කපනවා දකින්න.. මගෙ හිතට විවේකයක් දැනුණෙ ලොකු හාමුදුරුවො අපි කොහොම හරි දරුවගෙ කකුල සනීප කර ගමු මහත්තයෝ කියලා කියපු වෙලාවෙ.. මගෙ හිතේ තියෙන සැනසීම වචනයෙන් විස්තර කරලා කියන්න මම දන්නෙ නෑ පුතේ.."

වටේට තබා තිබූ කොට්ට තුන හතරෙන් එකක් ඇද ගත් ගඟුල් එය ළය මතට ඇද ගත්තේ ය. රෝස පැහැති ම උර හතරකින් අලංකරණය කළ කොට්ට පෙළ දකිද්දි, ගඟුල්ගේ දෙතොලතර ඇඳුණේ අපූරුම හසරැල්ලකි.

"මමත් ඉන්නෙ අමුතු ම ලෝකෙක තාත්තෙ.. මම හිතුවා තාත්තා ගියා ම මට ලොකු පාළුවක් දැනෙයි කියලා.. අනේ නෑ තාත්තෙ.. මට මේක මගේ ගෙදර ඉන්නවට වඩා හිතට නිදහස්.."

සමරසිංහ මහතා මොහොතකට ගොළු වූයේ, තමාගේ සිතට දැනෙන අපූරු හැඟුම් සියල්ල තමාගේ පුතු සමග බෙදා හදා ගැනීම කෙතරම් යුතුදැයි සලකා බලන්නට මෙනි. තමාට දැනෙන හැඟෙන සියල්ල තම පුතු ඉදිරියේ පෙළ ගැසීමෙන්, තමාගේ පුතු කෙදිනක හෝ නවත් දුකකට ඇදවැටේදැයි මොහොතකට ඔහුට සිතා බලන්නට වුවමනා වී තිබිණි. එහෙත්, අවසානයේ සමරසිංහ මහතාට ද නොදැනී ඔහුගේ බුද්ධිය පරදවා හැඟීම් ජයගෙන තිබිණි.

"අර දරුවා වැඩට ගියාද පුතේ..?"

"ඔව් තාත්තෙ.. හරියට කෑවද කියලවත් දන්නෙ නෑ.. දඩි බිඩි ගාලා විනාඩි පහට ලෑස්ති උනා.. ස්කූටර් එකේ නැග්ගා.. ඉගිලුණා..



Uploaded By Sanda

හයියෙන් යන්නෙපා කියලා අන්කල් තුන් හතර පාරක් ම කිව්වෙ.. යන හැටි දන්න හින්දා වෙන්න ඇතිනෙ.. මේ කඳු පාරවල්වල මට නම් බයේ බෑ තාත්තෙ.. පරක්කු උන හින්දා හයි ස්පීඩ් ගියාද දන්නෙත් නෑ.."

තමා පමණක් නොව තම පුතු ද මීට දින දෙකකට ඉහතදී දොරගුළු විවර වූ ඒ අපූර්ව ලෝකයේ සොමනසින් සැරිසරන වග සමරසිංහ මහතා ඉවෙන් මෙන් හඳුනා ගත්තේ ය.

"ඒ දරුවන්ට ඔය පාරවල් දැන් පුරුදු ඇති පුතේ.. අපිට තැනිතලාවල ගිහිල්ලා කඳු පල්ලම් අමාරුයි වගේ දැනුණට.. කඳු හෙල්වල ජීවත්වෙන අයට ඒවා ඒ හැටි ගාණක් නෑ පුතේ.. ඒ පරිසරය ඒගොල්ලන්ගෙ ජීවිතේ කොටසක්.."

පිය - පුතු දෙදෙනා ම දෙපස හිඳ සැනසුම් සුසුමක් හෙළුවෝ ය.

"මට පාළු ඇති කියලා වෙන්න ඇති අක්කත් ඇවිත් හැම වෙලාවෙ ම මල්ලි මොනවා හරි ඕනද කියලා අහනවා.. අන්කල් එහෙට මෙහෙට යමින් ගමන් හැම වතාවක ම ඇවිත් තුවාලෙ බලනවා සැරව ගලනවද කියලා.."

"අපිට අන්තිමේදි මේ පාර පෙන්නුවෙ උඩ ඉන්න දෙවියො වෙන්න ඇති පුතේ.. අවුරුදු පහළොවක් වින්ද දුක මදිද..? හැමදේ ම ඔහොම සිද්ධ උනේ මොකක් ම හරි හොඳකට වෙන්න ඇති.."

"ඔව් තාත්තෙ.. මේ වතාවෙ නම් මට සනීප වෙන්න පුළුවන් වෙයි.. මට එහෙම දැනෙනවා.."

"ලොකු කැපකිරීමක් කරන්න වෙනවා පුතේ.. ඒත්.. ඒ කැපකිරීම අමාරුවෙන් හරි කළොත්.. පුතාට ආයෙමත් දෙපයින් ඇවිදගන්න පුළුවන් වෙනවා පුතේ.."

"තාත්තා දන්නවද.. මස් මාළු ඒවා මේවා කනවට වඩා..





එළවළුත් එක්ක කන මේ කෑම ටික මොන තරම් ඇඟට සැහැල්ලුද කියලා.. ඇත්තට ම මේ දවස් දෙකට මට ඒ වෙනස දැනුණා.."

සමරසිංහ මහතා, දිගු සුසුමක් හෙළා ළය සැහැල්ලු කර ගත්තේ ය.

"ජීවිතේ හොඳ මිනිස්සුන්ට හැමදාම දුක් දෙන්නෙ නෑ පුතේ.. විඳින දුක් කන්දරාවෙ අවසානෙ සතුටකුත් දෙනවා.."

ගඟුල් ද පියාට නොදෙවෙනි සුසුමක් හෙළා ඉහිල් වෙන්නට වෙර දැරුවේ, ජීවිතය දෙස එතෙක් කිසිදා නොදුටු අලුත් ඇසකින් බලමිනි.

"ඔව් තාත්තෙ.. අවුරුදු හය හතක මගෙ ජීවිතේ වටේ තියෙන අතීතෙ දැන් කුණු ගොඩක්.. විදෙව්වා හොඳටම ඇති.. මට ඉක්මනට ම ඒ මගේ වටේ තියෙන කුණු ගොඩ පිරිසිදු කරලා.. අලුත් ම මනුස්සයෙක් විදියට.. මේ කකුල් දෙකෙන් හිටගන්න ඕන තාත්තෙ.. මේ අලුත් ලෝකෙට පය ගැහුව වෙලාවෙ ඉඳන් මගෙ හිත මං ගැන මුල ඉඳන් හිතන්න පටන් අරන් කියලා මට දැන් දැනෙනවා තාත්තෙ.."

ගඟුල්ට, තමාට දැනෙන හැඟෙන කිසිවක් තම පියාගෙන් වසංගා ගන්නට වුවමනා නොවිණි.

"මටත්.. ඒ දරුවව දැනෙන්නෙ මගෙ ම දරුවෙක් වගේ පුතේ.. පියල්ව දැනෙන්නෙ හරියට මට මගෙ ම සහෝදරයටත් වඩා ළඟින්.. මේ තරම් ඉක්මනට කිසිම බැඳීමක් මට මගේ ජීවිතේට ම දැනිලා නෑ පුතේ.."

එතෙක් කාලයක්, සිතිවිලි සිර ගෙයක සිරවී උන්නාක් මෙන්, පිය - පුතු දෙදෙනා ම තමාගේ නිදහස් සිතිවිලි ලෝකය බෙදා හදා ගන්නට වූහ.

"තාත්තගෙ වටේ හෙවණැල්ල වගේ කැරකෙන.. ඒ දුවව



Uploaded By Sanda

දැක්ක ම.. මට හරියට ලෝබ හිතෙනවා පුතේ.. මටත්.. මෙහෙම දුවෙක් හිටියා නම්.. කොච්චර හොඳ ද කියලා මට හිතෙනවා.. අද මේ ගමන ඇවිල්ලා ඉවර වෙනකල් ම මගෙ හිතේ හිටියෙ වෙන කවුරුත් නෙමෙයි.. ඒ දරුවා පුතේ.."

ගගුල්ගේ ළය මානව් කෙරේ උපන් අමුතු ම ළයාදරණීය බවකින් හිරි වැටී ගියේ, තම පියා ගෙවී ගිය දින දෙක තුළ ඇයට කෙතරම් නම් බැඳී ඇත්දැයි සිතා බැලූ මොහොතේ ය. ඒ පුදුමය ඔස්සේ ඔහු ගල් ගැසී සිටියේ ය. ඇගේ පුංචි පුංචි ළබැඳියාවන් තම පියාගේ හදවත එතරම් සුවපත් කරන්නට ඇතැයි ඔහු මොහොතකට හෝ සිතා තිබුණේ නැත.

"උදේ ම තේ එක හදලා.. දැතින් ම ගෙනල්ලා අතට දෙනකොට.. කෑම මේසෙට එක්කන් ගිහිල්ලා පුටුව ඇදලා දීලා වාඩිවෙලා කන්න කියලා කෑම ටික බෙදලා දෙනකොට.. ගිහිල්ලා නාගෙන එන්න කියලා තුවාය ගෙනල්ලා අතට දෙනකොට.. මේ විදියට.. පුංචි පුංචි දේවල් සේරම ළඟට වෙලා ඒ දරුවා කරලා දෙනකොට.. මට මතක් උනේ ඔයාගෙ අත්තම්මව පුතේ.. අත්තම්මගෙන් මං දැක්ක කරුණාවන්ත ළෙන්ගතුකම.. අවුරුදු හතළිහකට විතර පස්සෙ.. මං දැක්කෙ මානවී දුව ළඟ.. ඔයාගෙ අත්තම්මා නැති වෙනකොට මට අවුරුදු විස්සයි පුතේ.. එදා ඉඳන් අද වෙනකල් එහෙම කරුණාවක් මං අත් විඳලා තිබුණෙ නෑ. පෙරේදා වෙනකල් ම.. හැමදා ම සර්වන්ට්ස්ලගෙන් වැඩ ගන්න පුරුදු වෙලා හිටිය ඔයාගෙ අම්මා.. කවදාවත් මට තේ එකක් හදලා අතට දීලා නෑ.. මේ දවස් දෙකෙන් පස්සෙ මං ජීවිතේ ආපහු මුලට යන්න පටන් අරන් පුතේ.."

ගගුල් ට තම පියාගේ වදන් අදහා ගත නොහැකි විය. මේ.. ඔහුගේ මුවින් වචන බවට පත්වී වැගිරෙන්නේ කවරාකාර වූ දුකක්ද..? අදහා ගත නොහැකි පුදුමයෙන් මද වේලාවක් ගොළුව උන් ගගුල්, අවසානයේදී බොහෝ අසීරුවෙන්, සිත පීරා වචන කිහිපයක් සොයා ගත්තේ ය.





"තාත්තෙ.. මං හීනෙකින්වත් හිතුවෙ නෑ.. තාත්තගෙ ලෝකෙ සතුට තිබුණෙ එච්චර පුංචි පුංචි දේවල් ඇතුළෙ කියලා.. එතකොට, මෙච්චර කල් තාත්තා අපි ඉස්සරහා හිනා වෙලා හිටියෙ.. ඔය තරම් ලොකු දුකක් හිතේ හංගගෙන ද..? පියල් අන්කල්ලගෙ ලෝකෙ ඇතුළෙන් තාත්තා දවස් දෙකට ඔච්චර ලොකු සැනසීමක් හොයා ගත්ත ද..?"

සමරසිංහ මහතා, කවදාවත් නොවූ තරමින්, තම පුතු ඉදිරියේ, එතෙක් ගල් කරගෙන උන් තම හදවත දිය කොට, වගුරුවමින් සිටියේ ය.

"පුතාට දැනෙන්නෙ නැද්ද.. පුංචි පුංචි දේවල් ඇතුළෙ මිල කරන්න බැරි සතුටක් සැනසීමක් තියෙනවා කියලා.. පුතාට දැනෙන්නෙ නැද්ද පුතේ ඒක..?"

"මම ඔච්චර ගැඹුරට ඒ ගැන කවදාවත් හිතලා තිබුණෙ නෑ තාත්තෙ.. තාත්තා කියන දේ ඇත්ත කියලා මටත් දැනෙන්න ගනියි.."

"කොහොමද පුතා එහෙම කියන්නෙ.. මං මේ දේවල් මෙහෙම කිව්ව හින්දද පුතා එහෙම කියන්නෙ..?"

ගගුල්, මොහොතකට තම හදවත වටා ඇවිද බැලුවේ ය. ඒ වන විට.. බොහෝ දෑ.. ඔහුට ප්‍රත්‍යක්ෂ වෙමින් තිබිණි.

"මටත්.. එහෙම දැනෙයි තාත්තෙ.. මොකද.. මං තාත්තගෙ පුතා හින්දා.."

ගගුල් කීවේ, සමරසිංහ මහතාට හැඬෙන තරමේ සුසංවේදී කතාවකි.

හෝරා බාගයක් පමණ තම පුතු සමග ජීවිතයේ කිසිදා කතා නොකළ අන්දමේ සංවේදී හැඟීම්, දැනීම් බෙදා හදාගනිමින් උන් සමරසිංහ මහතා, ඇමතුමින් සමුගත්තේ, විඳගත නොහැකි තරමේ ගුප්ත හුදෙකලාවක ගිලෙමිනි.



Uploaded By Sanda

සමරසිංහ මහතාට තේ කෝප්පයක් පිළියෙළ කර ගෙන ආ, නිවසේ සේවිකාව මාලනී, තම හාම්පුතු දෙස බැලුවේ ශෝකයෙනි.

"පොඩි සර් නැතුව ගේ ම පාළුයි නේද සර්..? මේ දවස් තුන මම ගෙදර හිටියෙ හරි ම පාළුවෙන්.. උයලා පිහලා අතුගාලා අස් කළාට පස්සෙ මට වෙන වැඩක් තිබුණෙත් නෑ.. ඉව්වට ගෙදර කන්න කෙනෙක් හිටියෙත් නැනෙ සර්.."

"අපිට කවුරු හරි ළඟ නැති එකේ වටිනාකම දැනෙන්නෙ ඉඳලා ඉඳලා ළඟ නැතුව ගියාම මාලනී.. මේ පැය බාගෙට පුතා නැතුව මට පිස්සු වගේ.."

මාලනී, විමසන්නට කල් යල් බලමින් උන් පැනය, ඒ මොහොතේ විමසීමට කාල වේලාව තෝරා ගත්තා ය.

"පොඩි සර්ට.. එහෙ හොඳයිද සර්..?"

සමරසිංහ මහතාගේ දෙතොල`ග සොඳුරු හසරැල්ලක් පිපිණි.

"ආ.. පොඩි සර්ට එහෙ රජ සැප.. ගම්වල මිනිස්සුන්ගෙ ආගන්තුක සත්කාර ගැන මාලනී දන්නවනේ.. පොඩි සර් සැපට සනීපෙට ඉඳියි.."

සමරසිංහ මහතා කීවේ, ළය පුරවා ගත් සොම්නසිනි. මාලනීට පවා ඒ සතුටේ බර දැනිණි.

"අනේ කොච්චර දෙයක්ද සර්.. දෙයියන්ගෙ පිහිටෙන් පොඩි සර්ට සනීප උනොත් ඇති.. මොන දුකක්ද විඳින්නෙ.. සිංගප්පූරු ගෙනිහින් කකුල කපන්න හදන්නෙ කිව්ව දවසෙ ඉඳලා මට හරියට බත් කටක් කැවුණෙ නෑ සර්.. ඒ තරම් දුකකින් මං හිටියෙ.. කකුල නැතුව ඔය ප්ලාස්ටික් කැලි හයි කරගෙන ජීවිත කාලයක් දුක් විඳින්නද දෙයියනේ.. ඇරත් මේ තරුණ ජීවිතයක්.. මේ නාකි අපිට නං ඕන එකක්.. මේ පාරවත් දෙයියො බැලුවොත් ඇති.. සර්ලා පිටත් උන දවසෙ මං ජය සිරිමා බෝ හාමුදුරුවන්ට බාරෙකුත් අයින් කරා සර්.."





සමරසිංහ මහතාගේ වුවන පුරා සැරිසරුවේ අපූරු හසරැල්ලකි.

"සර්ගෙ අසනීපෙ සනීප වෙලා ආවට පස්සෙ.. අපි ගිහින් ඒ බාරෙ ඔප්පු කරමුකො මාලනී.. කෝ ලොකු මැඩම් මාලනී.. කොහෙ යනවා කියලද ගියේ..?"

"ලයන්ස් ක්ලබ් එකේ මැඩම් කෙනෙක්ගෙ මහත්තයෙක් අසනීප වෙලා ඉස්පිරිතාලෙලු සර්.. බලන්ඩ ගිහින් තව මොකක්ද වැඩකටත් ගිහින් එනවා කිව්වෙ.. කෑම තියන්ඩත් එපා කිව්වා මැඩම් රෑ වෙයි කියලා.."

සමරසිංහ මහතා වුවන පුරා නැගී සිටියේ දිගු සුසුමක් හෙලමිනි.

"එයා ඉතින් ගෙදරින් කෑම කන්නෙ අවුරුද්දට ම වේල් හතරයි පහයිනෙ..."

පිටත්ව යන්නටත් ගිය සමරසිංහ මහතා, හදිසියේ ම සිහිපත් වූ යමක් පවසන්නට මාලනී දෙස බැලුවේ ය.

"මාලනී.. පුතා කිව්වා.. රත්නජීවටත් නිවාඩු යන්න කියලා.. ලොකු මැඩම් ගෙදර ඉන්නවා කියලයැ.. චූටි පුතත් රට ගියේ මාසෙක ටුවර් එකකට.. ආයෙ මෙහෙ නිදහසක් ලැබෙන වෙලාවක් කියන්න බෑ.. මාලනිත් මේ සතියෙ ගමේ ගිහිල්ලා එන්න. මම ලොකු මැඩමට කියන්නම්.."

මාලනී, පුදුමයට පත් දෑසින් සමරසිංහ මහතා දෙස බැලුවා ය. ඇගේ දෑසේ සොම්නස සේ ම දොම්නස ද එකට මුසුවී පිරී තිබිණි.

"අනේ ලොකු සර්.. එතකොට.. ලොකු සර්ගෙ කෑම බීම ටික..?"

"ආ.. ඒ ගැන හිතන්නෙපා.. මට මොනව හරි කන්න පුළුවන්..



Uploaded By Sanda

මාලනී ගමේ ගිහින් එන්න.. හෙට උදේම පිටත් වෙන්න.. සිකුරාදට ආවම ඇති.. හවසට මං සල්ලි ලෑස්ති කරලා දෙන්නම්.."

"අනේ.. එහෙම කමක් නැද්ද සර්..?"

"වෙනදාට ගියා නොගියා වගේ ආපහු එන එකනෙ.. දෙගිඩියාවක් තියාගන්නෙ නැතුව මාලනී ගිහින් එන්න.. ආ.. මෙතන පන්දාහක් තියෙනවා.. ගෙදරට ගෙනියන දෙයක් තියෙනවා නම් සිසිර එක්ක ටවුමට ගිහින් අරන් එන්න.."

සියල්ල තීරණය වූයේ හදිසියෙනි. සමරසිංහ මහතා තම සේවක සේවිකාවන්ද දින කිහිපයකට නිදහස් කළේ තමාගේ හිතේ නිදහස උදෙසා ම ය.

"මාලනීත් ගමේ ගියා ම මේ ගේ පාළු අම්බලම ම වෙයි.. කමක් නෑ.. එහෙමත් ඉඳලා බලන්න ඕන.. කාත්කවුරුවත් නැත්තට ම නැතුව ඉන්නකොටත් හිතට වෙනස් ම සනීපයක් දැනෙයි.."

සමරසිංහ මහතා එසේ සිතා හිත හදා ගත්තේ ය.

පියාගේ දුරකතන ඇමතුමින් මතු කිසිසේත් ම නොසිතූ අන්දමේ කල්පනා ලොවක තනිවීමට ගගුල්ට සිදුවූයේ, ඔහු ඊට පෙර කිසිදා තම පියාගේ හදවතට එබී බලා, නොතිබුණු බැවිනි. භෞතික සැප සම්පතින් ආඪ්‍ය ලොවක ජීවත් වුවත් හදවතෙහි අප්‍රමාණ හිස්තැන් තිබෙන්නට ඇති වග ඔහු හඳුනා ගත්තේ පළමු වතාවට ය. ඔහුගේ හදවතට දැනුණේ තියුණු කම්පනයකි.

කල්පනාවේ කරවටක් ගිලී උන් ගගුල්ට, මානවීගේ ස්කූටරය පැමිණෙන හඬ ඇසුණේ නැත. නිවස පසෙක වූ ඇඹුල් පේර ගසේ ගෙඩි සොයමින් උන් චේතනා, නැගණිය පැමිණෙනු දැක නිවස ඉදිරිපිටට ආවාය.

"අක්කි.. කෝ ගගුල් අයියා..?"

ඈ, හිසින් කාමරය දැක්වූවා ය.





"අන්කල් ගිහිල්ලා කෝල් කළාද කොහෙද.. ඒ වෙලාවෙ ඉඳන් නිහඬ කල්පනා ලොවක තනිවෙලා.."

චේතනා කීවේ හිනැහෙමිනි. හිස ආවරණය ගලවා අතට ගනිමින් මානවී තම සොයුරිය වෙත හෙළුවේ තරවටු බැල්මකි.

"ඔයාට ඉතින් හැම එකම විහිළු.. කවුද දන්නෙ මොකක් හරි ප්‍රශ්නයක් ද කියලා..? ඉතින් අහලා බලන්න බැරි උනාද පොඩ්ඩක්..?"

"මං ඇහුවා.. කිව්වෙ නෑ.. තාත්තත් ඇහුවා.. කිව්වෙ නෑ.. දැන් සමහර විට.. ගොළුවත බිඳියි.. දැන් ඉතින් මෙතන බලධාරියා ආවනේ.."

චේතනා කීවේ කට ඇද කොට ය. මානවී, ස්කූටරයෙන් බිමට බසිමින් සොයුරිය දෙස බැලුවේ, කුහුලින් කුඩා කර ගත් දෙනෙතිනි.

"කවුද දැන් මෙතන බලධාරියා.. මේ මම ද..?"

"නැතුව ඉතින් අපියැ.. ලොකු හාමුදුරුවො ලෙඩාව බාර දුන්නෙ ඔයාටනෙ.. ඉතින් ඒ රෝගියාගෙ බාරකාරයා ඔයා තමයි.."

චේතනා කීවේ ගණනකටවත් නොගෙන ය. ජීවිතයේ.. පළමු වතාවට.. පළමු ම වතාවට.. මානවීගේ හදවතට කුමක්දෝ අමුතු ම හැඟීමක් දැනිණි. ඒ හැඟීමෙන් ඇතුළු හද තුළ ජනිත වූයේ නොදන්නා මිහිරියාවකි.

"අනේ යනවා යන්න අක්කි.. ඔයා හිතුවද මේක නාඩගමක් කියලා.. මම මේ ඉෂ්ට කරන්නෙ යුතුකමක්.. අපේ අම්මා ලෙඩ ඇඳට වැටිලා අපි අන්ත අසරණ උන වෙලාවෙ.. අන්කල් අපිට කරපු උදව්වට කළගුණ තමයි මම මේ සලකන්නෙ.. මගේ අනාගතේ උගසට තියලා මම මේ කරන දෙයින් ඒ ඇර මට ලැබෙන කිසිම දෙයක් නෑ අක්කි.. තේරුණාද..?"

නැගණිය තුළ මුලින් වූ සැහැල්ලුව බිඳී ගොස්, ඈ ශෝකයට



Uploaded By Sanda

පත්වූ බව දැනුණු මොහොතේ, චේතනාගේ හදවතට දැනුණේ වේදනාවකි.

"නංගි.. සොරි.. මං එච්චර දුරට හිතුවෙ නෑ.."

මානවී, චේතනාගේ දෑස දෙස බැලුවේ තීරණාත්මකව ය.

"දුර හිතන්නෙ නැතුව බෑ අක්කි.. දුර හිතන්න ම ඕන.. වචනයක් පිට කරන්න කලින් හත් අට වතාවක් හිතලා බලන්න පුරුදු වෙන්න.. හොඳට මතක තියාගන්න අක්කි.. එයා කසාද බැඳපු.. අනුන්ගෙ මනුස්සයෙක්.. අපේ මනුස්සකමට සීමාවක් නැති උනාට.. අපි එයාට ළංවෙන්න ඕන සීමාවක් තියෙනවා.."

චේතනා, සොයුරිය දෙස බලා සිටියේ බියපත් නෙතිනි.

"අක්කි.. අනුන්ගෙ උයනක තියෙන මල් ගහක් මැරිලා යන්න හදනකොට.. කවුරු හරි කිව්වොත් ඒ ගහට වතුර ටිකක් දාන්න කියලා.. ගහ කොළට ආදරේ මිනිස්සු විදියට අපි ඒක කරනවා.. හැබැයි අපි ඒ මල් ගහ උදුරලා ගෙනත් අපේ වත්තෙ හිටවන්න හිතාගෙන වතුර ටික දාන්නෙ නෑ.. ඔයාගෙ නංගිත් එහෙමයි කියලා විතරක් දැනට මතක තියාගන්න අක්කි.."

මානවී, නිවස දෙසට යන්නට පා එසෙව්වේ, පුරුද්දක් වශයෙන් ගෙන එන රටකජු පැකට්ටුව සොයුරිය වෙත දිගු කරමිනි. කෙතරම් සංකීර්ණ දෑ සොයුරියගේ මුවින් පිට වුවත්, මොහොතකින් චේතනාගේ මුව’ග සැහැල්ලු හසරැල්ලක් විසිරිණි.

"අද.. තුනක් ගෙනාවා නේ..???"

සියලු බරපතලකම් අමතක වී මානවීගේ දෙතොලතර හැඩැති හසරැල්ලක් ඇඳිණි.

"කෝ අක්කි, තාත්තා...?"

"ටිකිරි නැන්දලාගෙ ගෙහෙන් කතුරුමුරුංගා කඩනවා චමිර මල්ලිත් එක්ක.."





මානවී, තවත් පමා නොවී, ගෙට ගොඩ වූවා ය. ඈ, ගඟුල්ගේ කාමරයේ දොර තිරය අබියසදී මදක් නතර වූවා ය.

"අයියේ.. මං එන්නද..?"

මානවී, දොර තිරයට අත තබමින් ඇසුවා ය. ගඟුල්ගේ කල්පනාකාරී මුහුණ මත සිනා මල් වට්ටියක් ම ඉහිරිණි.

"ඔයාගෙ කාමරේට එන්න මගෙන් අවසර ඉල්ලන්නෙ මොනවටද..?"

"මේක කොහොමද මගේ වෙන්නෙ...? දැන් ඒක ඔයාගෙනෙ අයියෙ.."

"ඒ නැතත් ඉතින්.. ලෙඩාව බලාගන්න කෙනා ලෙඩාගෙ කාමරේට එන්න ලෙඩාගෙන් අවසර අරන් ඉන්නවයැ.."

මොහොතකට ගොළු වූ මානවී සැහැල්ලුවේ හිනැහුණා ය.

"හරි.. හරි.. අයියා දිනුම්.. කියන්නකො.. උදේ වරුවෙ මොකද කළේ..? කම්මැලිකමේ ද හිටියෙ..?"

දිය හැකි පිළිතුරු දහස් ගණනක් මුව’ගට ගොනු වුවත්, ගඟුල් කිසිවකට පිළිතුරු දුන්නේ නැත.

"දැන්ද ආවෙ නංගි..? මට බයික් එකේ සද්දෙවත් ඇහුණෙ නැනෙ.."

"එහෙම තමයි.. අපේ පුංචි වාහනවල සද්ධ එහෙම ලොකුවට ඇහෙන්නෙ නෑ.. ඇත්ත කියන්න අයියෙ.. ඇයි ඔච්චර අමාරුවෙන් හිනාවෙන්නෙ..? එක වරුවට.. ඔයාට.. හැමදේම ඇති කියලා හිතුණද..? කම්මැලිකමේ ද හිටියෙ..? අනේ සොරි අයියෙ.. මමයි, තාත්තයි ඉතින් කොහොම හරි තියෙන වැඩ ටික කරගන්නත් එපායැ.. ඇයි අපේ අක්කිවත්, අයියා එක්ක ටිකක් කතා කළේවත් නැද්ද..?"

Uploaded By Sanda

ගඟුල්ගේ මුව'ගට නැගුණේ අමුතුම අන්දමේ සිනාවකි. සරදමත්, ළබැඳියාවත් කැලතුණු ඒ සිනාවේ අරුත සොයාගන්නට ඈ ඉක්මන් නොවුණා ය.

"අනේ ඇයි අයියෙ.. ඒ ගමන අමුතු විදියට හිනා වෙනවා.. ඔහොම හිනාවෙන්න මං දැන් මොකක්ද කිව්වෙ..?"

ගඟුල් ඉහළට ඇදී, ඇඳ වියළට සමාන්තරව හිඳ ගත්තේ, කොට්ටයක් ද උකුල මතට ඇද ගනිමිනි. මානවී, ගඟුල් කෙරෙන් ඒ මොහොතේ දුටුවේ අපූර්වතම සැහැල්ලුවකි.

"ප්‍රශ්න විස්සක් විතර අහගෙන අහගෙන ගියා.. මං දැන් මොන ප්‍රශ්නෙටද ඔය ටිකෙන් ඉස්සර වෙලා උත්තර දෙන්නෙ..?"

ඇසිල්ලකින් සියල්ල අමතක වී, මානවීගේ ළයෙහි ඉපදී, මුව මත පිපුණේ සොඳුරු ම හසරැල්ලකි.

"හරි.. හරි.. මීට පස්සෙ.. මං අහන්නෙ කෙටි ප්‍රශ්න.. වරකට එක බැගින්.."

දොර තිරය අත හැරි මානවී, ගඟුල්ගේ යහන දෙසට ඇවිද ගොස්, පහත් වී, ඔහුගේ පාදයට අත තබා බැලුවා ය. පිටි පතුල වටා, යටි පතුල හා දණිහිසෙන් පහළ සිට වළලුකර දක්වාම සුරතේ දබරැඟිල්ල මෘදුව ගෙන ගිය මානවී, සැනසුම් සුසුමක් හෙළුවා ය.

"ඉදිමුම ගොඩක් අඩුවෙලා අයියෙ.. සැරව අයින් කරන බෙහෙත තව සති දෙකක් එක දිගට ම ගාන්න ඕන කිව්වා.. එතකොට මේ ඉදිමුම හෙමින් හෙමින් අඩුවෙලා යයි.."

මානවීගේ මෘදු ස්පර්ශයෙන් ගඟුල්ගේ ළය තුළ ආත්මානුකම්පාවේ ගිනි ඇවිළිණි. ඔහුගේ දෑසට කඳුළු පුරා ආවේ ඇසිල්ලකිනි. එහෙත්, ඔහුගේ දෑස් දෙස සෘජුව නොබැලූ මානවී ඒ කඳුළු නොදුටුවා ය. ඈ දුටුවේ තමාගේ යහන මත සුව පහසුවට දෙපා දිග හැරගෙන වැතිර හිඳින යෞවනයා පමණි.





"අයියා දන්නවද.. මම මේ ඇඳ ගත්තෙ.. අපේ යාළුවො කට්ටිය දාපු සීට්ටුවකින්.. ගන්නකොට හිතුවෙ නෑ මේ ඇඳෙන් මෙහෙම වටිනා ප්‍රයෝජනයක් ගන්න ලැබෙයි කියලා.."

ගඟුල්ගේ කිසිදු පිළිතුරක් නොලද්දෙන්, මානවී හිස ඔසවා බැලුවා ය. ඔහුගේ දෑසේ ඇඳී තිබුණු කළු වලාකුළු ගොන්න ඈ දුටුවේ ඒ මොහොතේ ය.

"අයියෙ.. ඇයි මේ..? මොකක්ද ප්‍රශ්නෙ..? කියන්න.. අන්කල් ගිය හින්දා.. ඔයා ගොඩක් දුකින්ද ඉන්නෙ..? මට අක්කි කිව්වා.. අන්කල්ගෙන් කෝල් එක ආව වෙලාවෙ ඉඳලා ඔයා කල්පනා කරනවලු අයියෙ.."

මානවීගේ හඬ එවර නම් බිඳී ගොස් තිබිණි. මොහොතක් නිසංසලේ ඈ නිරීක්ෂණය කළ ගඟුල්, දඟකාරකමක් කොට තුටු වන්නට හිත යටින් සැලසුම් ඇන්දේ නොදරුවෙකු ගාණට ය. ඔහු විසල් බරපතල පෙනුමක් මුහුණේ ඇඳ ගන්නට වෙර දැරුවේ ඇයට සිත යටින් සිනාසෙමිනි.

"අන්න.. අපේ තාත්තා හොඳට ම අප්සෙට් වෙලා..???"

මානවී, බෙහෙවින් ම තිගැස්සුණා ය. අසන්නට ලැබුණේ ඈ කිසිසේත් ම අසන්නට නොපැතූ දෙයක් ම ය. ගිලිහෙන්නට ගිය අත් බෑගය ඈ යළිත් උරහිසේ රඳවා ගත්තේ අසීරුවෙනි.

"අනේ ඇයි අයියෙ.. අපෙන් මොකුත් වරදක් උනාද..? මගෙ අතින් අන්කල්ගෙ හිත රිදෙන මොනවා හරි සිද්ධ වෙලාද..?"

නැගෙන්නට ආ සිනාව මුව තුළ ම සිර කොට ගත් ගඟුල්, බැරෑරුම් බව ම මුහුණේ රඳවා ගන්නට ආයාස දැරුවේ ය.

"මාව මෙහෙ තියලා.. මගෙ තාත්තා.. මෙයාව හිතින් එහෙ උස්සන් ගිහින්..! ඊරිසියාවෙ බෑ..!!!"

මවා ගත් සියලු බැරෑරුම්කම් අමතක කොට, ගඟුල් නොදරුවකු



Uploaded By Sanda

සේ හිනැහෙමින් කියද්දී, මානවී තමා ගැන ම උපන් නුපුරුදු පුදුමයකින් ගල් ගැසී ගඟුල් දෙස බලා සිටියා ය.

"මොනවද අයියෙ.. ඔයා ඔය කියන්නෙ.. අවේලාවෙ නිදාගෙන දවල් හීනයක්වත් දැක්කද..?"

"එහෙම.. ලස්සන දේවල් හීනෙනුත් පේනවා නම් කොච්චර ෂෝක්ද..? මම හීන දැක්කෙ නෑ.. මං කිව්වෙ අපේ තාත්තා කියපු දේවල්.. පැය බාගෙ කෝල් එකේ විනාඩි විසිපහක් ම ගියේ මෙයාගෙ වර්ණනාව කියවන්න..!!!"

මානවීට සිනා අමතක විය. ඇගේ මුහුණේ මැවුණේ බරපතල කල්පනාකාරී ස්වරූපයකි. එහෙත්, ඈ, මොහොතින් යළිත් සියල්ල අමතක කොට.. සියල්ල ම විහිළුවකට පෙරළා ගත්තා ය.

"අන්න නියම වැඩේ.. අන්කල්ට කතා කරලා තෑන්ක්ස් කරන්න ඕන එහෙනම්.. වෙන තාත්තලා පුතාලව ගෑනු ළමයි ළඟ දාලා යන්න බයයිනෙ.. මේ තාත්තට එහෙම බයක් නෑ කියන්නෙ.. ඒ තාත්තගෙ පුතාටත් වඩා මාව විශ්වාස ඇති.. ඒකනෙ එහෙම වෙන්න ඇත්තෙ.."

මානවී කීවේ, කාමරයෙන් පිටත්ව යන්නට ආපසු හැරෙමිනි.

"කෝ මගෙ රටකජු පැකට් එක.. දීලා යන්න..!!!"

මානවී, ගඟුල් දෙස හැරී බැලුවේ විස්මයෙනි. මේ කෙළිලොල් බව..??? හදිසියේ ම ගඟුල් කෙරෙන් පතළ වූ අසමාන සැහැල්ලුව..?? අදහා ගත නොහැකිව මානවී ආපසු හැරී බැලුවේ විස්මයෙන් හයා ගත් දෙනෙතිනි. ඈ, අත් බෑගයෙන් ගත් රටකජු පැකට්ටුව ගඟුල් වෙත නිහඬව ම දිගු කළා ය.

"යන්න.. යන්න.. භූතයෙක් දැකලා වගේ මං දිහා බලන් ඉන්නෙ නැතුව.. ඉක්මනට චේන්ජ් එකක් දාගෙන දවල්ට උයන්න ගන්න මට තව ටිකකින් බඩගිනි වෙයි.. අන්කල් හරියට දහයට





හොඳට ඉඟුරු දාලා තේ එකක් හදලා දුන්නා කඩෙන් පරිප්පු වඩේ ගෙනැල්ලා.. ඒ උනාට දැන් මට ඔයත් තේ එකක් හදලා දෙන්න ඕන..!"

මානවී, නැගෙන්නට ආ ලොකු ම ලොකු සිනාව දෙතොලතර සිර කර ගැනීමට නොසෑහෙන්නට වෙර දැරුවා ය.

"මේ.. මොනවද වෙන්න යන්නෙ අයියෙ..?"

"ඉසිවර දෑත් ගොඩක් මං දිහාට දික් වෙලා තියෙන මේ වෙලාවෙ.. මං මැරිලා ආයෙ ඉපදෙන්න මේ යන්නෙ..!"

ගඟුල්ගේ කතාව බාර ගත යුත්තේ විහිළුවටදැයි හැබෑවටදැයි නොදැන උන්නී, තවත් මොහොතක් ගල් ගැසී බලා සිටියා ය.

"ඉතින් කිව්වම යන්න.. ග්‍රාම සේවක නෝනා ඔය ඔසරිය ගලවලා ටක් ගාලා මානවී වෙන්න.. මම මේක ඔක්කොම කනවා.. පංගුව ඕන නම් ගිහිල්ලා ඉක්මනට එන්න.."

නිවසට පැමිණි දා උන් තරුණයා.. තෙදිනකට පසු එතැන සිටියේ නැත. ඔහු ඒ සැහැල්ලුව මවා පෙන්වූවාදැයි ඈ දැන සිටියේ ද නැත. කෙසේ හෝ වේවා.. ගඟුල් කෙරෙන් දිස් වූ ඒ සැහැල්ලුව ඇයට සැනසීමක් ම විය.

ඒ සතුට විසින් මානවී මුළුමනින් ම සන්සුන් යෞවනියක බවට පත් කොට තිබිණි.

"අයියෙ.. එන්නකො එළියට.. ඔයා ඔය ඉන්නෙ ඇත්තට ම සතුටින් නම්.. මටයි, තාත්තටයි ඒ තරම් සතුටක් තවත් නෑ අයියෙ.."

පිටුපා නොපෙනී යන මානවීගේ පාවහන් යුවළින් නැගෙන හඬ ගඟුල්ට ඇසුණේ වෙනදාටත් වඩා මිහිරි හඬිනි. ඇගේ දෑස් මානේ හෙට ලෝකය සදා ගත හැකි නම්, තමා කෙතරම් භාග්‍යවන්තයෙක් ද යන ලෝභී සිතිවිල්ල ඔහුගේ හදවතට එබී බැලුවේ ඔහු ද නොදැන ම ය.



Uploaded By Sanda

වනිගසේකර නිවසේ ගෙවෙන දෛනික දින චර්යාවට, ගඟුල් ඉක්මනින් ම හුරු වූයේ සියල්ලෝ ම පුදුමයට පත් කරවමිනි.

"මල්ලි වගේ සැප විඳපු කෙනෙක්.. මේ වගේ පරිසරයකට මෙච්චර ඉක්මනට හුරු උනා කියන්නෙ.. මට නම් හරි ම පුදුමයි මල්ලි.."

විටෙක චේතනා කියද්දී, ගඟුල් නිවී සැනසුණකු පරිද්දෙන් සන්සුන්ව ච හිනැහුණේ ය.

"හැමදේම තීරණය වෙන්නෙ අපේ හිත ඒ දේ බාරගන්න විදියටයි කියලා මට කියලා දුන්නෙත් ඔයාගෙ තාත්තමයි අක්කෙ.. මම ඒ පාඩම ඇත්තද කිලා අත්හදා බලනවා.. ඇත්ත.. සම්පූර්ණ ඇත්ත.. මේ ගේ ඇතුළෙ.. මම ඉන්නෙ ඇත්තට ම සතුටින්.."

චේතනා, ගඟුල්ගේ සිනා පිරුණු වත දෙස උවමනාවෙන් බැලුවා ය.

"ඔය තුවාලෙ.. කොයි කාලෙද මල්ලි ඉස්සර වෙලාම හැදුණෙ..? "

ගඟුල්, මඳ වේලාවක් නිහඬතාවයේ ගිලී හිඳියේ මතකයෙන් අතීතයෙහි සැරිසරමිනි.

"එතකොට මං ග්‍රේඩ් නයින් හිටියෙ අක්කෙ.. පුංචි විසප්පුවක් ආවෙ මේ පිටිපතුලෙ.. සපත්තු දාලා ඒ තුවාලෙ ගොඩක් වැඩි උනා.. මාස හයක් විතර බෙහෙත් කරලත් තුවාලෙ සනීප උනේ නෑ.. අන්තිමට මෙඩිකල් දීලා සපත්තු නොදා ඉස්කෝලෙ යන්න පර්මිෂන් ගත්තා.. එදත් එදායින් කවදාවත් සපත්තු දාන්න බැරි උනා.."

චේතනා, දිගු සුසුමක් හෙළුවා ය.

"මල්ලිත් විඳලා තියෙන්නෙ පුංචි දුකක් නෙමෙයි එහෙනම්.. හිතාගන්නවත් බෑ මට නම්.."





ගඟුල් දිගු සුසුමක් හෙළුවේ ය. ජීවිතයේ මග හැරුණු තැන් සොය සොයා දුක් වන්නට සැබැවින් ම ඔහුට උවමනා නොවිණි.

"මම ඩිග්‍රි එක කළේ ප්‍රයිවෙට් කැම්පස් එකක.. ඒ කාලෙ ආයෙමත් තුවාලෙ ගොඩක් වැඩි වෙලා තිබුණා.. ඔපරේෂන් දෙක තුනකුත් කළා.. ඒත් වැඩක් උනේ නෑ.. ඒ කාලෙ තමයි මම තාරිකා එක්ක යාළු උනේ.."

ගඟුල්ගේ මුහුණ දෙස සෘජුව බැලූ චේතනා තිගැස්සී ගියා ය.

"අනේ මල්ලි.. ඇස්වලට කඳුළු එන තරම් දුක හිතෙනවා නම්.. අපි ඒ කිසි දෙයක් කතා නොකර ඉමු.."

චේතනා ආයාචනා කළා ය. එහෙත්, ගඟුල්ගේ මුව මත යාන්තමින් සිනාවක් තැවරිණි.

"නෑ අක්කෙ.. හිතේ තියන් ඉන්නවට වඩා කාට හරි කියන එකෙන් හිත සැහැල්ලු වෙනවා.. අනික.. එයා ගැන කතා කළාට ඉස්සර වගේ මට දැන් දුක හිතෙන්නෙත් නෑ.."

තමාගේ සොයුරිය ඈතින් පැමිණෙනු දුටු චේතනා, ගඟුල් වෙත ඉඟියක් කළා ය.

"ඔන්න මල්ලි.. ඔයාගෙ සර්ව බලධාරියා එනවා.. ටක් ගාලා මූඩ් චේන්ජ් කරගන්න.."

චේතනා කියූවට උස් හඬින් සිනා නැගෙන්නට ආවත්, ගඟුල් මුව තුළ ම ඒ සිනාව සිර කර ගත්තේ ය. මානවීගේ මුහුණ නොහොඳ වී ඇතිබව දුටු, චේතනා හා ගඟුල් දෙදෙනා ම මානවීගේ මුහුණ දෙස බැලුවේ පුදුමයෙනි.

"අක්කි.. ඔයා දැන් මං කිව්ව පණිවිඩේ ඔයාගෙ මහත්තයගෙන් ඇහුවද..?"

මානවීගේ හඬෙහි සැබැවින් ම කෝපයක් තැවරී තිබිණි. ගඟුල්, මානවී දෙස බලා සිටියේ පුදුමයෙනි.



Uploaded By Sanda

"තාම ඇහුවෙ නෑ නංගි.."

චේතනා සොයුරියට පිළිතුරු පෑවේ බියපත් හඬිනි.

"තාම ඇහුවෙ නෑ.. එතකොට කවදද අහන්නෙ..?"

"අහලා කියන්නම් නංගි.."

"අහලා කියන්නම් තමයි..???"

මානවීගේ දෑසේ නළියන කෝපය දුටු ගගුල්ගේ මුව නිරායාසයෙන් ම විවර විය. අක්කා, නගාවරුන්ගේ ප්‍රශ්නයකට තමා මැදිහත් විය යුතු නැතැයි ඒ මොහොතේ ඔහුට මතක් වූයේ නැත.

"ඇයි නංගි.. ඔයාට අක්කි එක්ක කේන්ති ගිහිල්ලද ඔය කතා කරන්නෙ..?"

ගගුල් විමසුවේ අතිශය මෘදු හඬකිනි. එයට පිළිතුරු නොදී ඉන්නට මානවීවට නොහැකි විය.

"බලන්න අයියෙ.. ලොකු හාමුදුරුවො කිව්වට බබා හම්බ උනා ම මෙයා ගෙදර යවන්න කියලා... තාත්තටයි, මටයි ඒක එහෙම කරන්න හිත හදාගන්න බෑ.. තාත්තයි, මමයි කල්පනා කළේ එහා පැත්තෙන් මෙයාට ඉන්න ඇනෙක්ස් එකක් හදලා දෙන්න.. වෙන මිනිස්සුන්ට බලෙන් කියලවත් කරවගන්න බැරි දෙයක් අපි මෙයාට කරලා දෙන්න හදනකොට.. මෙයාට ඒකෙවත් අගයක් නෑ.. අපි කිව්වා මෙයාට එයාගෙ මහත්තයගෙන් අහලා අපිට උත්තරයක් දෙන්න කියලා.. එයා තාම ඒක අහලාවත් නෑ.. මෙයා මගෙ අක්කා උනාට.. තාත්තගෙ ලොකු දුව උනාට.. අනුන්ගෙ ගෑනු ගැන අපිට එහෙම තීරණ ගන්න බෑනෙ අයියෙ.."

දැඩිව කියූ මානවී, වැලේ වනා තිබූ නිවැසියන්ගේ ඇඳුම් කිහිපය ද රැගෙන, පවනට බඳු වේගයෙන් නිවස තුළට වැදී නොපෙනී ගියා ය.



Uploaded By Sanda



ගගුල්, චේතනා දෙස බැලුවේ පැහැදිලිව ම නොපැහැදිලි දෑසිනි. මානවී කෙරෙහි ලෙන්ගතුකම පිරුණු සිතට, ඔහුටත් නොදැනී ම චේතනා කෙරෙහි නොරිස්සුමක් කැඳවා ගෙන විත් තිබිණි.

"ඇයි අක්කෙ මානවීව කේන්ති කරවන්නෙ..? ඔයාට හොඳක් කරන්නනෙ තාත්තයි, නංගියි ලෑස්ති වෙලා තියෙන්නෙ.. ඇයි ඒක ගණන් නොගන්නෙ..?"

"එයා ආවා ම කතා කරන්න හිටියෙ මල්ලි.. ඉතින් මේ සතියෙත් ආවෙ නෑනේ.."

"ෆෝන් එකෙන්වත් කතා කරන්න අක්කෙ.. කතා කරලා තාත්තලට උත්තර දෙන්න.. එයාලට කේන්ති යන දේවල් කරන්න එපා.. පව්නෙ.. බලන්නකො ඒ දෙන්නා මොන තරම් මහන්සි වෙනවද කියලා.."

චේතනා, ගගුල් දෙස බැලුවේ අසරණ දෑසිනි.

"මගෙ ෆෝන් එකේ සල්ලිත් නෑ මල්ලි.. මට ඒ දේවල්වලටත් නංගිට කරදර කරන්න බෑනෙ.."

ගගුල්ගේ සිත තුළ සැබැවින් ම ශෝකයක් උපන්නේ, චේතනා ගැන නොව මානවී හා වනිගසේකර මහතා ගැන ය.

"හෙට මගේ ෆෝන් එක දෙන්නම්.. කතා කරලා උත්තරයක් දෙන්න අර දෙන්නට.."

කාමරයට වැදුණු ගගුල් යහනේ දිගා වී, ඇඳ වියළට වාරු වී, දෑස පියා ගත්තේ ය. ඔහු, දෑස් හැර බැලුවේ මානවීගේ පියවර හඬිනි. ඇ වැලේ තිබී ගෙන ආ ගගුල්ගේ ඇඳුම් කිහිපය නවා ගෙනැවිත්, ඔහුගේ ඇඳුම් වැටට දමමින් සිටියා ය. දෙවනුව, අනෙක් අතින් රැගෙන ආ තේ කෝප්පය ඈ දෑතින් ම ගගුල්ට පිළිගැන්වූවා ය. ඒ දුටු දසුනින්.. ඔහුගේ ළය නුහුරු ම නුහුරු මිහිරි හැඟීම් ගොන්නකින් හිරි වැටී ගියේ ය.

"නංගි.."

මානවී, හිස ඔසවා බැලුවා ය.

"ඇයි අයියෙ..?"

"තාමත් අක්කි එක්ක කේන්තියෙන් ද ඉන්නෙ..?"

"මෙයාලා බබාලා වෙන්න හදනවනෙ අයියෙ.. දෙන්නා දෙපැත්තෙ ඉඳගෙන පිස්සු නටනවා.. අපි මෙච්චර වද වෙන්නෙ අර නූපන් දරු පැටියා ගැන හිතලා අයියෙ.. නැත්තං අල්ලලා දාලා නිකම් ඉන්නවා.."

ගඟුල්ට උවමනා වූයේ ඇවිලෙනා ඈ නිවන්නට ය. ඊට ප්‍රථම, ඔහුට නිරාකරණය කර ගන්නට ප්‍රශ්න පත්‍රයක් ම ඉතිරිව තිබිණි.

"නංගි.. මං දෙයක් අහන්න.. මට ඇත්ත ම කියනවද..?"

මානවී, මෘදු සිනාවකින් යුතුව ගඟුල් දෙස බැලුවා ය.

"ඕන දෙයක් අහන්න අයියෙ.. අයියා දැන් දන්නවනෙ මම හිතේ එකක් තියාගෙන කටින් එකක් පිට කරන ජාතියෙ ගෑනු ළමයෙක් නොවෙන බව..?"

ගඟුල්, තීරණාත්මක ලෙස හිස සැලුවේ ය.

"ඒ හින්දම තමයි නංගි.. මං මේ ප්‍රශ්නෙ මෙච්චර විවෘතව නංගිගෙන් අහන්නෙ..? මට කියන්න නංගි.. ඔයා අක්කගෙ හස්බන්ඩ් එක්ක මොකක් හරි තරහකින් නේද ඉන්නෙ..?"

ඇසුරු කළ කෙටි කාලයේ දී වුවත්, හදවත විශ්වාසයෙන් පුරවා ලූ මිනිසා ඉදිරියේ, මානවී, පැකිළීමකින් තොරව විවෘත වූවා ය.

"මං මේ කියන දේ ඇහුව ම.. අයියවත් කැමති වෙන එකක්



Uploaded By Sanda



නෑ මං ඒ මිනිහට කතා කරනවා සලකනවා තියා බලනවටවත්.. මට නම් පේන්න බෑ ඔය මනුස්සයව.."

මානවී කීවේ දිගු සුසුමක් හෙළමිනි. සහෝදර සෙනෙහසට ළය උණු වූවාට, සොයුරියගේ සැමියා කෙරේ නම් මානවී තුළ වූයේ උග්‍ර කලකිරීමකි. ගඟුල්ගේ තිගැස්සුණු දෑස දෙස බලන්නට ඊටත් වඩා ඇයට දුක සිතිණි.

"ඇයි නංගි.. ඒ මනුස්සයා ඔයාට මොකුත් කරදරයක්______"

ගඟුල්ට කියාගෙන ආ දේ කියා නිම කිරීමට පවා නොදී, මානවී පිළිතුරු බැන්දා ය.

"ආ..පෝ.. නෑ අයියෙ.. ඒවට ආවා නම්.. අක්කගෙ මනුස්සයා කියලා බලන්නෙ නෑ අඬු කරනවා.. මොකුත් නොකළා උනාට ඒ මනුස්සයා හිතන විදිය මට අප්පිරියයි.. යාළුවෙලා මෙයාව රවට්ටගෙන ගිහින් හොරෙන් කසාද බැඳගත්තා මදිවට.. එයා ඉන්නෙත් රජ වංසෙන්.. මට පේන්න බෑ ඔය මිනිහගෙ ඔය උද්දච්චකමත්.."

මානවීගේ මෘදු ළබැඳි හඬ, ගොරෝසු වී තිබිණි.

"එහෙම කිව්වෙ.. නංගි______"

"ඒ මනුස්සයා හිතන් ඉන්නෙ අයියෙ.. අක්කලාට ළමයි හම්බ වෙන්න ඉන්නකොට.. නංගිලාටත් අක්කලාගෙ මිනිස්සුන්ගෙන් ළමයි හම්බ වෙන්න ඕන කියලා.. ඒ මිනිහා අන්න ඒ ජාතියෙන් හිතන මිනිහෙක්.. මං මේ කුල මල කියනවා නෙමෙයි අයියෙ.. ඒත්.. ඒ මනුස්සයා දැනගන්න ඕන තමන් කවුද කියලා.. අපේ අක්කි කරපු ගොංකං හින්දා ඒ මනුස්සයා දැන් අපිට ම පාට් දානවා.."

ගඟුල්ගේ දෑස බියෙන් විසල් වී තිබිණි. මානවී, සැහැල්ලු වෙන්නට වෙර දැරුවා ය.

"අයියා.. ඔහොම බයවෙලා වගේ මං දිහා බලන්න එපා.. මං එයාව අතේ දුරින් තියලා තියෙන්නෙ ඒකනෙ.. ඒ මනුස්සයටත් උනේ කටුස්සාගෙ කරේ රත්තරං බැන්දා වගේ වැඩක්.. දැන් එයා එනවා අපේ ඔළුවට අත හෝදන්න.. ඒවා කොහෙද මාත් එක්ක..?"

මානවී ගණණකට නොගෙන පැවසුවත්, ගඟුල්ගේ සිත තුළ වූ උග්‍ර ප්‍රශ්නාර්ථයන් වැඩි දියුණු වූවා මිස සමනය වූයේ නම් නැත.

"නංගි.. එහෙම බැලුවම.. මෙතන පේනවට වඩා ප්‍රශ්නයක් තියෙනවනෙ.. අක්කා මෙහෙ තියාගෙන ඉන්න එක.. කවද හරි ලොකු ප්‍රශ්නයක් වෙන්නත් ඉඩ තියෙනවා නේද..?"

මානවී, දිගු සුසුමක් හෙළුවා ය.

"ඔව් අයියෙ.. ලොකු ප්‍රශ්නයක් තමයි.. ලොකු හාමුදුරුවො උනත් නොකියා කිව්වෙ ඒක.. කසාද බැඳපු ගෑනු මිනිස්සු වෙන් වෙලා දෙපැත්තක ඉන්න එකත් ලොකු ප්‍රශ්නයක්.. ඒත්.. අක්කි ඒක තේරුම් ගන්නෙ නෑ අයියෙ.."

මානවීගේ හඬ වේදනාබර වී තිබිණි.

"ඔයයි, තාත්තයි පව් නංගි.. හරි ම පව්.. ඇත්තමයි.."

"අයියට තේරෙන දේ අපේ අක්කට තේරෙන්නෙ නැනෙ අයියෙ.. හොරෙන් පැනලා ගිහින් කුලෙන් පිට මනුස්සයෙක් එක්ක.. දැන් මනුස්සයත් නැතුව ළමයකුත් හම්බවෙන්න ඉන්දැද්දි ගෙදර ඇවිල්ලා ඉන්නකොට.. මිනිස්සු මොන මොන කතා කියනවද..? ඒ මනුස්සයා හම්බ කරන දේවල් ඒ මනුස්සයගෙ ගෙදරටයි, කට ගොන්නක් බොන්නයි නාස්ති කරනවා මිසක් අක්කට බලන්නෙ නෑ.. අපි සලකන හින්දා ඒ මනුස්සයට දැන් ගාණක් ම නෑ.."

මානවීගේ දෑස ඈතින් දිස්වන කඳු පන්තියේ වන, නිල වර්ණ වන තීරුවෙන් ද ඔබ්බට යොමු වී තිබිණි. වලාකුළක් සේ





සැහැල්ලුවේ තමා ගත කළ ජීවිතය හමාර වූයේ, තම සොයුරියගේ හිතුවක්කාරී ක්‍රියා කලාපයන් හමුවේ නොවේදැයි සිතද්දී, මානවීට තමා ගැන ම උපන් විසල් කම්පාවකින් හදවත සැලී ගියේ ය.

"මං දන්නෑ අයියෙ.. මට තේරෙන්නෙ නෑ.. එයාගෙ කැමැත්තෙන් කසාද බැඳලා ගියා නම්.. මොන කට්ටක් කාගෙන හරි ඒ මනුස්සයා එක්ක ඉන්න එපායැ.. ඒගොල්ලො ඇයි මෙච්චර සැහැල්ලුවට ජීවිතේ බාරගෙන තියෙන්නෙ කියලා මට තේරෙන්නෙ නෑ.. අක්කි මේ විදියට ආපහු ගෙදර ආව එකෙන් මගෙයි, තාත්තගෙයි නිදහස එහෙම ම නැති උනා අයියෙ.."

ගඟුල් බොහෝ වේලාවක් නිසොල්මනේ යුවතිය දෙස බලා සිටියේ ය. ඔහුට දැනුණේ චේතනා කෙරෙහි හදවතේ පිරී තිබුණු අනුකම්පාව බිඳෙන් බිඳ දියවී යන්නාක් මෙනි. ඔහු, තමාට වැටහුණු සත්‍යය ඇයට පහදා දීමට උත්සාහ දරමින් සිටියේ ය.

"ඔයා පව් නංගි.. සැහැල්ලුවෙන් වගේ හිනාවෙවී.. සිංදුවක් කිය කියා.. සතුටින් වගේ ජීවත් උනාට.. ඔයා ගොඩක් දුක් විඳිනවා නංගි.."

"දුක් විඳිනවා තමයි අයියෙ.. තේරුමක් නැති දේවල් වෙනුවෙන්.."

"මං නංගිට අවවාදයක් දෙන්න.. මං කියන දේ අහනවද..?"

මානවී, හොඳින් හිස හරවා, තරුණයා වෙත මද සිනා පෑවා ය.

"මමත් පුංචි රාහුල හාමුදුරුවො වගේ තමයි අයියෙ.. ලැබෙන ඕනෑම යහපත් අවවාදයක් හිස් මුදුනින් පිළිගන්නවා.."

ගඟුල්, පානය කොට අවසන් කළ තේ කෝප්පය අතට ගනිමින්, මානවී කීවා ය. ඇගේ නොඉඳුල් තුරුණු දෑස් මත ඔහු දුටුවේ අපූරු සෞන්දර්යයකි.



Uploaded By Sanda

"අක්කට.. මෙහෙ ගෙවල් එහෙම හදලා දෙන්න හදන එක හොඳ දෙයක් කියලා නංගි හිතනවද..? ඒක කවදා හරි නංගිට ම ප්‍රශ්නයක් වෙන්න පුළුවන් නේද..? ඕවා කරලා කවද හරි සජිත්ගෙ දෙමව්පියො නෑදෑයෝ නංගිටයි, තාත්තටයි බැන්නොත් ගෙවල් දොරවලුත් හදලා දීලා අක්කව මෙහෙ බලෙන් තියාගත්තා කියලා..???"

"ලොකු හාමුදුරුවන්ට මං ඔය ඇනෙක්ස් එකේ කතාව කිව්ව ම ලොකු හාමුදුරුවො කිව්වෙත් ඔය කතාවමයි අයියෙ.. බැඳපු මිනිස්සුන්ගෙ ජීවිතවලට එබිලා බලන්න ඕන පරිස්සමින් කිව්වා.. කසාද බැඳපු මිනිස්සුන්ගෙ ජීවිතවලට ඇඟිලි ගහන්න හොඳ නෑ කිව්වා.. ගොඩක් වෙලාවට බැඳපු මිනිස්සුන්ට ළංවෙලා උදව් කරන්න, හොඳ කරන්න ගියාම අපිට සිද්ධ වෙන නරක, නපුර වැඩියි කිව්වා.. මගෙ ඔළුවෙ මේ දවස්වල තිස්සේ ම කැරකෙන්නෙ ඔය ප්‍රශ්න ටික අයියෙ.."

මානවී වෙනුවෙන් උපන් ශෝකය, දිගු සුසුමක් වී ගඟුල්ගේ මුවින් ගිලිහුණේ ය.

"ඒත්.. අක්කා යන්නෙ නැත්නම්.. තාත්තයි, මමයි එයාව බලෙන් යවන්නද අයියෙ..? මේක මහ ගෙදර.. මේ ගෙදර එයාගෙත් ගෙදර.. අපි දෙන්නා මේ ප්‍රශ්නෙදි හරිම අසරණ වෙලා ඉන්නෙ අයියෙ.."

මානවීගේ දෙනෙත් අග කඳුළක් නළියනු දුටු ගඟුල්ගේ හදවත වේදනාවෙන් සැලිණි.

"ඔය ප්‍රශ්නෙට උත්තරයක් කොහේ හරි ඇති නේද නංගි.. මොකද උත්තර නැති ප්‍රශ්න මේ ලෝකෙ නෑ කියනවනෙ.."

"අක්කි කවද හරි දවසක තාත්තව බලාගනියි කියලා හිත හදාගන්න පුළුවන් නම්.. මම මේ ගෙදර අක්කිට ලියලා දෙන්න කියලා තාත්තට කියනවා.. එහෙම කරන්න බෑ අයියෙ.. අක්කි කවදාවත් තාත්තව බලාගන්නෙ නෑ.. එයා තාත්තව මරවගෙන



Uploaded By Sanda



එයාගෙ වැඩ ටික කරගනියි.. කවදා හරි දවසක තාත්තා ඉන්න ඕන මං ළඟ.. ඒ හින්දා ඒ වගේ තීරණ ගන්න ඉක්මන් වෙන්න බෑ අයියෙ.."

තමාගේ ආත්මීය වේදනාව අකුරක් නෑර ගළපන යුවතිය කෙරේ, ගඟුල්ගේ සිතට දැනුණේ අසීමිත වේදනාවකි.

"මාර ප්‍රශ්නයක් නේද නංගි.. මට පුදුම ඔයාගෙ ඉවසීම ගැනයි.. ඔච්චර ප්‍රශ්න තියාගෙනත් කිසි ම වෙනසක් නැතුව අක්කට සලකන ඔයා ගැන මට හරි ම පුදුමයි නංගි.."

"කවද හරි දවසක.. මේ ලෝකෙන් යන දවසක අපි මේ හැමදේ ම අතෑරලයි යන්නෙ අයියෙ.. ජීවත් වෙන මේ ටික කාලෙදි.. අක්කි එක්ක නෙමෙයි.. කිසිම කෙනෙක් එක්ක ප්‍රශ්න හදාගන්න මම කැමති නෑ අයියෙ.."

දෑස් මුලට රොක් වූ කඳුළ, මානවී, දබරැඟිල්ලෙන් පිස දමා ගත්තා ය.

"මට මෙහෙම දෙයක් හිතුණා අයියෙ.. තාත්තා කැමති නෑ මම ඕනවට වඩා කරදර වෙනවට.. නැත්නම්.. මේ දේ අනිත් හැම දේටම වඩා හොඳයි.. මට අර ගවන්මන්ට් ලෝන් එක ඉක්මනට ගන්න පුළුවන් අයියෙ.. ඕක ඉතින් අවුරුදු පහකින් හයකින් ගෙවිලා ඉවර වෙන එකනෙ.. කාලෙ යන වේගෙ දිහා බැලුවම අවුරුදු පහක් හයක් කියන්නෙ මොකක්ද? ඒ ලෝන් එකේ ඉන්ට්‍රෙස්ට් එකක් හරි අඩුයිනෙ අයියෙ.. අක්කිට දුන්න ඉඩම තියෙනවා මීට කිලෝ මීටර් තුනකට විතර එහා.. මට හිතෙනවා ඒකෙ පොඩි ගෙයක් හදලා දුන්නා නම් ඉවරයි කියලා.."

ගඟුල්ගේ දෑස දීප්තියෙන් බැබළිණි.

"අන්න කරන්න පුළුවන් නම් හොඳ ම වැඩේ නංගි.. එතකොට අක්කා ළඟත් නෙමේ, දුරත් නෙමේ.. එයාලා කොහොම හරි එයාලගෙ ජීවිත ගැන බලා ගනියි.. මේ ප්‍රශ්න, චෝදනා හැම

එකෙන් ම නංගියි, තාත්තයි දෙන්නමත් නිදහස්.. ඕන වෙලාවට එයාව බලන්නත් පුළුවන්.. අනිත් වෙලාවට නිදහසේ ඉන්නත් පුළුවන්.."

මානවීගේ දෑස අපේක්ෂාවේ දීප්තියෙන් දැල්විණි.

"අනේ අයියෙ..???"

මානවීගේ හඬ උද්යෝගයෙන් පිරී තිබිණි. ගගුල්, ඇ දෙස බැලුවේ විමතියෙන් දෑස කුඩා කරගෙන ය.

"ම්.. මොකද නංගි..?"

"අනේ අයියෙ.. අපේ තාත්තව ඒ වැඩේට කැමති කරවලා දෙන්නකො.. ප්ලීස්.. අයියා කිව්වොත් නම් තාත්තා කැමති වෙයි.."

මානවීගේ ආයාචනාත්මක මුහුණ දැක ගගුල්ට සිනා ගියේ ය. ඔහු හිස සැලුවේ ඒ සැහැල්ලු සිනාව සමගිනි.

"ගෙයක් හදලා දීලා එයාව යවන එක හොඳයි අයියෙ.. නැත්නම් කවද හරි ඔය මිනිස්සු මට කියයි කොල්ලෙක්ව ගෙට දාගෙන තමන්ගෙ අක්කව ගෙදරින් පන්නගත්තා කියලා.. වඳින්න යන දේවාලෙ මොනවටද ඔළුවට කඩන් වට්ටගන්නෙ.. නේද අයියෙ..?"

ගගුල්, සරණංකර හිමියන්ගෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණ මාස එක හමාරක පමණ කාලයක් ගෙවී ගොස් තිබිණි. ඒ වන විට අතොරක් නොමැතිව දුගඳ හමන, කුණු ලේ මිශ්‍රිත සැරව ගලා යන ස්වරූපයෙන් මදක් රෝගී තත්වය සුව අතට හැරී තිබිණි. ආලින්දයේ හිඳ තමාගේ ලැප්ටොප් පරිගණකයට දෑස යොමාගෙන





උන් ගගුල් දෑස ඔසවා බැලුවේ, මුස්නත් රැගෙන මානවී නිවස අමදින්නට පැමිණි බැවිනි.

උදෑසන අට පමණ වී තිබුණ ද, චේතනා ඒ වන විටත් අවදි වී සිටියේ නැත. සෑම දිනක ම පාන්දර හතරට පමණ අවදි වන මානවී, නිවසේ බොහෝ කාර්යයන් ඒ වන විට අවසන් කර තිබිණි. යන්ත්‍රයක් සේ යුහුසුලුව නිවසේ කුඩු මහත් කාර්යයන්හි තනිව නියැලෙන මානවී කෙරෙහි, ගගුල්ගේ සිත තුළ වූයේ අප්‍රමාණ වේදනාවකි.

"නංගි.. අක්කි තාම නැගිට්ටෙත් නැද්ද..?"

මානවී, මුව කොනකට සිනාවක් නගා ගත්තා ය.

"සැප ඇත්තෝ... පින් කෙරුවෝ.. කති.. බොති.. සුවසේ නිදති..!"

මානවී එය කියූ තාලයට, සිනා නොවී හිඳින්නට ගගුල්ට නොහැකි විය.

"හැමදේ ම විහිළු..! ඔයා වගේ පිස්සියෙක් නම් මම දැකලා ම නෑ නංගි.."

මානවී, නළල රැලි කළේ ප්‍රශ්නාර්ථයෙනි.

"එහෙදිවත්..???"

"කොහෙදිවත්..!!!"

ගගුල්, මොහොතක් බලා හිඳ.. යළි දෙතොල් විවර කළේ ය.

"එහෙත් ඉන්නවා.. එහෙ ඉන්නෙ මේ වගේ මනුස්සකම් පුරවගත්ත.. හොඳ.. ආදරණීය පිස්සියො නෙමේ.. ආත්මාර්ථකාමී.. ජඩ.. කැත.. කුහක උන්.. බැරි වෙලාවට පයින් ගහලා යන.. පුළුවන් වෙලාවට සුරංගනා හීන අරන් ළඟට එන.. උන් පිස්සියො නෙමෙයි.. මාර දූතිකාවෝ..!"



Uploaded By Sanda

ජීවිතයෙන්, යෞවනයෙන් නිස්කාරණයේ දුරකට පලා ගොස් හිඳින තරුණයා කෙරෙහි, මානවීගේ ළයෙහි ජනිත වී තිබුණේ සැබෑ ම අනුකම්පාවකි.

"ඕවා හිතන්නෙපා අයියෙ.. ඔන්න ඉතින් මගේ විහිළුවෙන් අයියා ඇස් රතු කර ගත්තනේ.. ඔයා සනීප වෙලා.. ඔයාගෙ කකුල් දෙකෙන් නැගිටින්නකො.. එතකොට.. ආයෙමත් මුල ඉඳලා ජීවිතේ පටන් ගන්න ඔයාට පුළුවන් වෙයි අයියෙ.."

"බලමුකො නංගි.. හැබැයි එකක්.. දෙව් දේවතාවො දැක්කට පස්සෙ.. මට ආයෙ ඔය මාර දූතිකාවො දිහා නම් බැලෙන්නෙ නෑ කියලා මං දන්නවා.."

ගඟුල්ගේ මුවින් ගිලිහුණු හද කළඹවන ආත්ම ප්‍රකාශනය දිගේ දුර යන්නට, සැබැවින් ම ඇ බිය වූවා ය.

"අයියෙ.. දැන් කකුලෙ අමාරුව අඩුයි නේද..?"

"කියලා වැඩක් නෑ නංගි.. කැක්කුම නම් ඇත්තෙ ම නෑ.. පුදුම සැහැල්ලුවක් දැනෙන්නෙ.."

"කසාය බොන හින්දා වෙන්න ඇති.. අයියගෙ ස්කින් කලර් එකත් හරියට වෙනස් වෙලා.. හරිම ෆ්‍රෙෂ් ලුක් එකක් තියෙන්නෙ දැන්.."

ගඟුල්, සැහැල්ලු තරුණයකු සේ, හැඳ උන් සැහැල්ලු අත් කොට කමිසයේ කොලරය ඔසවා ගත්තේ ය.

"කාටද ආඩම්බර..???"

ඔහු විමසුවේ කෙළිලොල් ලෙසිනි. මානවී ද පරාද වන්නට සූදානම් වූයේ නැත.

"වෙන කාටද..??? මේ අපිටනෙ.. මොකද අපිනෙ ඔයාට බෙහෙත් කරන්නෙ..!!!"





"අයියෝ.. විලි ලැජ්ජාවෙ බෑ.. මං හිතුවෙ ඒකට ආඩම්බර වෙන්න ඕන මං කියලා.."

"හරි.. හරි.. ආඩම්බරේ කාට ගියා ම මොකෝ.. ඕන වැඩේ වෙනවනේ.."

ආලින්දයේ ගෘහ භාණ්ඩ කිහිපය පිස දමා, බිම අතු ගා අවසන් කළ මානවී, ගඟුල් දෙස බැලුවා ය.

"අයියෙ.. දැන් ම කනවද..?"

"බඩගිනි නෑ නංගි.. අන්කල් ආවා ම කමු.."

"තාත්තා දැන් එන්නෙ නෑ අයියෙ.. තාත්තා කෑම අරන් වෙලට ගියේ.. අද එළවළු කොටුවෙ වතුර මුරේ හයේ ඉඳන් එකොළහ වෙනකල්.. වතුර හරවලා බලන් හිටියෙ නැත්නම් කවුරු හරි ඇවිත් වක්කඩ අහුරලා වතුර හරවගෙන යනවා.. ළඟට වෙලා ම බලාගන්න ඕන.."

ගඟුල්ගේ උවනේ ඇඳී තිබුණේ පැහැබර මදහසකි.

"මෙ ලෝකෙ.. කොච්චර ලස්සනද නංගි.. අපි ලස්සනයි කියලා හිතන ලෝකෙට වඩා.. මේ ලෝකෙ ගොඩක් ලස්සනයි නේද.."

"මංදා අයියෙ.. මේ ඉතින් අපි ජීවත්වෙන පරිසරය.. අනික.. සංසන්ධනය කර කර ඕවා කල්පනා කරන්න මට වෙලාවකුත් නැනෙ අයියෙ.."

"හරි.. හරි.. ඔයාටත් එක්ක ම ඒවා මං කල්පනා කරන්නම්කො.. අතු ගාලා ඉවර කරන්නකො.. අපි දෙන්නම කමු.. උදේ කොළ කැඳ වීදුරුව බිව්ව හින්දා බඩගිනි නම් ඇත්තෙ ම නෑ නංගි.."

මානවී, ආලින්දය අතු ගා ගෙන නොපෙනී ගිය මොහොතේ පටන්, ගඟුල් ඉමිහිරි සිහින ලොවක හිතුමතේ සැරිසරන්නට වූයේ ය. ඒ සිහින ලොව කෙතරම් රසවත්දැයි ඔහුගේ මුහුණ මත ඇඳී



Uploaded By Sanda

තිබුණු සොඳුරු මදහස තුළ ඇඳී තිබුණි. එහෙත්, ඔහුගේ ඉමිහිරි කල්පනා ලොව රජ වූයේ මොනවාදැයි, කවුරුන්දැයි දැන සිටියේ ඔහු ම පමණි.

ගගුල්ගේ කාමරයේ ඇඳ ඇතිරිලි ආදිය ඉවත් කරමින්, කාමරය අස් පස් කරන ඇගේ මුවින් නොදැනීම ගිලිහුණේ සොඳුරු ම ගීතයකි. ආලින්දයේ උන් ගගුල් පුටු වතට හිස තබා, දෑස් පියා ගත්තේ, ඇගේ මධුර මනෝහර ස්වරයේ නිර්ලෝභීව කිමිදෙන්නට ය.

- සෙනෙහෙස පුර හඳ වෙන දා
ඔබෙ අත ගෙන මහ පෝ දා
යන්න හිතයි මල් අරගෙන
තුන් හිත පහදා...
ඔබ එන්න හොඳේ පැන් අරගෙන
මගෙ හිත නොරිදා..

සඳ මලට තරු යායට
පෙම් බැන්දා සේ
කඳුළු වනේ ගම් මැද්දේ
පිය මැන්නා සේ
ජීවත් වෙමු ඉන්න තුරා
මල් පිපුණා සේ..

ඇළට දොළට ගංගාවට
හිත බැඳුණා සේ
ගහට කොළට වැව් යායට
හිස නැමුවා සේ
ජීවත් වෙමු ඉන්න තුරා
මල් පිපුණා සේ..-



Uploaded By Sanda



ඇගේ ගී හඬ, තමාට නවමු ලොවකට ආරාධනා කරන්නාක් වැනි සුවදායී හැඟීමකින් ගගුල්ගේ හදවත පිරී තිබිණි. ඔහුගේ ජංගම දුරකථනය නාද වූයේ ඒ අතර ය.

"තාත්තේ.."

"සති දෙකකින් ම ආවෙ නැනෙ පුතේ.. මං අනිද්දා එන්න කියලා හිතුවෙ. ඔෆිස් එකෙන් විශේෂයෙන් ගේන්න ඩොකියුමන්ට්ස් මොනවා හරි තියෙනවද පුතේ..?"

ගගුල්ගේ මුවින් සැහැල්ලු සිනාවක් පිට පැන්නේ ය.

"නෑ තාත්තෙ.. දැන් ඩේ වූ ඩේ හැම දෙයක් ම වෙබ් කෙරෙනවා.. කොර ගගහා ඔෆිස් ගියාට වඩා ලේසියට පිළිවෙළට දැන් වැඩ ටික ඔන් ලයින් කෙරෙනවා තාත්තෙ.."

තම පුතුගේ සිනා මුසු වදනක් ගානේ ම පුතු අත් විඳින සැහැල්ලුව දැනී, සමරසිංහ මහතාගේ හදවත සැනසිණි.

"කෝ පුතේ අර දරුවා..?"

"ප්‍රධාන වැඩේ නම් ගේ අතු ගාන එක.. ඒ අතරෙ ඉතින් තව වැඩ කීයක් කරනවද දන්නෙ නෑ.."

"ඒක නම් ඇත්ත.. මේ දරුවො කරන දේවල් එක්ක බැලුව ම.. ඔයාගෙ අම්මා, තාරිකාලා මොනවද පුතේ කරලා තියෙන්නෙ..?"

තම පියා - මවත්, බිරිඳත් සිහි කිරීමෙන්, එතෙක් වෙලා ඇඳී උන් ගගුල්ගේ සැහැල්ලුව අතුරුදන් වී ගියේය.

"අම්මා තාමත් තාත්තා එක්ක රණ්ඩු කරනවද තාත්තෙ මෙහෙ එන්න ඕන කියලා.."

"ඔව්.. අම්මට සිංහල තේරෙන්නෙ නෑ පුතා.. මාස තුනක් විතර පහු වෙනකල් අමුත්තො ගෙන්නන්නෙපා කියලා හාමුදුරුවො කිව්වා කිව්වට අම්මා විශ්වාස කරන්නෙ නෑ.. අම්මා කියනවා මම

අමුත්තෙක්යැ අම්මනෙ කියලා.. ඒත් ඉතින් ඔයාගෙ අම්මා තැනකට ගියාම හැසිරෙන්නෙ සේරම අමුත්තන්ට වඩා අමුතු විදියටනෙ.."

ගඟුල්ගේ සිත තුළ උපන්නේ සියුම් කලකිරීමකි. එහෙත්, තමාගේ ම මවට ගරහන්නට බැරිකමට ඔහු නිහඬ වූයේ ය.

"ලස්සන ම වැඩේ කියන්නෙ පුතේ.. මෙච්චර මේ හරියක් වෙලත්.. අම්මට නාම නාරිකා ලොකු වෙලා තියෙන එකනෙ.. තමන්ගෙ පුතාව අමු අමුවේ දාලා ගියාටත් පස්සෙ.. ලේලියෙක්ව ඔය තාලෙට ඔළුව උඩ තියන් දඟලන නැන්දම්මා කෙනෙක් මං දැක්කාමයි.."

සමරසිංහ මහතාගේ හඬට මුසුව තිබුණේ වේදනාව, කෝපය සේ ම කලකිරීමකි.

"අම්මට එයාගෙ පුතාට වඩා.. යාළුවගෙ දුව ලොකු ඇතිනෙ තාත්තෙ.. මේවා.. තාත්තගෙයි, මගෙයි අවාසනාව.. හොඳ වෙලාවට මල්ලිට හොඳ ම හොඳ ගෑනියෙක් හම්බ උනේ.. නැත්නම් මල්ලිටත් වෙන්නෙ තාත්තටයි, මටයි වගේ එකට වැටිලා දුක් විඳ විඳ ඉන්න.."

"මල්කි දුව නම් ඉන්නෙ පුතාව බලන්න පුදුම ආසාවකින්.. හැම තිස්සෙම පුතාව මතක් කරනවා.."

"නංගි නම් මටත් කෝල් කරනවා තාත්තෙ.. බබා මේ ෆොටෝස්වල ඉන්නවා වගේම ද තාත්තෙ..?"

ගඟුල් විමසුවේ වාවාගත නොහැකි වේදනාවත් අසීරුවෙන් වාවා ගනිමිනි.

"ඔව් පුතේ.. අපූරු කොලු පැටියා.. දැන් නම් ඇරපු අතක් නෑ මල්ලි පුංචි කාලෙ වගේමයි.."

"මටත් ෆොටෝස්වලින් බලනවට වඩා ඇස් දෙකෙන් ඇත්තට ම බබාව බලන්න ආසයි.. ඒත්.. මට කොහෙද මේ සැරව ගලන තුවාලයක් එක්ක එහෙම වාසනාවක් තිබුණෙ.."





"ඔහොම ඉන්නකො පුතේ.. හැමදේම හරියයි.. මල්ලිට හැම දේම ලැබුණා.. ඔයාට හැම දේම නැති උනා.. ඒ අපිට පෙනෙන ඇත්තනෙ පුතේ.. ඒත්.. දෛවය සමහර තීන්දු ගන්නෙ අපිට හොරෙන්.. හරි හෙමින්.. අවුරුදු පහළොවකට පස්සෙ සරණංකර හාමුදුරුවන්ව අපිට මුණ ගස්සන්න සැලසුම් හදපු දෛවය ම තව මොන මොන සැලසුම් හදලා තියෙනවද කියලා කවුද දන්නෙ පුතේ.. අපි දෙන්නා තව ටිකක් මෙහෙම බලන් ඉමුකො මොකද වෙන්නෙ කියලා.."

නිවස අතු ගා පිරිසිදු කොට අවසන් කළ මානවී, නිදි ගැට කඩමින් එන තම සොයුරිය දෙස බැලුවේ නොරිස්සුමෙනි.

"ශෝක් නැගිට්ටින වෙලාව අක්කි.. නවයයි වෙලාව.. ඔයාට කෙසේ වෙතත් ඔය බඩේ ඉන්න දරුවට දෙයියන්ගෙම පිහිටයි.. අන්න වතුර පැහිලා.. හදාගන්න කිරි එකවත්.."

කිසිවක් ඇසීමට පවා ප්‍රමාද නොවූ මානවී, ආලින්දය දෙසට ඇවිද ගියා ය. දුරකථන ඇමතුමෙහි උන් ගඟුල්ට ඇ අතින් සන් කළේ, ආහාරය සූදානම් බව අඟවන්නට ය. පිටව යන්නට සූදානම් යුවතියට ගඟුල් නවතින ලෙසට සන් කළේ ය.

"නංගි.. මේ තාත්තා අහනවා අනිද්දා එනකොට මොනවද ගේන්න ඕන කියලා..?"

ගඟුල් කෙළිලොල්ව විමසුවේ අවස්ථානුකූලව ගොතා ගත් කුඩා බොරුවකි. තම පුතුගේ සමාක් ප්‍රායෝගය සමරසිංහ මහතාගේ සිතට ද ගෙනාවේ අපූරු සැහැල්ලුව මුසු වූ සොම්නසකි.

"ඔය තියෙන හොඳ හිත විතරක් අරගෙන.. පරිස්සමට එන්න කියන්න අයියෙ.. ඒ හොඳටම ඇති.."

ගඟුල්ගෙන් පිළිතුරක් ලැබෙන තෙක් පමා නොවූ මානවී, සිනාසී වහා නික්ම ගියා ය.



Uploaded By Sanda

ග්‍රාම සංවර්ධන සමිතියේ මාසික රැස්වීම් වාරය සඳහා, සන්ධ්‍යාවේ මානවීත්, වනිගසේකර මහතාත් නිවසින් නික්ම ගියේ එක විට ම ය.

"මාටින් මාමෙ.. තාත්තයි, මමයි එනකල් ගෙදර ඉන්න හොඳද..?"

"මං ඉන්නං පොඩි දුව.. හැබැයි මට නිකං නං ඉන්ට බෑ.. මං අර පොඩි දුවගෙ මල් පාත්ති ටික සුද්ධ කරලා දාන්ටද..? පොඩි දුවට  වැඩ වැඩි හින්දා මේ ටිකේ මල් ගස් ටිකට සාත්තුවක් නෑ නේද..?"

"මාමට ඕන දෙයක්.. අන්න මම අර දුඹුරු පාට ෆ්ලාස්ක් එකට කහට එකක් දැම්මා.. එතන ම කහ පාට කප් එකේ හකුරු තියෙනවා.. මාමට ඕන වෙලාවට බොන්න.."

මානවී කියද්දී, මාටින් හිස සැලුවේ ලැජ්ජාවෙන් සිනාසීගෙන ය.

"මාටින්ගෙ බඩ ඉතින් මෝය කට වගේ තමයි.. කොච්චර දේවල් වැටුණත් ගාණක් නෑ.."

ගම්මුන් මාටින්ට විහිළු කළේ එසේ ය. එහෙත්, එය පූර්ණ සත්‍යය ම වූ බැවින්, මාටින් කිසිදා කිසිවකු සමඟ උරණ වූයේ නැත.

මානවීත්, වනිගසේකර මහතාත් පිටව ගිය මොහොතේ ගගුල්, චේතනාට ආමන්ත්‍රණය කළේ ය.

"අක්කේ.."

"ඇයි මල්ලි..?"

"ආ ෆෝන් එක.. මානවියි, තාත්තයි නැති වෙලාවෙ සජිත්ට කෝල් එක ගන්න.. බොහොම අමාරුවෙන් නංගි ලෝන් එක





දාලා ගෙදර හදලා දෙන්න හදන වැඩේට තාත්තා කැමති කරවා ගත්තෙ.. ප්‍රශ්න ඇති කරගන්නෙ නැතුව කතා කරගන්න.."

අසරණ දෑසින් ගගුල් දෙස බලා හිස සැලූ චේතනා, ගගුල්ගේ ජංගම දුරකථනයත් කන රුවාගෙන පැළ දොරින් මිදුලට බැස්සා ය. සජිත් දුරකථනයට ඇමතුවේ තෙවන වරට ද එය නාද වීමෙන් අනතුරුව ය. ඒ වන විට චේතනා බෙහෙවින් කෝපයට පත්වී සිටියා ය.

"මොකද සජිත් වෙලා තියෙන්නෙ.. කෝල් එකක් ගත්ත ම ආන්සර් කරන්න බැරිද..?"

"මං කොහොමද දන්නෙ තමුසෙ ගන්නවා කියලා.. කාගෙද ඔය ෆෝන් එක..?"

"ගගුල් මල්ලිගෙ.."

"ආ.. එතකොට දැන් උගෙ ෆෝන් එකෙන්ද කෝල් ගත්තෙත්..? අපූරු නාඩගම තමයි දැන් නෝනලා රඟ දක්වන්නෙ.."

"සජිත්.. තමුසෙ මගෙන් මොකුත් අහගන්න එපා.. සල්ලි තියෙන මොකක් හරි ෆෝන් එකකින් මම ම තමුසෙට ගන්නෙපායැ.. ෆෝන් එකට දාගන්න තමුසෙ මට සල්ලි දෙනවද එහෙම නැත්තං තමුසෙ මට කෝල්ස් ගන්නවද..? ඔය එකක්වත් නොකර නව එනවා මට බලු කතා කියන්නත්.. අඩු කළේ හෙලවෙනව ම තමයි.. තමුසෙත් හැම තිස්සෙ ම තමුසෙගෙ අඩුව ප්‍රදර්ශනය කරනවා.."

චේතනා, පෙර කිසිදු දිනයක නොවූ විරූ තරම් කෝපයෙන් වියරු වැටී සිටියා ය.

"කට වහනවා අයිසෙ.. බොරුවට බෙරිහන් දෙන්නෙ නැතුව.."

"බොරුවට.. බොරුවට නෙමෙයි මනුස්සයෝ.. මං බෙරිහන් දෙන්නෙ ඇත්තට.. ලෝකෙ ම තියෙන සුරංගනා හීන ටික සේරම



Uploaded By Sanda

පෙන්නලා.. මාව රවට්ටලා කසාද බැඳගෙන.. අම්මලා, අයියලා, අක්කලා සේර ම රොත්ත මැද්දට මාව ගිහින් දාලා.. මට දරුවෙකුත් හදලා දීලා.. දැන් කසාද බැඳලා නැති මිනිහා වගේ තමුසෙ තව ගෑනු පස්සෙන් යනවා කියලා මට ආරංචි වෙච්ච ඒවා බොරු කියලා කියන්න තමුසෙට පුළුවන්ද..? කතා කරනවා මනුස්සයෝ.. කතා කරනවා.."

සජිත්ට තම බිරිඳගේ වියරුව අදහා ගත හැකි නොවිණි. එතෙක් දිනක් චේතනාගේ හදවත තුළ නිදා උන් දුක් ගිනි කන්ද ම විදාරණය වී තිබිණි.

"චේතනා..!"

"සජිත්.. හිතේ තියෙන සේරම කියාගන්න නිදහසේ කතා කරන්න වෙලාවක් හම්බ උන වෙලාවෙ මට කතා කරන්න දෙන්න.. සංහිතිය ම එපා කියලා මං ඔයත් එක්ක ආවෙ මෙහෙම අත පල්ලෙන් වැටිලා වගේ මේ දුක විඳින්නද..? මට නම් දැන් හෙණ ගැහුවත් කමක් නෑ.. ඒත්.. මේ දරුවා ගැනවත් ඔයාට හැඟීමක් නැද්ද..? අර අහිංසක කෙල්ල නැත්තං එක රුපියලක් ඉල්ලගන්න කෙනෙක් ඉන්නවද මට..?"

මානවී මතක් කළ විට ම, සජිත්ගේ සිත තුළ හීන වී යමින් තිබුණු කෝපය යළි හිස එසවීය ය.

"මතක් කරන්න එපා තමුසෙගෙ ඔය අහංකාර මල ඉලව් නංගිව.. එයා තමුසෙට සැලකුවට අපිට සලකන්නෙ නෑනෙ.. මම එයාගෙ මස්සිනා.. ඒ ගැනවත් ගරු සරුවක් ඇතුවද තමුසෙගෙ නංගි හැසිරෙන්නෙ..?"

චේතනාට යළි ඉවසුම් නොදෙන කෝපයක් ඇති වූයේ නැගණියට කළ දෝෂාරෝපණය දරා ගත නොහැකිව ය.

"ගරු සරු දෙන්න පුළුවන් විදියටද තමුසෙ හැසිරෙන්නෙ.. ඒ මිනිස්සු ගරු සරු දෙයි තමුසෙ මං ගැනවත් හරියට සලකලා



Uploaded By Sanda



බලනවා නම්.. තාත්තයි, නංගියි නොහිටින්න මං මෙලහකට හාමතේ මැරිලා.. අද එනවා හෙට එනවා කියනවා.. මාස දෙකකින් ආවෙ නෑ.. අනේ සතයක් නෑ මට.. හැම එකට ම නංගිට අතපාන්න ඕන.."

චේතනා, වියරු වැටුණා ය. ඇ කියවන්නට වූයේ ඒ වියරුවෙනි.

"සජිත්.. මට කමක් නෑ තමුසෙ එක ගෑනියෙක් නෙමෙයි තව ගෑනු සීයක් පස්සෙ ගියත්.. මටයි මගේ දරුවටයි නිදහසේ ඉන්න ඕන.. ඒත් තමුසෙ.. කවදාවත් මට ඉහට වහලක් හදලා දෙන්නෙ නෑ.. ඒක මගෙ පව.. ඒ පවට පින දෙන්න බෑ.. ඒත්.. මගෙ නංගි හදන්නෙ මාව වැටිලා ඉන්න අපායෙන් අඩියක් උඩට ගන්න.. නංගි මට කිව්වා ලෝන් එකක් දාලා තාත්තා මට දීපු ඉඩම් කෑල්ලෙ ගෙයක් හදලා දෙනවා කියලා.."

එය ඇසුණු මොහොතේ, සජිත් හිනැහෙන්නට වූයේ උන්මත්තකයකු විලසිනි.

"අයියෝ.. තමුසෙගෙ නංගි වගේ මී හරකියක්.. වෙන නංගිලා පුළුවන් තරම් තමන්ගෙ අක්කලාගෙ දේවල් කඩා වඩා ගන්නවා.. ඒකට තමුසෙගෙ නංගි.. අක්කා හින්දා වෙස්සන්තර දාන පාරමිතාව.. හෑ... හෑ.. හා..!"

සජිත්ගේ විකාර රූපී සිනාව ඇසෙත් ම, චේතනාට සිතුණේ ම දිව ගොස් සජිත්ගෙ ගෙල මිරිකා දමන්නට තරම් ආවේගයකි.

"ඔව් මෝඩයෝ.. ඒ වෙන නංගිලා.. මේ මගේ නංගි.. තමුසෙ මාව දාපු නරකාදියෙන් මාව ගොඩගන්න හිතන ඒ මී හරක්කම හොඳ නැද්ද මෝඩයෝ තමුසෙගෙ ඔය අවලං ජීවිතේට වඩා.. මට තමුසෙ ඕනත් නෑ.. තමුසෙගෙ කසාදෙ ඕනත් නෑ.. කොච්චර පාහර වැඩක්ද මං මගේ නංගිටයි, තාත්තටයි කළේ.. ඒත් ඒ මිනිස්සු බෝධිසත්වයෝ.. තමුසෙ ඕන කුදයක් ගහගන්නවා.. මම නංගි හදලා දෙන ගේ කෑල්ලට ගිහින් පදිංචි වෙනවා.. තමුසෙ පැත්ත පළාතෙ නාවත් මට කමක් නෑ.. තමුසෙයි තමුසෙගෙ අනිත් උනුයි

කොහොම එවුන් උනත් තමුසෙගෙ අම්මා පුදුම හොඳ අහිංසක ගෑනියෙක්.. අම්මව එවනවා මං ළඟට.. මට ඒ ඇති.."

තම බිරිඳගේ වාග් ප්‍රහාරයේ ප්‍රබල බව අදහාගත නොහැකිව, සජිත් ජීවිතයේ ප්‍රථම වතාවට පුදුමයෙන් කම්පනයට පත් වී සිටියේ ය.

"චේතනා.. චේතනා.. මං කියන දේ පොඩ්ඩක් අහන්ඩ.."

සජිත්ට ප්‍රඥාව පහළ වීගෙන ඒ දැයි නොදන්නවා වුවත්, ඔහු තුළ කුමක්දෝ සන්සුන්කමක් ලියලා වැඩෙන්නට විය. පෙදරේරුවකු වුවත්, තමාගේ ම නිවසක් යනු ඔහුට සදාකාලික සිහිනයක් වූයේ ඔහුගේ චර්යාවේ වරදිනි. දිනකට රුපියල් දෙදහසක පමණ ඉහළ දෛනික වැටුපකට හිමිකම් කියූව ද ඔහුගේ බේබදුකම විසින් ඔවුන්ගේ ආර්ථිකය ගිල දමා තිබිණි. ගිය නුවණ ඇතුන් ලවා වත් ඇද්දවිය නොහැකි බව දැන උන් චේතනා, තමා විසින් ම ඇද වැටුණු අඳුරින් මිදීමට, පුංචි හෝ මැටි පහනක් දල්වා ගැනීමට තමාගේ තනි සිතින් විඳවමින් වෙර දැරුවා විනා, සැමියා සමඟ ගෝරනාඩු කරන්නට ගියේ නැත. සජිත් වැනි අදූරදර්ශී සැමියෙකු ගෙන් හොඳින් හෝ නරකින් හෝ කිසිවක් දිනා ගත නොහැකි වග, කාලයාගේ ඇවෑමෙන් චේතනා වටහා ගනිමින් සිටියා ය.

"මට තවත් අහන්න දෙයක් ඉතිරි වෙලා නෑ සජිත්.. මට දැන් ජීවිතේ තිත්ත වෙලා තියෙන්නෙ.. ඒත්.. මේ නූපන් දරුවා මගේ තකතීරුකංවලට පලි නැති හින්දා.. මං මේ හැම දෙයක් ම ඉවසගෙන ඉන්නවා.. ඉන්නෑවගෙ ගෙට කබල්ලෑවා රිංගගෙන වගේ.. මං මගේ තාත්තයි, නංගියි ළඟට බලෙන් ආපහු ඇවිත් වැටිලා.. ඒ දෙන්න ගෙන් සැලකුම් අරගෙන මේ කරගන්නෙත් මහා පාප කර්මයක්.. මට මේ පව් කවදා හරි පටිසන් දෙයි.. ඒත්.. මං ගැන බලන් නැතුව.. මාව මෙහෙම අසරණ කරපු ඔයාට.. දවසක මටත් වඩා විඳවන්න වෙයි සජිත්.. මං ගෙවනවා වගේ දහ ගුණයක් පව් ඔයාට ගෙවන්න වෙයි.."





"චේතනා.. චේ.. තනා.. මං කොහොම හරි මේ සතියෙ එන්නම්.."

එහෙත්, සජිත්ගේ අවසන් වැකිය අසන්නට චේතනා දුරකථනයේ රැඳී සිටියේ නැත. ඈ හඬමින් ම දුරකථන ඇමතුම විසන්ධි කර දැමුවා ය.

ඈ, මිදුලේ කෙළවරක වූ හිඳ උන් කොස් කොටය මතින් නැගී සිටියා ය. සෙමින් ඇවිද ගගුල් අසලට ගිය චේතනා, දුරකථනය ඔහු වෙත දිගු කළා ය.

"තැන්ක් යූ මල්ලි.."

ගගුල්, චේතනා වෙත හෙළුවේ දුක්මුසු බැල්මකි.

"රණ්ඩු කරන්න එපා කිව්වට.. රණ්ඩු කරන්න ඇති නේද ඇති වෙන්න..??? අක්කා හොඳට ම අඬලා.. ගිහිල්ලා මූණ හෝදගන්න අක්කෙ.. නංගියි, තාත්තයි එන්න කලින් රිෆ්‍රෙෂ් වෙන්න.. යන්න.."

ගගුල් අවවාද කළේ වැඩිහිටියකු සේ ය.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

චේතනා මාසික මාතෘ සායනයට පිටත්ව ගොස් සිටි අතර, මානවීට ද එය රාජකාරී දිනයක් විය. වනිගසේකර මහතා හිතවතකුගේ අවමංගල්‍යයකට සහභාගී වීමට නිවසින් පිටත්ව ගොස් සිටියේ ය.

"අයියෙ.. දවල්ට ටිකිරි නැන්දා ඇවිල්ලා කෑම බෙදලා දෙයි.. මාටින් මාමා අද දවස ම ගෙදර ඉඳියි.. එක විතර වෙනකොට කොහොමත් අක්කිත් එනවා.. ටිකිරි නැන්දා ඇවිල්ලා තේත් හදලා දෙයි.. පළවෙනි වතාවට අයියට අද ගෙදර තනියම ඉන්න වෙනවා.. තරහා නෑ නේද..?"



Uploaded By Sanda

ගඟුල්ගේ මුහුණේ ඇඳුණේ, මීට පෙර කිසිදා ඈ නොදුටු තරමේ සොඳුරු හසරැල්ලකි.

"තරහා වෙන්නෙ මොකටද නංගි.. මේ ගෙදර දැන් මට මගේ ගෙදර වගේ.. ඊටත් වඩා.. ඔයා හරි තාත්තා හරි ගෙදර නැති වෙලාවට ගමේ කී දෙනෙක් ඇවිල්ලා මාව බලලා යනවද නංගි..? මේ ගම්වල මිනිස්සුන්ගෙ තියෙන්නෙ පුදුමාකාර ලස්සන මනුස්සකම්.. කවදා හරි දාලා යන වෙලාවක දාලා යන්න බෑ කියලා ලෝබ හිතෙන තරමට ඒ මනුස්සකම් හරි ලස්සනයි නංගි.."

මානවීගේ දෙතොලතර ඇඳුණු හසරැල්ල, ඈ මුවින් නොකියූ දහසක් පිළිතුරු ඔහු ඉදිරියේ තැබුවේ ය.

"අයියා එහෙනම් පරිස්සමට ඉන්න.. මාටින් මාමා ඕන දෙයක් තිබුණොත් කරලා දෙයි.."

"ක්ලච්ස්වලින් ඇවිදින හින්දා මට දැන් ලොකු අපහසුවක් නෑ නංගි.. මගේ පුංචි පුංචි දේවල් දැන් මට තනියම කරගන්න පුළුවන්.."

"ලොකු හාමුදුරුවන්ට නිවන් දකින්න පින් එක් රැස් වෙන්න ඕන අයියව ඒ විඳපු දුකෙන් මුදව ගන්නවට.. මං එහෙනම් ගිහින් එන්නද අයියෙ...?"

"ආ නංගි.. මට ඔයාගෙ අර මැප් එක අඳින මෙටීරියල්ස් ටික දීලා යන්නකො ඔයා ඩ්‍රාෆ්ට් කරපු පොඩි මැප් එකත් එක්ක.. මං ඇඳලා තියන්නම්.. අද දවසට මට වැඩකුත් එපායැ.."

මානවී, නොදැරියක සේ සතුටින් ඉපිලුණා ය.

"තැන්ක් යූ අයියෙ.. ලොකු ම ලොකු උදව්වක්.. වෙලාවක් නැතුව පස්සට ම ගිය වැඩක්.. මගෙ ඔෆිස් රූම් එකේ තිබුණ එක ම අඩුව.. ඔයාට පින් අයියෙ.."





මානවී, තුළ වන සතුටට නොදෙවෙනි සතුටකින්, ගඟුල් තමාගේ ළය පුරවා ගත්තේ ය.

'ඔයා මං වෙනුවෙන් කරන දේවල්වල හැටියට.. මේ වගේ පුංචි දෙයක් කළත් මට ලැබෙන සතුට මොන තරම් ද කියලා.. ඔයාට හිතා ගන්නවත් බෑ නංගි..'

ගඟුල්, සිතින් සිතුවා පමණි. තමාගේ දෙපා වැඳ, ස්කූටරයට නැගී, තමාට අත ද වනාගෙන පිටව යන යුවතිය දෙස ඔහු බලා සිටියේ, උල්පතකින් මෙන් සෙනෙහස ගලා එන හදවතිනි.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

තමාගේ ළඟ ම මිතුරකු ද වන නීතිඥ හසිත් වීරක්කොඩි අමතන ගඟුල්ගේ හඬ, බොහෝ කලකට පසුව කෝපයෙන් සේ ම ශෝකයෙන් ද වෙළී තිබිණි.

"වෙන මිනිහෙක් ළඟටත් ගිය ගෑනි දැන් කොහොමද මට කියන්නෙ ඩිවෝස් එක දෙන්න බෑ කියලා හසිත්..? ඒක මොන නීතියක්ද මචං..? මොන විහිළුවක්ද..?"

"මං පැහැදිලිව තාරිකාට කතා කළා මචං.. එයා කිසි ම දෙයක් පිළිගන්න ලෑස්ති නෑ.."

"එයා එච්චර නටන්නෙ මචං.. අපෙ අම්මා එයත් එක්ක හොඳින් ඉන්න හින්දා.. ඔය තාරිකාගෙ ඩබල් ගේම් ටික අපෙ අම්මගෙ අතට ම මාට්ටු කරලා දෙන්න විදියක් ඇත්තෙ නැද්ද බං..?"

ගඟුල් විමසුවේ බරපතල ස්වරයෙනි. හසිත් මදකට කල්පනා කළේ ය.

"මචං ආවා අයිඩියා එකක්.. අපේ බිනරයා ඔය සී.අයි.ඩී. වැඩේට මරු හාණ්ඩෙ.. උඹට පුළුවන්ද වාහනයක් දීලා ටිකක් අත



Uploaded By Sanda

පය දිගැරලා වියදම් කරන්න..? අපි බඩුත් එක්ක හොරු ආන්ටිගෙ අතට ම අල්ලලා දෙමු.."

"නියමං මචං.. කරන දෙයක් කරපං.. මං ඔෆිස් එකට ඉන්ෆෝම් කරන්නම්.. බීනරට කියපං කැමති වාහනයක් සිලෙක්ට් කරගෙන යන්න කියලා.. පුළුවන් දෙයක් කරලා මේ කරදරෙන් මාව ඉක්මනට නිදහස් කරපං මචං.."

ගඟුල්ගේ හදවත විසල් වේදනාවකින් ඇදුම් කන්නට විය. අහිමි වී ගිය ජීවිතය ගැන ඔහුට දැනෙන්නට ගෙන තිබුණේ ඉමහත් ලෝබකමකි.

"මොනවා හරි කරලා මේ කොඩිව්නේ ඉක්මනට ගොඩ දාලා.. මේ කුණු ගඳ ගහන බන්ධනය කපලා දාපං මචං.. මං ඊකිට දුන්නෙ දිව්‍ය ලෝක සැප.. මම හැම තැන ම ගියේ මල් වට්ටිය වගේ ඊකිව ඉස්සර කරගෙන.. මගේ තුවාල දැන් සනීප වේගෙන යනවා.. ඒත් ඒ ගාණට මගේ හදවතේ තුවාල පැරෙනවා මචං.. කුණු ගඳ ගැහුවෙ මගෙ තුවාලවලින් ගලපු සැරව නෙමෙයි.. උන්ගෙ මනුස්සකම.."

හසිත්ට ඒ මොහොතේ තම මිතුරා පිළිබඳව උපන්නේ සාතිශය අනුකම්පාවකි.

"බී රිලැක්ස් මචං.. අපි ඒ කතාව ඉක්මනට ඉවරයක් කර ගම්මු.."

"ඔව් මචං.. මට ඉක්මනට ඒ කරදරේ ඉවරයක් කරලා දීපං.. මට.. ඉක්මනට මගෙ අලුත් ජීවිතේ පටන් ගන්න ඕන.."

ගඟුල් කීවේ ස්ථිර සාර හඬිනි.

"තාරිකාට.. අවංකව ම ආදරේ කරපු වරදට.. මම මේ දවස්වල.. සෑහෙන්න මට ම දඬුවම් දීගන්නවා.. මාව ම රිද්දා ගත්තා දැන් ඇති හසිත්.. මට මේ සේරම ප්‍රශ්නවල කෙළවරක් දකින්න ඕන.."





හසිත්, තම මිතුරා අස්වසන්නට අසීරු උත්සාහයක නිරත වූයේ ය. ඔහු, නොසිතූ ම සැහැල්ලුවක් මවා ගන්නට වෙර දැරුවේ එබැවිනි.

"ගඟුල්.. ඒක නෙමෙයි මචං..???"

මිතුරාගේ ස්වරයෙහි වූ අමුත්ත, ගඟුල් මොහොතකින් වටහා ගත්තේ ය.

"එහෙනං මොකද මචං..?"

"කෙල්ල ලස්සනද..?"

"මොන..???"

"පල.. පල.. සුදු ලූණු පොඩි කරන්නැතුව...?"

ගඟුල්ගේ හදවත පාරාදීසයක පාවෙන්නට වූයේ ය.

"හිටපංකො මං උඹට ෆොටෝ එකක් එවන්න.."

"යකෝ.. ෆොටෝසුත් ගත්තද..? උඹ මාර පොරක්නෙ බං.."

"පිස්සුද බං.. එහෙන් මෙහෙන් දුවන ගමන් හොරෙන් ගත්ත ෆොටෝ කෑලි දෙක තුනක් තමයි තියෙන්නෙ.. නැත්තං කොහෙද.. මේ කසාදෙ කඩාගත්ත මිනිස්සු මල් වගේ කෙල්ලන්ගෙ ෆොටෝ ගන්න ගිහින් අහුවුණොත් ගෙවල්වලිනුත් එලවලා දායි බං බෙහෙත් කෙරිල්ල පැත්තක තියලා.. දුප්පත් උනත් මේ උඩරට පැත්තෙ ගම්වල මිනිස්සුන්ගෙ මොකක්දෝ අමුතු ආඩම්බරකමකුත් තියෙනවා මචං හොඳ වගේ ම.."

හසිත්, තම මිතුරා ප්‍රාර්ථනා කරන ලෝකය පිළිබඳ අංගු මාත්‍රික ඉඟියක් සොයා ගත්තේ ය. ඒ සොම්නසින් ඔහු හඬ නගා හිනැහුණේ ය.

"හිටපංකො.. හිටපංකො.. මං ඉක්මනට මේ බරබාගෙ ලිහලා



Uploaded By Sanda

උඹව නිදහස් කරලා දෙනකල්.. අද විතරක් නෙමෙයි අපිට හෙටත් තියෙනවා.. ඊට පස්සෙ බැරියැ උඹට ඔය කොටුවෙන් එළියට ඇවිත් නිදහසේ හිතන්න.. අපි හෙට ගැන පසුව හිතමු අද හිනැහී කතා කරමු..!!!"

හසිත් සිනාසෙමින් කීවේ, ගී පද කිහිපයක් ද පමණට මුසු කරමිනි.

"හරි.. හරි.. කයිය තියලා වැඩ පෙන්නපංකො.. ඊට පස්සෙ බැරියැ ඔය කියන හෙට ගැන හිතන්න.."

කොළඹ නිවසේ හා හුරුපුරුදු නාගරික පරිසරයේ සිටියාට වඩා බොහෝ සේ සොම්නසින්, සතුටින් සිටින තම මිතුරා කෙරෙහි හසිත්ගේ සිත තුළ පිළිසිඳී තිබුණේ අප්‍රමාණ වූ සතුටකි. හසිත්, ඇමතුමෙන් සමුගෙන ගියේ, ගඟුල්ගේ පියා සමඟ ඒ සතුට බෙදා ගැනීමේ අරමුණිනි.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

"ආරච්චි නෝනා..??? අපෙ ආරච්චි නෝනා..!!!"

කාගේදෝ ඇමතුම් හඬක් සවනට වැටෙද්දී, ගඟුල්ගේ මුව මත සිනාවක් විසිරුණේ ඉබේට ම ය.

"ආරච්චි නෝනා..!!!"

ගඟුල්, දෙතුන් වතාවක් තමාට ම මුමුණා ගත්තේ, දෙතොල් මත ඇඳුණු සිනා බොඳ නොවී තිබියදී ම ය. මානවීට යළිත් වතාවක් අමතන්නට මුව විවර කරන්නට සූදානම් වූ ගැමියා, ආලින්දය පසෙක හිඳ උන් තරුණයා දුටුවේ දෙවනුව ය.

බයාදු සිනාවක් මුවට නංවා ගත් ගැමියා වඩාත් බැගෑබරව ගඟුල් වෙත පියවර එසෙව්වේ ය. ගඟුල් ද ගැමියා වෙත හෘදයාංගම සිනාවක් තිළිණ කළේ ය. අව්‍යාජ ගැමියන් අතරේ ගෙවී ගිය නෙමසක කාලය තුළ, ගඟුල්ගේ සිතිවිලි සේ ම චර්යා ලෝකය ද





මහා පරිවර්තනයකට හසුවී තිබිණි. ඔහු බෙහෙවින් ආදරණීය, ළබැඳි හදවතක් ඇති තරුණයකු බවට පත් වී සිටියේ ය.

"මහත්තයා.. අපේ ආරච්චි නෝනා ගෙදර ඉන්නවද..?"

ගඟුල්ට, මානවීගේ මානව ගුණයන් සියල්ල එක පැහැර සිහියට නැගිණි. පුරුද්දට 'අන්කල්' යැයි කියවෙන්නට ගිය වචනය ඔහු සීරුවට ගිල ගත්තේ ය.

"නෝනා නම් ගෙදර නෑ මාමා.. ලෙඩෙක් බලලා එන්න කියලා මේ ළඟකට ගියා.."

"එහෙමද මහත්තයා.. අද ආරච්චි නෝනගෙ නිවාඩු දවස බව දැන දැන ම තමයි මං ආවෙත් මහත්තයා.. මේ අපේ පොඩි පුතාට.. ඉන්ටව් එහෙකට යන්ට චරිත සහතිකයක් ගන්ට උවමනා වෙලා නෝනගෙ වසමෙන් නෙවෙයි අපි අර උඩහ ගල්ලන්දෙ වැඩ බලන වසමෙ.. පොඩි පුතා හෙට උදේ ම ආපහු යන්ටත් ඕන කිව්වා.. ඊට ආවොත් ඒක ගන්ට පුළුවන්ද බලන්ටයි මං ආවෙ මහත්තයා.. පොඩි පුතා ගෙදර නෑ.. හදිස්සි වැඩකට නුවර ගිහින් එන්ට ගියා.. ඒකයි බලාගෙන යන්ට මං ආවෙ.."

ගැමියා පැවසුවේ ගඟුල් ඉදිරියේ තවත් දෙකට නැවෙමිනි. ගඟුල් මුව පුරා හිනැහුණේ ය.

"නෝනලාගෙ රස්සාව පැය විසි හතර ම වැඩ විදියටලුනෙ සලකන්නෙ මාමා.. නෝනා ඕන වෙලාවක වැඩට ලෑස්ති පිටනෙ ඉන්නෙ.. පෙරේදා එක්කෙනෙක් ආවා පදිංචි සහතිකයක් අරන් යන්න.. හරියට ම රෑ දොළහයි එනකොට.."

ගඟුල් කීවේ හිනැහෙමිනි.

"නෝනා පොත්පත් ටිකවත් ගෙනත් තියෙනවද දන්නෑ මහත්තයා.. අපි මේ අවේලාවෙ කරදර කරන්ට ආවට..."

"ආ.. ඒවා ගෙනත් ඇති.. නෝනා ඒවයෙ අඩුපාඩුවක් තියන්නෙ



Uploaded By Sanda

නෑ මාමා.. නෝනගෙ මොන වැඩෙත් එහෙම තමයි මාමා.. හරි ම පිළිවෙළයි.."

ගැමියා, බුලත් කහට බැඳි දසන් දක්වා හෘදයාංගම සිනාවක් පෑවේ ය.

"අනේ ඇත්තමයි මහත්තයා.. ආවයින් ආවෙ නෑ මේ අපේ ආරච්චි නෝනා වගේ ආරච්චි මහත්තයෙක් කවමදාකවත් අපේ ගම්මානෙට.. අපේ ග්‍රාම සංවර්ධන සංගමේ රැස් වෙච්ච වෙලාවෙත් ගමේ උදවිය සේරෝම කතා උනේ අපේ ආරච්චි නෝනට ඊළගට මාරුවීමක් එහෙම දෙනවා නං අපේ ගමට නෝනාව දෙන්ට කියලා දිසාපතිතුමාට ලියුමක් දීලා තියන්ට ඕනෑ කියලා.."

ගගුල්ගේ මුව මත සොඳුරු සිනාවක් සිතුවම් විය.

"නෝනාව ගමට එච්චර ම වටිනවද මාමා..?"

"ආයෙත් අහලා මහත්තයා.. ආවයින් ආවෙත් නෑ.. ආයෙමත් එන්නෙත් නෑ ඔහොම මිනිස්සුන්ට හිත ඇති ආරච්චි මහත්තුරු අපේ මහත්තයා.."

මිදුලේ වූ පිහිඹියා ගහ යට බංකුවෙන් හිඳ ගැනීමට සැරසෙන ගැමියා දුටු ගගුල්, යළිත් හඬ අවදි කළේ ය. මානවී කෙරෙහි සිත තුළ උපන් සියුම් ආඩම්බරය ද සිත තුළ රැවාගෙන, ගගුල් ගැමියාට ඇමතුවේ වඩාත් හෘදයාංගම ලෙසිනි.

"මාමා.. ඇවිල්ලා මෙහෙන් වාඩිවෙලා ඉන්නකෝ.. මානවී තව ටිකකින් එයි.."

"මම මෙහෙම ඉන්නම් මහත්තයා.."

"නෑ.. නෑ.. මෙහෙන් වාඩිවෙලා ඉන්න මාමා.. නෝනා දැන් එනවත් ඇති.."

ගගුල්, දෙතුන් වතාවක් පෙරැත්ත කළ පසු, ගැමියා ආලින්දයට ගොඩ වී ගගුල්ට මදක් දුරින් වූ පුටුවකින් හිඳ ගත්තේ ය.





සුදු පැහැති දූහුල් රෙදි කඩකින් වසා, ස්ටූලය මත තබාගෙන උන් ගගුල්ගේ වම් පාදය ගැමියා දුටුවේ ඒ මොහොතේ ය.

"මහත්තයා අපේ ලොකු හාමුදුරුවන්ගෙන් බෙහෙත් අහගන්ට ද ආවෙ..?"

සරණංකර හිමියන්ගේ කිත් යසස් හි දිග පළල දැන ගන්නට ගගුල්ට ගැමියාගේ ඒ වචන කිහිපය ද ප්‍රමාණවත් වූයේ ය.

"ඔව් මාමා.. පිටිපතුලෙ ලොකු තුවාලයක්.."

"දැන් ගුණයිද මහත්තයා..???"

"මම දැන් ඇවිත් මාස තුනයි මාමා.. එනකොට තිබුණට වැඩිය සෑහෙන ගුණයක් තියෙනවා මාමා.."

ගැමියාගේ මුහුණේ ඇඳී ගියේ සොම්නස් සහගත සිනාවකි.

"ඇස්වහක් කටවහක් නෑ මහත්තයා.. දෙයියන්ගෙ බුදුන්ගෙ පිහිටෙන් ඉක්මනට සනීප වෙයි.. ලොකු හාමුදුරුවො අත තිබ්බා නං ආයෙ දෙකට දෙවාරයක් නෑ ඕකෙ කෙළවරක් දකිනව ම තමයි මහත්තයා. හැබැයි.. උන්නාන්සෙ කියන විදියකට ම පිළිවෙත් ටික නං පුරන්ට වෙයි.. එහෙම කෙරුවොත් තමයි නියමාකාර ප්‍රතිකර්මෙ සිද්ධ වෙන්නෙ.."

ගගුල්, ගැමියාගේ වදන් පිළිත්තේ හිස් මුදුනිනි. නිර්ව්‍යාජ මිනිසුන්ගේ හෘදයාංගම වදන් හමුවේ, සිතක් නිවී සැනසී සුවපත් වන අපූරුව ඔහු අත් විඳිමින් සිටියේ ය.

"ඒවගෙ නම් අඩුවක් නෑ මාමා.. මානවියි, නාත්තයි දෙන්න ම හරි හරියට මහන්සි වෙනවා බෙහෙත් ටික කරන්න.. මාටින් කියලා මාමා කෙනෙක් ඉන්නවා බෙහෙත් හොයලා හදන වැඩේටම.. මට තේරෙන්නෑ මාමා.. ලොකු හාමුදුරුවො නම් සත පහක්වත් ගැන කතා කරනවටවත් කැමති නෑ.."

ගැමියා වහා කට ඉස්සර කළේ ය.



Uploaded By Sanda

"හා.. හා.. මහත්තයා.. උන්නාන්සෙ ඉර්සින්නාන්සෙ කෙනෙක්.. ඒ උත්තමයො මුදල් හදල් එක්ක ගනුදෙනුවක් නෑ නොවැ මහත්තයා.."

"වෙන්නත් ඇති මාමා.. ලොකු හාමුදුරුවො වගේ උතුම් විදියට ජීවත්වෙන ස්වාමීන් වහන්සේ නමක් මම මීට කලින් නම් කොහෙදිවත් දැකලා නෑ.."

"මේ කලියුග කාලෙ.. විපරීත දේසෙ.. ඒ වගේ උත්තමයො දැහට දකින්ටත් ලොකු කුසලයක් කරලා තියෙන්ට ඕන මහත්තයා..!"

ගැමියාගේ මුවින් ගිලිහුණු වදනක් ගානේ ම වූ ප්‍රශංසාවන්, ගඟුල්ගේ හදවත විසල් සැනසීමකින් පුරවා දමමින් සිටියේ ය.

ගැමි වැඩිහිටියාගේ මුව මත අමුතු ම තාලයේ සිනාවක් ඇඳී තිබෙනු දුටු ගඟුල්, ඔහු දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයෙනි.

"ඇයි මාමා..?"

"මට දෙයක් මතක් වෙලා හිනා ගියේ මහත්තයා.. අපේ ලොකු හාමුදුරුවො කරුණා නිධානයක් නං තමයි.. හැබැයි ප්‍රතිකාරයක් කරලා කමකට නැති උන්ට නං ප්‍රතිකාර කරන්නෙ නෑ.. ඔය දියවැඩියා තුවාල එහෙම කුණු කරගෙන උන්නාන්සෙ ළඟට යන ගමේ කසිප්පුකාරයො දිහා එහෙම නං උන්නාන්සෙ හැරිලවත් බලන්නෙ නෑ මහත්තයා.. කසිප්පු වඩියෙන් වඩියට තුවාලෙ කුණු කරගන්න උන්ට බෙහෙත් හේත් කරලා වැඩක් නෑ කියලා උන්නාන්සෙ දන්නවා.."

ගැමියා එය කියූ තාලයට උස් හඬින් සිනා නොවී හිඳින්නට ගඟුල්ට නොහැකි විය. සොඳුරු, කෙළිලොල් තරුණයා දෙස මඳ වේලාවක් ලෝභී දැසින් බලා උන් ගැමියා, එතෙක් වේලා තමාගේ සිත තුළ කැකෑරුණු පැනය ඉදිරිපත් කරන්නට, සුදුසු ම වේලාව එය වගට තීරණය කළේ ය.

"මහත්තයා.. මේ අපේ.. ආරච්චි නෝනා බඳින්ට ඉන්න..





මහත්තයා වත්ද..? මහත්තයා ඉන්න හැල්ලුව දැක්කම.. මට එහෙම හිතුණා මහත්තයා.. මං මේ නිකමටයි ඇහුවෙ.."

ආගන්තුක ගැමියා නොසිතූ මොහොතක විමසූ, නොසිතූ පැනයෙන්, ගඟුල්ගේ හදවත නොසිතූ පරිමාණයකින් තිගැස්සිණි. එහෙත්.. ඒ සමඟ ම.. ඔහුගේ හදවත වසා.. ඉතිරී.. පැතිරී.. යන්නට වූයේ ද නොසිතූ ම ඉමිහිර කි.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

සිරිනාථ ගමගේ යනු ප්‍රදේශයේ වෙසෙන ප්‍රසිද්ධ දැව ජාවාරම්කරුවෙකි. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක මායිමකට වෙන්නට සරුවට වැවී ඇති කොස් ගස් පහක් කපා ගැනීමට ඔහු උප්පරුවැට්ටි යොදමින්, දත කමින් හිඳින්නේ කලෙක පටන් ය. එම ඉඩම පිහිටියේ මානවී වැඩ බලන ග්‍රාම නිලධාරී වසමක් වන කැන්දයාය ගම්මානය මැදින් දිවෙන මාර්ගයට යාබදව ය.

"මොකද නෝනා ඔච්චර ගණන්.. මට මේ පෝමිට් එක අත්සන් කරලා දුන්නා නං.. ඉතුරු හරිය ලොක්කොත් එක්ක බලා ගන්න හැටි මං දන්නවා.. ග්‍රාම සේවක වෙච්ච නෝනට තියෙන්නෙ මොකෙකුටවත් නැති අමාරුවක්නෙ.. මේ රටේ තව ඔය ඕන තරම් හොරට ගස් කපන්නෙ.. මෙන්න මේක අත්සන් කරලා දෙන්ට නෝනා.. නෝනගෙ උෂ්ණෙ නිකං ග්‍රාම සේවකයෙක්ගෙ වගේ නෙමෙයි දිසාපතියෙක්ගෙ වගේනෙ.."

සිරිනාථගේ වදන්, යවුල් සේ, මානවීගේ සවන් තුළ පමණක් නොව හදවත තුළ ද ඇනී තිබිණි.

"මුදලාලි ඔහොම නෙමෙයි මට මොනවා කිව්වත් මට මේ බොරු පර්මිට් එකකට අත්සන් කරන්න බෑ.. මේක ආර්.ඩී.ඒ. එකේ ඉඩමක්.. දැන දැන ම හොරට පර්මිට් අත්සන් කරලා මගෙ හෘද සාක්ෂිය මරාගන්නත් මට බෑ.. හිරේ ලගින්නත් මට බෑ.. මුදලාලි



Uploaded By Sanda

මහත්තයා අර දන්නවා කිව්ව ශිල්ප ක්‍රම දාලා ලොකු ලොක්කො මාර්ගයෙන් ම පුළුවන් නම් ඔය වැඩේ කරගන්නකෝ.."

"ආ.. එහෙමද නෝනා..? එහෙනං ඒකත් බලාගමු.. වැඩිය ඉදිමෙන්ඩ එපා නෝනා.. කවුරු හරි උස්සලා ගෙම්බෙක් වගේ පොළොවෙ ගහනකල් නෝනා දන්නෙත් නැතිවෙයි.."

සිරිනාථගේ තර්ජනය මානවීට යළි යළිත් ඇසෙන්නාක් බඳු විය. දුෂ්ට ජවාරම්කරුවාගේ වදන්වලින් ඈ වියරු වැටුණා ය.

'නෝනාගෙ උෂ්ණෙ නිකං ග්‍රාම සේවකයෙක්ගෙ වගේ නෙමෙයි.. දිසාපතියෙක්ගෙ වගේනෙ..!!!'

අපහාසය විසින් ලද වියරුව, ඈ ජයග්‍රහණයේ මාවතකට පෙරළා ගන්නට අදිටන් කර ගත්තා ය.

'මට ඕන නං දිසාපති කෙනෙක් වෙන්නත් පුළුවන් මිනිහෝ.. මට නේද චැලෙන්ජ් කළේ.. දැන් බලාගෙන හිටපන් මානවී මානවීට කරන්න හදන දේ..!!!'

දැඩිව සිතින් සිතා ගත් ඈ, ඒ සුබ බ්‍රහස්පතින්දාවේ , තමාගේ පොත් අල්මාරිය ම බිමට හලා ගත්තා ය. ඇගේ සිත තුළ වූයේ පුදුමාකාර උද්වේගයකි. උද්යෝගයකි. ඒ උද්දාමය ඇගේ සියලඟින් දිස් විය.

"නංගි.. මොකද මේ හදිස්සියෙ පොත් අල්මාරියක් පෙරළගෙන දගලන්නෙ..?"

ගඟුල් විමසුවේ බලා හිඳ බැරි ම තැන ය. කිහිලිකරු ආධාරයෙන් තමා සමීපයේ සිටගෙන සිටින තරුණියාගේ ප්‍රශ්නකාරී දෑස දෙස, මානවී බැලුවේ අධිෂ්ඨානය සපිරුණු සිනාවක් ඇඳගෙන ය.

"මං.. සී එස් ලියන්න හිතුවා අයියෙ..!!!"

මොහොතකින්.. දෙකකින්.. තුනකින්.. ගඟුල්ගේ දෑසේ ඇඳුණේ තරු බබළන දීප්තියකි.





"නංගි.. ඇත්තම ද ඔය..? ඇත්තද කියන්නෙ..?"

ගඟුල්ගේ වචන තුළ පුදුමයට යටින් වන සොම්නස හැඳින ගත් මොහොතේ, මානවී දෑස ඔසවා ගඟුල් දෙස බැලුවේ පුදුමයෙනි.

"ඇයි අයියෙ..? මම ඒක කිව්වම අයියගෙ මූණෙ සතුට පෙනෙන්නෙ නිකම්.. අයියා එග්සෑම් එක ලියලා පාස් වෙලත් ඉවරයි වගේනෙ අයියෙ..!"

ගඟුල්, මොහොතක් යුවතිය දෙස ම බලා සිටියේ ය. ඔහුගේ ළය මත දහසක් පැතුම් පිදී එමින් තිබිණි.

"ඔයා මොකක් හරි දිනනවා කියන්නෙ.. මං දිනුවා වගේ සතුටුයි තමයි නංගි.. ඔයාලා මාව ඔයාලගෙ කරගෙන සලකන කොට.. මටත් ඔයාලව නිකම්ම මගේ වෙනවනෙ නංගි.."

මොහොතක් ගඟුල් දෙස බලා උන් මානවී, හිස සලා හිනැහුණා ය.

"ඇත්ත තේන්නම්.. ඒක එහෙම වෙන්න ම එපායැ.."

කෙළිලොල් හඬින් පැවසූ මානවී, යළිත් තමාගේ කාර්යයෙහි යුහුසුලුව දෑතත්, දෑසත් රැඳෙව්වා ය.

'සහකාර ප්‍රාදේශීය ලේකම්.. ප්‍රාදේශීය ලේකම්..' ආදී නාම පුවරුත් කිහිපයක් ඇගේ දෑස් ඉදිරිපිට මැවී පෙනෙන්නට වූයේ ය. නැවුම් අපේක්ෂාවේ සන්තුෂ්ටිය විසින්.. ඇගේ මුව මත මල් මදහසක් සිතුවම් කොට තිබිණි.

"කොච්චර හොඳද නංගි සී එස් ලියන්න හිතුව එක.. පාස් උනා ම මොන තරම් හොඳ රෙකග්නිෂන් එකක් තියෙන ගවර්න්මන්ට් ජොබ්ස් තියෙනවද..? මං අහලා තියෙනවා.. සී එස් එග්සෑම්ස් පාස් වෙන්න නම් හරි අමාරුයිලු නේද නංගි..?"

ගඟුල් විමසුවේ මානවී අසලින්ම ම වූ අසුනකට බර දෙමිනි.



Uploaded By Sanda

"එග්සෑම් පාස් වෙන එක නෙමෙයි අමාරු වැඩේ අයියෙ.. මේ කසිකබල් දේශපාලඥයො ඇඟිලි ගහන්නෙ නැති කෙහෙම්මලක් නෑනෙ.. උන්ගෙ කතුරුවලට අහු නොවී අපේ තැන බේරගන්න එක තමයි මේ රටේ දැන් ලොකුම අමාරු දේ.."

"ඒක නම් ඇත්ත.. නංගි හොඳට එග්සෑම් පාස් වෙන්න මහන්සි වෙන්නකො.. අපි එතකොට බලමුකො.. මේ රටේ අපිටත් කරන්න පුළුවන් දේවල් ඇතිනෙ.."

ගගුල්, ව්‍යංගයෙන් කියූ දෑ, මානවීගේ හදවත තුළ වූ දිරි දහස් ගණනින් වැඩුවේ ය.

"ග්‍රාම නිලධාරී එග්සෑම් එකේ මගේ රැන්ක් එක 3 අයියෙ.. ඉතින් මං හිතනවා.. මට සීඑස් පාස් වෙන එක අමාරු දෙයක් නෙමෙයි කියලා.. අනික.. එග්සෑම් ලියන්න චාන්සස් හතරක් හම්බ වෙනවා.. ඕපන් එග්සෑම් එක දෙපාරක් ලිව්ව හැකි.. ලිමිටඩ් එග්සෑම් එක දෙපාරක් ලිව්ව හැකි.. දැන් ඒජ් ලිමිට් එකත් 31.. ඒ හින්දා ගොඩ දාගන්න පුළුවන් අයියෙ.."

"විල් පවර් එක සේරට ම වඩා වටිනවා නංගි.. ඔයා පාඩම් කරන්නකො.. මමත් පුළුවන් උදව්වක් කරන්නම්.."

ඈ, තම හිතෛෂීවන්තයා වෙත පැහැසැර හසරැල්ලක් පෑවා ය.

"තැන්ක්ස් අයියෙ.."

"මොනවද ඔය හොයන්නෙ ඉතින්..?"

"ජෙනරල් නොලේජ්, අයිකිවු, බුක්ස් වගයක් තිබුණා.. ඒ ටික හෙව්වෙ අයියෙ.."

මානවීගේ සේ ම ගගුල්ගේ ද දවස සතුටින් පිරී තිබිණි.

'මං සීඑස් ලියන්න හිතුවා අයියෙ..!!!'





දවස මුළුල්ලේ ම ගගුල්ගේ හදවත තුළ මානවීගේ වදන් යළි යළිත් ප්‍රතිරාවනය වන්නට විය. ඒ ඒ මොහොතක් මොහොතක් පාසා ම, ඔහුගේ හදවත මහා සොම්නසකින් ඉපිළෙන්නට විය. ඔහු, යහනට වැටී දෑස පියා ගත්තේ, ඒ සොම්නස රිසි සේ සිත පුරා විඳ ගන්නට ය.

ආලින්දයේ හිඳ පොත් පත් තෝරන මානවීගේ මුවින් නිරායාසයෙන් ගිලිහෙන ගී හඬ ඔස්සේ, ඔහු සුරංගනා සිහිනයක පාවෙන්නට වූයේ ය.

- නෙලාගන්න බෑ
මගේ අත දිග නෑ
අනේ ඒත් නව මල් පිපියන්
කෝටි ගණන් නව මල් පිපියන්...

මට විතරද මල් පිපෙන්නෙ
මං විතරද මල් කඩන්නෙ
අනුන් ඇවිත් මල් නෙළුවාවේ
මලේ සුවඳ මට දැනුණාවේ..

අතින් නෙළන මල් පිපෙන්නෙ
පෙර පිනටයි මට හිතෙන්නෙ
මුළු ලොවට ම මල් පිපුණාවේ
එමල් දකින ඇස් ලැබුණාවේ...-

ගන අන්ධකාරයක ගිලී උන් තමාගේ ජීවිතයට හිරු දහසක ආලෝකය රැගෙන ආ සරණංකර හිමියන්, මානවී හා ඇගේ පියා කෙරෙහි ගගුල්ගේ ළයෙහි ඉපදී තිබුණේ සදාහරිත සෙනෙහසකි.

'මානවී.. ඔයා රැජිනක් නංගි.. රැජිනක් වෙන්න හැම සුදුසුකමක් ම තියෙන ඔයාට.. අඩුවකට තිබුණෙ රත්තරන් ඔටුන්නක් විතරයි..



Uploaded By Sanda

ඔයා සීඑස් පාස් වෙනවා කියන්නෙ.. ඔයාගෙ ගෝල්ඩ් කුවුන් එකත් හරි නංගි.. යෙස් මානවී.. යූ කැන් වින්..! යූ මස්ට් වින්..!! යූ ඩූ වින්...!!!'

ඔහුගේ හදවතෙහි වූයේ, මානවී කෙරෙහි ජනිත වන අතොරක් නොවන සුභාශිංසනයකි.

ඔහු හදවතෙහි වන ප්‍රමෝදය කෙතරම් ද යත්.. ඒ රාත්‍රියේ තම පියාට ඇමතූ මොහොතේ, ඈ වෙනුවෙන් පියාගෙන් ඉල්ලීමක් ද කළේ ය.

"තාත්තෙ.. මානවී සීඑස් ලියන්න හදන්නෙ.. ලබන සතියෙ එනකොට.. ගුණසේන එකට ගිහිල්ලා එයාගෙ එග්සෑම් එකට පාඩම් කරන්න සූට් වෙන පොත් ටිකක් අරන් එන්න.. අර මගෙ ඔෆිස් රූම් එකේ ග්‍රේ කලර් කබඩ් එක උඩ තියෙන ලැප්ටොප් එකත් අරන් එන්න.. එනකොට මටත් පුළුවන් එයාට ඕන කරන ඒවා හොයලා ඩවුන්ලෝඩ් කරලා දෙන්න.."

තම පුතුගේ වදන් හමුවේ, සමරසිංහ මහතාගේ හදවතට පවා දැනුණේ අපූර්ව සුවයකි.

'මේ දරුවන්ව එක ම උසකින් උස්සලා තියන්න.. දෛවය.. අපූරු සැලසුමක් අඳිනවා වගේ මට පේන්නෙ.. ඒ දරුවා.. දක්ෂයි.. ඩිග්‍රි එකකුත් තියෙන එකේ.. ඒ දරුවා තව දුර ගමනක් යයි ඔය පාරෙ..'

සමරසිංහ මහතා පවා ඒ මොහොතේ අත් විඳින්නට වූයේ, පෙර කිසිදා නොවිඳි සැනසීමකි. නැවුම් හෙටක අරුණලු ඔහු ද නොදැනීම ඔහුගේ ඇතුළු හද මත එතෙමින් තිබිණි.





ඒ... ගෙවී යමින් තිබුණේ ගගුල් සමරසිංහ.. සරණංකර හිමියන්ගෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණ ගෙවී යන සයවන මාසයයි. එතෙක් නිසංසලේ ගලා ගෙන ගිය ගගුල්ගේ ජීවිතය නමැති සුනිල දිය දහරට, බොර දිය එක් වන්නට ගෙන තිබුණේ නොසිතූ ම ඉසව්වකිනි.

'මං ආයෙත්.. නිදහසේ ඉගිළෙන කුරුල්ලෙක්.. මට දැන්.. අලුත් අත්තටු ලැබිලා.. මට දැන් පුළුවන් මං ආස කරන ඕනම තැනකට ඉගිල්ලෙන්න..'

සැබැවින් ම ගගුල් ජීවත් වූයේ විහඟකු සේ සොම්නසිනි. තාරිකාගෙන් දික්කසාදය හිමිවූ බව දන්වා මිතුරු හසිත් වීරක්කොඩි ගෙන් ඇමතුම ලත් මොහොතේ, ගගුල් එලෙස උදාන ගී ගායනා කළේ ය. එහෙත්, මහා කුණාටුවක් තමා පසුපස යළි හඹා ඒ යැයි ගගුල් මොහොතකට හෝ සිතුවේ නැත.

ගගුල් සමරසිංහගෙන් දික්කසාදය හිමි වී, තවත් තෙමසක කාලයකට පසුව, තාරිකා හඬාගෙන පැමිණ ගගුල්ගේ මව වන තමාරා සමරසිංහ හමු වූවා ය.

"අනේ ආන්ටි.. මට ගගුල්ගෙන් සමාව ගන්න ඕන.. එයාට දැන් සනීපයි.. මං කරපු වැරදි මට දැනුයි තේරෙන්නෙ.. ගගුල් කැමති නම්.. මං ආපහු ගෙදර එන්නද ආන්ටි..?"

ආත්මාර්ථකාමී, පව්ටු, දුර්ජන ගැහැනියකගේ, කෲර නින්දිත ආත්මීය කතාව නොදැන උන් ගගුල්ගේ අදූරදර්ශී මව, ඒ



Uploaded By Sanda

මොහොතේ ගත්තේ තම පුතණුවන් හැර දමා ගිය ගැහැනියගේ පාර්ශවයයි.

"කතා කරලා බලමුකො දුව.. අපේ ලොකු පුතා ඔයාට හරි ආදරෙන් හිටියෙ.. එයා ඔයාට එක්ස්කියුස් කරයි.."

තමාරාගේ පිළිතුරට තාරිකා නම් වූ යසඹ ගැහැනිය සිත යටින් සිනාසුණේ උමතුවෙන් මෙනි. තමා, තමාගේ අනියම් සැමියා ගෙන් නින්දිත ම අයුරින් ප්‍රතික්ෂේප වූ බව, අධම ගැහැනිය තම නැන්දම්මා හමුවේ හෙළි කළේ නැත.

"කේශව.. මම ගගුල්ගෙන් ඩිවෝස් වෙලා මාස තුනකුත් ඉවරයි.. ඇයි අපි මැරි කරන්නෙ නැත්තෙ තාම..?"

කේශව පතිරත්න සරදමට හිනැහුණේ සාහසික ලෙසිනි.

"තාරිකා තමුසෙට පිස්සුද..? තමුසෙට අමතක උනාද මං මැරි කරලා ළමයි දෙන්නෙක් ඉන්න තාත්තා කෙනෙක් කියලා.. මං තමුසෙට කවදාවත් කියලා නෑ මං තමුසෙව කසාද බඳිනවා කියලා..?"

තාරිකා, තම අනියම් සැමියා දෙස බැලුවේ වියරුවෙනි. එහෙත්, ඒ වියරුව ඉදිරියේ නොසැලී හිඳින්නට උවමනා තරම් තුරුම්පු කේශව ළඟ තිබිණි.

"තමුසෙ හිතුවද මං කේප්ප වස්සෙක් කියලා.. අසනීපයක් උනාම තමන්ගෙ මිනිහව දාලා නව මිනිහෙක් ළඟට ගිය තමුසෙ වගේ පහත් ගෑනියක්ව මං කසාද බැඳගන්න..??? අර අච්චර හොඳ ගෑනියෙක්ව ලිහලා දාලා මගෙ කෙල්ලො දෙන්නට තාත්තෙක් නැති කරලා.. තමුසෙ වගේ පිස්සු බැල්ලියෙක්ව බැඳගන්න මට පිස්සු නෑ ගෑනියේ.."

මාස ගණනාවක් නොව, දෙවසරකට ආසන්න කාලයක් තමා සමඟ එකට ජීවත් වූ මුග්ධ පිරිමියා ඉදිරියේ තාරිකා කෝපයෙන් ආවේශ වී වෙව්ලමින් සිටියා ය.



SL UNLIMITED
The spirit of Sri Lankan community



"මොකක්ද මිනිහො කිව්වෙ..? එතකොට තමුසෙ මං එක්ක මෙච්චර කාලයක් ජීවත් උනේ..??? තමුසෙ මහ බල්ලෙක් ඕයි.. තමුසෙ මාව රැවැට්ටුවා.. තමුසෙ මාව අතරමං කෙරුවා.."

කේශවගේ කුරිරු උස් සිනා හඬ, තාරිකාගේ කුලී මාළිගයේ බිත්ති මත රැඳී දෝංකාර දෙන්නට විය.

"මං පිරිමියෙක් ගෑනියේ.. තමුසෙ මගේ ඇඟටම එනකොට, මං මොකටද තමුසෙගෙන් ඈතට යන්නෙ.. පූරුවෙ කරුමෙකට කකුලෙ තුවාලයක් ආවට.. ගගුල් කියන්නෙ මොන තරම් හොඳ මිනිහෙක්ද..? ඒ මනුස්සයගෙ ම සල්ලිවලින් තමුසෙ මේ ගෙවල් අරගෙන.. මිනිස්සුත් හොයාගෙන.. සැප හෙව්වනේ..??? අච්චර හොඳ මනුස්සයව දාලා ආව විදියටත් වඩා නරක විදියට තමයි, ඒ තරම් හොඳ නැති මිනිහෙක් උන මට ඔය වගේ දෙයක් උනොත් තමුසෙ මාව දාලා යන්නෙත්.. එකට ජීවත් උන එකෙන් තමයි මං දැනගත්තෙ තමුසෙගෙ දළවල කොච්චර විස පිරිලා තියෙනවද කියලා.. තමුසෙ වගේ විසකුරු හැපින්නක් බෙල්ලෙ එල්ලා ගන්න මට පිස්සු නෑ ගෑනියේ.."

වසර දෙකක අනියම් ප්‍රේමයක සුව බිඳුණේ එලෙසිනි. එහෙත්, ඒ නීච කුලංගනාව පරාජය බාර ගෙන නිහඬ වන්නට සිතුවේ නැත. ගගුල් සමරසිංහගේ අතීත සෙනෙහස දඩමීමා කරගන්නට ඇ නව සැලසුම් සකස් කළේ එබැවිනි. සමරසිංහ මහතා තම ලේලියගේ සියලු නිහීන හැසිරීම් පිළිබඳව මනා අවබෝධයකින් පසු වූවත්, තමාරා සමරසිංහ නම් තාරිකාගේ ඒ උගුලේ හසු වූවා ය.

ඇ, තම සැමියා ඉදිරියේ තාරිකා වෙනුවෙන් කරුණු දක්වන්නට වූයේ එබැවිනි.

"තමාරා.. මොනවද ඔයා ඔය කියන පිස්සු කතා..? ඔයාටත් අරකිට වගේ පිස්සු හැදීගෙන එනවා නම්.. ගිහින් බෙහෙත් ටිකක් ගන්න.. මෙතන මගෙ යකා අවුස්සන්නෙ නැතුව.."



Uploaded By Sanda

සමරසිංහ මහතා කිසිදා නොවූ විරූ සේ කෝපයට පත්ව සිටියේ ය.

"මිනිස්සු අතින් වැරදි වෙනවා.. මිනිස්සු ඒවට සමාව දෙනවා.."

"මගෙ පුතා වැරදි කළෙත් නෑ.. වැරදි කරපු උන්ට මගෙ පුතාගෙන් සමාවකුත් නෑ.."

"තාරිකා කියන්නෙ එයාගෙ වයිෆ්.."

"ඒ ඉස්සර.. දැන් එයා මගෙ පුතාගෙ දික්කසාද ගෑනි.. තමන්ගෙ සැමියාගෙ අසනීපයක් ඉවසගෙන ඉන්න බැරුව තවත් මිනිහෙක් එක්ක ගිහින් බුදියගත්තු වල් වනචර අම්මණ්ඩියෙක් වෙනුවෙන් වචන නාස්ති කරන්න ඔයාට විලි ලැජ්ජාවක් කියලා එකක් නැද්ද තමාරා..?"

සමරසිංහ මහතාගේ කෑගැසිල්ලේ තරමට මුළුනැන්ගෙය දෙස උන් මාලනී පමණක් නොව රත්නජීව පවා තිගැස්සිණි.

"පොඩි සර්ව බලන්න බෑ කියලා පැත්තට දාපු අම්මා මහ ලොකුවට එනවා මෙතන වල් ගෑනියෙක් ආයෙමත් මේ ගේ අස්සට දාගන්න කතා කරන්න.."

මාලනී, රත්නජීවට ඇසෙන සේ දත්මිටි කමින් කියවන්නට වූවා ය. රත්නජීව ද පසු වූයේ ඇයට නොදෙවෙනි කෝපයකිනි.

"මේ නාකි වෙන්න ඉන්න අම්මණ්ඩි.. අර ලෙස්ලි කියන පොලිතින් කාරයත් එක්ක නටන නාඩගම් අපි දන්නෑ කියලා වෙන්න ඇති හිතේ.. මට යකා නැග්ගොත් මම මැද්දට පැනලා ලොකු සර්ට මේ සේරම කියනවා.. මරු නැන්දම්මයි, ලේලියි.. වල් ගෑනු එනවා අහිංසකයන්ව ආන්ඩු මාට්ටු කරන්න.. හිතෙන හිතෙන වෙලාවට පිටින් කන්න ගිහින් වැඩ වැරදුණාම ගෙට රිංගන්න හදන්නෙ අපේ ලොකු සර්රුයි, පොඩි සර්රුයි පිංපියො කියලද දන්නෑ මේ වල් ගෑනු හිතාගෙන ඉන්නෙ.. අරකි හිතන් ඇති අපි





මේ මොකවත් දන්නෑ කියලා.. හොර මිනිහා අරකිව අතෑරලා.. දැන් පොඩි සර්ට සනීප වෙන හින්දා ඒකි හදන්නෙ.. ආයෙමත් මේ ගෙට රිංගන්න වෙන්න ඇති.. තවත් නම් මං මේවා ඉවසන් නෑ.. මේ සතියෙ යන ගමන් සේරම විස්තර ටික ලොකු සර්ට කියනවා.. ගිය ගමන් පොඩි සර්ට කියනවා.."

රත්නරජීව, ආලින්දය දෙසට කෝපයෙන් ඇවිද ගියේ මෝටර් රථයේ යතුර ද වේගයෙන් සුරතට ගුලි කර ගනිමිනි.

නිවස වටින් විත්, ඉදිරිපසට පැමිණෙන ඔහුට ඇසුණේ, සමරසිංහ දෙමහල්ලන්ගේ ගෝරනාඩුව එතෙක් ද අවසන් වී නොමැති බවයි.

"කොහොම උනත්.. මං පුතාව බලන්න යන්න මේ සතියෙ එනවා.."

"සනීප උනාම පුතා ගෙදර එනවා.. ලොකු හාමුදුරුවො කැමති නෑ පමණට වඩා අමුත්තො එහෙ යනවට.."

"ඒක හරි කතාවක්නෙ.. මං එයාගෙ අම්මා.. අම්මට තමුන්ගෙ දරුවව බලන්න බැරිද..? මම අමුත්තෙක්ද..?"

"පුතාට අමාරු ම වෙලාවෙ පැත්තකට දාලා අත පිහදා ගත්තෙ.. අම්මගෙ දරු කැක්කුම හින්දා වෙන්න ඇති..??? දැන් නිකම් විහිළු කතා කියන්නෙපා තමාරා.."

සමරසිංහ මහතාගේ සිත තුළ, තම අකීකරු බිරිඳ කෙරෙහි උපන්නේ අසීමිත කෝපයකි.

"කොහොම හරි මට මගෙ ළමයව බලන්න යන්න ඕන.. මේ ඉරිදට යන්න ඕන.. මට වෙන නිවාඩු නෑ.. මේ ඉරිදා පුතාව බලන්න මම එනවාමයි.."

සමරසිංහ මහතා, නිම් හිම් නොවන කෝපය සඟවා ගත්තේ අසීරුවෙනි.



Uploaded By Sanda

"ඉරිදට එහෙ යන්න බෑ.. අපි ගියත් යන්නෙ සතියෙ දවසක.. ඉරිදට අර දරුවට ක්ලාස්.."

තමාරාගේ මුව කොන නැගුණු සමච්චල් සහගත සිනාවට, සමරසිංහ මහතාගේ සිතට නැගුණු අසීමිත කෝපය ඔහු පාලනය කර ගත්තේ අසීරුවෙනි.

"ඔය ගොඩේ ගෑනු තව මොනවා ඉගෙන ගන්නද රොහාන්..? මොන නාඩගමක්ද ඒ..? ගෙදර වැඩත් කරනවා නම්.. රස්සාවටත් යනවා නම්.. තව ඉගෙනත් ගන්නවා නම් මට හිතාගන්න හැකි අපේ ළමයට සලකන විදිය.. මේ ගෙදර රජ සැපට හිටිය ළමයව අර කොහේදෝ කැලේක ගිහිං අතරමං කරලා ඇවිල්ලා ඔයත් සන්තෝසෙන් ඉන්නවනෙ..? පුදුම තාත්තෙක් තමයි..!"

සමරසිංහ මහතාට එවර නම් තම සිතට නැගි කෝපය පාලනය කර ගැනීම පහසු වූයේ නැත. ඔහු බිරිඳට කෑගැහුවේ දබරැඟිල්ල ද උලුක් කරමිනි.

"මේ තමාරා.. නොදන්න දේවල් ගැන කියවන්නෙ නැතුව ඉන්නවා.. ඒ මිනිස්සු දෙවියන්ට වගේ ළමයට සලකන විදිය ගිහිල්ල ම බලා ගන්නවා ඇස් දෙකෙන් ම.. අම්මා කෙනෙක් විදියට තමුන් සතුටු වෙන්නෙ මොන විදියටද..? සිංගප්පූරු ගිහින් කකුල කපාගෙන ඇවිත් ජීවිත කාලෙට ම අබ්බගාතයෙක් විදියට ජීවත් වෙනවා දකින්න උනා නම් අම්මා විදියට සන්තෝස වෙන්න ඔයාට පුළුවන්ද..? මොන විකාරයක්ද මේ..? මොන හෙණයක්ද මේ..?"

සමරසිංහ මහතා, දෑතින් ම හිස බදා ගත්තේ ය. ඉදිරි ආලින්දයේ කොණකට වී, එතෙක් වේලා නොපෙනී උන් රත්නජීව අනවසරයෙන් ම දෙමහල්ලන් ඉදිරියේ පෙනී සිටියේ ය.

"සර්.. අපි යමු.. දහයට බෝඩ් මීටින්.. අපි ඉක්මනට යමු.. හොඳට ම පරක්කුයි.."





තම ස්වාමි දියණිය කෙරේ ඒ මොහොතේ බිඳක් හෝ හැකීමක් නොකළ රත්නජීව කීවේ, තමාරා සමරසිංහ දෙස වැරදී හෝ නොබලමිනි.

ඉදිරිය බලාගෙන රිය පදවන රත්නජීවගේ මුහුණ බැලූ සමරසිංහ මහතා, අසීරුවෙන් හඬ අවදි කර ගත්තේ ය.

"බලන්න රත්නෙ.. මොනවද මේ වෙන්න යන්නෙ..? මේ ලොකු මැඩම්ටත් පිස්සු හැදීගෙන එනවද මං දන්නෑ රත්නෙ.."

සිතට දැනෙමින් තිබුණු කෝපයට, රත්නජීවගේ වැඩිහිටි මුහුණේ හකු පාඩා නළියමින් තිබිණි.

"ලොකු මැඩම් තාමත් තාරිකා නෝනගෙ ලණු කනවා සර්.. ඒවට ඉඩ දීලා බෑ.. ලෝකෙ තියෙන සේරම වල් වැඩ කරපු ගෑනියෙකුට ආපහු මේ පවුලට ගිනි තියන්න දීලා බෑ.. පෙර කුසලයකට අර අපුරුවට සුවපත් වෙන පොඩි සර්ගෙ ජීවිතේ ආයෙත් නම් කිසිම විදියකට අවුල් වෙන්න දීලා බෑ සර්.."

සමරසිංහ මහතාගේ සිත පෙර කිසිදා නොවූ විරූ අන්දමින් කලබල වී, කරදරයට පත්වී, දැඩි වී තිබිණි. ඔහු වෙනදා මෙන් නොව ගඟුල්ගේ ව්‍යාපාරික පරිශ්‍රයේ කාර්යාල කාමරය දෙසට ඇවිද ගියේ නවා ගත් හිසිනි. සමරසිංහ මහතාගේ ස්වරූපය දුටු ගඟුල්ගේ පෞද්ගලික ලේකම්වරිය පවා බිය ගත්තාය. ප්‍රධානියාට සුබ උදෑසනක් පතන්නට නැගී සිටි ඇයට යළි අසුනෙහි අසුන් ගන්නට පවා අමතක විය.

"ගුඩ් මෝනින් සර්.."

"ගුඩ් මෝනින් දරුවො.. වාඩිවෙන්න.. මොකද මේ බය වෙලා..? බෝඩ් මීටින් එක කෝල් කරන්න දහය හමාරට.."

පෞද්ගලික ලේකම්වරියගේ නිල කාමරය පිහිටා තිබුණේ ගඟුල්ගේ කාමරයට යාබදව ය. අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා,



Uploaded By Sanda

දිනාරා, මානව සම්පත් අංශයට යැවූ සමරසිංහ මහතා, තම පුතුගේ දුරකථන අංකය අංකනය කළේය.

තාරිකා පිළිබඳව තමා දැනගත් සියලු තොරතුරු සමරසිංහ මහතා තම පුතු හමුවේ තැබුවේ ය.

"අම්මටත් පිස්සු හැදීගෙන එනවද තාත්තෙ..? ගිය ගෑනි ගියා.. ආයෙ මොකටද එයා ගැන වද වෙන්නෙ..? අම්මට එයාගෙ පුතාටත් වඩා දාලා ගිය ගෑනිව ලොකු වෙලා ද..?"

"පුතා.. තාරිකාට හරි ආදරෙන්ලු හිටියෙ.."

"ඒක ඉතින් කවුරුත් දන්න කතාවනෙ තාත්තෙ.. ඔව්.. මං ආදරේ කළා තමයි.. මං යාළුවෙලා ඉඳලා, මං කසාද බැඳපු මගේ ගෑනිට.. ඒත්.. මං අසරණ උන වෙලාවෙ මාව දාලා අවලමේ ගිය වල් ගෑනියෙකුට ආදරේ කරන්න මට නාම පිස්සු හැදිලා නෑනෙ තාත්තෙ.. තාරිකා දැක්කෙ ගගුල් ළඟ ඉන්න හොඳ පිරිමියා විතරයි.. මගේ ළඟ හැංගිලා ඉන්න යක්ෂයා ඇවිස්සුණොත් එයාට දුවන්න පාරක් නැතිවෙනවා තාත්තෙ.. එයා හිතාගෙන හිටියද දන්නෙ නෑ වට ම ගිහින් ගෙට ම එන්න.. මං ඒ තරම් මී හරකෙක් නෙමෙයි කියලා අම්මට කියන්න තාත්තේ, තාරිකාට කියන්න කියලා.."

"අම්මා මේ නටන්න තියාගත්ත නාඩගම මොකක්ද කියලයි මට තේරෙන්නෙ නැත්තෙ පුතේ.."

"අම්මගෙ යාළුවගෙ දුවනෙ.. හෝදලා ගෙට ගන්න කියලා වෙන්න ඇති කියන්න හදන්නෙ.. මේ ලොකු පුතාගෙ හැටි තාත්තා ඇර අම්මවත් දන්නෙ නෑ තාත්තෙ.. මං තාරිකාව බැන්දා.. නවදුරටත් මගේ නොවෙන හින්දා ලිහුවා.. එච්චරයි.. දැන් එයාව ලිහලා ඉවරයි.. නීතියෙන් වගේ ම හිතිනුත් ලිහලා දාලා ඉවරයි.. ආයෙ එයා යන පාරකවත් යන්න මම කැමති නෑ තාත්තේ.."

පිය - පුතු දෙදෙනා ම, දෙපසට වී සුසුම් හෙළුවේ එකිනෙකාට නොදෙවෙනි ලෙසිනි.





"පුතේ.. එතකොට.. තාරිකාගෙ ඩිරෙක්ටර් පෝස්ට් එක..?"

ගගුල්ගේ ළය පිළිකුලෙන් සේ ම කෝපයෙන් ද වෙව්ලුම් කන්නට විය.

"එයාගෙ සැලරි එක විතරක් බැන්ක් අකවුන්ට් එකට යවන්න කියන්න තාත්තෙ.. ඒක කරන්නෙත් මගේ මනුස්සකමට මිසක් වෙන දේකට නෙමෙයි.. නැත්නං මය ගෑනි අතින් අතට ගිහින් කාණුවකට ම වැටෙයි.. ඒ හින්දයි ජීවත් වෙන්න සල්ලි දෙන්නෙ.. ඒ ඇරෙන්න එයාට මගේ ලෝකෙ හැම තැන ම දොරවල් සේරම වැහිලා තාත්තෙ.. හසිත් ඩොකියුමන්ට්ස් ටික ගෙනත් දෙයි තාත්තෙ.. ඩිරෙක්ටර්ස්ලා සේරගෙන් ම සයින් කරලා තාත්තා ඒ ටික අරන් එන්න මට සයින් කරන්න.."

ජීවන කතරේ, ගගුල්, අතරමං වී සිටියේ ය. ගිනි ගන්නා හදවතට යාන්තම් පොද වැස්සක් වැටෙන්නට වූයේ වනිගසේකර නිවසට පැමිණි පසුව ය.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

සේවය සඳහා පිටත්ව ගොස්, එදින සන්ධ්‍යාවේ නිවසට ගොඩ වන මානවී පැමිණියේ හඬාගෙන ය. දුටු දසුනින් ගගුල් ද, මානවීගේ පියා ද දෙදෙනා ම අතිශය බියට පත් වූහ.

"පොඩි පුතේ.. ඇයි මේ..? පුතේ.. ඇයි මෙ අඬන්නෙ..?"

වෙනදා පුරුද්දට මානවීගේ සුරත අත් බෑගය දෙසට ගියේ නැත. ඈ, නිවසට ගොඩ වී කඳුළු වැකුණු දෑසින් ම ආලින්දයේ පුටුවකට බර වූවා ය.

"ඇයි නංගි මේ..? මොකද උනේ..? ඇයි අඬන්නෙ..?"

වනිගසේකර නිවසට පැමිණ මාස නවයක කාලයක් ඉක්ම ගොස් තිබුණ ද, ඒ කාලය මුළුල්ලේ කිසිදු දිනයක මානවී මෙලෙස



Uploaded By Sanda

හඬනු දැක නොතිබුණු බැවින්, ගගුල්ට ඇගේ හැඬුම දරා ගැනීම පහසු වූයේ නැත.

"ආයෙ.. රටකජු ගේන්න වෙන්නෑ අයියෙ.. ඊයෙ රෑ.. අර රටකජු විකුණපු සීයා නැතිවෙලා.."

මානවීගේ ඉකිබිඳුම ළඟ දෙදෙනා ම ගොළු වූහ.

"අවුරුදු අනූවක් ජීවත් වෙලා.. නිරෝගීව ඉඳලා.. ඔහොම එක පාරටම නැති උනා කියන්නෙ.. ඒක හරි ම වාසනාවන්ත මරණයක් පුතේ.. ඒ මනුස්සයා දුකක් නොවිඳ මැරුන එක ගැන සතුටු වෙන්න පුතේ.."

මානවී, කම්මුල් මතින් ගලා යන කඳුළු දෙපේළිය පිටත්ලෙන් පිස දමා ගනිමින් නැගී සිටියා ය.

"මග තොටදී හම්බ උනත්.. හිතට ළඟින් හිටපු කෙනෙක් ඇත්වෙලා යනකොට.. ගොඩක් දුකයි තාත්තා.. දවසකට හරි ළෙන්ගතුකමක් දක්වපු කෙනෙක්ගෙ දුරස්වීමක්.. දරා ගන්න බෑ හරිම වේදනාවක් හිතට දැනෙනවා අයියෙ.."

ඒ වන විට, දරුවා ලැබුණු චේතනා ද, මානවී හා පියා විසින් ඉදි කර දුන් නව නිවසේ පදිංචියට ගොස් සිටි අතර, මානවී වැඩි වශයෙන් ම පසු වූයේ හුදෙකලාව අත් විඳිමිනි. එබැවින් ඇ පෙරට වඩා බොහෝ සංවේදී වී සිටියා ය. ඇගේ සිත සැනසිය යුත්තේ කෙසේදැයි වනිගසේකර මහතා හෝ ගගුල් දැන සිටියේ නැත. දෙදෙනාට ම හැකි වූයේ නිහඬව බලා හිඳීමට පමණි.

ඒ රාත්‍රියේදී ම, ගගුල්ගේ දුරකථනයට ඔහුගේ මවගෙන් ලද ඇමතුමෙන් ගගුල් අතිශය පීඩාවට පත් වූයේ ය.

"මොනවද මේ කියන්නෙ අම්මෙ.. හෙට එනවා කියන්නෙ.. හෙට මානවීට ක්ලාස්.. හෙට එන්නෙපා අම්මෙ.. හෙට එන එක මේ ගෙදර අයට කරදරයි.."





"අපි කාගෙන්වත් සැලකිලි බලාගෙන එන්නෑ පුතා.. හෙට මම මේ ගමන කොහොමත් එනවා.. ලැස්ති වෙන හැම වෙලාවක ම ඔයයි, තාත්තයි මගෙ ගමන වළකනවා.. හෙට නම් කවුරු එපා කිව්වත් මම එනවාමයි.."

තම මවගේ හිතුවක්කාරී පිළිවෙත කෙරෙහි ගගුල්ගේ සිතෙහි වූයේ උග්‍ර කලකිරීමකි. එහෙත්, කළ යුතු කිසිවක් සිතා ගත නොහැකිව දෙගිඩියාවට පත්වූ ගගුල් වනිගසේකර මහතා වෙත ගියේ බර වූ සිතිනි.

"මම කොච්චර මෙහෙ එන්න එපා කිව්වත් අම්මා අහන්නෙ නෑ අන්කල්.. ඒ එයාගෙ හැටි.. අනේ මට සමාවෙන්න අන්කල්.."

තමා ඉදිරියේ හිඳ, අසරණව දොඩන තරුණයා දෙස, වනිගසේකර මහතා බැලුවේ වේදනාවෙනි.

"ඔය තරම් හිත කරදර කරගන්න එපා පුතා.. අම්මා ඇවිත් ගියාවෙ.. අම්මටත් පුතාව දකින්න ආස ඇතිනෙ.."

ගගුල්ගේ මුවග'ට නැගුණේ සරදම් සහගත සිනාවකි.

"මගේ හදවතේ අම්මා කියන කෙනා ඉන්න ඕන තැන.. අද මගේ අම්මා නෑ අන්කල්.. දස මාසයක් කුසේ තියන් ඉඳලා දරුවෙක් බිහි කරන එක කොයි අම්මත් කරන දෙයක්.. අම්මා කියන වචනෙ හැබෑ අර්ථය නිරූපණය වෙන්නෙ ඒ අම්මා දරුවා බිහි කළාට පස්සෙ දරුවව සමාජයට දායාද කරන්න දරන උත්සාහයේ ස්වරූපය මත අන්කල්.. ඒකෙදි අපේ අම්මා ෆේල්.. මගේ තාත්තා වගේ හොඳ තාත්තෙක් නොලැබුණා නම්.. මමයි, මල්ලියි දෙන්නත් අද මෙතන නෑ අන්කල්.."

ගගුල්ගේ වදන් සියල්ල පැහැදිලි බවින් පිරිපුන් නොවූවත්, ඔහු අදහස් කළ දේ වටහා ගන්නට වනිගසේකර මහතාට අපහසු වූයේ නැත.

Uploaded By Sanda

"මේ ලෝකෙ ජීවත් වෙන හැම මනුස්සයම එක වගේ නෑ පුතේ.. ඒ හැම කෙනෙක්ගෙ ම ස්වරූපයන් ඉවසන්න අපි පුරුදු වෙන්න ඕන පුතේ.."

මාස නවයක කාලයක් මුළුල්ලේ එක ම සෙවණක ජීවත් වීමෙන්, වනිගසේකර මහතාගේ ජීවන දහම බොහෝ දුරට ග්‍රහණය කරගෙන උන් ගඟුල්, ඒ මොහොතේත් මඳ සිනා නගා, මානවීගේ පියාගේ වදන් කෘතවේදීව පිළිගත්තේය. එහෙත්, හදවතේ වන අවංක හැඟීම් වචන බවට පත් කිරීමට තරම්, භාෂාවේ වන සොඳුරු වචන ඔහු දැන සිටියේ නැත.

"මාව වෙනස් මනුස්සයෙක් කරපු අන්කල්ට ගොඩක් පින්.. ඒ පින වගේ ම පිනක් මානවීටත් අයිතියි.. ඒ හා සමානම පිනක් ලොකු හාමුදුරුවන්ටත් අයිතියි.."

"අපි හැමෝම එක ම සංසාර ගමනක මගියො පුතේ.. අපි හතර පස් දෙනා මේ ආත්මය කියන ගංගාවෙන් තවත් ඉවුරක් හොයාගෙන ඇදෙන එක ම පාරුවක නැග ගත්ත යාත්‍රාකාරයො කීප දෙනෙක්.. ඒකයි අපි අතරෙ මේ අමුතු බන්ධනයක් ඇතිවෙලා තියෙන්නෙ.."

තමාගේ මව පසු දින පැමිණෙන බව ඒ රාත්‍රියේ ගඟුල්, මානවී වෙත දැනුම් දුන්නේ දැඩි පසුතැවිලි ස්වරූපයකිනි. මානවී, ගඟුල් දෙස බැලුවේ ප්‍රශ්නකාරී බැල්මකිනි.

"අම්මා එන එකට අයියා ඔච්චර හිතේ කරදරෙන් ඉන්නෙ ඇයි අයියෙ..?"

"නංගිට හෙට ක්ලාසස් යන්න වෙන්නෙත් නෑ.. කවුරු හරි එන එක නංගිටයි, තාත්තටයි කොයි තරම් කරදරයක්ද..?"

"කවුරු හරි එන එක අපිට කරදරයක් කියලා අපි කවදාවත් කියලා තියෙනවද අයියෙ..? අපිට පුළුවන් තරමින් ආගන්තුක සත්කාර කරලා යවනවා මිසක් අපි කවදාවත් කාටවත් කරදරයක්



Uploaded By Sanda



කියලා හිතලා නෑ.. අයියගෙ යාළුවො ම කොයි තරම් ඇවිල්ලා ගියාද..? ඒ හැමෝම පුදුම විදියට අපිට හොඳ කිව්වා කියලා අයිය ම නේද කිව්වෙ..? ඉතින් අපෙන් අයියගෙ අම්මට අඩුවක් වෙයිද..? ඇයි මේ අම්මා එන එක ගැන අයියා මේ තරම් වද වෙන්නෙ..?"

කියා ගන්නට නොහැකි දහසක් දෑ හදවතෙහි තෙරපවාගෙන, වද වේදනා විඳින තුරුණු හදවත මානවී දුටුවේ හෝ හැඳින්නේ නැත. අනුන් සතු උයනක මල් නෙළන්නට තබා, එමල් දෙස බලන්නට පවා නොරිසි වූ ඈ, නැවතී සිටියේ ඔහුගේ හදවතට ගව් ගණනාවක් දුරිනි. එහෙත්, ඔහුගේ හදවත තුළ උපන් අනුපමේය සෙනෙහස නැවතී සිටියේ ඇගේ හදවත මත්තෙහි ය.

"අම්මා.. ආව අනිත් අය වගේ නෙමෙයි හින්දා නංගි.. මං වද වෙන්නෙ.. ඒ ආපු හැමෝටම වඩා අම්මා වෙනස් හින්දා.."

මානවී, ගඟුල්ගේ කසාය වීදුරුව ඔහු වෙත පිළිගන්වා, කාමරයේ වන මේසයට හේත්තු වී සිනාමුසුව ගඟුල් දෙස බැලුවා ය.

"මොකක්ද අයියෙ අම්මගෙ වෙනස.. කොණ්ඩෙ කළු කරලා, ස්ට්‍රේට් කරලා තියෙන එකද..? කොටට අඳින එකද.. ලිප්ස්ටික් කියුටෙක්ස් ගාන එකද..? මොනවද..? ඒවා නම් ඉතින් මෙ ගම්වල සමහරුත් දැන් කරනවනේ.. ලෝකෙම වෙනස් වෙලා අයියෙ.. ඔය එකක්වත් දැන් මහා වෙනස්කම් නෙමෙයි.."

"ඒවා නම් ප්‍රශ්න නෙමෙයි කියලා මං දන්නවා.. ඒත්.. අම්මා හිතන විදිය ප්‍රශ්නයක් නංගි.. අම්මා, තාත්තා වගේ නෙමෙයි.."

මානවී, යළිත් මෘදු සිනා නැගුවා ය.

"එක වගේ මිනිස්සු කොහෙද අයියෙ ඉන්නෙ.. අම්මයි, තාත්තායි දෙවිදියක් වෙන්න ම එපායැ.."

සන්ධ්‍යාවේ දිය නෑමෙන්, තවමත් නොවියැලුණු වරළ මුදා

ගෙන උන් යුවතියගේ සුන්දරත්වය දෙස නොබලා හිඳින්නට, ගඟුල්ගේ තුරුණු දෑස කීකරු වූයේ නැත. ඇගේ කැරළි ගැසුණු කේශ කලාපයේ නැවරූ මෘදු ඕඩිකොලෝන් සුවඳ කාමරය පුරා පැතිරී තිබිණි.

"මං කිව්වෙ.. එහෙම වෙනසක් නෙමෙයි නංගි.."

ආත්මය සිර ගත කළ බැඳීම හමුවේ, ගඟුල් වචන තෝරා බේරා ගත්තේ ප්‍රවේසමෙනි.

"මට තේරෙන්නෙ නෑ අයියෙ.. අයියා මොනවද කියන්න හදන්නෙ..?"

ගඟුල්, යුවතිය දෙස බැලුවේ දිදුලන දෑසිනි. ඒ මොහොතේ නම් ගඟුල්ගේ දෑසේ වූ කාන්තිය, මානවීගේ දෑස සිසාරා ආත්මය පතුලට ම රිංගා ගත් බව පළමු වතාවට ඇයට ද දැනිණි.

"අපේ තාත්තා.. ඔයාට පණ වගේ ආදරෙයි නංගි.."

මානවී, නොදැරියක සේ සොම්නසින් ඉපිලුණා ය. එහෙත්, ගඟුල් හඬ නැගුවේ ආත්මයෙනි.

"අන්කල් දූවලට ආදරෙයිනෙ.. ඉතින් දුවෙක් නැති හින්දා අන්කල් මට ගොඩක් ආදරෙයි.. ඒක ඉතින් අලුත් කතාවක් නෙමෙයිනෙ අයියෙ.."

"ඔච්චර සැල්ලුවෙන් ඉන්නෙපා නංගි.. මම මේ කියන්නෙ සීරියස් කතාවක්..!"

කසාය වීදුරුව උගුරට දෙකට ගිල දැමූ ගඟුල්, මානවී දෙසට වීදුරුව දිගු කළේ නොරිසුම් සහගත දෑසින් ඈ දෙස ඍජුව බලමිනි. ගඟුල්ගේ ඒ බැල්මට මානවී තිගැස්සුණා ය.

ඒ වන විට, පාදය පොළොවට ස්පර්ශ වන ලෙස අඩිය තබා ඇවිදින්නට ගඟුල්ට නාහිමිපාණන්ගෙන් අවසර ලැබී තිබුණු බැවින්,



Uploaded By Sanda



ඔහු ඇවිද ගියේ තනි කිහිලිකරුවක ආධාරයෙනි. හිඳ උන් යහන මතින් නැගිට ගත් ගඟුල්, කොර ගසමින් ඇවිද ගොස්, කවුළුව අද්දරින් සිට ගත්තේ, පවා මානවී දෙස නොබලමිනි. මානවී, මොහොතක් ගල් ගැසී බලා සිටියාය.

"අයියෙ..??? ඇයි..!!!"

"ප්ලීස් නංගි.. මාව තේරුම් ගන්න.."

"අයි..යෙ.. ඇයි මේ..? ඔයාට දුක හිතන්නවත්, කේන්ති, ගන්නවත් දෙයක් මම දැන් කිව්වෙ නෑ නේද..? අම්මා වෙනස් කියලා කිව්ව කතාව මම සීරියස්ලි ගත්ත නැති එක ඔයාගෙ හිත ඔච්චර රිද්දන දෙයක් කියලා මං හිතුවෙ නෑ අයියෙ.."

ගඟුල්, කවුළුවෙන් ඉවත යොමු කරගෙන උන් දෑස පමණක් නොව කය ම හරවා, කවුළුවට පිටුපා මානවී දෙස බැලුවේ ය.

"මට බයයි නංගි..?"

"බය..යි..??? මොනවටද අයියෙ..?"

"හෙට ඇවිත්.. අම්මා ඔයාගෙ හිත රිද්දයි කියලා..?"

"මගේ..??? ඒ මොකටද අයියෙ..?"

මානවීගේ දෑස විමතියෙන් කුඩා වී තිබිණි.

"ඔයාව දැකපු ගමන්.. අම්මට ඔයා ගැන ඊර්ෂ්‍යා හිතෙයි නංගි..!!!"

මානවී ප්‍රකම්පනය වූවා ය. ඈ, අත තිබූ වීදුරුව ලිස්සා යා නොදී රැක ගත්තේ අසීරුවෙනි. ඈ, වෙව්ලන දසැඟිලි අතරට එතෙක් වේලා මැදිව තිබූ වීදුරුව මේසය මතින් තබා, තමා පසෙකින් වූ පුටු වත දැඩිව අල්ලා ගත්තා ය.

"අම්මා.. මට ඊර්ෂ්‍යා කරන්න..??? ඒ මොනවටද අයියෙ..?"

"ඔයා ගොඩක් ලස්සනයි මානවී.. වෙලාවකට ආටිස්ට් කෙනෙක් ඇඳපු ලස්සන චිත්‍රයක් වගේ..!"

ගගුල්ගේ මුවින් පිටවන වදනක් වදනක් ගානේ ම මානවී පුදුමයෙන් ගල් ගැසුණා ය.

"අපි වෙන් උනත්.. අම්මා තාමත් තාරිකාට ආදරෙයි.."

එකකට එකක් නොගැළපෙන ගගුල්ගේ වදන් ළඟ මානවීගේ මුව මුළුමනින් ම ගොළු වී තිබිණි. ඈ තමාගේ ම දෙසවන් අදහාගත නොහැකිව සෙල් පිළිමයක් බවට පත්වී සිටියා ය.

"ඔයා තාරිකාට වඩා ගොඩක් ලස්සනයි නංගි.. ගොඩක් පින් පාටයි.. ඒ හින්දා.. ඔයාව දැක්ක ගමන්.. අම්මා ෂොක් වෙයි.. ඔයාව දැක්කම ඊර්ෂ්‍යා නොකර ඉන්න අම්මට බැරි වෙයි.."

පෙර කිසිදා නොවූ විරූ තරමට මානවී නැති ගෙන සිටියා ය.

"එක පැය විසි හතරක් එක තැනක ඉන්න පුළුවන්කමක් නොතිබුණ එයාගෙ පුතා.. මාස නවයක් තිස්සෙ.. එක තැනක ගැට ගහලා තිබ්බ මැජික් එක මොකක්ද කියලා.. අම්මා එක තත්පරේට දැන ගනියි නංගි.. කියන්න මානවී.. කියන්න මට.. ඊට පස්සෙ.. එයා ඔයාට ඊර්ෂ්‍යා නොකර ඉඳියිද නංගි.. ඉඳියිද..?"

මානවීගේ දෑසින් උල්පතකින් මෙන් කඳුළු කඩා හැලෙන්නට විය. ඈ, කුතුහලය සේ ම භීතිය ද රඳවා ගත් දෑසින් ගගුල් දෙස බලා සිටියා ය.

"දෙයියනේ අයියෙ.. මොනවද ඔයා කියන්නෙ.. ඔයාව එක තැනක ගැට ගහලා ගියපු රහස මම කියලද ඔයා කියන්න හදන්නෙ..??? ප්ලීස් අයියෙ.. මට පව් පුරවන්න නම් එපා.. කකුලට බෙහෙත් කළා තමයි.. හැබැයි මම එක නියපොතු තුඩකින්වත් වැරදි විදියට ඔයාට ළංවෙලා නෑ.. ඔයා අනුන්ගෙ කියලා දැනන් හිටිය මං හිටියෙ, මං ඉන්න ඕන සීමාවෙ අයියෙ.. ලොකු





හාමුදුරුවො මට පවරපු වගකීමෙන් දශමයක් එහාට මං අඩිය තියල නෑ.. ඉතින්.. එහෙම මට.. ඔයාගෙ අම්මා මොනවට ඊර්ෂ්‍යා කරනවද අයියෙ..?"

මානවී, එකදු ක්ලේශී සිතිවිල්ලකට හෝ තමාගේ ආත්මයේ ආසන්නයට හෝ පැමිණීමට ඉඩ නොතැබුවා ය. ජීවිත කාලය ම අතිශය පවිත්‍ර ජීවිතයක් ගත කළ ඈ, ඒ මොහොතේ පවා තමාගේ ආත්මීය පවිත්‍රත්වය රැක ගැනීමට වෙර දැරුවා ය.

"අවුරුදු තිහක්.. මේ ජීවිත් වින්දෙ නැති.. හැම සැලකිල්ලක් ම මේ මාස නවයට.. මේ ගෙදරදී මං වින්දා නංගි.. මේවට ලෝබ නොවී ඉන්න.. ලොකු හාමුදුරුවො වගේ.. මම මාර්ග ඵලයකට ඇවිල්ලා නෑ නංගි.."

මානවී, ඇසෙන වචනයක් ගානේ ම පුදුමයෙන් ගල් ගැසෙන්නට වූවා ය.

"ලොකු හාමුදුරුවො මාර්ග ඵලයක් ලබලා..???"

"මට තේරෙන හැටියට.. වෙන්න ඇති නංගි.. එහෙම නැත්නම්.. ඔය විදියට බැඳීම් වලින් ඉහිල් වෙලා ජීවත් වෙන්න.. යතිවරයෙකුටවත් බෑ.. ආදරේ කියන්නෙ.. හිත කැමති දේ ලබා ගන්න උදව්වන ලෝබකමට.. කකුල සනීප වෙනවා වගේ ම.. ඒ ආදරේ කියන ලෝබකමින් මං දැන් රෝගී වෙලා නංගි.."

නෙළා ගත යුතු මල් පිපෙන්නේ අත පොවන මානයේ ය. උස් තුරු මුදුන්වල මල් පිපෙන්නේ නෙළන්නට නොවේ. ඒ මල් පිපෙන්නේ ජීවයේ පැවැත්ම අඛණ්ඩව පවත්වාගෙන යන්නටත්, ලෝකය සොඳුරු බවින් පුරවන්නටත්, දැක බලා දෑසත්, හදවතත් සනහා ගන්නට පමණි. මානවී, කෙමෙන් කෙමෙන් පියවි ලෝකයට පැමිණියා ය.

"කුඹුරු යායට ම මේ දවස්වල ඌරො එන්න පටන් අරන් අයියෙ.. යායෙ කුඹුරු ගානක් ම ඌරො පොඩි කරලා ගිහින්.. අද



Uploaded By Sanda

දවල් තාත්තට ඌරු වැට හදලා දෙන්න සජිත් අයියත් ඇවිත්.. තාත්තා ගියා දහයියා පත්තු කරලා එන්න.. තාත්තා එනවත් ඇති දැන්.. මං බලලා එන්නම්.. හෙට උදේට හාල් පිටි රොටී කමුද අයියෙ.. පිටි වගයක් තියෙනවා.."

මානවී, උපායශීලීව කතාව ම වෙනතකට හරවා, ගඟුල්ගේ කාමරයෙන් නික්මී ආලින්දය දෙසට ඇවිද ගියා ය.

"දැක්කද කපටිකමට ලිස්සලා ගිය හැටි..? මේ.. මාස නවයට.. මං මගේ හිතේ තියෙන දේවල් කියා ගන්න.. කොච්චර අවස්ථා හෙව්වද..? ඒත්.. ඒ කිසි දෙයක් නොදැනුණා නොතේරුණා වගේ.. ඔයා ගහක් ගලක් වගේ හිටියා.. ඒත්.. මම කවද හරි.. ඔයාව මගේ කර ගන්නවමයි මානවී.. මගේ ලෝක දිගේ මං මේ කකුල් දෙකෙන් ඇවිදගෙන යන්නෙ.. ඔයාව මේ අත් දෙකින් අල්ලගෙන ම යි..!!"

ගඟුල් මුළු ආත්මයෙන් ම අධිෂ්ඨාන පාරමිතාවකට මුල පිරුවේ ය. එහෙත්, ඒ කිසිවක් නොදන්නී, ආලින්දයේ වූ අසුනකට බරවී පියා පැමිණිය යුතු පෙර මගට දෑස යොමාගෙන උන්නී ය.

සෙමින් පැමිණි ගඟුල් ඈ අසල ම වූ අසුනකට බර දුන්නේ ය.

"මට සජිත් අයියගෙ වෙනස ගැන හිතාගන්නවත් බෑ අයියෙ.. ගේ හදලා දීලා පදිංචි කෙරෙව්වා විතරයි එයා එහෙම පිටින් ම වෙනස් ම මනුස්සයෙක් වෙලා අයියෙ.."

"මේ ලෝකෙ මහ පුදුමාකාර තැනක් නංගි.. ජීවත්වෙන මිනිස්සුත් ඒ වගේ ම පුදුමාකාරයි.. වෙනස් වෙන විදිය හිතාගන්නවත් බෑ.."

"පෙරේදා වත්තෙ ගම්මිරිස් කැඩුවලු, රුපියල් අට දාහක් ගත්තලු.. ඒවා තාත්තා හිටවපුවා හින්දා තාත්තගෙ පංගුව කියලා රුපියල් හාරදාහක් ගෙනත් බලෙන් ම තාත්තට දීලා ගියාලු.. දැන් වැඩ නැති දවස්වලට පුළුවන් හැම වෙලාවෙ ම තාත්තගෙ උදව්වට දුවගෙන එනවලු.. සජිත් අයියගෙ ගෙදර මිනිස්සුත් එහෙමලු අයියෙ..





මාත් එක්ක නම් වැඩි ආශ්‍රයකට එන්නෙ නෑ.. මට නම් බයයිද කොහෙද..?"

මානවී, හිනැහෙන්නට වෙර දැරුවා ය.

"ඔව් ඉතින්.. නයි මිරිස් කරලක්නෙ.. බය ඇති තමයි ළං වෙන්න.."

ගඟුල්ගේ වදනක් ගානේ ම වූයේ සරදමක් වුවත්, ඒ සරදම පරයා නැගෙන සෙනෙහස හඳුනා ගන්නට මානවී ඒ මොහොතේ නම් සමත් වූවා ය.

"ඒ උනාට නයි මිරිස් හරිම රසයි කිය කියානෙ කන මිනිස්සු කන්නෙ.."

මානවී, ඇඟට පතට නොදැනී කියා දැමුවා ය. ගඟුල් හැකි තාක් පසෙකට දිගෑදී මානවීගේ කණක් රිදෙන්නට ඇල්లුවේ ය.

"ඌයි අයියෙ.. මොකද මේ..? මගේ කණ ගලවන්න හදන්නෙ.. ඔයා මයික් ටයිසන් වෙන්න හදනවද..?"

මානවී, ගඟුල්ගේ වමත, දැතින් ම අල්ලා තමාගේ කන මුදවා ගත්තා ය.

"මට වෙන්න ඇති හිත්ටි එක පාස් කළේ.. ඉන්නවකො මං නයි මිරිස් කාලා පෙන්නනකල්..!"

ගඟුල්ගේ විහිළුව, ඇගේ හද මත පතිත වූයේ ඊයම් බරුවක් මෙනි. ඔහුගේ විහිළුවෙන් කුල්මත් වන්නට තරම් සැහැල්ලු හදවතක් ඇයට තිබුණේ නැත.

"අනේ මං විහිළු කළේ නෑ අයියෙ.. ඔයාගෙ ජීවිතේ මමවත්.. මගේ ජීවිතේ ඔයාවත් විහිළුවට ගන්න ඕනත් නෑ.. අපි අයිති ලෝක දෙකකට.. ඒ ලෝක දෙකේ.. අපි ජීවත් වෙන්න ඕන දෙවිදියකට.. යා දෙක නොරන රථ.. අපි මේ මාස ගාණක්



Uploaded By Sanda

අමාරුවෙන් එක්කහු කරපු මනුස්සකමේ පිරිසිදු කිරි කළේට ගොම බින්දුවක් මුහු කරන්න ඕන නෑ අයියෙ.. ප්ලීස්.. අපි දෙන්න ම මේ කතා කරපුවා සේරම කතා කළේ නෑ කියලා හිතලා අමතක කරලා දාමු අයියේ.."

ගුරු පාර දෙසින් ඇදී ආ විදුලි පන්දම් එළිය, නිවස දෙසට හැරිණි. මානවීගේ හදවතට අපමණ වූ සහනයක් දැනිණි. මානවී සිනාමුසුව උන් කැනින් නැගිට පියා පැමිණෙන පෙරමගට ගියා ය. ගඟුල්ගේ දෑසේ පොර බදන කඳුළු ඇ නොදුටුවේ එබැවිනි.

"තාත්තා.. දහයියා පත්තු කළාද..?"

"පත්තු කළා පුතේ.. යායෙම මිනිස්සු පැල් රකින්න කතා කර ගත්තා මේ ඌරු කරදරේ හින්දා.."

මානවී, බියෙන් දෑස හකුළුවා ගත්තා ය.

"එතකොට තාත්තා.. අපේ කුඹුර..???"

"සජිත් පුතාගෙ අයියා සමන් පුතා කැමැත්තෙන් ම ඉදිරිපත් උනා පැලේ ඉන්න පුතේ.. කුඹුර කැපුවා ම කොල්ලට වී බුසල් හත රටක් දෙනවා.. සල්ලිවලට හාල් කන මිනිස්සුන්ට ඒකෙ වටිනාකම නිමක් නැනෙ පුතේ.."

වනිගසේකර මහතා පාදයේ දමා ගෙන උන් රබර් සෙරෙප්පු යුවළ ගලවා, ආලින්දයේ පසෙකින් දමා නිවසට ගොඩ වූයේ ගඟුල් වෙත ද හෘදයාංගම සිනාවක් තිළිණ කරමිනි.

"පොඩි පුතේ.. ඔය සෙරෙප්පු සේරම ගෙට ම දාන්න.. අර අලුත් ගෙදර ටොමියා ගෙවල් ගානෙ රිංගලා තියෙන තරමක් සෙරෙප්පු උස්සගෙන යනවලු.."

පියාගේ අවවාදය පිළිගත් මානවී, හිරු ආවරණය යට තබා තිබූ පාවහන් රාක්කය ම ඔසවා, ආලින්දයේ පසෙකින් තබා, නිවසේ ඉදිරි දොරටුව වසා දැමුවා ය.





"පුතා ඇයි ඇහැරගෙන හිටියෙ.. වේලපහින් නිදාගන්නෙපායැ පුතේ.."

ගඟුල්, මානවීගේ පියා වෙත හෙළුවේ හද කකියවන වේදනාබර බැල්මකි. තම දියණිය ප්‍රකෘති සැහැල්ලුවෙන් හිඳියදී, ගඟුල්ගේ මුහුණ වේදනාවෙන් හැකිළී තිබෙන හේතුව කුමක්දැයි, වනිගසේකර මහතාට නම් අනුමානයෙන් හෝ සිතා ගත නොහැකි විය. මානවීගේ පියා ගඟුල් දෙස බලා ඉවත බලාගත්තේ උග්‍ර ප්‍රශ්නාර්ථයෙනි.

"මට නිදිමත නෑ අන්කල්.."

ගඟුල්ගේ හඬ බෙහෙවින් වේදනාබර යැයි වනිගසේකර මහතා වටහා ගත්තේ ය.

ගඟුල්ගේ මව වන තමාරා සමරසිංහ, තමාගේ පුතු බලන්නට පැමිණි දිනය, තමාගේ ජීවිතයට එතරම් දෛවෝපගත වේ යැයි මානවී කිසිදු විටෙක සිතුවේ නැත. ඇ පැමිණෙනුයේ තමා අප්‍රිය කරනු ලබන පුද්ගලයෙකු සමගින් බව දැනගත් මොහොතේ මානවීගේ සිත වඩාත් ව්‍යාකුල බවට පත් විය. ඇයට අතීත දිනයක් සිහිපත් විය. රත්නජීව රෝගාතුරව පසු වූයෙන්, ඒ සති අන්තයේ සමරසිංහ මහතා පැමිණියේ, ඔවුන්ගේ අනෙක් රියදුරු වූ, තරුණ වියේ පසුවන සිසිර සමගිනි. පැමිණි මොහොතේ පටන් තමා හමුවේ අධිමානී ලෙස හැසිරෙන සිසිර කෙරෙහි උපන් කලකිරීම, මානවී, ගඟුල්. සමගින් වචන බවට පත් කළේ ඔවුන් පිටත්ව ගිය පසු එදින රාත්‍රියේදී ය.

"අයියෙ.. මං දෙයක් කියන්නම්.. තරහා වෙන්නෙපා ප්ලීස්.."



Uploaded By Sanda

"ඔයත් එක්ක තරහා වෙන්න මං..??? ඊට වඩා මට මාත් එකක් තරහා වෙන එක ලේසියි නංගි.. කියන්න.. මොකක්ද..?"

සිත වූ නොරිස්සුම පහ කිරීමට, මානවී පමණට වඩා කාලය ගත කළේ නැත.

අවංක බවත්, ඍජු බවත් ඇගේ ජන්මගත ගති ලක්ෂණ විය.

"අර සිසිරව නම් ආයෙ මෙහෙ එක්ක එන්න එපා කියලා අන්කල්ට කියන්න..."

ගගුල්, දෑස උස්සා මානවී දෙස බැලුවේ විමතියෙනි.

"ඇයි නංගි.. මොකද උනේ..?"

"මොනවත් උනාට නෙමෙයි අයියෙ.. මට එයාව අල්ලන්නෙ ම නෑ.. එයා මාර පාට් එකෙන්නෙ ඉන්නෙ.. ඊට වඩා මහ කපටි පෙනුමක් එයාට තියෙන්නෙ.. එයා මං දිහා බලන්නෙ නිකම් 'දෙන්නම් උඹට' කියනවා වගේ.. අයියා එයාව විශ්වාස කරනවද නැද්ද කියලා නම් මං දන්නෙ නෑ.. හැබැයි මට නම් එයාව එක පොඩ්ඩක්වත් විශ්වාස නෑ.."

මානවී කීවේ ස්ථිරසාර හඬිනි. ගගුල් මඳ වේලාවකට ගැඹුරු කල්පනාවකට වැටුණේ ය.

"මේ ගෙදරට එනවා නම් කවුරු හරි.. අපිට ඒ එන කෙනාට තමන්ගෙ කෙනෙකුට වගේ හිනාවෙලා කතා කරන්නවත් ඉඩ තියන්නෙ ඕන අයියෙ.. එයා මගෙම ගෙදරට ඇවිල්ලා.. අලි ඔළුවෙන් ඉන්න හදනවා නම්.. මට එයාට ආගන්තුක සත්කාර කරන්න විදියක් නෑ හිත පිරිසිදුවෙන්.."

මානවී, අවධාරණය කළා ය. ලෝකයේ තමා එතුවක් දුටු එඩාත් ම මෘදු, මොළොක්, කාරුණික යුවතිය තුළ, එබඳු දැඩි ගැහැනියක නිදන්ගතව ඇතැයි ගගුල් කිසිදා නොසිතුවේ ය.





"සොරි නංගි.. මම තාත්තට කියන්නම්.. සමහර විට නංගි කියන කතාව හරි ඇති.. සිසිර වැඩිපුර ගමන් බිමන් ගියෙ තාරිකා එක්ක.. සමහර විට සිසිර අපිට වඩා තාරිකාට හිතවත් ඇති.."

මානවී, ගගුල්ගේ වදන් පිළිගත් අයුරින් හිස සැලුවා ය.

"එහෙනම් ඒක වෙන්න ඇති තාරිකා දවසක් කිව්වෙ වැඩකාරයොත් ඕවා කරන්නෙ අප්පිරියාවෙන් කියලා.. සිසිර එක්ක විතරනෙ මම රත්නජීව අන්කල් නැති වෙලාවට ගමනක් හරි ගියේ.. සිසිර ෂුවර් එකට ම මොනවා හරි කියන්න ඇති.."

ළය තුළ උපන් නොතේරෙන වේදනාවක් නමින්, මානවීගේ මුවින් දිගු සුසුමක් ගිලිහිණි.

"මං දන්නෑ අයියෙ.. ඒත්.. මම කියන්නෙ මට තේරෙන දේ.. එයාව ඔෆිස් එකේ වැඩවලට දාලා ගෙදර ගමන් බිමන්වලට වෙන ඩ්‍රයිවර් කෙනෙක් ගන්න කියලා අන්කල්ට කියන්න අයියෙ.. විශ්වාසයක් නැති මිනිස්සු ළඟ තියන් ඉන්නවා කියන්නෙ ම.. තමන්ගෙ අතින් ම බෙල්ල කපා ගන්නවා වගේ වැඩක්.."

මානවී, තමාට දැනුණු, හැඟුණු දෑ එයාකාරයෙන් ම වචන බවට පත් කළා ය.

"නංගි.. මට ඇත්ත කියන්න.. සිසිර ඔයාට මොනවා හරි කිව්වද..?"

මානවීගේ දෑසේ වූයේ, පුහුණුව ලත් යුධ සෙබළියකගේ දෑසක වන එඩිතර බවකි.

"මහ්.. නෑ අයියෙ.. කිව්වෙ නම් නෑ.. කියන්න වගේ ලෑස්ති උනා.. අර බුලත් වැල පිටිපස්සට වෙලා කා එක්කද ෆෝන් එකෙන් කුටු කුටු ගානවත් ඇහුණා.. මගේ ශරීර ලක්ෂණ තමයි විස්තර කරනවා ඇහුණෙ.. ෂුවර් එකට ම මං ගැන තාරිකාට තමයි කියන්න ඇත්තෙ.."



Uploaded By Sanda

මානවී, එවර නම් සැහැල්ලු ලෙස හිනැහුණා ය. එහෙත්, එදින සිසිර කෙරෙහි ඇගේ හදවතෙහි උපන් කහට පැල්ල ම එලෙසින් ම ඉතිරි විය.

තමාරා සමරසිංහ පැමිණෙන්නේ සිසිර සමගින් යැයි දැනගත් මොහොතේ, ඒ කහට පැල්ල ම ඇගේ සිත තුළ විශාල පදාසයක් බවට පත්වෙමින් තිබිණි.

උදෑසන නවය පමණ වන විට තමාරා සමරසිංහ, වනිගසේකර නිවසට පැමිණියා ය. මාස ගණනාවකින් මව තමා හමුවට පැමිණියා වුවත්, ගගුල්ගේ සිතට විශේෂිත සතුටක් හෝ හැඟීමක් දැනුණේ නැත.

'අම්මා උනත්.. දුකේදි මාව අත්ඇරලා ගියා නම්.. මොනවටද මං එයා ගැන සතුටු වෙන්නෙ.. තුවාලෙ හැදුන මුල් දවස්වල උනත් බෙහෙත් ටික දාන එක පවා නාත්තගෙ ඇගේ ගහලා එයා නිදහස් උනා.. ඔයා හොයපු ඒ නිදහස ඇතුළෙ මගෙ හිතේ ඔයා ගැන තිබුණ ආදරේ ටිකෙන් ටික මැරෙන්න ගත්තා අම්මෙ.. ඔයා ගැන මගෙ හිතේ දැන් මහා ලොකු හැඟීමක් නෑ..'

මොන්ටෙරෝ රියෙන් බසින මව දෙස, ගගුල් බලා සිටියේ උකටලී මනසිනි. දණහිසටත් මදක් කෙටි ඇගට හිර සායක් හා ක්‍රීම් පැහැති අත් කොට සිල්ක් බ්ලවුසයක් ඇඳ උන්, ස්ට්‍රේට් කළ කෙටි කොණ්ඩය කඩා දමා, අව් කණ්ණාඩි යුවළය හිස මත පැළඳ උන් කාන්තාව දුටු මතින් මානවීගේ සිත තුළ එතෙක් ඇඳී උන් 'ගගුල්ගේ අම්මා' යන සිත පහදවා තිබූ සිතුවම මුළුමනින්ම බොඳවී ගියේ ය. 'අම්මා' යන වචනයේ වන උත්තරීතර අරුත බොඳ වී යන්නට ද වැඩි වේලාවක් ඉතිරිව නොමැති බව, ඒ මොහොතේ මානවී දැන සිටියේ නැත.

මානවී, සිනාමුසුව ඉදිරියට ගියේ උඩරට චාරිත්‍රානුකූලව නිවසට පැමිණි අමුත්තාගේ දෙපා වැඳ ඔවුන්ගේ පැමිණීම පිළිගන්නට ය. එහෙත්, ගගුල්ගේ මවගේ අහංකාර පරවශ හැසිරීම, බැල්ම ඉදිරියේ





වහා ම මානවී තම සිනැඟි හකුළාගෙන පසෙකට වූවා ය. ඇයට නිතැතින් ම බැලුණේ තම පියා දෙස ය. ගගුල්ගේ මවගේ මාන්නක්කාර හැසිරීම වනිගසේකර මහතාගේ ද දෑසට හසුව, මොහොතින් ඔහුගේ හිත ද බිඳී තිබිණි. එහෙත්, ඒ මොහොතේ, තමාගේ සදාචාරයත්, සමරසිංහ මහතාගේ මිනිසත්කමත්, ගගුල්ගේ ආදරණීය බවත් සිහිපත් කර ගනිමින් වනිගසේකර මහතා තම සිතට පිවිසෙන නොරිස්සුම ආයාසයෙන් යටපත් කර ගත්තේ ය.

"ගෙට යමු ආන්ටි.."

මානවීගේ ඇමතුමින්, තමාරා සමරසිංහගේ මුහුණ තවත් කළු වන අයුරු ගගුල් පවා දුටුවේ ය.

'මාස නවයක් තිස්සෙ.. කිසි ම කරදරයක් නැතුව අපි මේ ගෙදර හිටියා.. මොන කරුමෙකට අම්මා මේ ගමන ආවද මන්දා..'

තම මවගේ පමණට වඩා අහංකාරය මුසු මුහුණ දුටු මොහොතේ, ගගුල්ට දැනුණේ එවන් හිස් හැඟීමකි.

"එන්න නෝනා.. වාඩිවෙන්න.."

පහසුවෙන් කිසිවකු කෙරෙහි අමනාප නොවන වනිගසේකර මහතාගේ සිත තුළ පවා වූයේ නොපහන් බවකි. ඔහු පවා ගගුල්ගේ මවට ආමන්ත්‍රණය කළේ යුතුකම සලකා පමණි. අමුත්තන් පසුපසින් විවෘත ආලින්දයට ගොඩ වූ මානවී තම පියාගේ මුහුණ බැලුවා ය. පියාත්, දියණියත් දෙදෙනා කිසිවක් කථිකා කරගත් තාක් මෙන් නිවස තුළට යන්නට පා එසෙව්වෝ ය.

"ඔය ළමයත් ඇවිත් වාඩිවෙන්න.."

වනිගසේකර මහතාත්, මානවීත් දෙදෙනා ම ඇතුළු ආලින්දයට වැදී නොපෙනී ගියේ, ගගුල් දෙස නොබලමිනි. ඔහුගේ මුහුණ බලන්නට බැරි තරම් වේදනාබර වී තිබිණි.

"කොහොමද පුතා.. දැන් සනීපද..?"



Uploaded By Sanda

ඖෂධ ආලේප කර තිබූ බැවින්, තමාරාට පුතුගේ පාදය ප්‍රකෘතිමත් ස්වරූපයෙන් දැක ගැනීමට නොහැකි විය. ගගුල් තම මවගේ පැනය උවමනාවෙන් ම මග හැරියේ ය.

"වාඩිවෙන්න අම්මෙ.. කීයටද ගෙදරින් ආවෙ..?"

බොහෝ උණුසුම්, හෘදයාංගම, මිත්‍රශීලී මිනිසුන් වන මානවීගේත්, ඇගේ පියාගේත් නිහඬ චර්යාව ගගුල්ට දරා ගැනීම පහසු වූයේ ම නැත. තම මව විසින් මානවීත්, පියාත් ගණනකට නොගෙන උන් අයුරු මැවී පෙනෙද්දී, ඔහුගේ සිතට දැනුණේ නිම් හිම් නොවන කෝපයකි.

"අපි පහට ආවා පුතා.. ඔයා මේ කොහෙද ඇවිත් ඉන්නෙ ළමයො.. එනවා එනවා ඉවරයක් නෑ.. මට එපා වෙලා ආවෙ.."

"අපි අම්මට එන්න කිව්වද..? නැනෙ.. අපි එපා ම කියද්දිනෙ අම්මා ආවෙ.. නේද..?"

ගගුල්ගේ සිත වූ නොරිස්සුම.. තමාරාට දැනිණි. ඈ, මදක් මෙල්ල වූවා ය.

"ඔයා කොහොමද පුතා මෙහෙ ඉන්නෙ..? මේ කැලෑවක් ඇතුළට වෙලා ඔයා කොහොම ඉන්නවද මන්දා.. කිසි පහසුකමක් නැතුව..?"

"පහසුව තියෙන්නෙ හිතේ අම්මෙ.. අනික මොකක්ද මට මෙහෙ තියෙන අපහසුව..? අතට පයට හැමදේම ඉෂ්ට වෙද්දි එතන මිනිහෙකුට අපහසුකමක් තියෙනවද..? ලොකු ම දේ.. අවුරුදු පහළවක් තිස්සෙ මේ විඳවන කරුම වණේ සනීප කරගන්න එක තරම් පහසුවක් තවත් මට මේ ජීවිතේ තියෙන්න පුළුවන්ද..?"

තමාරාගේ පිළිතුරකට පවා ඉඩක් නොතබා ගගුල්ගේ කෝප දීප්ත දෑස දෙවනුව යොමු වූයේ තවමත් ආලින්දයේ කොනකට වී සිටගෙන සිටි රියදුරා වෙතට ය.



Uploaded By Sanda



"සිසිර.. තමුසෙත් ඔහෙන් ඉඳගන්නවා.. පන්තියක වැරැද්දක් කරලා දඬුවමක් ලැබිච්ච ළමයෙක් හිටගෙන ඉන්නකොට වගේ බොරුවට හිටගෙන ඉන්නෙ නැතුව.. මට පෙන්නන්න බෑ ඔය බොරු බය පක්ෂපාතීකම.. හතර වටේ ගිනි අවුළුවලා දැන් මෙතන බොරුවට මං ඉස්සරහා බබා වගේ හිටගෙන ඉන්නවා.."

සිතෙහි නළියන කෝපයේ තරම ගගුල්ගේ නළියන, දෙකම්මුල් මත ලියැවී තිබිණි.

"පුතා මොකද මේ සිසිරට කඩන් පනින්නෙ..? ඒ ළමයා ඔයාට කරපු වරද මොකක්ද..?"

ගගුල්, තම මවත්, සිසිරත් දෙදෙනා ම දෙස බැලුවේ අභියෝගාත්මක දෑසිනි.

"මෙයාද.. මෙයා මේ තරම් කේලම්කාරයෙක් කියලා මං දැනන් හිටියෙ නෑ.. අර ගෑනි එක එක මිනිස්සු එක්ක ලගින්න ගිහින් මට අප්‍රසන්න උන නිසා මං ඒ ගෑනිව දික්කසාද කළේ.. ලිහපු ගෑනි ඒ විදියට ඉන්නෙ නැතුව මොන මගුලටද මට සැරෙන් සැරේ කෝල් කරන්නෙ..? මගෙ තාත්තවත්, රත්නජීව අන්කල්වත්, මගෙ යාළුවො එකෙක්වත් මළාට මං ගැන ඔය ගෑනිට කියන්නෙ නෑ.. සිසිර තමුසෙ තමයි තාරිකාට මෙහෙ විස්තර අකුරක් නෑර කිව්වෙ.. නපුංසක වැඩ කරන්නෙපා මිනිහෝ.. පිරිමි වෙලා තමුසෙලා කරනවා වගේ වැඩ ගෑනුවත් කරන්නෙ නෑ.."

තම මව විසින් මානවීත්, ඇගේ පියාත් නොතකා හැරීමේ කෝපය හා ශෝකය ගගුල් දස දෙසින් ම පිට කරමින් සිටියේ ය. සිසිරට දැනුණේ පොළොව පලාගෙන ගොස් සැඟවෙන්නට තරම් ලැජ්ජාවකි. ඇතිවන්නට ගිය මහා ගැටුම වියැකී ගියේ වනිගසේකර මහතා ආලින්දයට පැමිණි බැවිනි.

"නෝනලා මොනවද බොන්නෙ..? තාම උදේ හින්දා තේ හදන්නද..? කිරි තේ හදන්නද..දවල් වෙලා බොන්න නම් තැඹිලි, කුරුම්බා, වැල් දොඩම්, පැණි දොඩම්.. ඔය ඕන එකක් තියෙනවා.."

තමාරා සමරසිංහ සිටියේ දෙලොවක් අතර ය. තමා රඟ දක්වන්නට සිතාගෙන පැමිණි භූමිකාව තවදුරටත් රඟ දැක්විය නොහැකි වග ඇ වටහා ගත්තේ ගඟුල්ගේ කර්කශ ප්‍රතිචාරයෙනි.

"උදේට මගින් කාලා ආවෙ මිස්ට වනිගසේකර.. කමක් නෑ.. කිරි තේ එකක් බොමු.. ප්ලේන් ටී බොන්න බෑ.. මට ගැස්ට්‍රයිටීස්.."

වනිගසේකර මහතා හිස සලා පිටව යන්නට මත්තෙන් ගඟුල් දෙස බැලුවේ ය.

"පුතාටත් තේ හදන්නද..?"

"එපා අන්කල්.. මං දැන් බඩ පැලෙන්න කාලනෙ ඉන්නෙ.. අද අර කළටි පොල්වලින් හදපු පොල් මැල්ලුම පුදුම රහක්.. ඉඳිආප්ප තිහක්ද කොහෙද කෑවා මං.."

ගඟුල් පැවසුවේ සත්‍යය ම වුවත්, ඔහුට උවමනා වූයේ ඒ මොහොතේ තම මවට රිදවන්නට ය. ආලින්දයේ කොනක ම වූ පුටුවකට වී සිසිර පවා බලා සිටියේ බිරාන්තව ය.

මුළුතැන්ගෙයට වැදුණු මානවී, යළි ආලින්දය පළාතටවත් නොගියා ය.

"මගින් කෑවලු පුතේ.. ආඩම්බරකමත් තියෙනවා.. ඒ උනාට කිරි තේ එකක් හොඳයිලු.. අහංකාරකමට කට මැත දෙඩෙව්වට උන්දැලාට මගදි හරිහමන් කෑම ටිකක් හම්බ වෙන්න නැතුව ඇති පුතේ.."

මානවී, කට කොනකට සිනාවක් නගා ගත්තා ය.

"එයාගෙ අහංකාරකම එයාට.. අපි ගණන් නොගෙන හිටියම ඉවරයි තාත්තා.. ආපෝ.. අර රත්තරන් අන්කල්ගෙ අහලකින්වත් තියන්න බෑ.. ආවට යුතුකමක් විදියට සලකනවා.. ගඟුල් අයියගෙ අම්මා හින්දා ඉවසනවා.."





සිත තුළ කැකෑරෙන නොපහන් බව, මානවී වචන කිහිපයකින් සාරාංශගත කොට හෙළිදරව් කළා ය. වනිගසේකර මහතා හිස සැලුවේ දියණිය සමඟ එකඟ වෙමිනි.

"අපරාධෙ මගෙ ක්ලාස් එක තාත්තා.. ඉක්මනින් උයා ගත්තොත් මට වරුවකට හරි යන්න පුළුවන් නේද..?"

මානවී, පිළියෙළ කළ තේ කෝප්පය තැබූ බන්දේසිය පියා වෙත පෑවේ එසේ පවසමිනි. වනිගසේකර මහතා තම දියණිය දෙස බැලුවේ පුදුමයෙන් දෑස විසල් කර ගෙන ය. දියණියගේ සිත රිදී ඇති තරම හඳුනා ගන්නට ඊට වඩා සාක්ෂි ඔහුට උවමනා නොවිණි.

"මොනවද පුතේ එහෙනම් අපි උයන්නෙ..?"

"පරිප්පු ටිකක් හින්දලා, සැමන් තෙල් දාලා, බෝංචි ටිකක් උයලා, කලවම් මැල්ලුමක් හදලා, පපඩම් බදිමු තාත්තා.. අපේ කුඹුරෙ කැකුළු හාල් බත්නෙ කොහොමත් උයන්නෙ.. අන්කල් ආවා නම් ඔය කෑම වේල දිව්‍ය ලෝක රහයි කියලා කයි.. මොනවා කරන්නද..? අම්මගෙ හැටියට නම් මේ කෑම හරියන එකක් නෑ.. ඕන එකක් තාත්තා.. කනවා නම් කාපුදෙන්.. නැත්තං නිකම් හිටපුදෙන්.. අපිට පුළුවන් විදියටනෙ අපි දෙන්නෙ.."

පියාත්, දියණියත් යුහුසුලුව දිවා ආහාරය පිළියෙළ කරන්නට වූවෝ ය. තම මවගේ ආගමනයත් සමඟ ම නිවස තුළ රජයන්නට වූ නිහැඬියාව ගඟුල්ට දරා ගත නොහැකි වේදනාවක් වූයේ ය.

"අම්මෙ.. කැත විදියට හැසිරෙන්නෙපා.. මූණ පුරා හිනා වෙලා අර ළමයා අම්මා ඉස්සරහට ආවම.. අම්මා ගණන්වත් ගන්නෙ නැතුව අහක බැලුවෙ හරියට කම්මුලට ගැහුවා වගේ.. ඒ මිනිස්සුන්ගෙ ගෙදරට ඇවිල්ලා ඔහොම හැසිරෙන්න ලැජ්ජා නැද්ද අම්මෙ..?"

තමාරා, සාවඥ සිනාවකින් මුව ඇද කර ගත්තා ය.



Uploaded By Sanda

"ආ පුතා.. ඒ ගැන වදවෙන්න එපා.. අපි ඔයාව බලලා යන්න ආවා මිසක් ගෙදර මිනිස්සු එක්ක නෑදෑකම පවත්වන්න ආවෙ නැනෙ.. මමත් මේ මිනිස්සු ඉස්සරහා හොඳ විදියට හැසිරුණොත් ඒ කෙල්ල හිතා ගනියි අර ඔයාගෙ තාත්තා වගේ මමත් එයාට ගොඩක් කැමතියි කියලා.. අපෝ.. මං කැමති නෑ.. රූපෙ ලස්සන තිබුණට මේ වන්නි වනාන්තරේක කෙල්ලෙකුට පැහැදෙන්න මං මෝඩ නෑ පුතා.."

මවගේ වචනයක් වචනයක් ගානේම රිදෙන සිත පාලනය කර ගන්නට ගගුල් දැන සිටියේ නැත.

"මාස නවයක්.. මාස නවයක්.. පන්සලක ඉන්නවා වගේ සැනසීමෙන් හිටියා.. හතර වටේ ම ගිනි තියලා යන්න.. මොකටද ආවෙ අම්මෙ..? මොකටද මෙහෙ ආවෙ..?"

තමාගේ ම පුතුගේ සුසංවේදී හදවත තලා, පාගා, පොඩි කර දමමින් තමාරා සමරසිංහ වියරු සතුටක් අත් වින්දා ය.

"තාරිකාව අර තරම් ඉක්මනට දික්කසාද කරගන්න ඕන උනේ මොකද කියලා මට දැන් හරියට ම ඔප්පු වෙලා ඉවරයි.."

"එනකොට අම්මා දැන් ආවෙ මාව බලන්න නෙමෙයිද.? මේ අවලමේ ගිය වල් බැල්ලියෙක් වෙනුවෙන් අම්මා මොකද ඔය තරමට නටන්නෙ..? තුවාලෙ ගඳයි කියලා මාත් එක්ක ඉන්න බෑ කියලා ඒකි මහ ගෙදර ගියේ නෑනෙ.. ගියෙ තවත් මිනිහෙක් ළඟටනෙ.."

තමාරාට ද තම පුතුට දෙවෙනි වන්නට වුවමනා නොවිණි.

"හරි.. තාරිකා එපා.. හැබැයි මානවිත් එපා.."

ගගුල්ට උත්තර තැන් අමතක විය.

"මොන මගුලක්ද ඔය කියවන්නෙ අම්මෙ.. මේ මිනිස්සුන්ගෙ මනුස්සකම ඔය විදියට බාල්දු කරන්න එපා.. මේ තාත්තයි, දුවයි





දෙන්නා මගෙ පස්ස පැත්ත හේදුවෙ නැති එක විතරයි.. ඒ මනුස්සකමට ඔය විදියට කැත කතා කියන්න එපා.."

"අන්න ඒ හින්දම තමයි.. මමත් මේ ටික කියන්නෙ.. මිනිස්සු තමන්ට ලාභ ප්‍රයෝජනයක් නැත්නම් ඔය විදියට ඔයාව ඔළුවෙ දාගෙන සලකන්න ඕන නෑනෙ.. මොනව හරි ආපහු බලාපොරොත්තුවෙන් තමයි ඔයාව මේ තරම් හොඳට බලාගන්නවා ඇත්තෙ.."

"මහ ලොකු සමාජ සේවිකාව.. මනුස්සකම ගැන දන්න තර ම තමයි ඔය.. විනාශ කළා.. කල්පෙකට පස්සෙ ඇවිත් සේරම විනාශ කළා..!!!"

තවදුරටත් සිතට නැගෙන කෝපය පාලනය කරගෙන හිඳින්නට ගගුල් දැන සිටියේ නැත. මවට පහර දෙන්නට බැරිකමට, ඔහු, පාදය තබාගෙන උන් කුඩා ස්ටූලයට, ඇති වෙර යොදා, රෝගී කකුලෙන් ම පා පහරක් එල්ල කළේ ය.

ආලින්දය දෙසින් ඇසුණු විශාල ශබ්දයත් සමඟ ම, මුළුතැන්ගෙයි ආහාර පිසිමින් උන් මානවීත්, පියාත් දෙදෙනා ම ගැස්සී ගියහ. එතෙක් වෙලා ආලින්දය දෙසින් බහින් බස් වීමක් අපැහැදිලි හඬින් ඇසුණ මුත් සිත රිදවාගෙන උන් පියා හෝ දියණිය ඒ දෙසට අවධානයක් යොමු කළේ නැත. එහෙත්, කිසිවක් පෙරළී යන හඬ ඇසුණු සැණින් පියාත් - දියණියත් දෙදෙනා උනුන් මුහුණු බලා ගත්හ.

"රණ්ඩු කරනවා වගේ තාත්තා.. අපි මොකද කරන්නෙ..? පවුල්වල අම්මලා, පුතාලගෙ ප්‍රශ්නවලට අපි මැද්දට පනින එක හරිද..?"

"අම්මලා පුතලගෙ ප්‍රශ්න මොනවා උනත් ඒ දරුවා ඉන්නෙ අපේ වහල යට පුතේ.. ඒ දරුවව අපිට බාර දීලා ගියේ ඒ දරුවගෙ තාත්තා මිසක් ඔය දැන් ඇවිත් ඉන්න අපි ඇහැටවත් දැකලා නැති



Uploaded By Sanda

අම්මයි කියන මනුස්සයා නෙමෙනෙ.. ඒ හින්දා අපි ගිහිල්ලා බලමු මොකක්ද මේ වෙන්නෙ කියලා.. ඒ ළමයට මොනවා හරි උනොත් ඒකටත් අපි වගකියන්නෙපායැ පුතේ.. කෝ පුතේ.. අත හෝදගෙන එන්න යන්න බලන්න.."

වනිගසේකර මහතා පැවසුවේ තීරණාත්මක හඬකිනි.

මානවීත්, පියාත් ආලින්දයට පිවිසෙන මොහොතේ, එහි වූයේ ගත නිහැඬියාවකි. මානවී බැලුවේ ගගුල් දෙස ය. ඔහුගේ දෑසින් කඳුළු වැක්කෙරෙමින් තිබිණි. පාදයේ වේදනාව දරා ගත නොහැකිව ඔහු පාදය බදාගෙන දඟලමින් සිටියේ ය. තමාරා සමරසිංහ දෙස නොබැලූ මානවී, පෙරළී ගිය ස්ටූලය තිබූ තැනින් තබා, ගගුල්ගේ පාදය ඔසවා ඒ මතින් තැබුවේ ය.

"පාරා ගත්තා නේද තුවාලෙ..? මේ ලේ ගලනවා.. කොච්චර කේන්ති ආවත් මෙහෙම තමන්ගෙන් ම පළි ගන්නවද අයියෙ..? අනේ තාත්තා.. මේ තුවාලෙන් ලේ ගලනවා.. අර ගෝස් කැල්ලකුයි, උදේ හදපු බෙහෙත් එකයි ඉක්මණට අරගෙන එන්නකෝ.."

වාතාවරණය අතිශය සංකීර්ණ වුවත්, මානවීත්, වනිගසේකර මහතාත් හැසිරුණේ හැකිතාක් සන්සුන් විලසිනි.

"මෙච්චර මේ හරියක් වෙලා තියෙද්දිත් පේනවද මේ ගෑනු ළමයගෙ තියෙන මුරණ්ඩුකම.. බලන් ගියා ම මේ ගොල්ලනට කිසි කලබලයක් නැනෙ මං මෙච්චර දේවල් කියලත්.."

ගගුල්ගේ මවගේ මුග්ධ හැසිරීමට මානවී අනුකම්පා කළා ය. අනුවණයන් සමඟ ගනුදෙනු කිරීමේ කලාව ඈ සහජයෙන් ම වටහා ගෙන සිටියා ය.

"අපි කලබල වෙන්නෙ මොනවටද ආන්ටි.. කලබල වෙන්න අපි වරදක් කරලා නැනෙ.. අපිට පුළුවන් විදියට අපි අයියව බලා ගත්තා.. අයියව සනීප කරන්න ලොකු හාමුදුරුවන්ට උදව් කළා.."





පියා ගෙනැවිත් දුන් ගෝස් කැබලි ගෙන මානවී ප්‍රවේසමෙන් තුවාල පිස දමන්නට වූවා ය. ඇගේ දෑත් පුරා රුධිරය තැවරී තිබිණි. ගගුල් වේදනාවෙන් කඳුළු සලමින් සිටියේ ය.

"කිසිම අම්මා කෙනෙක් තමන්ගෙ දරුවෙකුට නොකරන විදියෙ දෙයක්නෙ නෝනා මෙතන මේ කරන්නෙ.. තමන්ගෙ දරුවා සුවපත් වෙනවා දකිනකොට අම්මා කෙනෙක් මොන තරම් සන්තෝස වෙන්න එපාද? ඇයි නෝනා මේ දරුවගෙ හිත මෙහෙම තැලුවෙ..?"

කෝපය සඟවාගෙන වනිගසේකර මහතා විමසුවේ ඉවසීමෙනි.

"කකුල සනීප උනාට වැඩක් නැනෙ මෙයා ආපහු යන්නෙ වෙන ලෙඩක් දාගෙන නම්..?"

මානවීත් - පියාත් දෙදෙනා ම හැකි තාක් ඉවසුව ද, තමාරා සමරසිංහගේ අභූත චෝදනා ඉදිරියේ මුනිවතින් පසුවීම නම් මදක් දුෂ්කර විය.

"නෝනා.. මොනවද මේ ඉවක් බවක් නැතුව කියවන්නෙ.. මොකක්ද දැන් මේ පුතා දාගත්ත ලෙඩේ..?"

තමාරාගේ සිරුර පුරා දිව යන ද්වේෂයේ රුධිරය රත්වී තිබිණි.

"ඇයි මිස්ට වනිගසේකර.. ඔයාගෙ දුව මේ තරම් ඇගේ දාගෙන පුතට සලකන්නෙ.. ඔයාගෙ දූවගෙ හිතේ පුතා ගැන වෙන බලාපොරොත්තුවක් ඇතුව නෙමෙයිද..? මේවා දකිනකොට නම් අපිට හිතෙන්නෙ ම එහෙම තමයි.."

මානවී, වියරු ලෙස සාවද්‍ය සිතාවක් පෑවා ය. ගගුල්ගේ අහිංසක මුහුණ බලාගෙන ඔහුගේ සිත නොරිදවිය හැකි බැවින් ද, තම පියාගේ සදාචාර සම්පන්න භාවයට ගෞරවයක් වශයෙන් ද, තමාගේ ම ආත්ම ගරුත්වය උදෙසා ද ඈ ආයාසයෙන් වුවත් සිතට නැගෙන වදන් පාලනයකින් යුතුව මුවින් පිටතට දැමුවා ය.



Uploaded By Sanda

"අයි.. යෝ.. බයවෙන්නෙපා ආන්ටි.. මමයි, තාත්තයි මේ හැමදේ ම කළේ මනුස්සකමට.. මනුස්සකම ගැන හිතලා අපි මේ කරපු දෙයින් ලැබිච්ච සතුට ඇරෙන්න අපිට වෙන කිසි ම දෙයක් ලැබිලත් නෑ.. බෙහෙත් හදන මාටින් මාමට අන්කල් අතින් මාටින් මාමගෙ අතට ම දුන්න ඒ සල්ලි ඇරෙන්න.. අපි නම් අයියගෙන්වත්, අන්කල්ගෙන්වත් කිසිම දෙයක් අරගෙනත් නෑ.. ආන්ටි ඔය කරපු චෝදනා ටික කරුණාකරල ඉල්ලා අස් කරගන්න.. නැත්නම් ඔය කියපුවට ආන්ටිට ම කවදා හරි දවසක නොසෑහෙන්න පසුතැවෙන්න සිද්ධ වෙයි.."

උවැසියක සේ තමා ඉදිරියේ හිඳ, කිසිදු පැකිළීමකින් තොරව, නිරවුල්ව පැහැදිලිව වචන අමුණන යුවතිය පිළිබඳව තමාරාට පළමු වරට දැනුණේ විස්මයකි.

"අපේ තත්වෙ මොකක්ද..? අපි කවුද කියල අපි දන්නවා ආන්ටි.. උස අතුවල මල් පිපෙන්නෙ පොළොවෙ ඉන්න අපිට කඩන්න නෙමෙයි කියලා මං හොඳට ම දන්නවා.. අපි කඩාගන්න ඕන මල් පිපෙන්නෙ අපේ අත පොවන මානෙ.. උස අතුවල මල් කඩන්න නම්.. අපිත් ඒ ගාණට උඩට යන්න ඕන.. ඔය දෙක ම නැතුව.. උඩ තියෙන මලක් කඩන්න උඩ පැනලා හති වැටෙන මෝඩයෙක් නෙමෙයි මං.. ඒ හින්දා.. ආන්ටි මාව නම් ලෙඩක් ගාණට දාගන්නෙපා..!"

තුවාලයෙන් ගලන ලේ ධාරාව අසීරුවෙන් පාලනය කරගත් මානවී, උදෑසන ගැල්වූ ඖෂධය ම යළි ගගුල්ගේ රෝගී පිටිපතුල පුරා මෘදු ලෙස ආලේප කළා ය.

"නංගී.."

මානවී, හිස ඔසවා, ගගුල් දෙස බැලුවා ය. ඇගේ දෑසේ ඇඳී තිබුණු මෘදු මදහස දිව ඔසුවක් සේ ඔහුගේ ආත්මය පුරා තැවරිණි.

"ඔයයි අන්කලුයි ගොඩක් හොඳයි අයියෙ.. මේ කිසිම දේකට අපි තරහා නෑ.. තාත්තයි, මායි දෙන්න ම තරහා නෑ.. අයියා බය





නොවී ඉන්න.. ඉක්මනට සනීප වෙන්නකො.. ඊට පස්සෙ බලමු.. අනික.. කිසිම හේතුවක් හින්දා.. මේ විදියට තමන්ට රිද්දගන්නත් එපා.. අපිට අපිත් නැති උනොත්.. කවුරුවත් ම නෑ.. අපිට වැඩිය හොඳට අයියා ඒ අත්දැකීම විඳලා තියෙනවනෙ.. ඒ හින්දා.. ප්ලීස් බී කූල් ඩවුන් අයියෙ.. කාම් ඩවුන් ප්ලීස්.."

තමාරා සමරසිංහට දැනෙන්නට වූයේ දරාගත නොහැකි අපහසුවකි. තමා ඉදිරියේ සිංහ සෙයියාවෙන් හැසිරෙන යුවතියක් වංකගිරි වනයකදී ඈ කිසිසේත් ම අපේක්ෂා කරගෙන පැමිණියේ නැත.

මානවී, දණ බිම ඔබ, හිඳ උන් තැනින් නැගී සිටියේ, වඩා උස ස්ටූලය මතින් ගගුල්ගේ පාදය ඔසවා තබමිනි.

"අනේ නෝනා.. මේ දරුවා සනීප උනාට පස්සෙ එක්ක යන්න.. එතනින් අපේ සම්බන්ධකම් ඉවරයි.. නිකම් බොරු ප්‍රශ්න අවුළුවාගෙන දුක් විඳින්නත් එපා.. අහක ඉන්න මිනිස්සුන්ට දුක් දෙන්නත් එපා.. සමාජ සේවය කරන්න නෝනා නෝනලගේ සංගමෙත් එක්ක රට පුරාමත් යනවා නේද..? මනුස්සකම නැතුව ඔය සමාජ සේවය කියන එක කරගන්නත් අමාරුයි නේද නෝනා.. අපේ යුතුකම අවසානෙ දක්වා ම අපි හරියට ඉෂ්ට කරන්නම්.. නෝනා මේ අහක ඉන්න අපිව මේ නැති ප්‍රශ්නවලට පටලවා ගන්න එපා.. මේක බොහොම කාරුණික ඉල්ලීමක්.."

මානවීත්, පියාත් ආලින්දයෙන් පිටව ගියේ, සැබෑ නිර්භය සෙබළුන් මෙන් කය සෘජුව තබාගෙන ය. වරදක් නොකළ ඔවුනට පසුතැවීමට හෝ බියවීමට කරුණක් තිබුණේ නැත. යුද්ධයකට ගොස් අන්ත පරාජයකට ලක්වූ සතුරකු සේ තමාරා සමරසිංහ පසුබා සිටියා ය. නිවස තුළ යළිත් පැතිර ගියේ ඝන නිහැඬියාවකි.

'තාත්තයි දුවයි දෙක ම එකයි.. මං මෙච්චර දේවල් කියලත් එක දගමයක් සැලුණෙ නෑ.. පුදුම රෙස්පෙක්ට් එකක්නෙ මේ කෙල්ල ළඟ තියෙන්නෙ.. එක අතකට.. වැරැද්දක් කරන කෙනෙකුට



Uploaded By Sanda

නම් ඔහොම ඔළුව කෙළින් තියාගෙන කතා කරන්නත් බෑ.. එතකොට.. මට ද වැරදුණේ..? මට.. කොතනද වැරදුණේ..?'

නිසොල්මනේ ගෙවී ගිය කාලය කොපමණදැයි කිසිවකු දැන සිටියේ නැත. ඒ වන විට පියාගේත්, දියණියගේත් මුළුතැන්ගෙයි කාර්යයන් අවසන් වී තිබිණි.

"තාත්තා.. අරගොල්ලො කනවා නම් බෙදලා දෙන්න.. එයාලා කමැති නම් විතරයි.. බල කරන්න යන්න එපා තාත්තා.. කෑම අරින භාජන සේරම මේසෙ උඩ හෝදලා තියලා තියෙනවා.. මං එහෙනම් ටක් ගාලා ලෑස්ති වෙලා යන්නම්.."

"පුතේ මේ වෙලාවෙ ගිහින්..???"

මානවී, තම පියාගේ දෑස ඍජුවම දිස්වන සේ පියාට සම්මුඛව සිට ගත්තා ය.

"එක තත්පරයක්වත් ප්‍රමාද වෙන්න හොඳ නෑ තාත්තා.. ඔළුවට අත හෝදන්න එන උන්ට පාඩමක් උගන්නන්න ම ඕන.. උගන්නලාමයි පස්ස බලන්න ඕන..!!!"

මානවී කීවේ දැඩි හඬිනි. ඒ හඬෙහි වූ අධිෂ්ඨානශීලී බවට වනිගසේකර මහතා පවා තිගැස්සිණි.

"පුතේ..!!!"

"තාත්තා..!!! කොහොමද දවසක.. මගේ තාත්තට මිනිස්සු කිව්වොත්.. මේ අපේ දිසාපති මැඩම්ගෙ තාත්තා, කියලා එහෙම..!!!"

මානවී කියද්දී, වනිගසේකර මහතාගේ දෑසට සැණෙන් කඳුළු අහුරක් ම නැගුණේ ය.

"පුතේ.. මට.. මට..!!!"

"ඒ හීනෙ හරි ලස්සනයි තාත්තා.. ඒ හීනෙ හැබෑ කරගන්න.. අපි දෙන්නා.. ටිකක් දුවමුද තාත්තා..???"



Uploaded By Sanda



වනිගසේකර මහතාගේ දෑසින් කඳුළු දහරාවක් ම කඩා වැටිණි. ඒ කඳුළු දහරාවේ ලියැවී තිබුණේ, ලොව දිනන්නට වෙර දරන දියණියකට ආදරණීය පියෙකුගෙන් ලද නියත විවරණ ය.

හෝරා බාගයකට පමණ පසු ගමනට සූදානම් වූ මානවී, පොත්පත් දැමූ විශාල අත් බෑගය ද, හෙල්මටය ද රැගෙන ආලින්දයට පැමිණියා ය. රෝස පැහැති මල් වැටුණු රැළි සායට, රෝස පැහැති බ්ලවුසයක් ඇඳ, කුඩා කොණ්ඩ කටුවකින් කැරළි ගැසුණු කේශ කලාපය එකතු කොට තමා ඉදිරියට පැමිණි යුවතියගේ සොඳුරු බව තමාරාගේ දෑස පවා තිගැස්සුවේ ය. ගගුල්, ඈ දෙස බැලුවේ බියපත් නෙතිනි.

"න..ං..ගි.. යන..වද..???"

"ක්ලාස් ගිහින් එන්නම් අයියෙ.. දවස ම ක්ලාස් කට් කරගන්න එක අපරාධෙ.. තාත්තා බෙදලා දෙයි.. කන්න හොඳ ද..?"

ගැඹුරු අරුතක් සරල වචනවලින් කියූ මානවී, තමාරා වෙත හැරුණා ය.

"කෑම හදලා තියෙන්නෙ ආන්ටි.. බඩගින්නෙ යන්නෙපා.. කාල ම යන්න.. ආන්ටිලා පරිස්සමට යන්න.. මං ගිහිල්ලා එන්නම්.."

ඊට වැඩිය සමුගැනීමක් නොකළ මානවී, පිහිඹියා ගස පාමුල බංකුවෙහි හිඳ උන් සිසිර දෙස ඇස් කොනින් හෝ නොබලා ම ගොස්, ස්කූටරයට නැගී, එය පණ ගන්වා ගත්තා ය.

මානවී.. යතුරු පැදියට නැගී ඉගිළී ගියේ, තමාරාගේ සිත තුළ ගොඩනැගී තිබුණු උදාරම් බවට දරුණු පහරක් එල්ල කරමිනි. නොදන්නා පසුතැවිල්ලක් පැමිණ තමාරාගේ ළය මත බර අඩි තබා ඇවිදින්නට ගෙන තිබිණි.

හරියට ම ගෙවී ගොස් තිබුණේ.. වසරකුත් මාස දෙකක කාලයක් පමණි. සරණංකර හිමියන්ගේ ඉසිවර දෑතේ බෙලෙන්, වසර පහළවක් පුරා ගඟුල්ගේ සමස්ත ජීවිතය උදුරා ගත් පිටිපතුලේ වූ තුවාල සමූහය සුවපත් වී තිබිණි. අවසන් තුවාල සිදුර ද වැසී ගොස් පිටිපතුල මුළුමනින් ම සමින් වැසී සම්පූර්ණ වූ දා, ගඟුල් සරණංකර හිමියන් ඉදිරියේ හිඳ කුඩා දරුවෙකු මෙන් හඬා වැටුණේ ය.

"මං දැන් හොඳට ම වයසයි දරුවො.. මගේ අතින් තවත් කාටවත් ප්‍රතිකාර කෙරෙන්නෙ නෑ.. ඔය දරුවා තමයි මගේ අවසන් රෝගියා..!!!"

සරණංකර හිමියන්ගේ වදන් සවන් වැකෙද්දී, මානවීගේ දෑසින් ද කඳුළු උතුරා ගලන්නට විය.

"පොඩි දූව.. ඔහොම කම්පා වෙනවා දකින්ට මං මනාප නෑ.. මට දැන් අවුරුදු අසූ පහක්.. ඉක්මනින් ම මොහොතක මේ ආයු සංස්කාරය අත් අරින්ට උවමනයි දරුවෝ.."

මානවී, ගඟුල් සමරසිංහ මහතා, වනිගසේකර මහතා ආදීහු හීතියෙන් සේ ම ශෝකයෙන් බලා හිඳියදී, සරණංකර හිමියන් පමණක් උපේක්ෂා පෙරදැරිව නිවන බිඳිමින් උන්හ. උන් වහන්සේගේ ශ්‍රී මුවින් ගිලිහුණු බොහෝ වදන් අදටත් මානවීට සිහිනයකි.

"පොඩි දූව.. මං පොඩි දූවගෙ වේල පත්කඩේ බැලුවා.. මේ.. මම පොඩි දූවගෙ අනාගතේ බලන අන්තිම ම වතාව දරුවො.. වසරක දෙකක ඉදිරි කාලය බොහෝ ම ශුෂ්කයි.. ගමන් කරන්න





තියෙන මාර්ගය කටුකයි.. නමුත්.. ගල් බොරළු මාවත කෙළවර ක්ෂේම භූමිය මුණ ගැහෙනවා.. ආත්ම සංයමය බොහොම වැදගත්.."

උන් වහන්සේ එදින අන් කවරදාවත් නොවූ විරූ තරමේ දෑ දෙඩූහ.

"ඉදිරි අවුරුදු පහක විතර කාලය පොඩි දූවට බොහොම අවිවේකයි.. පොඩි දූව වෙදකම ශාස්ත්‍රයක් විදියට ප්‍රගුණ කරන්ට පටන් ගන්නෙ වයස අවුරුදු තිස් පහෙත් විතර.. ඒ වකවානුව වෙනකොට දරන තානාන්තරෙත් එක්ක පොඩි දූව මහා කීර්ති කදම්භයක් අත්පත් කරගන්නවා.. එදාට.. මං පූර්වයේ කියල තිබ්බව අර මහා වෙද පරම්පරාව ආරම්භ වෙනවා.."

සරණංකර හිමියන්ගේ විශ්වසනීය වදන්, මානවීට නම් පද ගළපාගත නොහැකි ප්‍රහේලිකාවක් ම වූයේ ය.

"මේ පුතා.. අපිට මුණ ගැහුණෙ.. බොහොම දෛවෝපගත ආකාරයටයි පොඩි දූව.. මගේ අවසන් රෝගියා වගේ ම.. පොඩි දූවගෙ පළමු රෝගියාත් සංසාර චක්‍රයේ අපූරු හමුවීමක් වෙනවා දරුවෝ.."

මානවී, වර්තමානයේ හිඳ ඒ අතීතය සිහිපත් කළේ කඳුළු වැකුණු දෑසිනි.

"දරුවො.. මේ දරුවගෙ රෝගය.. නිට්ටාවට සුවයි.. වැරදීමකින් වත්.. අවුරුදු දහයක් පහළවක් ගතවෙලා ගිහින් හරි.. ආයෙමත් රෝගය ඉස්මතු උනෝතින්.. මෙන්න මේ පොතේ කළ යුතු ප්‍රතිකාර වට්ටෝරුව අනුපිළිවෙලින් සහපිළිවෙළින් සටහන් කරලා තියෙනවා.. මේ පොත ප්‍රවේසමට අරන් තියාගන්ට පොඩි දූව.."

සරණංකර හිමියන් පිළිගැන්වූ වෛද්‍ය සංග්‍රහය දෝත පා පිළිගත් මානවී, සරණංකර හිමියන්ගේ දෙපා මුල වැටී හඬා වැටුණා ය.

"මේ අල්මාරි දෙකේ ම දමලා තියෙන්නෙ වෙද පොත් පොඩි



Uploaded By Sanda

දූව.. මේ පොත් ටික සුරක්ෂිතව ගෙදරට ගෙනියන පිළිවෙළක් හදාගන්ට.."

සරණංකර හිමියෝ බොහෝ දෑ කෙටියෙන් පහදන්නට වූහ.

"ඔහොම වැළපෙන්ට හේතු කාරණා නෑ නොවැ පොඩි දූව.. අර්හත්භාවයෙන් නිවීම පසක් කරගන්න තාක් කල් සංසාර ගමනෙ මගියො වෙච්ච අපි මුණ ගැහෙන එක නවත්තන්ට බැහෙ පොඩි දූව.. ඒ නිවීම අපිට තව දුරයි දරුවො.. අපි තවත් භවේකදි මුණ ගැහෙයි.."

හරියට ම.. ඉන් තෙමසක කාලයකට පසුව.. සරණංකර හිමියෝ අපවත් වී වදාළහ. උන් වහන්සේ තම දේහය, මරණින් මතු වෛද්‍ය විද්‍යාලයකට පවරා දී තිබූ බැවින්, උන් වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳ අවසන් කටයුතු කිසිවක් සිදු කෙරුණේ නැත.

ගොරතර සසර කතරට පැයූ සූර්යාලෝකයක් බඳු උත්තම ඉසිවර දෑසක් එසේ පියවී ගියේ ය. එදින තරම් සංවේගයෙන් වැළපුණු දිනයක්, මානවීගේ දිවියේ පෙර කිසිදා හමුවී තිබුණේ නැත.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

වසරකුත් තෙමසක කාලයක් මුළුමනින් ම ගෙවී ගිය පසු, ඒ දෛවෝපගත දිනයේ.. ගගුල් සූදානම් වූයේ එතරම් කාලයක් තමාට සෙවණ දුන් වනිගසේකර නිවසත්, තමා රැක බලා ගනිමින් සැනසූ පිය - දියණි ඉසිවර දෑත් අතහැර, තමාට උරුම ලෝකය වෙත පිය මනින්නට ය. සමුගෙන යන්නට පළමුව ගෙවී ගිය පෙර දින රාත්‍රිය, අතිශය තීරණාත්මක රාත්‍රියක් වූ අතර, ගගුල්ගේ ආදරණීය හදවත මහ සමුදුරක් සේ සෙනෙහසින් කැළඹුණ ද, මානවීගේ ළතෙත් මෘදු හදවත, මහමෙරක් සේ නොසැලී සිටින්නට වෙර දැරුවේ ය.

"නංගි.. මම මේ අන්තිම වතාවට අහන්නෙ.. මේ තරම්.. මේ





තරම් ඔයාට ආදරේ කරන මාව අමතක කරලා.. හිත හදාගෙන ජීවත්වෙන්න ඔයාට පුළුවන්ද නංගි..???"

ප්‍රේමයෙන් ආතුර ගගුල්ගේ තුරුණු දෑසින් කඳුළු වෑහෙමින් තිබිණි.

"ඔයාගෙ අම්මා.. මගෙ හිත කෑලි කෑලිවලට කැඩුවා අයියෙ.. ඒක අමතක කරන්න මට තාම බැරි උනා."

තමාගේ දෑස තුළ කඳුළකට ඉඩ නොහදන්නට මානවී ප්‍රවේසම් වූවා ය.

"එතකොට.. මගෙ ආදරේ..??? මගෙ තාත්තගෙ ආදරේ.. දුක හිතෙන්නෙ නැද්ද නංගි ඔයාට..?"

මානවීගේ ළය තුළ වන අධිෂ්ඨාන පාරමිතාවක බල මහිමය ගගුල් පළමු වරට හඳුනා ගත්තේ ඒ මොහොතේ ය.

"මල පිපිලා තියෙන්නෙ.. ගොඩක් උස මුදුනක අයියෙ.. මං බලන්නම් ඒ මල නෙළන්න මට ළංවෙන්න පුළුවන්ද කියලා.."

නොකියා, නොපෙන්වා, සගවාගෙන උන්.. ඇගේ හදවතේ අංශු මාත්‍රයක්.. ඒ අවසන් රාත්‍රියේ ඔහු හඳුනා ගත්තේ ය. ඔහුට උවමනා වූයේ, ඈ වැළඳගෙන හඬා වැටෙන්නට ය. එහෙත්, පවිත්‍ර ම යුවතිය, ආත්මාභිමානය ඉදිරියේ ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී බලා සිටියා ය.

"මානවී.. නංගි.. පැත්තකින් තියන්න මගෙ මේ ආදරේ.. ඔයාගෙ අත් දෙකින්.. මට ආපහු මගේ ජීවිතේ ගෙනත් දුන්න එකේ.. වන්දිය ගෙවන්න මට අවස්ථාවක් දෙන්න නංගි."

තමාගේ සිත දියාරු වේ යැයි අසීමිතව බිය ගත් යුවතිය, කවුළුවෙන් ඈත අනන්තයෙහි දිදුලන තාරුකා මල් ගොමුව වෙත දෑස යොමා ගෙන උන්නා ය.



Uploaded By Sanda

"කාලය.. ඒ අවස්ථාව හදලා දෙයි ද කියලා.. අපි ටිකක් බලාගෙන ඉමු අයියෙ.. ඔයාගෙ හදවත ඇතුළෙ මං ජීවත් වෙන්නෙ කොහොමද කියලා බලාගන්න මට තවත් කාලයක් ඕන වෙයි අයියෙ.. සමහර විට.. ඒ කාලෙ ගතවෙනකොට.. ඔයාගෙ අම්මා කුඩුපට්ටම් කරපු මගෙ හිතත් හැදිලා තියෙයි.."

දෙකම්මුල් තෙමාගෙන ගලා ගිය අලුත් කඳුළු දෙපේළිය.. මානවී සැණෙකින් පිස දමා ගත්තා ය.

"හිත හංගා ගත්තට.. ඔයා මට ආදරෙයි නංගි..!"

අනන්තයෙන් දෑස මුදවා ගත් මානවී, සෘජුව ම ගඟුල්ගේ දෑස දෙස බැලුවා ය.

"ඔව් ඇත්ත.. ඔයා ගැන ආදරයක්.. ගෞරවයක්.. සෙනෙහසක් නැත්නම්.. මට ඔයා ළඟ මෙහෙම වැටීගෙන ඔයා වෙනුවෙන් වෙහෙසෙන්න බෑනෙ අයියෙ.. මං ඔයාට ආදරෙයි තමයි.. ඒත්.. ඒක.. විවාහයකින් බැඳෙන්න ඕන වගේ පටු සිතිවිල්ලකට එහා ගිය ගැඹුරු උත්තරීතර බැඳීමක්.."

ගඟුල් කිසිවක් ම නොකියා, දෑස තරයේ පියා ගත්තේ ය. හදවතේ උපදින සෙනේ සිතිවිලි සයුර සමඟ පොර බැදීම ඔහුට පහසුවක් වූයේ නැත.

"අයියෙ.. කෝ අර ලොකු ට්‍රැවලින් බෑග් එක දෙන්න.. මං අල්මාරියෙ තියෙන ඔයාගෙ ඇඳුම් ටික පැක් කරලා දෙන්නම්.."

"එ.. පා..!!! මට මේ ගෙදරින් කිසිම දෙයක් ගෙනියන්න බෑ නංගි.. කවද හරි දවසක.. මං මේ ගෙදරින් ගෙනියනවා නම්.. ගෙනියන්නෙ... ඔයාව විතරයි මානවී.. මාව සුවපත් කරපු ලොකු හාමුදුරුවන්.. මම ගෙනියන්නෙ ඔයාව විතරයි..!!!"

"අ..යි..යෙ..!!!"

"මොකුත්ම කියන්නෙපා තවත්.. මොකුත් ම එපා.. ඔයාගෙ



Uploaded By Sanda



අල්මාරියෙ එක පැත්තක්.. හැමදාම මගේ වෙන්න ඕන නංගි.. ඔයා වෙන කාට හරි අයිති උනොත්.. මට ජීවත් වෙන්න බැරිවෙයි මානවී.. එහෙම උනොත් නම්.. මට ජීවිතයක් නැති වෙයි.."

ගඟුල් උමතු වූවකු මෙන් කියවාගෙන යන්නට වූයේ ය.

"කවද හරි.. ඔයාට මාව දාලා වෙන කවුරු හරි ළඟට යන්න ඕන උනොත් හරි.. සිද්ධ උනොත් හරි.. මම මේ දාලා යන සේරම එකතු කරලා ගිනි තියලා දාන්න නංගි.."

මානවී, කඳුළු අතරින් වුවත්, මදහසක් නගා ගත්තා ය.

"මොනවට ගිනි තිබ්බත්.. මතකයට ගිනි තියන්න පුළුවන්ද අයියෙ..??? අපිට අයිති මේ මතකය.. අපිව ගිනි තියයි අයියෙ.."

රාත්‍රිය ගෙවී ගියේ නිදි නොලබා ම ය. ගඟුල් කැඳවා ගෙන යාමට සමරසිංහ මහතා පැමිණියේ උදෑසන අටට පමණ ය. පියකු සේ තමාට සෙනෙහස දක්වන ගඟුල්ගේ පියා දුටු මතින් මානවීට ඉකි ගැසී හැඬිණි.

"මගෙ පුතා ළඟ.. බොරුවට මුරණ්ඩුකම් පෙන්නුවට.. ඔයාගෙ හිත මට පේනවා මගෙ දුව.. කවද හරි.. මගෙ ගෙදර.. මගෙ දූව වෙන්නෙ ඔයාමයි පුතේ.. නීතියෙන් මගේ ලේලි කරගෙන ඔයාව මේ ගෙදරින් ගෙනියන්න.. මං පෙරහැරකින් ආයෙත් එනවාමයි පුතේ.."

සමරසිංහ මහතා කීවේ, මානවී වැළඳගෙන ඇගේ නළලත සිපගෙන ය.

"ඔය කියන ලෝකෙ.. මට උරුම නම්.. ඒ ලෝකෙට එන්න දෛවය මට ඉණිමං හදයි අන්කල්.. බලමු.. එහෙම වෙයිද කියලා.."

මානවී, සමරසිංහ මහතාගේ දෙපා මුල වැටී, වැඳ, ආයාසයෙන් හිත අල්ලාගෙන නැගී සිටියා ය.

"අනේ අන්කල්.. ගගුල් අයියව ඇස් දෙක වගේ බලාගන්න.. හිටියා වගේ ම.. හෙවණැල්ල වගේ,, අයියගෙයි, අන්කල්ගෙයි ළඟින් ඉන්න.."

මානවී, රත්නජීවගේ පවා දෙපා අල්ලා වැඳ වැටුණා ය. ඇගේ සෙනෙහස ඉදිරියේ නොහැඬුවෝ නොවූහ.

"මං.. මගේ පණ කියලා හිතාගෙන ඒ දෙන්නව බලාගන්නං දුව.. දුවගෙ මනුස්සකමට සලකන විදියක් මට නෑ වෙන.."

උදාවී තිබුණේ.. ජීවිතයේ කිසිදා උදා වී නොතිබුණු තරමේ අතිශය සුසංවේදී මොහොතකි. මානවී සිටියේ සේවා ස්ථානයට යන්නට සූදානම් ව ය. දෛවෝපගත ලෙස ඈ හැඳ සිටියේ ඔවුන් හමුවූ පළමු දිනයේ හැඳ උන් දේදුනු වර්ණ ඔසරිය ම ය.

"දේදුන්නක් වගේ ලස්සන ජීවිතේකුත් මම ඔයාට ගෙනත් දෙනවා නංගි.. ඔයාට බෑ.. දේදුන්නක් වගේ මෙහෙම මගේ ඇස් ඉස්සරහින් පෙනිලා නොපෙනිලා යන්න.."

මානවී, දෑසට උනා එන කඳුළු වළක්වා ගන්නට දැන සිටියේ නැත. දෑසින් ගලා යන කඳුළු දෙපේළියට එලෙස ම තිබෙන්නට ඉඩ හළ මානවී, සෘජුව ගගුල් දෙස බැලුවා ය.

"මට ඔයා යන හැටි.. බලන්න බෑ අයියෙ.. ඔයාට කලින් මං යන්නම්..!"

කියාගත යුතු අනන්ත අප්‍රමාණ දෑ හදවත තුළ දෝර ගලමින් තිබිය ද, මානවී, ගගුල් දෙදෙනා ම ළය පැලී යන තරමේ සොවකින් ගල් ගැසී උන්හ.

"ලොකු හාමුදුරුවො කිව්ව විදියට ම.. කිව්ව දේවල් පිළිපදින්න අයියෙ.. මෙහෙන් ගියා කියලා.. කන බොන දේවල් වෙනස් කරන්න එපා.. කට දිව පිනවනවට වඩා.. මේ නිරෝගී සුවය සම්පතක් නේද අයියෙ.. කකුල් දෙක පොළොවට තියන් කෙලින් හිටගෙන ඉන්න කොට.. හරියට රාජ කුමාරයෙක් වගේ.. ඔය සුව පහසුව





නැතිවෙන කිසිම දෙයක් කරන්න හිතන්නවත් එපා අයියෙ.. පරිස්සමට ඉන්න.. අයියගෙ යාළුවො ටික මතක් කළා කියන්න.. මල්ලියි - වයිෆුයි දෙන්නත් මතක් කරන්න.. සයුරුයි, මල්කියි හරි ම හොඳයි.. අයියගෙ යාළුවන්ගෙනුත්.. හසිත් අයියව විශේෂයෙන් ම මතක් කළා කියන්න.. හසිත් අයියා මහ පුදුමාකාර හොඳ ගතිගුණ තියෙන යාළුවෙක්.."

"හසිත් ඔයාට කතා කරයි නංගි.. හසිත්ටත් වෙන සහෝදර සහෝදරියො නැති හින්දා වෙන්න ඇති ඔයාට පුදුම ආදරයක් තියෙන්නෙ.."

"යන ගමන්.. අක්කිලාගෙ ගෙදරට ගිහින් යන්න අයියෙ.. අක්කිත් ඔයාට ගොඩක් ආදරෙයි.."

මානවී, දෙකම්මුල් දිගේ රූරා වැටෙන කඳුළු දෙපේළිය, පිටත්ලෙන් පිස දමා ගත්තා ය. තවත් පමා වුවහොත්, දමා යා නොහැකි, හදවත නාය යන වේදනාවකින් තමාට පීඩා විඳින්නට සිදුවන බව මානවී දැන සිටියා ය.

"ඒ රාජ කුමාරයට පණ දුන්නෙ.. මේ රාජ කුමාරි.. එයා නැතුව මට ජීවත්වෙන්න බෑ..!!"

මානවී, ගගුල්ගේ දෙපා මුල වැඳ වැටුණා ය. වෙනදා මෙන් ඇගේ හිස මත සුරත තබා ආශිර්වාද නොකළ ගගුල්, දෙඋරෙන් අල්ලා ඈ ඔසවාගෙන, දෑතින් ම ළයට තුරුළු කර ගත්තේ ය. මානවීගේ හිස මත මුහුණ ඔබා ගත් ගගුල්ගේ හැඬුම මානවීගේ හැඬුම පරාද කළේය.

"මාව ඔහොම දාලා යන්න එපා නංගි.. මට ඔයා නැතුව ජීවත්වෙන්න බෑ.."

ගගුල්ගේ පෙම්වන්ත සිතට යටින් වන, තමාගේ ලෝකයේ රික්තයන්, මානවීගේ හදවතට සැණෙන් ගොඩ වූයේ ය. හැඟීම්වලට වහල් නොවූ ඈ, වහා ම ගගුල්ගේ දෑත් අතරින් මිදුණා ය.



Uploaded By Sanda

"පරිස්සම් වෙන්න අයියෙ.. බුදු සරණයි.."

එපමණක් කියූ ඈ, තම පියාගේ දෙපා වැඳ, ඉක්මන් ගමනින් ගොස් ස්කූටරයට නැගුණා ය. පමණටත් වඩා ඉක්මනින් හිස ආවරණය පැළඳ ගත් ඈ, වහා ම එය පණ ගන්වාගෙන, වැරදීමකින් හෝ යළි හැරී නොබලා වේගයෙන් ඉදිරියට ඇදුණා ය.

සෙල් පිළිමයක් සේ, මානවී පිටවී යන දෙස ඔහේ බලා සිටි ගඟුල්, අවසඟව මෙන් යළිත් අසල ම වූ අසුනකට කඩා වැටුණේ ය.

"ඔච්චර දුක් වෙන්නෙපා පුතා.. මගෙ දුව එච්චර දැඩි හිතක් තියෙන කෙනෙක් නෙමෙයි.."

"ඒ උනාට.. මේ උඩරට කෙල්ලො.. හරි ආඩම්බරයි අන්කල්.. ගොඩක් හොඳ උනාට... ඒ කෙල්ලන්ගෙ හිත්වල හංගාගත්ත මහා අහංකාරකමක් තියෙනවා.. ආපහුවත් නොබලා නංගි යන්න ගියේ.. අන්න ඒ අහංකාරකමට.."

ගඟුල්ගේ සුසුම් කාගේත් ළයට බර වැඩි වූයේය.

"මේ හැම දෙයක් ම දෛවයේ තීන්දු පුතේ.. අපිට ඒවා ගැන කලින් දැනගන්න බෑ.."

"අන්කල්.. මට.. මානවී නැතුව.. ජීවත්වෙන්න බෑ.. ප්ලීස් අන්කල්.. නංගිට ඒක තේරුම් කරලා දෙන්න.."

"නොපෙන්නා හිටියට නංගි ඒක දන්නවා පුතේ.. අපි බලන් ඉම්මු.. ලොකු හාමුදුරුවො කිව්වනෙ අපි කාටවත්ම නරකක් නපුරක් සිද්ධ වෙන්නෙ නෑ කියලා.."

වනිගසේකර මහතා උත්සාහ කළේ ම, තරුණයාගේ රිදුණු සිත සුවපත් කරන්නට ය.

එතෙක් වේලා නිහඬව උන් සමරසිංහ මහතා ද, හිඳ උන් අසුනින් නැගී සිටියේ ය.





"අපි මේ දරුවන්ව කොහොම හරි එකතු කරන්න ඕන පියල්.. අපි අතරෙ අවදි වුණේ සංසාරගත බැඳීමක්.. ඒ බැඳීමෙන් මිදිලා අපිට ජීවත්වෙන්න අමාරුයි.."

"ඒක නම් සහතික ඇත්ත සර්.. පුතා නැතුව මේ ගෙදර ඉන්න වෙනවා කියලා මතක් වෙනකොටත් මඟෙ පපුව පැලෙන්න එනවා සර්.."

පියවරුන් දෙපළ ද සහතිකෙන් ම හැඬුවෝ ය. සමුගැනීම කෙතරම් වේදනාකාරී වුවත්, ඔවුනට සමුගැනීමට සිදු විය. වසරකුත් තෙමසක කාලයක් ඉක්ම ගිය තැන, ගඟුල් සමරසිංහ තමාගේ සුපුරුදු ලෝකය වෙත පිය මැන්නේ දෙපයිනි. කිහිලිකරු, රෝද පුටු වාරුවෙන් සරණංකර හිමියන්ගේ ඉසිවර සෙවණට පැමිණි ගඟුල් නික්ම ගියේ, කායිකව පූර්ණ වශයෙන් සුවපත් තරුණයකු ලෙසිනි.

ගඟුල් නව ජීවිතයක් ලද තරුණයෙකු ලෙස අගනුවරට නුදුරු හෝමාගම ප්‍රදේශයේ පිහිටි තම නිවසට පා තබද්දී, ඊට ගව් බොහෝ ගණනාවක් දුරින් පිහිටි, සුවපත්භාවය උදෙසා ඔහු වෙත දිගු කළ ඉසිවර දෑත් ඇත්තෝ, හුදෙකලාවේ සුසුම් ලන්නට වූහ. වසරකුත් තෙමසකට පසුව, තම තමාට හුරු පුරුදු ලෝක වෙත ගමන් කළ වනිගසේකර මහතාත්, මානවීත් නිවසට ගොඩ වූයේ, එක ම වෙලාවක ය.

"ගෙදර පැත්ත පළාතෙ ඉන්න හිත දුන්නෙ නෑ පුතේ.. මං ගියා වත්තෙ ගම්මිරිස් වැල් ටික වටේ සුද්ධ කරලා දාලා එන්න.."

"අපි ඉතින් ආපහු අපේ ලෝකෙට එන්නෙපායැ තාත්තා.. මට නම් වෙලාව ගත උනා දැනුණෙ නෑ තාත්තා.. අර කන්ද නාය ගිය තැන තිබුණ ගෙවල් දෙක හදන්න තැනක් බලන්න යන්න දිසාපතිතුමා ආවා.. ඒක බලන්න අපි රාස්ස කැලේ මූකලානට ගියා.. පහළ බෝවිටියාව ගමට ළඟින් තියෙන රිසවේෂන් කැල්ලෙ ඒ ගෙවල් දෙක හදලා දෙන්න අවශ්‍ය දේවල් ලෑස්ති කරලා



Uploaded By Sanda

දෙන්නම් කියලා දිසාපතිතුමා කිව්වා.. ඉඩම වෙන් කරගන්න වැඩේ සර් කරලා දෙන්නම් කිව්වා.. ඕන කරන සල්ලි ගෙවයි.. ගෙවල් හදාගන්න වැඩ ටික ශ්‍රමයෙන් කරගන්න අවශ්‍ය දේවල් ටික ලෑස්ති කරන්න කියලා මට කිව්වා.."

මානවී, ගඟුල් නික්ම ගිය පළමු දිනයේ ම, තමාගේ ප්‍රකෘති ලෝකයට පැමිණ සිටියා ය. වනිගසේකර මහතා තම දියණිය දෙස බැලුවේ අදහා ගත නොහැකි විස්මයෙනි.

"පුතේ.. අර දරුවා.. ගියා ම.. පාළු නැද්ද පුතේ..? මට නම්.. ඉන්න බැරුව ගියා.. දවසටවත් මං ගෙදර ආවෙ නෑ.."

මානවී, තම පියා දෙස බැලුවේ අනුකම්පාවෙනි. හැඟීම් හි වහල්භාවය යනු, සෑම විටෙකම මිනිසා වෙත ගෙන එනුයේ දුක ම බව මානවී දැන සිටියා ය.

"තාත්තා.. ගඟුල් අයියා එයාට අයිති ලෝකෙට යන්න ඕන.. අපි අපේ ගෙදර.. අපේ ජීවිතේ ගත කරන්න ඕන.. ඒගොල්ලො වෙනුවෙන් අපි මාස ගාණක් අපේ හැමදේම කැප කළානෙ තාත්තා.. ඒත්.. දැන් අපිට ආපහු අපේ පුරුදු ජීවිතේට එන්න සිද්ධ වෙනවා.."

මානවී, පියා අත පිළියෙළ කළ තේ කෝප්පය තබමින්, සන්සුන්ව තෙපලුවා ය.

"ඔයා නැතුව ජීවත් වෙන්න බෑ කියලා අර දරුවා හැපි හැපී ම කිව්වනෙ පුතේ.."

වනිගසේකර මහතාගේ පසුතැවිල්ල පිරි හඬ මානවීගේ දෙතොලතර ඇන්දේ මලානික සිනාවකි.

"අවුරුදු පහළොවක් තිස්සෙ එයාට නැති උන ජීවිතේ වෙනුවෙන් මාස පහළොවක්.. එයා.. ලෝකෙන් ම වෙන්වෙලා මෙහෙ ගත කළේ, වෙනස් ජීවිතයක් තාත්තා.. ඒ ජීවිතේදි එයා ගෑනු ළමයෙකුට ඇසුරු කළේ මං විතරයි.. ගඟුල් අයියගෙ හිතේ මං ගැන තියෙන පැහැදීම ආදරේ කියලා මං කොහොමද විශ්වාස





කරන්නෙ තාත්තා..? වෙන කවුරුවත් ම නැතුව මං විතරක් ම හිටපු හින්දා.. ඒක මං ගැන ඇති උන තාවකාලික ඇල්මක් හරි ආකර්ෂණයක් හරි වෙන්නත් පුළුවන් නේද තාත්තා..? තව ගෑනු ළමයි දකිනකොට.. තේරා ගැනීම් ගොඩක් තියෙනකොට.. මං ගැන ඇති උන ඒ හැඟීම් බැඳීම් දියවෙලා ම යන්නත් පුළුවන් නේද.. යුතුකම් ඉෂ්ට කළාට.. මං එයාට අනේ දුරින් හිටියෙ.. අන්න ඒ ඇත්ත තේරුම් ගත්ත හින්දා තාත්තා.."

තම දියණියගේ වදන් අදහාගත නොහැකිව, මානවීගේ පියාගේ දෑස විමතියෙන් විසල් වී තිබිණි.

"පුතේ..!!!"

"ඔච්චර පුදුම වෙන්නපො තාත්තා.. මම කිව්වෙ ඇත්ත.. කාලයට ඉඩ දීලා ටිකක් බලන් ඉමු තාත්තා.. ඇත්ත මොකක්ද කියලා හරියට ම අඳුන ගන්න අපිට ටික කාලයක් බලන් ඉන්න ම වෙනවා.."

මානවී, තෙරක් නොපෙනෙන අනන්තයක දෑස රඳවාගෙන හෙමින් සීරුවේ තමාගේ තේ කෝප්පය තොල ගාන්නට වූවා ය.

මානවී, ඒ රාත්‍රියේ යළි එතෙක් දිනක් ගඟුල්ගේ හරිහරණයට වෙන් කොට තිබූ, තමාගේ කාමරයට පිවිසියා ය. හාත්පස ඔහුගේ සුවඳ රැඳී තිබුණත්, අන් සතු උයන පිපි මලකට පෙම් බඳින්නට තරම් ඇ බාල බොළඳියක නොවුණා ය.

'නීතියෙන් වෙන් උනත්.. එයා තාරිකාගෙ හිටිය හස්බන්ඩ්.. එයා.. අනුන්ට අයිති වෙලා හිටිය පිරිමියෙක්.. මට ආදරෙයි කියලා දෙවියන් බුදුන් සාක්ෂි කරලා කිව්වත්.. පරිසරයත් එක්ක එයාගෙ හිත වෙනස් වෙයිද කියලා කවුද දන්නෙ..?'

මානවීගේ දෑසේ කඳුළක් නළියන්නට වූයේ ය. ඇ, හිද උන් පුටුවෙන් නැගිට ගොස්, ගඟුල් පරිහරණය කළ, ඇඳ ඇතිරිලි, කොට්ට උර, දොර ජනෙල් තිර රෙදි ආදිය ඉවත් කරන්නට වූවා



Uploaded By Sanda

ය. තම දියණියගේ ක්‍රියාව දුටු වනිගසේකර මහතාගේ ළය කිරි ගැසිණි.

මැදියම් රැයේදී දියණියගේ කාමරය දෙසින් ඇසුණු ඉකිබිඳුම් හඬ, වනිගසේකර මහතාගේ දෑස ද කඳුළින් තෙමාලූයේ ය.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

අනපේක්ෂිත මොහොතක ලද මිතුරාගේ දුරකථන ඇමතුමෙන් හසිත් කලබල වූයේ ය.

"මචං.. ගගුල්.. මොකෝ බං.. මේ යක්කු ගස් නගින වෙලාවෙ..?"

"උඹේ නින්ද දාපං පැත්තකට.. අහගනිං මේ ගුඩ් නිව්ස් එක..!"

මිතුරාගේ උද්දාමයෙන් පිරුණු හඬ හසිත්ගේ නින්ද පළවා හැරියේ ය.

"කියපං.. මොකක්ද.. මේ රෑ දොළහට මාව ඇහැරවපු ත්‍රිල් නිවුස් එක..?"

"මානවීට උඩදුම්බර සහකාර ප්‍රාදේශීය ලේකම් විදියට අපොයින්මන්ට්ස් හම්බ වෙලාලු.."

හසිත්, නිදි යහනින් නැගිට්ටා නොව බිමට පැන්නේ ය. ඔහුගේ ළයෙහි පිදුණනු සොම්නසට නිම් හිම් නොවිණි.

"මචං මරුනෙ.. ඔය දීලා තියෙන්නෙ දෙන දෙයියො අත පිරෙන්න ම.. දැන් හරිනෙ.. දීපං ග්‍රෑන්ඩ් පාටියක් අපිට.. මං හෙට උදේ ම අපේ උන් සේරටම දෙනවා මේ නිවුස් එක.."

ඒ අතිශය ප්‍රීතිදායක මොහොතේ වුවත්, ගගුල්ගේ මුවින් ගිලිහුණේ දිගු සුසුමකි.

"පාටි එකක් දෙනවා.. කවද හරි ඔය කෙල්ල මගේ ළඟට



Uploaded By Sanda



ආව දවසක.. ඔය ආඩම්බරකාරිට මගේ ආදරේ තාමත් විශ්වාස නෑ හසී.. මගේ පණ තියෙන්නෙ එයා ළඟ කියලා ඒ ආඩම්බරකාරිට තාමත් තේරුම් ගන්න බැරි උනේ ඇයි මචං..? මොන කරුමයක්ද මේ..? කෙල්ලොත් දැක්කා.. ඔහොම ගල් හිතක් තියෙන කෙල්ලෙක් නම් දැක්කෙ නෑ.."

"අනේ මැට්ටො.. ඒකි උඹේ පස්ස පැත්ත හේදුවෙ නැති ටික විතරයි.. ගල් හිතකින් නම් ඒකිට ඒ තරම් ආදරෙන් උඹව බලාගන්න පුළුවන්ද..? ඒ ගල් හිත මලක් වෙන හැටි ඉක්මනට ම බලාගන්න හැකි.. කෙල්ල ඔය තරමට අප්සෙට් උනේ උඹේ අම්මගෙ ලූස් ටෝක් වලින්.. අපි කොහොම හරි මානවීගෙ හිත හදමු මචං.."

හසිත් කීවේ, තීරණාත්මක හඬිනි.

"මං ඇවිල්ලා.. අවුරුද්දයි මාස අටක් ගියා.. හිත හදාගන්නවා නම් හදාගන්න.. මානවීට ඒ ගන උන කාලෙ ඉඳිද මචං..?"

මිතුරාගේ දුක්බර හඬ දරා ගැනීම හසිත්ට පහසු වූයේ නැත. ආදරයක් හදවතේ පුරවාගෙන නිරපරාධේ දුක් විඳින තම මිතුරා කෙරෙහි හසිත්ගේ සිත තුළ උපන්නේ විසල් වේදනාවකි.

"බය නොවී හිටපං මචං.. මානවී ගොඩක් හොඳ කෙල්ලෙක්.. ඒකි උඹව දාලා වෙන කෙනෙක් ළඟට යන්නෙ නෑ.. මට ඒක සීයට දාහක් ෂුවර්.."

"එහෙනං ඇයි මචං.. මෙලෝ දෙයක් ගාණක් නෑ වගේ ඔහොම ඉන්නෙ.."

"ඒ.. ඒකිගෙ හැටිනෙ බං.. මේ වෙලාවෙත් මෙලහකට සිංදුවක් කිය කියා ඇති.. හිටපංකො මං ඔය උප දිසාපති මැඩම්ට දැන්ම කෝල් එකක් ගන්නකල්.."

හසිත්ගේ වදන් ගගුල්ගේ ළයෙහි වූ බරින් විශාල අර්ධයක් නිදහස් කළේ ය.

- කලක් ඇවෑමෙන් පෙරුම් පුරා
සසැඳෙන පිවිතුරු සිතක් සොයා
සසර ගෙවා ආ පැතුම් පුරාගෙන
ඔබ හමුවේ නව කෙනෙක් උනා..

කලක් ඇවෑමෙන් පෙරුම් පුරා
මා සිටියා මග දෙනෙත් අයා..
සිහින විමානෙන් ඔබ ඇවිදින් අද
මා හදවත මල් ලොවක් කළා..

ජීවිතයක සෙනෙහස බැඳිලා
ආදරයක සෙවනැලි අතුරා
මා හදවත විසිතුරු කරලා
ඇඳි සිතුවම් නොම යයි මැකිලා

ආදර දෙවොලේ සීනු හඬින්
මා සිත ඔබ වෙත කැඳවනවා
සීතල මිහිඳුම් සේල ඉරා
ගත දවටා මා වෙත එනවා..-

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

කාර්යාල කාර්ය සහායක, සපුමල් පැමිණ සහකාර ප්‍රාදේශීය ලේකම්වරියගේ කාර්යාල කාමරය පිරිසිදු කරන්නට වූයේ යුහුසුලුව ය.

"සහකාර ප්‍රාදේශීය ලේකම් - මානවී වනිගසේකර"

පුවරුව ප්‍රවේසමට පිස දමා, සපුමල් යළි මේසය මත තැබුවේද ප්‍රවේසමෙනි. මානවී, කලබලයෙන් කාමරයට ඇතුළු වෙද්දී, සපුමල් එකත්පස් වූයේය.





"ගුඩ් මෝනින් මැඩම්.."

"ගුඩ් මෝනින් සපුමල්.."

මානවී, අත් බෑගය පසෙකින් තබා, මේසය මත වූ අත්සන් තැබීමට නියමිත ලිපිගොනු ගොන්න අතට ගත්තා ය.

"සපුමල්.. සර්ලගෙ මළ ගෙදර යන අයගෙ ලිස්ට් එක සංජීව මහත්තයගෙන් ඉල්ලගෙන එන්න.. දැන් මේ ගමන සංවිධානය කරන්නෙ ජයරත්න මහත්තයා නේද..? ජයරත්න මහත්තයටත් ඉක්මනට එන්න කියන්න.."

ප්‍රාදේශීය ලේකම්වරයාගේ මවගේ අවමංගල්‍ය උළෙලට සහභාගී වීමට පාදුක්ක ප්‍රදේශයට යාම සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියල්ලෝ ම සූදානම් වෙමින් සිටියහ. අවමංගල්‍යයට පෙර දිනය වූ එය බදාදා දිනයක් වූ බැවින්, දිවා කාලය ගමන සඳහා යොදා ගෙන තිබිණි. ඒ වන විට වෙලාව උදෑසන හතට පමණ විය. සපුමල්ගේ පණිවිඩය ලද පමාවට සුභසාධක සංගමයේ සභාපති වශයෙන් කටයුතු කරන ජයරත්න මහතා, වහාම සහකාර ප්‍රාදේශීය ලේකම්වරිය ඉදිරියේ පෙනී සිටියේ ය.

"මැඩම්..!"

"ජයරත්න මහත්තයා.. ගමනට වුවමනා සේරම සූදානම් ද..?"

"ඔව් මැඩම්.. සේරම ලෑස්තියි.. අපි තිස් පස්දෙනෙක් ගමනට ලෑස්තියි.."

"පිටත් වෙන්නෙ කීයටද..?"

"අපි නවයට පිටත් වෙනවා මැඩම්.. අවසන් කටයුතු දෙකටනෙ පටන් ගන්නෙ.. අපිට ප්‍රමාද නොවී ආපහු එන්න පුළුවන් මැඩම් වේලාසන ගියා ම.."

"ඔව් ජයරත්න මහත්තයා.. හැමදේකම වගකීම ජයරත්න මහත්තයා බලාගන්න ඕන.. මට මිනිස්ට්‍රි එකේ මීටින් එක දහය



Uploaded By Sanda

හමාරට.. මම දැන් පිටත් වෙනවා.. මම මීටින් එක ඉවර වෙලා කෙළින් ම සර්ලගෙ ගෙදරට එන්නම්.. අපි එහෙදි මුණ ගැහෙමු.."

"හොඳයි.. මැඩම්.."

"වියදම් වෙන හැම සතයක් ම සටහන් කරගන්න.. හැම වියදමකට ම බිල්ස් ගන්න.. හැමදේම පිළිවෙලකට සිද්ධ වෙන්න ඕන ජයරත්න මහත්තයා.."

"මං ඒ සේරම බලාගන්නම් මැඩම්.."

මානවී, තම කාර්යාල කාර්ය සහායකවරයාට අමතන විදුලි සීනුව එබුවේ ය.

"සපුමල්.. නිර්මාල්ට කියන්න හරියට ම හත හමාරට අපි පිටත් වෙන්න ඕන කියලා.."

"හොඳයි මැඩම්.. ෆයිල්ස් ටික වාහනේට දාන්නද මැඩම්..?"

"එපා සපුමල්.. මම ගේන්නම්.."

තමාට කර ගත හැකි සියලු වැඩ කටයුතු තනිව කර ගන්නා, අනිසි කාර්යයක් හෝ පමණට වඩා කාර්යයන් කිසිදු විටෙක තමාට තබා වෙනත් කිසිවකු හෝ වෙත නොපවරණ තම ස්වාමි දියණිය කෙරෙහි, සපුමල්ගේ සිත තුළ කවදත් වූයේ අප්‍රමාණ වූ ගෞරවයකි.

"ලොකු සර්.. තව මාස හයකින් පෙන්ෂන් යන්න ඉන්නෙ.. එතකොට පොඩි මැඩම් තමයි ලොකු මැඩම් වෙන්නෙත්.. දෙයියනේ කියලා අපි හැමෝට ම නිදහසේ ආසාවෙන් වැඩ ටික කරන්න පුළුවන්.."

සපුමල්, සහකාර ප්‍රදේශීය ලේකම්වරියගේ රියදුරු වූ නිර්මාල් සොයා ගියේ, තම ස්වාමි දියණියගේ මිනිසත්කම් පිළිබඳ ගෞරවණීය සිතිවිලි පුරවා ගත් හදවතිනි. 'සහකාර ප්‍රාදේශීය ලේකම් - උඩදුම්බර'





ලෙස සටහන් වූ නාම පුවරුව රැගත් කැබ් රිය, හරියට ම හතයි තිහ වන විට ආයතන පරිශ්‍රයෙන් පිට විය.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

අවමංගල්‍ය උළෙලට සහභාගී වූ මානවී රැගත් නිල රිය, අවිස්සාවේල්ල - කොළඹ ප්‍රධාන මාර්ගයේ කොළඹ දෙසට වේගයෙන් ධාවනය වෙමින් තිබිණි. රිය, ප්‍රධාන මාවතේ ගම් නගර පසු කරමින් හෝමාගම නගරය ද පසු කරමින් ඉදිරියට ඇදෙමින් තිබිණි. දෑස මානයෙන් වේගයෙන් පසුව යන ගොඩනැගිලි අතරේ වූ, එක්තරා ගොඩනැගිල්ලක නාම පුවරුව දකිත් ම, මානවීගේ හෘද ස්පන්දන වේගය සැණින් අහසට නැංගේ ය.

'ගඟුල් සමරසිංහ ට්‍රාන්ස්පෝර්ට් සොලියුෂන්ස්..'

ඇයට.. මොහොතකට.. මුළු ලෝකය ම අමතක විය. උන් හිටි තැන්.. තමාගේ තරාතිරම.. මේ සියල්ල අමතක විය. ඇගේ මුවින් නොසිතූ ආලාපයක් පිට විය.

"අනේ.. නිර්මාල්..???"

තම ස්වාමි දියණියගේ ආයාචනාත්මක හඬ, තරුණ රියදුරකු වූ නිර්මාල්ගේ ළය ප්‍රකම්පනය කළේ ය. පවනට බඳු වේගයෙන් ඉගිළ ආ රියෙහි වේගය බාල වූයේ නිරායාසයෙන් ම ය.

"ඇ..යි.. ඇ..යි.. මැඩම්..???"

මානවී, කෙළ පොදක් ගිල දමා, ආයාසයෙන් වචන සොයා ගත්තා ය.

"නිර්මාල්.. වෙලාව කීයද..?"

"හතරයි මැඩම්.."

Uploaded By Sanda

තවත් මොහොතකින් රිය මාවතේ කොනකට වන්නට නැවතිණි.

"මගේ යාළුවෙක් ඉන්නවා.. අර එහා පැත්තෙ.. ඒ ඔෆිස් එක පහු උනා.. අපි එතෙන්ට ගිහිල්ලා යමුද නිර්මාල්..?"

"ඉස්සරහට ගිහින් යූ ටර්න් එකක් ගහගෙන එමු මැඩම්.."

නිර්මාල්, රිය පණ ගන්වා ගත්තේ ය. මානවී වනිගසේකර.. ජීවිතයේ එතෙක් නොගිය තීරණාත්මක ආපසු ගමන ඇරඹුවාය. මානවී, වදනින් නොකී සියල්ල.. තුරුණු හදවතක් හිමි නිර්මාල් පහසුවෙන් ම හඳුනා ගත්තේ ය.

තම ස්වාමි දියණිය කෙරෙන් දිස් වූ කැළඹිල්ල නිර්මාල්ට බොහෝ දෑ පැහැදුවේ ය. ඔහුගේ මුව මත සිහින් සිනා රැල්ලක් ඇඳී තිබිණි.

'උප දිසාපති උනාට ඉතින්.. අවුරුදු විසි අටක කෙල්ලෙක්නෙ.. සීඑස් වලින් දිස්ත්‍රික්කෙ දෙවෙනියා කියන්නෙ පට්ට මීටරයක් වෙන්න එපායැ.. ඒ උනාට.. අනේ නිර්මාල් කියලා කෑගැහුවෙ හරියට ම ආසම සෙල්ලම් බඩුව හදිසියේ වාහනෙන් බිමට වැටුණා ම බය වෙලා අඬන පොඩි එකෙක් වගේ.. අනේ පව්..'

නිර්මාල්, රිය පාරේ අනෙක් පසට හරවා ගත්තේ ය.

"මැඩම්.. කොතනද තැන..???"

"ඉස්සරහා රෝස පාට මල් පිපිච්ච මාර ගහක් තිබුණා.. ඊට එහා පැත්තෙන් ලොකු එන්ට්‍රන්ස් එකක් තිබුණා.. තාප්පෙ සිල්වර් කලර් ප්ලේට් එකක ගඟුල් සමරසිංහ ට්‍රාන්ස්පෝට් සොලියුෂන්ස් කියලා බෝඩ් එකක් තිබුණා.."

නිර්මාල් විසින් පදවාගෙන ගිය නිල රථයේ ඒ මොහොතේ සිටියේ, සහකාර ප්‍රාදේශීය ලේකම්වරියක වූ මානවී වනිගසේකර නොව, කුළුඳුලේ ම තම පෙම්වතා හමුවන්නට යන සසල බාල





බොළඳ යුවතියකි. නිර්මාල්, තම ස්වාමි දියණිය දැක්වූ ඉසව්ව පහසුවෙන් හඳුනා ගත්තේ ය. නිර්මාල් රිය ගේට්ටුවට සමීපයේ නවත්වත් ම, ආරක්‍ෂක කුටියේ වූ ආරක්‍ෂක නිලධාරීන් දෙදෙනා උනුන් මුහුණු බලා ගත්තේ පුදුමයෙනි.

'සහකාර ප්‍රාදේශීය ලේකම් - උඩදුම්බර'

ප්‍රධාන ආරක්‍ෂක නිලධාරී, සේනාරත්න ආරක්‍ෂක කුටියෙන් ඉවතට පැමිණියේ, තම කණිෂ්ඨ නිලධාරියාට කලබලයෙන් අමතමිනි.

"ශාන්ත.. දිසාපති කෙනෙක්.. හැබැයි මෙහෙ ළඟ පාතක නම් නෙමෙයි.. මේ අවේලාවෙ.. හතරත් පහුවෙලා.."

ආරක්‍ෂක නිලධාරීන් දෙදෙනා ම හිස් වැසුම් පළඳමින් රිය වෙත දිව ආවේ පුදුමයෙනි. ආරක්‍ෂක නිලධාරීන් නිර්මාල්ගේ අන්තයෙන් රියට එබෙද්දී, මානවී තම අසුන අද්දර රිය කවුළුව විවෘත කළා ය.

"අපිට ගඟුල් සමරසිංහ මහත්තයාව හම්බවෙන්න පුළුවන්ද..?"

යුවතියකගේ හඬක් පිටුපස අසුන දෙසින් ඇසෙද්දී, නිර්මාල් වෙත යොමු වූ ආරක්‍ෂක නිලධාරීන් දෙදෙනාගේ දෑස්, කටහඬ ආ දෙසට යොමු විය.

"සර් නම් දැන් ඔෆිස් එකේ නෑ මැඩම්.. මැඩම්________???"

මානවීගේ රුව.. ඒ මොහොතේ ම.. ආරක්‍ෂක නිලධාරීන්ගේ දෑස් විනිවිද ගියේ ය. මතකය.. සැණෙින් අවදි වූයේ ය. තම හාම්පුතුගේ කාර්යාලීය මේසය මත හිඳ මුළු ලෝකය සමඟ ම මොහොතක් නෑර හිනැහි හිඳින.. ඒ සොඳුරු රුවැත්තිය.. තමා හමුවේ පහළ වී ඇති වග දැනුණු මොහොතේ.. සේනාරත්නට උන් හිටි තැන් අමතකව, දෑස් උඩ ගියේ ය. ඒ සමඟ ම ඔහු පියවි ලෝකයට පැමිණියේ ය.



Uploaded By Sanda

මානවී, මේ පුදුමය දෙස ඊටත් වඩා පුදුමයෙන් බලා සිටියේ ය.

'මේ මිනිස්සු මොකද මේ මෙච්චර පුදුම වෙලා.. හරියට මාව කලින් දැකලා තියෙනවා වගේ..???'

ආරක්ෂක නිලධාරියා වඩාත් පක්ෂපාතී ලෙස මානවී දෙසින් රියට එබුණේ ය.

"මැඩම් ඇතුළට යමු.. මහත්තයා ඔහොමම වාහනේ අර පේන මල් ගහ ළඟට ගන්න.."

සේනාරත්න ඒ කලබලයෙන් ම තම සගයාට ඇමතුවේ ය.

"ශාන්ත.. දුවන්න ඔෆිස් එකට.. රිසෙප්ෂන් එකේ නෙල්කා මිස්ට කියන්න සර්ගෙ මැඩම් ඇවිල්ලා කියලා.. ඇවිත් ඇතුළට එක්ක යන්න කියන්ඩ.."

"මොනවා.. සර්ගෙ මැඩම්..???"

"ඔව් බං ඔව්.. විස්තරේ පස්සෙ.. ඇයි බං සර්ගෙ මේසෙ උඩ හිනා වේගෙන ඉන්නෙ.. ඒ මැඩම් තමයි ඔය ආවෙ.. පලයං බං ඉක්මනට.."

ශාන්ත තම දෙපා ඉක්මන් කළේ දරාගත නොහැකි විස්මයෙනි. ආරක්ෂක නිලධාරියා රැගෙන ආ පණිවුඩයෙන් නෙල්කා පවා කැලඹුණා ය.

"මොනවා.. මැඩම් ඇවිල්ලා..!!!"

"ඔව්.. ඔව්.. ඔව්.. අර වාහනේ ළඟට ගිහින් මැඩම්ව එක්කගෙන එන්න නෙල්කා මිස්.."

නෙල්කා, සාරිය සකස් කර ගනිමින්, ඉක්මන් ගමනින් රිය වෙත ඇවිද ගියා ය. නිල රියෙහි වූ නාම පුවරුව දැකීමෙන්, ඈ වඩාත් ගෞරව සම්ප්‍රයුක්තව හැසිරීමට නිතැතින් ම පෙළඹුණා ය.



Uploaded By Sanda



නිර්මාල් විසින් හැර දුන් රියෙන් බිමට බට මානවී, තමා දෙසට කලබලයෙන් ඇවිද එය යුවතිය දැක, තවත් පුදුමයට පත් වූවා ය. සිනාමුසුව තමා ඉදිරියට පැමිණෙන යුවතිය ඉදිරියේත් මානවී වික්ෂිප්තව පසු වූයේ එබැවිනි.

"මේ අය මැඩම්ව කලින් දන්නවද මැඩම්..? මැඩම්ව දැක්ක ම මේ හැමෝම අමුතු විදියට පුදුම උනා වගේ.."

"ඒක තමයි නිර්මාල් මමත් බැලුවෙ.. මම අදමයි ආවෙත්.. මම නම් කාවවත් දන්නෙ නෑ.. ඒත්.. එයාලා නිකම් මාව දන්නවා වගේ තමයි හැසිරෙන්නෙ.. අනේ මන්දා.."

මානවිට වැඩි යමක් කියා ගැනීමට ඉඩ නොලැබුණේ, තමා සමීපයට ම පැමිණි යුවතිය නිසාවෙනි.

"එන්න මැඩම්.. ඇතුළට යමු.. සර් මේ දැන් වුට්ටකට කලින් ගෙදර ගියා.. මැඩම් ආවා කියලා මං සර්ට කෝල් කරන්නම් මැඩම්.."

යුවතියගේ පමණට වඩා වැඩි ආචාරශීලීත්වය හමුවේ, මානවී සැබැවින් ම පුදුමයෙන් සසල වී සිටියා ය. මානවීට ඉස්සර වන්නට ඉඩ දී යුවතිය පසුපසට වූවා ය.

"මිස්.. මාව දන්නවද..? අර සෙකියුරිටි ඔෆිසර්ස්ලා දෙන්නත් මාව දැක්ක ගමන් පුදුම උනා.. ඇයි ඒ..?"

යුවතිය සිනාසුණා පමණි. තවත් මොහොතකින් තමාගේ ම දෑසින් සත්‍යය දකින්නට ඉඩ තිබියදී, තමා කට ඉස්සර කළ යුතු නැතැයි නෙල්කා සිතුවාය.

'ඔෆිස් එක පුරා ම තැනින් තැන ඉඳලා අපිට හිනා වේගෙන ඉන්න මැඩම්ව අපිට අඳුනගන්න බැරිද..? මේක ෆැන්ටසියක් මැඩම්.. මැඩම්ගෙ ඇස් අදහාගන්න බැරිවෙයි තව ටිකකින්..'

යුවතිය සිහින් සිතුවා පමණි. ඈ, සිනාමුසුව මානවීට කාර්යාල

පරිශ්‍රයේ දොරටු විවර කළාය. විසල් කාර්යාල පරිශ්‍රයට ඇතුළු වන විට ම, ඉන්ද්‍රජාලික බලයකින් මෙන් මානවීගේ දෑස ඉහළ බිත්තිය වෙත යොමු විය. ඇයට.. තමාගේ ම දෑස අදහාගත හැකි නොවිණි.

"දෙයියනේ.. ලොකු හාමුදුරුවන්ගෙ ෆොටෝ එකක් නේද..? මට අදහා ගන්නවත් බෑ.. කිසිම කෙනෙක් ළඟ අපේ ලොකු හාමුදුරුවන්ගෙ ෆොටෝස් නෑ.. එතකොට.. ගඟුල් අයියා මේක එයාගෙ ෆෝන් එකෙන් ගත්ත එකක්ද..?"

මානවීගේ දෑස කඳුළින් පෙඟී යනු නෙල්කා පවා දුටුවා ය.

"මම.. සර්ට කෝල් කරනකල්.. මැඩම් මෙතනින් වාඩිවෙන්න මැඩම්.."

මානුවී, යුවතියට ස්තුති කොට, අසල ම වූ අසුනකට බර වූවා ය.

'ඒ කියන්නෙ.. ගඟුල් අයියගෙ හිතේ.. අපි ඉන්නවා.. අවුරුදු දෙකක් ගෙවිල ගිහිල්ලත්, එයාට අපිව අමතක වෙලා නෑ කියන්නෙ.. එයාගෙ හදවතේ ඇත්තට ම අපි ඉන්නවා..'

සරණංකර හිමියන්ගේ සේයාරුව දකිත් ම, මානවීට තමා හා ගඟුල් සබැඳි අතීතයේ බොහෝ දෑ සිහිපත් විය. ඔහුගේ සෙනෙහස මායාවකැ'යි සිතූ යුගය නිමා කරන්නට කල එළඹ ඇතැයි ඇයට දැනෙමින් තිබිණි.

කාර්යාලයීය දුරකථනයෙන් ඇමතුමක් ලැබෙන විට ගඟුල් නිවසට පා තැබුවා පමණි. කුමාර ලීලාවෙන් රියෙන් බැස එන තම වැඩිමහල් පුතු දෙස, තමාරා සමරසිංහ පවා බැලුවේ ලෝබී දෑසිනි.

'අර ගෑනු ළමයව නොසලකා හැරලා මං කළේ ලොකු වැරැද්දක්. ඒ ළමයයි, තාත්තයි නොවෙන්න ලොකු පුතා කොහොමද මේ විදියට කකුල් දෙකෙන් ඇවිදින්නෙ..? සනීප වෙලා ඇවිල්ලා අවුරුදු දෙකක් වෙන්න ආවා.. ලොකු පුතා ඒ ළමයව අමතක





කරන්නෙ නෑ. රිසෙප්ෂන් එකෙයි, බෝඩ් රූම් එකෙයි, ඔෆිස් රූම් එකෙයි හැම තැනම පුතා ඒ ගෑනු ළමයගෙ ෆොටෝස් ෆ්‍රේම් කරලා එල්ලගෙන.. ආයෙ කවදාවත් පුතා වෙන ගෑනු ළමයෙක් ගැන හිතයි කියලා මම නම් කීයටවත් හිතන්නෙ නෑ.. ඒ ගෑනු ළමයගෙත් පුදුම අහංකාරකමක්නෙ තියෙන්නෙ.. අම්මලා, තාත්තලා විරුද්ධ උනා කියලා ආදරේ කරනවා නම් ඔහොම වෙන් වෙලා ජීවත්වෙන්න පුළුවන්ද..? අනේ මන්දා.. මොනවා කරන්නද කියලා.. මට හිතෙනවා.. වෙලාවක ගිහිල්ලා ඒ ළමයට සොරි කියලා එන්න.. ඔව්.. මං එහෙම කළොත් තාත්තලා පුතාලගෙ හිත්වල මං ගැන තියෙන කහටවත් නැතිවෙලා යයි..'

තමාරා සමරසිංහ නිවස වෙත පැමිණෙන පුතු දෙස බලාගෙන එසේ පශ්චාත්තාප වෙද්දී, ගඟුල් නිවස තුළට පැමිණියේ තම මව එතරම් නොතකමිනි. ලද දුරකතන ඇමතුම, උඩු මහල දෙසට එසවූ ඔහුගේ දෙපා යළි ආලින්දය දෙසට හැරවීය. කාර්යාලයීය දුරකතන ඇමතුම දැකීමෙන් ගඟුල්ගේ සිත මදක් නොරිස්සුමට පත් විය.

"නෙල්කා.. දැන් ඇයි..? මම මේ ඔෆිස් එකෙන් ආවා විතරනේ.."

"ඔව් සර්.. මේ දැන්.. ඔෆිස් එකට මැඩම් ආවා සර්..!"

"මැඩම් ආවා..??? මොන මැඩම් ද..? මේ අම්මා ගෙදර ඉන්නෙ..??"

ගඟුල්ගේ හඬෙහි එවර වූයේ නොරිස්සුම පැරද වූ විසල් පුදුමයකි.

"නම නම් මං දන්නෙ නෑ සර්.. අර සර්ගෙ මේසෙ උඩ තියෙන ෆොටෝ එකේ ඉන්න මැඩම් ඇවිල්ලා සර්..!!!"

ගඟුල්ට.. මුළු ලොව ම අමතක විය. ඔහුට දැනුණේ කිසිවකු විසින් තමා කරකවා අතහැරියාක් බඳු සසල බවකි.



Uploaded By Sanda

"මොනවා..! මොනවද නෙල්කා කියන්නෙ..?"

"ඔව් සර්.. ඒ මැඩම් ඇවිල්ලා..!!!"

"වෙන්න බෑ.. නෙල්කා කොහොමද හරියට ම කියන්නෙ..? කොහොමද හරියට ම අඳුනා ගත්තෙ..?"

"ෆොටෝ එකේ ඉන්න මැඩම්ගෙ වම් කම්මුලේ තියෙන ලකී හෝල් එක මේ මැඩම් හිනාවෙනකොට මං ඇස් දෙකට ම දැක්කා සර්.."

ගඟුල්, ඇසෙන කිසිවක් අදහාගත නොහැකිව වටපිට බැලුවේ ය. අනපේක්ෂිත මොහොතක අසන්නට ලැබුණේ.. තමාගේ සමස්ත ජීවිතය රැඳී ඇති අපේක්ෂාවේ සුභාරංචිය නොවේද..? දැනුණු සොම්නසට ඔහුගේ පපුව සිරවන්නට වූයේ ය.

'මානවී ඇවිත්..??? මට කිව්වෙ නෑනෙ එනවා කියලා..'

තම ප්‍රධානියාගේ වදන් තුළ වන සසල බව, නෙල්කාගේ මුව තුළ තුනී හසරැල්ලක් ඇන්දුවේ ය.

"මැඩම්.. පාදුක්කෙ මළ ගෙදරක ගිහින් එන ගමන්លු සර්.. මැඩම්ගෙ ෆෝන් එකේ බැට්‍රි ඩෙඩ්ලු.."

තවදුරටත් කාලයෙන් අංශු මාත්‍රයක් හෝ අපතේ හරින්නට ගඟුල්ට හැකි නොවිණි. ඔහු, හී ගසක වේගයෙන් ආපසු හැරී රිය වෙත ගියේ දිවගෙන ය.

"පුතා.. පුතා.. කොහෙද ඔය යන්නෙ..?"

තමාරාගේ කෑගැසීම ගඟුල්ට ඇසුණේ නැත. නිවසේ උද්‍යාන මාවත දිගේ ඔහු රිය ගෙන ගියේ පවනට බඳු වේගයෙනි. කලබල වූ තමාරා, වහා තම සැමියා සොයා පිය මැන්නා ය.

"රොහාන්.. රොහාන්..???"





බිරිඳගේ කලබලකාරී කෑ ගැසීමට බිය පත්වූ රොහාන් සමරසිංහ මහතා, වහාම තම කාමරයෙන් පිටතට පැමිණියේ ය.

"මොකද තමාරා..?"

"අනේ රොහාන් බලන්න.. ලොකු පුතාට කෝල් එකක් ආවා.. මොන මැඩම්ද කියලා පුතා අහනවා ඇහුණා.. වාහනේ හරවා ගත්තා.. මෙලෝ සිහියක් නැතුව ආපහු යන්න ගියා.."

මොහොතක් කල්පනාවේ උන් සමරසිංහ මහතා, තම පුතුට ඇමතුමක් ගත්තේ දෙගිඩියාවෙනි.

"ලොකු පුතා.. ඇයි..? කොහෙද යන්නෙ..?"

"අන්න.. තාත්තගෙ දූව ඇවිල්ලලු..!!!"

සමරසිංහ මහතාට දැනුණේ ජීවිතයේ එතෙක් විඳි සෝ තැවුල් සියල්ල නිවී ගියාක් බඳු සැනසීමකි. පුතුගේ ඇමතුම විගසින් අවසන් කළ සමරසිංහ මහතා, ගඟුල්ට නොදෙවෙනි කලබලයකින් ගමනට සූදානම් වූයේ ය.

"රත්නජීව..??? රත්නජීව.!!!"

පිය - පුතු දෙදෙනාගේ කලබලයට මුසුව තිබූ සොම්නස් සහගත බව දුටු තමාරා, ඉවෙන් මෙන් යමක් හඳුනා ගත්තා ය.

"අනේ.. මොකක්ද රොහාන් මේ කලබලේ.. පුතා ඉගිලුණා.. දැන් ඔයත් දුවන්න හදනවා.. ඇයි මේ..?"

මොහොතක් තම බිරිඳ දෙස තරවටු දෑසින් බලා උන් රොහාන් සමරසිංහ තම ආත්මීය කතාව ම වචන හයකට ගොනු කළේ ය.

"මගේ දූවව.. ඔයාගෙ ලේලිව.. බලන්න යන්නෙ..!!!"

පුදුමයෙන්, ශෝකයෙන් සේ ම, පසුතැවිල්ලෙන් ආතුර සිතින් තමාරා සමරසිංහ එතන ම වූ අසුන මත හිඳ ගත්තා ය.



Uploaded By Sanda

'කවද හරි දවසක.. ඔයාගෙ ඔය කකුලෙ දැන් හැදිලා තියෙන තුවාලෙත් සනීප වෙන්නෙ.. අන්න ඒ ඉසිවර දෑතින් තමයි තමාරා.. හොඳට මතක තියාගන්න..'

ගගුල්ගේ මව, පුටු ඇන්දට හිස තබාගෙන ඉකිබිඳ හඬන්නට වූවාය.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

"සර් එනකල්.. මැඩම්ව සර්ගෙ රූම් එකෙන් වාඩි කරවන්න කිව්වා මැඩම්.. අපි යමු සර්ගෙ රූම් එකට.."

තමා ඉදිරියේ පමණටත් වඩා ගරු සරු ඇතිව හැසිරෙන යුවතිය දෙස මානවී බැලුවේ අනුකම්පාවෙනි.

"මං මෙහෙම ඉන්නම් නංගි.. මෙතන හොඳයි.."

"සර්ගෙ මැඩම්ව කස්ටමර් කෙනෙක් වගේ මෙතන ඉන්දලා තියලා.. සර්ගෙන් මට බැනුම් අහන්න වෙයි මැඩම්.."

යුවතිය කීවේ සිනාසෙමිනි. හිනැහෙමින් හිස සැලූ මානවී, හිඳ උන් අසුනින් නැගී සිටියා ය.

"ඕගොල්ලොන්ගෙ සර් වසයි ද නංගි..?"

මානවීගේ හදවත පුරා පැතිර තිබුණේ මිහිරි හැඟුම් සමුදායකි.

"අනේ නෑ මැඩම්.. හොඳට හරී.. ම හොඳයි.. නරකට.. හරී ම.. නරකයි.."

ගගුල්ගේ කාර්යාල කාමරය දෙසට දිවෙන කොරිඩෝරය දිගේ ඇවිද යද්දී, මානවීගේ දෑස යළිත් තෙත් විය. කොරිඩෝරය කෙළවර බිත්තියෙහි ඉහළින් ගසා තිබුණේ, සමරසිංහ මහතාත්, වනිගසේකර මහතාත්, මානවීත් එකට හිඳ ගත් ඡායාරූපයකි.

'ඔයා මාව නව මාස ගාණක් අඬවයි අයියෙ.. ඔයා.. මේ තරම් මට ආදරේ කරන්න ඇති කියලා.. මං හීනෙකින්වත් හිතුවෙ නෑ..





මං හිතුවෙ.. දකින්නෙ නැතුව.. ඈතින් ඉන්නකොට.. ඔයාට මාව අමතක වෙලා යයි කියලා.. ඔයාගෙ ආදරේ මායාවක් කියලා.. ඔයාගෙ ආදරේ මාව ගව් ගාණක් උඩින් උස්සලා තිබ්බා.. මං මේ හැම දේම දිනාගත්තෙ ඔයාගෙයි, මගෙයි ලෝක දෙක අතර තිබුණ පරතරය බිඳලා දාන්න.. අන්තිමේදී.. මං ඒක කළා.. ඔයා මං වෙනුවෙන් ඉපදුණ ආදරේ පරිස්සම් කරගෙන බලාගෙන හිටියා.. මීට වඩා උතුම් ආදර පූජාවක් තවත් තියෙනවද අයියෙ..?'

අමාත්‍යාංශයේ පැවති රැස්වීමට සහභාගී වීම සේ ම, අවමංගල්‍ය උත්සවයට ද සහභාගී විය යුතු බැවින්, මානවී හැඳ සිටියේ කහ, සුදු වර්ණ මිශ්‍රිත අත්යන්ත්‍ර ඔසරියකි. අත වූ ලේන්සුව රියෙහි දමා ආ බැවින්, ඈ, දෑසට ඉනු කඳුළු පිස දමා ගත්තේ ඔසරි පොටිනි.

"එන්න මැඩම්.. මේ සර්ගෙ ඔෆිස් රූම් එක.. මෙහෙන් වාඩි වෙලා ඉන්න මැඩම්.. මම තේ එකක් එවන්නද මැඩම්..? මැඩම් බොන්න මොනවද..? ටී ද ප්ලේන්ටී ද..?"

"මොකුත් එපා නංගි.. සර් ආපු ගමන් මම යන්න ඕන.. ගොඩක් රෑ වෙන්නත් කලින් නුවරට යන්නත් ඕනනෙ.. බොහොම ස්තූතියි.. මට මොකුත් එපා නංගි.."

"හරි මැඩම්.. මම එහෙනම් යන්නම්.. මැඩම්ගෙ ඩ්‍රයිවර්ට මම ටී එකක් යවන්නම්.."

"හොඳයි නංගි.."

මානවීගේ, මානව ගුණයන් හමුවේ තෙල්කාගේ පවා දෑසට කඳුළු නැගිණි.

'තාරිකා මැඩම් ඇවිත් තිබුණෙ අපායෙන්.. මේ මැඩම් ඇවිත් තියෙන්නෙ දිව්‍ය ලෝකෙන්.. අපේ සර් සේරම පව් ගෙවලා ඉවරද කොහෙද.. හාස්කමකින් වගේ කකුලත් සනීප වෙලා, අර යක්ෂ ගෑනිගෙනුත් ගැලවිලා තියෙන්නෙ.. අනික මේ මැඩම් ආණ්ඩුවෙ



Uploaded By Sanda

ලොකු රස්සාවක්නෙ කරන්නෙ.. අරයා වගේ සේරටම ඇඟිලි ගහන්න එනවා නියා මේ මැඩම්ට නම් මේවා දිහා හැරිලා බලන්නවත් වෙලාවක් නැතිවෙයි.. පුදුම නිහතමානීකමක්.. වචනයක් ඇහෙනකොටත් හිත නිවෙනවා..'

නෙල්කා යන්නට ගියේ මානවී කෙරෙහි උත්තම ගණයේ සිතුවමක් ළය පුරා ඇඳගෙන ය. ඒ සිතුවම ඈ හෙටින් මතු ආයතනයේ සියල්ලන් ඉදිරියේ නිර්ලෝභීව දිග හරිනු ඇත. එය ම මතු යම් දිනෙක මානවී වනිගසේකරගේ නොව මානවී සමරසිංහගේ කීර්ති කදම්භය බවට පත්වනු නොඅනුමාන ය.

ආයතනයෙන් පිටව ගිය වේගයටත් වඩා වැඩි වේගයකින් ආපසු පැමිණි ගඟුල්, මෝටර් රථය නැවැත්වූයේ මානවීගේ නිල රථය නවතා තිබුණු ස්ථානයට දකුණු පසිනි. රිය පැමිණි ආකාරයෙන් ම පැමිණියේ කවුරුන්දැයි නිර්මාල් වටහා ගත්තේ ය. තම ස්වාමි දියණියගේ සෙන්න්වන්තයා හඳුනා ගන්නට නිර්මාල්ට පමණට වඩා වැඩි ආයාස දරන්නට වුවමනා වූයේ නැත. එසේ ම, මානවීගේ රියදුරා පිළිබඳව අසා තිබුණු විස්තර අනුව, ගඟුල්ගේ අනුමානය වැරදී ගියේ ද නැත. තරුණයන් දෙදෙනා ම උනුන් හා සිනාසුණේ වඩාත් හෘදයාංගම ලෙසිනි.

"නිර්මාල් නේද..?"

"ඔව් සර්.. මැඩම් ඇතුළට ගියා සර්.."

ගඟුල්ගේ ළය, උණුසුම් වායු ධාරාවකින් පිරී ගියේ ය. සියොත් තටු ලැබූ තුරුණු හදවත, තම ප්‍රියම්භිකාව සොයා ඇවිද ගියේ ලෝකය ම දිනාගත් උද්දාමයෙනි.

දුරකථනයෙන් ඉඳ හිට කතා බහ කළ ද, ඔවුන් මේ හමුවන්නේ වසරකුත් මාස අටකට පසුව ය. මානවීගේත්, ගඟුල්ගේත් දෙදෙනාගේ ම හදවත් තුළ පිරී ඉතිරී යමින් තිබුණේ අප්‍රමාණ වූ සෙනෙහසක හැඟීම් ප්‍රවාහයකි. ආයතනය තුළට පිවිසෙන තම ප්‍රධානියා දුටු මතින් නෙල්කා නැඟී සිටියා ය.





"සර්.. මැඩම්, සර්ගෙ ඔෆිස් රූම් එකේ.."

"තැන්ක්ස්.."

තම ප්‍රධානියා කෙරෙන් නෙල්කා දුටුවේ පෙර කිසිදා නොදුටු අන්දමේ ප්‍රීතිමත් හැසිරීමකි.

ගඟුල්, තම කාර්යාල කාමරයට ඇතුළු වන මොහොතේ, මානවී සිටියේ ගඟුල්ගේ මේසය මත වූ තම ඡායාරූපය දෙස ම තබා ගත් දෑසිනි. දොරටුව විවරවත් ම, මානවී හැරී බැලුවේ කඳුළු රැඳි දෑසිනි. මොහොතක් අදහා ගත නොහැකි දෑසින් ඈ දෙස බලා උන් ගඟුල්, අඩියට දෙකට ළංවී.. ඈ කිටි කිටියේ තම දෑත් යට සඟවා ගත්තේ ය.

සුසංවේදී, මිනිත්තු ගණනාවකට පසු, මානවීගේ උරහිසත්, බඳත් වටා වෙලී තිබුණු දෑත් බන්ධනය මඳක් ලිහිල් කළ, ගඟුල්, මානවීගේ දෑසට එබුණේ ය.

"ඔයා එහෙනම් ආවා.. නේද නංගි..?"

"නෑ.. ඔයා ඉන්න තැන පෙනි පෙනී.. මට ආපහු යන්න බැරි උනා අයියෙ..!"

මානවී, යළිත් වතාවක් දෑස් පියාගෙන, මොහොතකට ගඟුල්ගේ පපුතුරේ හිස ඔබා ගත්තා ය.

"මේ කවුද අයියෙ..??? මෙයා ඇයි මෙතන..???"

මානවී, උගුරෙන් මෙන් විමසුවේ, කඳුළු උතුරා යන දෑසින් තමාගේ ම ඡායාරූපය දෙස බලමිනි.

"ඒ මගේ ලෝකෙ..!!!"

මානවී, වෙව්ලන දෙතොල විවර කර ගත නොහැකිව වේදනා වින්දා ය.



Uploaded By Sanda

"මගෙ හැම දවසක් ම ගෙවුණෙ.. මේ හිනාවෙන ඇස් දෙක දිහා බලාගෙන.. මං විතරක් නෙමෙයි.. මගේ ළඟ වැඩ කරන හැමෝම හැම දවසක් ම පටන් ගත්තෙ.. ඉවර කළේ මේ ලස්සන හිනාව දිහා බලාගෙන.. හැම තැන ම ඉඳලා.. මේ ඇස් දෙක.. හැමෝම දිහා බලන් හිටියා.."

"මං දැක්කා අයියෙ.. රිසෙප්ෂන් කවුන්ටර් එකේ බොකේ එක ළඟ මං ඉන්නවා දැක්ක ම.. මාව ෆේන්ට් වෙයි කියලා මං හිතුවෙ අයියෙ.. දොර අරිනකොට ම ලොකු හාමුදුරුවන්ගෙ ෆොටෝ එක දැක්ක ම.. එතනින් එහාට තවත් මොනවත් දැනගන්න දෙයක් මට ඉතිරි උනේ නෑ අයියෙ.."

මිනිත්තු ගණනාවක් ම, ගඟුල්ගේ පපුතුරේ උණුසුමට නතුව උන් මානවී, අසීරුවෙන් වුවත්, ඔහුගේ සෙනෙහසේ උණුසුමෙන් මිදුණා ය.

"රෑ වෙන්න කලින්.. මං යන්නත් ඕන අයියෙ.."

"අ..නේ.. අද.. ඉඳලා.. යන්න නංගි.. මං ඔයාව හෙට ගිහින් ඇරලවන්නම්.."

"බෑ අයියෙ.. මං ආවෙ ඔෆිස් වෙහිකල් එකක.. මං ආවෙ ඔෆීෂියල් ගමනක්.. ඒ ගමන ඔෆීෂියල් විදියට ම ඉවර කරන්න ඕන.."

හිත ආයාසයෙන් අල්ලා ගනිමින්, මානවී දෙඩුවා ය. සෙනෙහස කෙතරම් දළු ලෑවද.. ඇගේ සෘජු ගුණාංගයන්ගේ කිසිදු වෙනසක් සිදුවී නොතිබිණි.

ගඟුල්ගෙන් මිදුණු මානවී, අසල ම වූ අසුන මතින් හිඳ ගත්තා ය. ඈ හිස ඔසවා ගඟුල් දෙස බැලුවා ය.

"කෝ.. මට කකුල පෙන්නන්න.."

පුටුව ඉදිරියට ඇද ගත් ගඟුල්, මානවී ඉදිරියේ හිඳ ගත්තේ ය.





පහළට නැවී, ගඟුල්ගේ වම් පාදය ඔසවා, තමාගේ උකුළ මතින් තබා ගත් මානවී, සුරතින් එය මෘදු ලෙස පිරිමැද්දා ය.

"නංගි..!!!"

"අපිනෙ මේ කකුල සනීප කළේ.. මට හිතාගන්වත් බෑ.. මේ අර කපලා දාන්න හැදුව කකුලද කියලා.. ලොකු හාමුදුරුවො නම් අඩු තරමෙ සකෘදාගාමී ඵලයටවත් පත්වෙලා ඉන්න ඇති අයියෙ.. කොහේවත් ලොකු හාමුදුරුවන්ගෙ පින්තූරයක් නෑ.. ඔයා ළඟ තියෙනවා දැක්කම මගෙ පපුව පැලෙන්න ආවා අයියෙ.."

"තාත්තලා දෙන්නයි, ඔයයි ඉන්න ෆොටෝ එක ඇරෙන්න.. අනිත් ඔක්කොම මං මගේ ටැබ් එකෙන් ඔයාලට නොදැනෙන්න ගත්ත ෆොටෝ නංගි.."

මානවීගේ දෑසින් ගිලිහුණු කඳුළක්, ගඟුල්ගේ පාදය මත ඉහිරිණි. තමාගේ ම ඔසරි පොටින් මානවී ඒ කඳුල පිස දැමුවා ය.

"අපිව මුණ ගස්සපු කකුල..!!! පරිස්සම් කරගන්න අයියෙ.."

මානවීගේ දෑස හෝරා යන්ත්‍රයේ රැඳුණේ ඉබේට ම ය. හඬා වැටෙන හිත ආයාසයෙන් අල්ලා ගනිමින් මානවී, තමාගේ උකුළ මත තබා ගෙන උන් ගඟුල්ගේ පාදය සෙමින් බිම තැබුවේ ය.

"රෑ වෙනවා අයියෙ.."

සමුගත යුතු බව පවසා ගත නොහැකිව ඈ අසීමිතව වේදනා වින්දා ය. සුන්දර ම සිහිනයකින් සේ සිදුවූ හමුවීම දරාගත නොහැකිව ගඟුල්ගේ දෑසේ ද කඳුළු අහුරක් ම නළියන්නට වූයේ ය.

"අර හසිත් එක්ක කියලා තිබුණා වගේ.. තාමත් හිතන්නෙ. මගෙ ආදරේ.. මායාවක් කියලද..?"

මානවී, දෙතොල් විදා හිනැහුණා ය.



Uploaded By Sanda

"නෑ... ඒක මගෙ හිත රවට්ටන මට ම හදාගත්ත මායාවක් අයියෙ.. මෙහෙම ලස්සන හීනයක් මගේ හිතේ උඩින් ම තියෙන්න ඇති.. ඒකනෙ මැරීගෙන පාඩම් කරලා මං සීඑස් පාස්වෙලා මේ තැනට ආවෙ.."

"මං දැනගෙන හිටියා කවද හරි ඔයා මං ළඟට එන බව නංගි.. මගේ ආදරේ හැබෑ වෙන බව මං දැනන් හිටියා.."

"රුවන්වැලි සෑය, සමාධි පිළිමෙ.. වඳින්න ඕන නම්.. බැතිමතා යන්න ඕන අනුරාධපුරේ... මමත්.. මගේ හදවතේ උඩින් ම හදාගත්ත වෙහෙර විහාර දාගැබ් පිළිම.. වඳින්න.. උන් වහන්සේලා වැඩ ඉන්න තැනට ආවා අයියෙ.."

ගඟුල් යළිත් වතාවක්.. මානවී තුරුළ කර ගත්තේ ය. මෘදු ලෙස ඇගේ නළලත සිප ගත් ගඟුල්, ඇගේ සුරතින් අල්ලා ගත්තේ ය.

"අදින් පස්සෙ.. හැම දවසක් ම අපේ.. එහෙනම් පරිස්සමට යන්න රත්තරං.. උඩදුම්බරට උප දිසාපති උනාට.. මේ මගේ පුංචි කෙල්ල.. මං මේ වෙලාවෙ කොච්චර ආදරෙන් පිස්සු වැටිලා හිටියත්.. තව රෑ වෙලා ඔයාව යවන්න මට බෑ.."

මානවී, පහත් වී, ගඟුල්ගේ දෙපා වැන්දා ය. සුපෙම් හැඟුම් අනන්තයක් ළය දරාගෙන, පෙම්වතුන් ආයතන පරිශ්‍රයෙන් පිටතට පැමිණිය හ.

ගඟුල්, මානවී ඇගේ නිල රිය වෙත කැඳවාගෙන ගියේ සුරතින් අල්ලාගෙන ම ය. මානවී හා ගඟුල් රිය අසලට සමීප වෙත් ම, ඒ අසලම නැවතුණු රිය දුටු ගඟුල් පුදුමයෙන් දෑස් විසල් කළේ ය.

"නංගි.. තාත්තා..!"

රියෙන් බැස තමා වෙතට පැමිණෙන රුව දුටු මානවීට,





තවත් උහුලා හිඳින්නට නොහැකි විය. ඈ, ඉදිරියට ගොස් සමරසිංහ මහතාගේ ළයට තුරුළු වූවා ය.

"එහෙනම් මගෙ දුව ආවා..!!!"

"ඔව් තාත්තෙ.. ආවා.. දැන් තාත්තා අර කිව්ව පෙරහැරෙන් ඇවිල්ලා.. මගේ තාත්තගෙන් මාව ඉල්ලගන්න.. පෙරහැරකින් ඇවිල්ලා මාව ඉල්ලන්න පුළුවන් තැනට මං ආවා තාත්තෙ.. දැන් මගෙ හිත හිස් නෑ.."

මානවී, සමරසිංහ මහතාගේ දෙපා මුල වැඳ වැටුණා ය. ආයතනයේ සේවක සේවිකාවන් රැසකගේ හෘදයාංගම හැඟුම් රැගත් දෑස්, ඔවුන් වෙත යොමුව තිබූ වග ඔවුන් කිසිවකුත් දැන සිටියේ නැත.

'සහකාර ප්‍රාදේශීය ලේකම් - උඩුදුම්බර'

පුවරුව දකිත් ම, සමරසිංහ මහතාගේ දෑස යළිත් කඳුළින් තෙත් විය.

"ඉක්මනට ම එනවා පුතේ.. දැන් මගෙ දුව.. පරිස්සමට ගිහින් එන්න.."

අසීරුවෙන් වුවත්.. ඒ මොහොතේ, ඈ පිටත් කර හැරිය යුතුව තිබූ බැවින්, ගඟුල්, ඇගේ සුරතින් අල්වාගෙන ම, ඇගේ නිල රථයෙහි පිටුපස දොර විවෘත කර දුන්නේ, යළිත් වතාවක් ඇගේ නළලත සිප ගනිමිනි. රත්නජීවගේ දෑසින් ද කඳුළක් කඩා වැටිණි. මානවී, රත්නජීවගේ දෙපා වැන්දේ දුටු දෑස් සියල්ල හඬවමිනි.

"පුතේ.. අපි හෙට ගිහිල්ලා ඇරලවන්නම්.. අද ඉඳලා යන්න පුතේ.."

"විදියක් නෑ තාත්තෙ.. හෙට උදේම ගංවතුරෙන් කැඩුන



Uploaded By Sanda

ගෙවල් වගයක් බලන්න යන්න තියෙනවා.. මං ගිහිල්ලා එන්නම්.. බුදු සරණයි තාත්තෙ.. බුදු සරණයි අයියෙ.. බුදු සරණයි අන්කල්.."

මානවී, කඳුළු පිරී එන දෑස වසංගාගෙන රියට නැගුණා ය.

නිර්මාල්, රිය පණ ගන්වා, සෙමින් ඉදිරියට ගත්තේ ය. මානවීගේ සේ ම, පිය - පුතු දෙදෙනාගේ ම දෑස්වල වූයේ නළියන කඳුළු ය.

නොපෙනී යන රිය දෙස, පිය - පුතු දෙදෙනා ම බලා සිටියේ අදහාගත නොහැකි දෑසිනි.

"අපි මේ වීකෙන්ඩ් එකේ.. එහෙ යනවා පුතේ..! හීනයක් වගේ..! එන්නෙ ම නැතිවෙයි කියලා හිතපු කෙල්ල.. නොකියම ආවා.. පුදුමයි.. නොකියම ආවා..!!!"

සමරසිංහ මහතාගේ වදන් තුළ වූයේ පුදුමාකාර සොම්නසකි. ගඟුල්, ඈ නොපෙනී ගිය අනන්තය දෙස, බොහෝ වේලාවක් බලා සිටියේ ය.

ප්‍රේමය බලවත් ය. එහෙත්.. මුළු මහත් මානව සංහතියටම පොදු වූ මානව ප්‍රේමය ඊට වඩා බොහෝ බලවත් ය. එකා වන්ව එකට රොක් වූ, ඉසිවර දෑත් සියල්ල පසක් කරලූ සනාතන සත්‍යය එයයි.

- සමාප්තයි -



Uploaded By Sanda



# ඉසිවරු දෑත්

## දිල්හානි වික්‍රමරත්න

''අවුරුද්දක් හමාරක්... ඔය දරුවට මම කියන විදිහට පිළිවෙත් පුරන්න පුළුවන්නම්.. දරුවට සුවපත් වීමේ භාග්‍යය තියෙනවා.. නගරයේ ජීවත් වෙච්ච.. සැප සම්පත් මැද්දෙ.. සුකුමාර මහේශාක්‍ය ජීවිතයක් ගතකරපු ඔය දරුවට මේ දුෂ්කර ක්‍රියාව කරන්න පුළුවන් වෙයි ද??

ගගුල්, දොහොත් මුදුන් තබා සරණංකර හිමියන්ට නමස්කාර කළේ ය.

''ඔබ වහන්සේ කියන ඕනෑ ම දෙයක්.. මං කරන්නම් අපේ හාමුදුරුවනේ..''

සරණංකර හිමියෝ යළිත් මඳ සිනාවක් පෑවෝ ය.

''ජීවිත හරණයකට වඩා මේ දුෂ්කර ක්‍රියාව පහසුවක් තමයි දරුවෝ..''

උන් වහන්සේගේ කතාව තුළ කිසිදු බරක් තිබුණේ නැත. සසර ගමන තුළ ඔසවාගෙන යන්නට සුවිශේෂී බලගුවක් නොවූ උන් වහන්සේට සියලු කාරණා අල්පමාත්‍ර වූ සැහැල්ලු කාරණා ම වූයේ ය.

''අනික ඉතිං.. මේ අපේ මල්ලිගෙ ගෙදර ගතකරන ජීවිතයත්.. ඔය දරුවට තවත් සැහැල්ලුවක් වෙයි.. කොයි වෙලාවෙත් හිනා වෙවී.. සිංදුවක් තාලය මුමුණ මුමුණා.. කිරිල්ලියක් වගේ සැහැල්ලුවෙන් ඉගිලෙන දරුවෙකුත් ගෙදර සැරිසරනකොට.. ඔය දරුවට පාලුවක් දැනෙන එකකුත් නෑ..''

නොසිතූ මොහොතක සරණංකර හිමියන්ගේ මුවින් ගිලිහුණු විවරණය, අදහාගත නොහැකිව, පියපුතු දෙදෙනා උනුන් මුහුණු බලා ගත්හ. කිසිදු වගක් නොවූ ලෙස සරණංකර හිමියෝ ගගුල්ගේ උපන් වේලාව ලියාගත් පත් ඉරුවෙහි මදකස ඇඳි මුහුණ රඳවා ගෙන උන්හ.

Shaakya Publications

ISBN 978-955-0207-51-0

ISBN: 978-955-0207-51-0

දිල්හානි වික්‍රමරත්න ප්‍රකාශන

077 3 598233, 077 3 847369

රු.495/-

SL UNLIMITED
The spirit of Sri Lankan community
Uploaded By Sanda